32 වන කාණ්ඩය
12 වන කලාපය

බ්‍රහස්පතින්ද
1984 දෙසැම්බර් 13

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නිල වාර්තාව

(අශෝධිත පිටපත)

## අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

රාජනීතිඥ ගරු එන්. ඩී. එම්. සමරකෝන් මහතා අග්‍රවිනිශ්චයකාර තනතුරෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනාවෙහි අඩංගු චෝදනා පිළිබඳ විශේෂ කාරක සභාව : වාර්තාව

විසර්ජන පනත් කෙටුම්පත, 1985 [දහනව වන වෙන්කළ දිනය] :
[ශීර්ෂ 61-69 (වෙළඳ හා නාවික) ; ශීර්ෂ 162-166 (සංස්කෘතික කටයුතු)] කාරක සභාවේදී සලකා බලන ලදී

වෙළෙඳ නැව් පනත : නියෝගය

ජාතික ලේඛනාරක්ෂක පනත : නියෝග

කල්තැබීමේ යෝජනාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 32
இல. 12

வியாழக்கிழமை
13 டிசம்பர் 1984

# பாராளுமன்ற விவாதங்கள்

*(ஹன்சாட்)*

*அதிகார அறிக்கை*

*(பிழை திருத்தப்படாதது)*

*பிரதான உள்ளடக்கம்*

விஞக்களுக்கு வாய்மூல விடைகள்

கௌரவ என். டி. எம். சமரக்கோன், கியு. சீ, அவர்களைப் பிரதம நீதியரசர் பதவியிலிருந்து நீக்கக் கோரும் தீர்மானத்திலுள்ள குற்றச்சாட்டுக்களை விசாரிப்பதற்கான தெரிகுழு : அறிக்கை

ஒதுக்கீட்டுச் சட்டமூலம், 1985 [ஒதுக்கப்பட்ட பத்தொன்பதாம் நாள்] :

குழுவில் ஆராயப்பட்டது [தலைப்புக்கள் 61-69 (வர்த்தகம், கப்பற்றுறை) ; தலைப்புக்கள் 162-166 (கலாசார அலுவல்கள்)]

வணிகக் கப்பற் சட்டம் : ஒழுங்குவிதி

தேசிய சுவடிக்கூடச் சட்டம் : ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை

---

**Volume 32**
**No. 12**

**Thursday**
**13th December 1984**

# PARLIAMENTARY DEBATES

**(HANSARD)**

## OFFICIAL REPORT

**(Uncorrected)**

## PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

SELECT COMMITTEE ON ALLEGATIONS IN RESOLUTION FOR REMOVAL OF HON. N. D. M. SAMARAKOON, Q.C., FROM OFFICE OF CHIEF JUSTICE : REPORT

APPROPRIATION BILL, 1985 [Nineteenth Allotted Day] :
Considered in Committee [Heads 61 – 69 (Trade & Shipping) ; Heads 162 – 166 (Cultural Affairs)]

MERCHANT SHIPPING ACT : REGULATION

NATIONAL ARCHIVES LAW : REGULATIONS

ADJOURNMENT MOTION

2–A 080952–3,250 (84/12)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

**1984 දෙසැම්බර් 13 වන බ්‍රහස්පතින්ද**
**வியாழக்கிழமை, 13 டிசம்பர் 1984**
*Thursday, 13th December, 1984*

*පූ. භා. 8.30 ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*பாராளுமன்றம் மு. ப. 8.30 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 8.30 a.m.* MR. DEPUTY SPEAKER (MR. NORMAN WAIDYARATNA) *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
### PAPERS PRESENTED

(1) Statement of Accounts of the University Grants Commission for the year ended 31.12.1982, together with the Report of the Auditor-General thereon and observations of the Commission.

(2) Supplementary Estimate No. 42 of 1984. – (*Mr. M. Vincent Perera, on behalf of the Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways.*).

(1) A Resolution under section 10 of the Customs Ordinance (Chapter 235) relating to Import Duties.

(2) Two Orders made under section 4 and section 7 of the Turnover Tax Act, No. 69 of 1981.

(3) An Order made under section 69 of the Stamp Duty Act, No. 43 of 1982. – (*Mr. M. Vincent Perera, on behalf of the Minister of Finance and Planning*).

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රාජනීතිඥ ගරු එන්. ඩී. එම්. සමරකෝන් මහතා අග්‍ර විනිශ්චයකාර තනතුරෙන් ඉවත් කිරීම සඳහා වූ යෝජනාවෙහි අඩංගු චෝදනා පරීක්ෂා කළ විශේෂ කාරක සභාවේ වාර්තාව

### கௌரவ என். டி. எம். சமரக்கோன், கியு. சீ. அவர்களைப் பிரதம நீதியரசர் பதவியிலிருந்து நீக்கக் கோரும் தீர்மானத்திலுள்ள குற்றச்சாட்டுகளை விசாரிப்பதற்கான தெரிகுழு

### REPORT OF SELECT COMMITTEE ON ALLEGATIONS IN RESOLUTION FOR REMOVAL OF HON. N. D. M. SAMARAKOON, Q.C., FROM OFFICE OF CHIEF JUSTICE

පූ. භා. 8.32

**ලලිත් ඇතුලත් මුදලි මහතා (ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා සහ නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා)**

**(திரு. லலித் அத்துலத் முதலி—தேசிய பாதுகாப்பு அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சரும்)**

(Mr. Lalith Athulath Mudali – Minister of National Security and Deputy Minister of Defence)

Mr. Deputy Speaker, I present the Report of the Select Committee appointed to investigate and report to Parliament on the allegations referred to in the Resolution placed on the Order Paper of 5th September 1984, for the Presentation of an Address to His Excellency the President requesting the removal of the Hon. N.D.M. Samarakoon, Q.C., from the Office of the Chief Justice of the Supreme Court.

For the information of hon. Members, before the Report is printed, I will read out the operative sentence. It is as follows :–

> We are satisfied that the Hon. Chief Justice's speech, taking into account all the circumstances, constitutes a serious breach of convention and has thereby imperilled the independence of the judiciary and undermines the confidence of the public in the judiciary. However, every breach of convention does not necessarily amount to proved misbehaviour. The standard of proof required is very high. In all the circumstances of this case, while this Committee cannot but condemn this speech, we cannot come to the conclusion that the Hon. Chief Justice is guilty of proved misbehaviour.

Three Members of the Committee have come to the same conclusion, but for different reasons.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)**
**(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)**
(Mr. Sarath Muttetuwegama-Kalawana)

Same conclusion ? I do not think so.

**ලලිත් ඇතුලත් මුදලි මහතා**
**(திரு. லலித் அத்துலத்முதலி)**
(Mr. Lalith Athulath Mudali)

They have come to the conclusion that there is no proved misbehaviour.

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා**
**(திரு. சரத் முத்தெட்டுவெகம)**
(Mr. Sarath Muttetuwegama)

They have come to the conclusion that there is no proved misbehaviour, but not to the earlier part of it.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

For different reasons.

**ලලිත් ඇතුලත් මුදලි මහතා**
**(திரு. லலித் அத்துலத்முதலி)**
(Mr. Lalith Athulath Mudali)

That was the reason. The earlier part gives the reasons.

එම්. වින්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)

(Mr. M. Vincent Perera Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

I move,

"That the Report of the Select Committee appointed to investigate and report to Parliament on the allegations referred to in the Resolution placed on the Order Paper of 5th September, 1984, for the presentation of an Address to His Excellency the President requesting the removal of the Hon. N.D.M. Samarakoon, Q.C., from the Office of the Chief Justice of the Supreme Court, be printed."

*ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

# ORAL ANSWERS TO QUESTIONS

## ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය : මිළ දී ගත් මෝටර් කාර්

## கிராம அபிவிருத்தி அமைச்சு : கொள்வனவு செய்யப்பட்ட கார்கள்

## MINISTRY OF RURAL DEVELOPMENT : CARS PURCHASED

390/84

රිචඩ් පතිරණ මහතා (අක්මීමන)
(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)
(Mr. Richard Pathirana-Akmeemana)

ග්‍රාම සංවර්ධනය පිළිබඳ ඇමතිතුමියගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) 1977 ජූලි මාසයේ සිට 1984 අගෝස්තු මස අග දක්වා එතුමියගේ අමාත්‍යාංශයට මිළදී ගනු ලැබූ සියලුම මෝටර් කාර් සම්බන්ධයෙන් වර්ගය හා මෝස්තරයත්, සාදන ලද්දේ ඇණවුමකටද යන වගත්, ඩීසල්/පැට්‍රෝල් ගැලුමකින් දුවන සැතපුම් ගණනත් දක්වමින් ඒවායේ මුළු වටිනාකම එතුමිය ප්‍රකාශ කරන්නේද?

(ආ) එක් එක් මෝටර් රථය සඳහා ගෙවන ලද තීරු බදු ප්‍රමාණය සහ ඒ ඒ රථයේ මිල, රක්ෂණ හා ගැල් කුලිය සැදී ඇති අයුරු එතුමිය දක්වන්නේද?

(ඇ) රථය වෙන්කර ඇත්තේ කවරකුගේ ප්‍රයෝජනය සඳහාද යන්නත් වැය වෙන ඉන්ධන වියදම ලබා ගන්නේ කවර වැය සම්මතය යටතේද යන්නත් එතුමිය ප්‍රකාශ කරන්නේද?

கிராம அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா :

(அ) 1977, ஜூலை முதல் 1984, ஆகஸ்ட் முடிவுவரை அவரது அமைச்சுக்கென கொள்வனவு செய்யப்பட்ட சகல கார்களினதும் மொத்தப் பெறுமதியையும் ஒவ்வொரு காரினதும் இனம், மொடல், அவை கட்டளையின் பிரகாரம் செய்யப்பட்டனவா, இல்லையா, அவை/டீசல் பெற்ரேல் கலனொன்றுக்கு ஓடக்கூடிய மைல்கள் ஆகிய விபரங்களுடன் அவர் கூறுவாரா?

(ஆ) அவற்றின் இரயம், காப்புறுதி, கேழ்வுப் பெறுமதியையும்(C.I.F. Value)ஒவ்வொரு காருக்கும் செலுத்தப்பட்ட தீர்வையையும் அவர் கூறுவாரா?

(இ) ஒவ்வொரு காரும் யாருடைய பாவனைக்கு ஒதுக்கப்பட்டுள்ள தென்பதையும் பயன்படுத்தப்படும் எரிபொருள் எந்த வாக்குப் பணத்திலிருந்து பெறப்படுகின்றதென்பதையும் அவர் கூறுவாரா?

Asked the Minister of Rural Development –

(*a*) Will she state the total value paid for all cars purchased for he Ministry from July 1977 to end of August, 1984 with their make, model, whether made to order or not, and miles per gallon of diesel/petrol ?

(*b*) Will she give a break down of the C.I.F. value and the duty paid for each of the cars ?

(*c*) Will she state for whose use the car is allocated and from what Vote is the fuel consumed drawn ?

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

One hehalf of the Minister of Rural Development, I table the Answer.

*සභාමේසය මත තබන ලද පිළිතුර :*
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
*Answer tabled :*

(අ) අංක 9 ශ්‍රී 5361–604 පර්ජෝ වර්ගය
ඇණවුමකට සාදවා නොමැත. පැට්‍රල් ගැලුමකින් වායු සමීකරණය සහිතව සැතපුම් 14 ක් හා සාමාන්‍ය සැතපුම් 16 ක්.
මුළු වටිනාකම රු. 179,535.35

අංක 9 ශ්‍රී 9726–504 පර්ජෝ වර්ගය ජී. එල්. මෝස්තරය
ඇණවුමකට සාදවා නොමැත. පැට්‍රල් ගැලුමකට සැතපුම් 20 ක් පමණ
මුළු වටිනාකම රු. 116,134.16

අංක 10 ශ්‍රී 2062–504 පර්ජෝ වර්ගය ජී. එල්. මෝස්තරය
ඇණවුමකට සාදවා නොමැත. පැට්‍රල් ගැලුමකට සැතපුම් 20 ක් පමණ
මුළු වටිනාකම රු. 115,917.60

අංක 9 ශ්‍රී 802–මිට්ෂුබිසි ගැලන්ට් ස්ටෙසන් වැගන් වර්ගය–සිග්මා මෝස්තරය
ඇණවුමකට සාදවා නොමැත. පැට්‍රල් ගැලුමකට සැතපුම් 20 ක් පමණ
මුළු වටිනාකම රු. 68,972.00

අංක 12 ශ්‍රී 3733–මිට්ෂුබිසි වර්ගය–ලාන්සර් මෝස්තරය
ඇණවුමකට සාදවා නොමැත. පැට්‍රල් ගැලුමකට සැතපුම් 24 ක් පමණ
මුළු වටිනාකම රු. 88,199.00

අංක 13 ශ්‍රී 1934 බෙන්ස් වර්ගය–280 එස්. මෝස්තරය
ඇණවුමකට සාදවා නොමැත. පැට්‍රල් ගැලුමකට සැතපුම් 18 ක් පමණ
මුළු වටිනාකම රු. 6,53,200.95

අංක 7 ශ්‍රී 1058–ඩැට්සන් වර්ගය
ඇණවුමකට සාදවා නොමැත. පැට්‍රල් ගැලුමකට සැතපුම් 20 ක් පමණ
රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ඇත.

(ආ) අංක 9 ශ්‍රී 5361–තීරුබදු නොමැත.

| | | |
|---|---|---|
| රථයේ මිල | ... | 1,66,384 25 |
| රක්ෂණය | ... | 6,867 60 |
| ගැල් කුලිය | ... | 14 00 |
| ප්‍රවාහණ ගාස්තුව | ... | 5,000 00 |

අංක 9 ශ්‍රී 9726–තීරුබදු ... 14 00

| | | |
|---|---|---|
| රථයේ මිල | ... | 1,06,749 09 |
| රක්ෂණය | ... | 4,051 63 |
| ගුදම් ගාස්තු | ... | 319 44 |
| ප්‍රවාහණ ගාස්තුව | ... | 5,000 00 |

අංක 10 ශ්‍රී 2062–තීරුබදු ... 14 00

| | | |
|---|---|---|
| රථයේ මිල | ... | 1,06,532 41 |
| රක්ෂණය | ... | 4,051 75 |
| ගුදම් කුලිය | ... | 319 44 |
| ප්‍රවාහණ ගාස්තුව | ... | 5,000 00 |

අංක 9 ශ්‍රී 802–තීරුබදු නොමැත.

| | | |
|---|---|---|
| රථයේ මිල | ... | 68,665 13 |
| ගුදම් කුලිය | ... | 10 00 |

ගුදම් කුලී රක්ෂණ නොමැත.

අංක 13 ශ්‍රී 1934–තීරුබදු නොමැත.

| | | |
|---|---|---|
| රථයේ මිල | ... | 6,35,275 75 |
| රක්ෂණ ගාස්තුව | ... | 12,425 20 |
| ප්‍රාදේශීය ගාස්තුව | ... | 5,500 00 |

(ඇ) අංක 9 ශ්‍රී 5361–ගරු ඇමතිතුමියගේ නිලරථය
අමාත්‍යාංශයේ 87 ශීර්ෂය
මෙම වාහනය රජයේ සැපයීම් අධ්‍යක්ෂ වෙත භාරදී ඇත.

අංක 9 ශ්‍රී 9726–ලේකම්
අමාත්‍යාංශ–87 ශීර්ෂය

අංක 10 ශ්‍රී 2062–ගරු ඇමතිතුමිය
අමාත්‍යාංශ–87 ශීර්ෂය

අංක 9 ශ්‍රී 802–නියෝජ්‍ය ඇමතිතුමා
අමාත්‍යාංශ–87 ශීර්ෂය
මෙම වාහනය රජයේ සැපයීම් අධ්‍යක්ෂ වෙත භාරදී ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අංක 12 ශ්‍රී 3733—නියෝජ්‍ය ඇමතිතුමා
අමාත්‍යාංශ—87 ශීර්ෂය

අංක 13 ශ්‍රී 1934—ගරු ඇමතිතුමිය
අමාත්‍යාංශ—87 ශීර්ෂය

අංක 7 ශ්‍රී 1058—දෙපාර්තමේන්තුවේ රාජකාරී සඳහා
දෙපාර්තමේන්තු—88 ශීර්ෂය

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Question No. 1.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Finance and Planning, I ask for two weeks' time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Question No. 2.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Finance and Planning, I ask for two weeks time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
**(பிரதிச் சபாநாயகர் அவர்கள்)**
(Mr. Deputy Speaker)

Question No. 3.

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

On behalf of the Minister of Finance and Planning, I ask for two weeks' time to answer this Question.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**එම්. වින්සන්ට් පෙරේරා මහතා**
**(திரு. எம். வின்சன்ற் பெரேரா)**
(Mr. M. Vincent Perera)

I move,

"That the proceedings on Items 2 and 3 of Public Business appearing on the Paper be exempted at this day's sitting from the provisions of Standing Order No. 70(3)."

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put and agreed to.*

## විසර්ජන පනත් කෙටුම්පත, 1985
### ஒதுக்கீட்டுச் சட்ட மூலம், 1985
## APPROPRIATION BILL, 1985

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී – [ප්‍රගතිය දෙසැම්බර් 12]*
*[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் மேலும் ஆராயப் பெற்றது.—[தேர்ச்சி : 12 டிசம்பர்]*
*[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee – [Progress : 12th December]*
[MR. DEPUTY SPEAKER *in the Chair*]

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

The vote on Heads 61 to 69 will be taken at 2.30 p.m.

**61 වන ශීර්ෂය.– වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා**

1 වන වැඩ සටහන.– සාමාන්‍ය පරිපාලනය හා වෙළඳ තොරතුරු සේවා – පුනරාවර්තන වියදම්, රු. 84,18,000

***தலைப்பு 61.—வியாபார, கப்பற்றொழில் அமைச்சர்***

***நிகழ்ச்சித்திட்டம் 1.— பொது நிருவாகமும் வியாபார தகவற் சேவைகளும்—மீண்டுவருஞ் செலவு, ரூபா 8,148,000***

HEAD :61 – MINISTER OF TRADE AND SHIPPING

Programme 1 – General Administration and Trade Information Services– Recurrent Expenditure, Rs. 8,418,000

පූ. භා. 8.36

**සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)**
**(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)**
(Mr. Sarath Muttetuwegama–Kalawana)

Mr. Chairman, I move

"That the Programme be reduced by Rs. 10".

I will be very brief in regard to the remarks that I propose to make and confine myself really to one particular aspect of this Ministry's work and one Corporation that comes under this Ministry. I refer, Sir, to the Insurance Corporation. Now, of course, there are two Insurance Corporation and I believe the setting up of the second corporation is a prelude to the privatization of insurance in this country. I am one of those people, Sir, who stand against the privatization of nationalized ventures, but when you see the work of the Insurance Corporation, one really begins to have serious double about whether the nationalized sector can work in such an area as insurance. What has happened, Sir, is really when the Insurance Corporation enjoyed a monopoly of Insurance in this country, before the setting up of the other corporation, they had a total monopoly of insurance in this country, life, personal accidents, other schemes of insurance including motor insurance were entirely the monopoly of the insurance Corporation. Even today, if they are not the monopoly they are still restricted to these two Corporations.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

Sir, with regard to the Insurance Corporation of Ceylon I want to make a serious complaint about the way they handle claims. They are not here in the capacity of a purely business profit making place. They are a corporation belonging to the people of this country and they must handle claims with some humane approach. I have had occasion to raise a Question here, which was answered on behalf of the Hon. Minister by the Hon. Minister of Parliamentary Affairs about a person by the name of Angamma of Ratnapura who made a claim in regard to an accident arising from a car which was insured with the Corporation. When that man made his claim the Corporation totally ignored the claim ! Then he filed action against the person who met with the accident and made the Corporation a party. *Ex Parte* judgment was entered because for some reason or the other the Corporation lawyers did not come on the trial date. The Corporation did not appeal. They did not do anything. The judgment was in force. They dilly-dallied about the payment. Ultimately, I do not know at what stage it is now but writ of execution had been taken out against them. This is a Corporation. They had only to pay. That man is seriously injured and crippled below the waist. He is waiting for this money to go for an operation to the UK. That man has approached you on a personal level and on a legal level but has had no response what so ever from the Corporation. So, there are a number of people like this and a number of claims which have been totally ignored. I want to ask the Hon. Minister to tell the Corporation that they must deal with claims in a more humble manner. That is one case.

මහේන්ද්‍ර විජේරත්න මහතා (මීරිගම)
(திரு. மகேந்திர விஜேரத்ன — மீரிகம)
(Mr. Mahendra Wijeratne–Mirigama)

That is just a stray case. We can check that up.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

The Corporation knows the case well because it is a Ratnapura District Court case where *ex parte* judgment was entered and Questions had been asked in Parliament about it.

That is one case. But there are several cases of people who have made claims to the Corporation which are not dealt with either expeditiously or humanely. I am not asking you to tell the Corporation to pay evey claim that is made. Naturally you cannot do that. You cannot then exist as a business and certainly not to pay frivolously but there are genuine cases and the fact of the matter is that those claims are not properly met. I think it is a matter of policy. It is not a question of personnel working in any department but it is a question of formulating adequate policy. Therefore you should take some steps about this matter.

Another mater I would like to ask the Hon. Minister is actually whether he is thinking of privatizing insurance because there had been various stories. There was a newspaper story about three months ago saying that insurance was to be privatized. There were foreign companies here it was after a great deal of agitation that insurance was nationalized. Of course, there are weaknesses as I myself has had occasion to mention just now, but that does not mean that this whole field of insurance, which is a very lucrative business, should be thrown open to private people. I know there are people who are doing agency business waiting till this is privatized to step back into insurance business and particularly there are foreign companies which will completely out manoeuvre any local company or any local corporation if they are allowed to do insurance business in Sri Lanka. therefore, I would ask the Hon. Minister, on the one hand to get the Insurance Corporation and the National Insurance Corporation to remodel their policy in regard to claims and secondly to jealously guard the nationalized insurance ventures. Thank you.

ලලිත් ඇතුලත් මුදලි මහතා (ජාතික ආරක්ෂාව පිළිබඳ ඇමතිතුමා සහ නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා)
(திரு. லலித் அத்துலத் முதலி—தேசிய பாதுகாப்பு அமைச்சரும் பிரதி பாதுகாப்புப் அமைச்சரும்)
(Mr. Lalith Athulath Mudali – Minister of National Security and Deputy Minister of Defence)

I would like to make a contribution in relation to this Ministry because the period under review includes a part in which I was also directly responsible.

Sir, I must first congratulathe Hon. Minister and Deputy Minister for the very acceptable way in which they are handling the rather diverse and tricky problems necessarily involved in the functions of the subjects of this Ministry.

The matter raised by the hon. Member for Kalawana is an individual case which must necessarily be looked into. While there have been such complaints and while there may be some validity in some of those cases it must not be forgotten that perhaps in the history of insurance no two institutions have faced such difficulties as those which arose after the incidents of July 1983. I do not think any institution had so many claims.

I believe that by and large the corporations have acquitted themselves well and met the claims of the public. If we had at that time private insurance companies without sufficient financial backing we would have had a series of defaults in the payment of insurance after the incidents of July 1983. So, whatever framework we work out in insurance, I think we need to have strong financial institutions, and I personally believe that they must all be totally committed to this country.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Sir, the matters I want to arise out of an observation I found coming out from some report relating to the purchase of ships by the Ceylon Shipping Corporation. I think I know more about those facts than many people do. The Ceylon Shipping Corporation's purchase of ships was done in accordance with the procedures laid down by the Government. The original proposal from the Ministry of Trade and Shipping, which I endorsed, was to purchase second hand-ships. When it went up to Cabinet many strong views were expressed that the time was appropriate to purchase new ships. That view was expressed because the prices of ships in the world market at that time were very, very low indeed, and it was felt that the advantage of the low prices must be taken by Sri Lanka. Up to that time Sri Lanka had not purchased new ships. We had only purchased old ships. That view prevailed, and new ships were purchased in accordance with the properly constituted tender procedure.

Now. at the time the decision was made nobody could have predicted the disastrous drop in freight rates that was to take place two years from the time the decision was taken. When the ships came into the sea, as it were and were put to use the freight rates had dropped disastrously by that time. At that time so may shipping companies, including the national lines of other countries, got into difficulties, and some actually went into bankruptcy. But the Ceylon Shippong Corporation has even during this difficult time, even having to make payments on the ships, managed to keep operating at an operational profit.

The point I wish to make is this. After this has all happened, many years later, a group of people sit together and make a comment and say, "Why did you purchase new ships" ? I do not know whether they could even question a Cabinet decision, which was to purchase new ships. As I said earlier, the original proposal of the Ministry of Trade and shipping was to purchase old ships, but because the ships were so cheap at that time the decision was taken to buy new ships. The point I want to make is this. In this Ministry, by its very nature you have to take risks at dicision-making. Nobody could have at that time what the freight rates were likely to be. But now in 1984 you have people who come and say, "Why did you not in 1980 predict that in 1982 the freight rates would drop ?" I mean, these are untenable arguments. Nobody in the world could have predicted these things. From those pundits I would ask one question. This is 1984. Would you kindly predict and tell me what the freight rates are going to be in 1986 ? You cannot do business in that way.

What I am worried about, Sir, is that in this field there are a number of officials–civil servants, heads of corporations–who have to take decisions which are inherently risky, which cannot necessarily be always right. But if we are going to have a committee which suddenly turns up many years later and questions their judgment, then all you are going to do is, you are going to stultify those officials ; you are not going to allow the public sector of this country to work on proper business lines. We do not need to have people who are wise after the event. It is far better to have these committees to tell us what is going to happen in the future.

So I would strongly suggest that in the assessment of the work of this Ministry that must be borne in mind. It is inherent that there is risk in taking commercial decisions. These decisions are right most of the time. In fact, if you look at the record of the Ministry of Trade and Shipping, most of the time they are right. If fact, their record of being right is quite impressive. But occassionally, sometimes, world conditions are such that you cannot fully predict a situation totally. But I am confident that as the years go by and as the freight rate market in the world becomes more remunerative and stabilize, it will be said that the decision to purchase these ships and acquire this fleet was undoubtedly right. At the moment, if we go to buy new ships now, they are much more expensive than they were at the time we ordered. Nobody says that. At that time it was bought at possibly the cheepest point in the set-up.

That is not the thing I am really going on, Sir. I do not want to see public officials who have to take these risky decisions suffer. Actually, it is not the politicians who take the decision because when the Cabinet decided to purchase these ships a Cabinet tender board was set up headed by officials. No Minister or Deputy Minister gets involved in this, and I think the country knows that the tradition of the ministry of Trade and Shipping in the last seven years, which is now being ably carried out by the Minister and Deputy Minister, is not to get involved in any of these individual tender businesses. But the officials have to take the decision. You must trust them to take it with the attendant commercial risk. If those things are sometimes not predicted with a kind of astrological sense of accuracy, we must not try to be wise after the event and try to castigate them or find fault with them or complain about them. As the Deputy Minister says, all that was done with the advise of ESCAP, which is an international UN organization.

Then, Sir, there is the question which is seeking to agitate people now quite a lot, " Why are prices so high ? " In the first place, prices are not necessarily determined by the Ministry of Trade. The country knows that. The Ministry of Trade is concerned with supply. Prices are determined by the availability of supply, the amount of money in the market, the cash flow situation, the inflation situation, the supply and demand situation, all of which are not controlled by any single Ministry.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලලිත් ඇතුලත්මුදලි මහතා]

But as far as the month of December is concerned – I have followed the prices now for the last seven to eight years – Prices are high in December. They are always high in December. Yesterday, in the debate on the Votes of the Ministry of Food, I think the hon. Member for Akmeemana (Mr. Richard Pathirana) raised the question, why are rice prices high at this moment. It is a perfectly fair question. But if you look at the price structures, always in December the prices go up. Why ? One, for seasonal reasons. Vegetables are relatively in short supply in the month of December unless weather patterns change. From the 10th of January the picture will change when all the crops that have been sown now begin to be harvested. Rice prices also follow the same pattern because the stocks of rice collected in the month of August in the Yala season gradually begin to run down. But soon as the Maha begins to be harvested by about the 10th of January, unless the weather pattern changes radically, you will have a situation where the prices will come down.

Sometimes there is an element of consumer hoarding. Sometimes there could be trader hoarding. Now, trader hoarding is a matter which the Ministry of Trade has to deal with, and I find they have dealt with it quite adequately. But please do not think that perishables are hoarded by anybody.

My experience in te last seven years of this is that nobody hoards perishables because they perish with it if they hoard. Perishables are largely determined by weather patterns and supply. So while there should be concern always about the level of prices one should not ignore the fact that seasonal factors play a very large role in determining the actual prices.

Then, Sir, part of the food distribution system is affected by the fact that for security reasons we had to put certain restrictions on movement. But I think the Hon. Minister of Trade will agree with me, that together with the Ministry of Food and Co-operatives, and the Ministry of Defence and the Ministry of National Security we have worked very closely together to see that nobody in this country will starve and nobody will do without. I want to congratulate the Ministry of Trade and the Ministry of Food and Co-operatives for the very great and unstinting co-operation that they have given us on all defence and security matters. I know that many of their officials run grave risks in ensuring that food and other necessary items are distributed. To the people of Jaffna in particular, Sir, I would like to say that despite curfews we have a system by which food will be distributed. We will see to it that nobody will starve and nobody will go without even in the Jaffna peninsula, although there was a 61-hour curfew which ended this morning and which was very useful to carry out certain operations against the terrorists. It was one very useful way of separating terrorists from innocent people because innocent people do not go out during curfew time. We managed, in order to have food distribution, to lift the curfew locally for an hour or two to ensure that food is adequately distributed. In the future also when the curfew has to be imposed – and it should be imposed again for very long periods of time – we will follow the policy of removing the curfew locally for an hour or two in order to enable the people of the area to get their essential supplies. This Ministry has in the past faced a number of challenges. Now they have to be more conscious of the security and the problems that security creates for their distribution. I am certain that they will be equal to the task. We have a Minister and a Deputy Minister who, like my Deputy Minister and me, work togeher like two wheels of a bicycle. I want to tell the new Deputy Minister that that was the secret of success of how the Trade and Shipping Ministry worked from 1977 to 1984, and now I see that the same principles and can the same comraderie are operating.

I thank them for giving me always the opportunity of being closely consulted on all important matters and I am certain that this Ministry will continue in the years ahead to work with the same acceptance that it has gained with the public. The public's faith in the Minisrty is strong and I am sure it will continue in the years ahead.

පූ.භා. 8.55

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)**
**(Mr. Richard Pathirana–Akmeemana)**

ගරු සභාපතිතුමනි, වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන වචන කීපයක් කතා කරන්න අදහස් කරනවා. ගාලු දිස්ත්‍රික්කයෙන් පැමිණි කෙනකු වශයෙන් කැබිනට් මණ්ඩලයේ සිටින එකම ඇමතිවරයා මේ ඇමතිතුමා නිසා පළමුවෙන්ම මම එතුමාට සුබ පතන්න කැමතියි. ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකුට කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයකු වශයෙන් පත්වීමේ වාසනාව ලැබීම ගැන අපි සතුටු වෙනවා. එතුමාගේ කාර්යයන් සාර්ථකව කරගෙන යෑමට පුළුවන් වේවායි ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට මම ප්‍රාර්ථනා කරනවා.

මේ අමාත්‍යාංශය යටතේ තිබෙන මහපොළ ලොතරැයිය සම්බන්ධයෙන් අපේ බලවත් සතුට පළමුවෙන්ම පළකරන්න කැමතියි. මන්ද ? මේ මහපොළ ලොතරැයිය මඟින් මේ රටේ දුප්පත් ළමයින්ට විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ගැනීම සඳහා සෑහෙන තරම් ආධාරයක් ලැබෙන නිසා. මීට කලින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමේදී දුප්පත් ළමයින්ට යම්-යම් බාධාවලට මුහුණ පාන්නට සිදු වුණා. මහපොළ ලොතරැයිය නිසා එවැනි ශිෂ්‍යයන් බොහෝ දෙනකුට සෑහෙන සහනයක් ලැබී තිබෙනවා. මේ ආධාර මීටත් වඩා පුළුල් අන්දමින් ලබා දීමට වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශය කටයුතු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා.

විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලබන ළමයින්ට බොහෝ විට ප්‍රශ්නයක් වුණේ විශ්ව විද්‍යාලයට ගොස් අවුරුදු තුනක් හතරක් නැත්නම් පහක් ඒ අධ්‍යාපනය ලබා ගන්නේ කොහොමද යන කාරණය බව දීර්ඝ කාලයක් ගුරු වෘත්තියේ යෙදී සිටි කෙනකු වශයෙන් මම පෞද්ගලිකව දන්නවා. එවැනි දුප්පත් ළමයින්ට සම්පූර්ණයෙන්ම නොව සෑහෙන තරම් දුරට සහනයක් මහපොළ ලොතරැයි ක්‍රමය මඟින් ලැබී තිබෙනවා. ඒ නිසා ඒ ගැන අපි සතුටු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට කලින් කතා කළ හිටපු වෙළඳ හා නාවික ඇමති වර්තමාන ජාතික ආරක්ෂක ඇමතිතුමා භාණ්ඩ මිල පිළිබඳව කරුණු සඳහන් කළා. ඇත්ත වශයෙන් දැනට අපට අවබෝධ වී තිබෙන්නේ භාණ්ඩ මිල පාලනය කිරීමට වෙළඳ අමාත්‍යාංශයට පුළුවන්කමක් නැති බවයි. නව ඇමතිතුමා මේ අමාත්‍යාංශය බාර ගත් අවස්ථාවේදී ඉතාම ඉක්මනින් ජීවන වියදම වැඩිවීමේ වේගය අඩු කරනවායයි ප්‍රකාශ කළ බව මට මතකයි. නමුත් ඒ කාර්යය තවමත් ඒ කී ආකාරයෙන් සාර්ථක වෙලා නැහැ.

ඒ නිසා මේ කාරණයට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. අපට ලැබී තිබෙන වාර්තා අනුව මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ ජීවන වියදම 561.9 යි. මෙහි ඉතාම සුළු ප්‍රමාණයක එහා-මෙහා වීමක් — වෙනස් වීමක් — සිදු වූ නමුත් ජීවන වියදමේ අඩුවීමක් වෙලා නැහැ.

**එම්. එස්. අමරසිරි මහතා (වෙළෙඳ හා නාවික කටයුතු පිළිබඳ ඇමතිතුමා)**
**(திரு. எம். எஸ். அமரசிறி—வர்த்தக, கப்பற்றுறை அமைச்சர்)**
(Mr. M. S. Amarasiri - Minister of Trade and Shipping)

සැප්තැම්බර් මාසයේ අඩු වෙලා තියෙනවා 1.2 ක්.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

සැප්තැම්බර් මාසයේ අඩු වෙලා ආපහු ඔක්තෝබර් මාසේ වැඩි වෙලා තියෙනවා.

**එම්. එස්. අමරසිරි මහතා**
**(திரு. எம். எஸ். அமரசிறி)**
(Mr. M. S. Amarasiri)

අවුරුදු දහයකට පස්සේ මේ සැප්තැම්බර් මාසේ අඩු වී තිබෙනවා 1.2 ක්. යුනිට් දෙකක්.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

ඒකත් පත්තරවල දැම්මේ සියයට 1.9 ක්ය කියල. ඒකත් වැරදියි. මොකද ? 561.9 න් 1.9 ක් අඩු වුණාම ඒක සියයට 1.9 ක අඩුවීමක් නොවෙයි.

**එම්. එස්. අමරසිරි මහතා**
**(திரு. எம். எஸ். அமரசிறி)**
(Mr. M. S. Amarasiri)

ඒක පත්තරකාරයන්ගෙන් අහන්න.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

අද මේ භාණ්ඩ මිල වැඩි නිසා වෙළඳ අමාත්‍යාංශයට බොහෝම අමාරු තත්ත්වයක් ඇති වී තිබෙනවා. සාමාන්‍ය ජනතාවට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ අඩු මිලට ඔවුන්ට ලබා දීම වෙළඳ අමාත්‍යාංශයට ගැටළුවක් වී තිබෙනවා. හැම භාණ්ඩයක්ම අඩු මිලට ලබා දෙන්නැයි මම කියන්නේ නැහැ. නමුත් මේ රටේ සාමාන්‍ය දුප්පත් ජනතාවට ඉතාමත්ම අවශ්‍ය භාණ්ඩ කීපයක් තිබෙනවා. අඩු ගණනේ ඒ භාණ්ඩ කීපයවත් අඩු මිලට ලබා දෙන්නට වෙළඳ අමාත්‍යාංශයට පුළුවන්කම තිබෙන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ඊයේ උදේ මම කථා කරන ගමන් පෙන්වා දුන්නා, සහල් මිල හා අනිකුත් අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ගණන් වැඩි වී ඇති ආකාරය ගැන. එහෙම නම් මම මේ ඇමතිතුමාගෙන් අහනවා—විශේෂයෙන්ම හිනිදුම ආසනයේ ජනතාව ගැන එතුමා හොඳින් දන්නා නිසා වැඩි විස්තර නොකියා එතුමාගෙන් අහනවා—සාමාන්‍ය ගම්බද ජනතාවට අවශ්‍ය භාණ්ඩවල මිල අඩු කරන්නට එතුමාට පුළුවන්කම ලැබී නැද්ද කියා. ඇත්තෙන්ම සුඛෝපභෝගී භාණ්ඩවල මිල අඩු කරන ලෙස අපි ඉල්ලන්නේ නැහැ. නමුත් සාමාන්‍ය දුප්පත් ජනතාව ජීවත්වන ප්‍රදේශවලින් පාර්ලිමේන්තුවට ආ පුද්ගලයන් හැටියට—ඇමතිතුමාත් ඇවිත් තිබෙන්නේ එවැනි ප්‍රදේශයකින්—අපේ රටේ සාමාන්‍ය මිනිසුන්ට වුවමනා කරන පාරිභෝගික භාණ්ඩවල මිල අඩු කළ යුතු බවට මේ උත්තරීතර සභාවේදී ඉල්ලීම් කරන්නට අපේ යුතුකමක් තිබෙනවා. මන්ද ? අපේ රටේ සාමාන්‍ය ජනතාවට ජීවත් වෙන්නට බැරි තත්ත්වයක් අද ඇති වී තිබෙනවා. සමහර විට ආණ්ඩු පක්ෂයේ නමුත්නාන්සේලා කියාවි දැන් ඉස්සරට වඩා ආදායම් වැඩි වී තිබෙන බව. උදහරණයක් මගින් මම එය වැරදි බව ඔප්පු කර තවත් කාරණයකට අවධානය යොමු කරන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, ආහාර මුද්දර සහනාධාර ලැබීමේ ආදායම් සීමාව රු. 300 ට සීමා කර තිබෙනවා. ඒ අනුව කිසියම් කෙනෙකුගේ දවසක ආදායම රු. 10 ක් වුණොත් ඔහුට ආහාර මුද්දර දෙන්නේ නැහැ. එහෙම නම් ඒකෙන් අදහස් වෙන්නේ පුද්ගලයෙකුට රු. 10 කින් දවසක් ගත කරන්නට පුළුවන් බවයි. [බාධා කිරීමක්] මා පිළිගන්නවා, ආහාර මුද්දර සහනාධාර ක්‍රමය මෙතුමාට පැවරී ඇති කාර්යයක් නොවන බව. එහෙත් ආණ්ඩුව ප්‍රතිපත්තියක් හැටියට පිළිගෙන තිබෙනවා, රු. 10 ක ආදායමින් කෙනෙකුට දවසක් ගත කළ හැකි බව. ඒ පිළි ගැනීම කොයි හැටි වෙතත්, සාමාන්‍ය හාල් කිලෝවක් මිල දී ගන්නට අද රු. 10 ක් ඕනෑ කරනවා. එහෙම නම් මේ භාණ්ඩ මිල වැඩි වීම අපේ රටේ සාමාන්‍ය ජනතාවට බොහොම පීඩාකාරී අන්දමට බලපා ඇති බවයි මගේ තර්කය. එම නිසා කරවල, පරිප්පු, මිරිස්, රටළුණු, රතුළුණු, පිටි සහ පාන් වාගේ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල—සුඛෝපභෝගී භාණ්ඩවල නොවෙයි—මිල අඩු කරන ලෙසටයි අප ඉල්ලා සිටින්නේ. මෙන්න මේ භාණ්ඩවල මිල අඩු කරන්නට වෙළඳ අමාත්‍යාංශයට තවම පුළුවන්කමක් ලැබුණේ නැහැ.

**මහේන්ද්‍ර විජේරත්න මහතා**
**(திரு. மகேந்திர விஜேரத்ன)**
(Mr. Mahendra Wijeratne)

හාල් මිල අඩු කළොත් ගොවි මහත්වරු මොකද කියන්නේ ?

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

හාල් මිල අඩු කළොත් ගොවි මහත්වරු මොකද කියන්නේ ? ඒකයි ප්‍රශ්නය ? රජයේ මන්ත්‍රීවරුන් ඒ ගැන කියන කථා අපට පිළිගන්න බැහැ. නියෝජ්‍ය ඇමතිතුමා උත්සාහ ගන්නේ මා ඉදිරිපත් කළ ප්‍රශ්නය වෙනත් පැත්තකට හරවන්නටයි. නමුත් අපේ රටේ සාමාන්‍ය ජනතාවට අවශ්‍ය මූලික භාණ්ඩ කීපයවත් අඩු මිලට දෙන්නට වෙළඳ අමාත්‍යාංශයට පුළුවනි. උදහරණයක් වශයෙන් ගනිමු, ලක්ස්ප්‍රේ මිල ගැන. ලක්ස්ප්‍රේ මිල ගණන් වැඩි වී තිබෙන්නේ මොකද ? කොයි ආකාරයටද ? දැන් අපේ රටේ සාමාන්‍ය ජනතාවගේ දරුවෝ බොන්නේ 'ලක්ස්ප්‍රේ' කිරිපිටියි. හෝර්ලික්ස්, නෙස්ටෝමෝල්ට්, නෙස්ප්‍රේ ආදී කිරිපිටි වර්ග මිලදී ගන්නට පුළුවන්කමක් නැහැ. මිල ඉතා වැඩියි. එම නිසා, ලක්ස්ප්‍රේ මිල වැඩි වුණු ප්‍රමාණය ගැන කල්පනා කර බලා, එහි මිලෙහි අඩුවක් කරන්න. මිලෙහි වැඩිවීම පාලනය කරන්නට ක්‍රියා කරන්න. දැන් සාමාන්‍ය ජනතාවගේ දරුවන්ට ලක්ස්ප්‍රේවත් පානය කරන්නට බැහැ.

**එම්. එස්. අමරසිරි මහතා**
**(திரு. எம். எஸ். அமரசிறி)**
(Mr. M. S. Amarasiri)

1975 කාලයේදී ගරු මන්ත්‍රීතුමා මාසයකට ලක්ස්ප්‍රේ ටින් කීයක් බිව්වද ? නමුත්නාන්සෙත් අපිත් එක පැත්තෙ හිටපු යාළුවො නෙ.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

පසුගිය ආණ්ඩුව බලයේ සිටිද්දී රටේ ආහාර හිඟ වී තිබුණු නිසා ජනතාව මන්ද පෝෂණයෙන් පෙළෙන බව 1977 මැතිවරණ කාලයේදී නමුත්නාන්සේලාගේ පක්ෂයේ අය කිව්වා. එවැනි තත්ත්වයක් ඇති වුණේ පසුගිය ආණ්ඩුව පැවති කාලයේ තිබුණු ආහාර හිඟය නිසාය, මිල වැඩි නිසාය කිව්වා. ඒ ඒ ද්‍රව්‍යවල මිල ගණන් පෙන්නුවා. නමුත්නාසේලාගේ වරද මෙකයි. ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂය ස්වකීය මැතිවරණ ව්‍යාපාරවලදී තමන්ගේ පක්ෂය බලයට ආවොත් බඩු මිල වැඩි වෙනවාය කිව්වේ නැහැ. කිසිම කෙනෙක් එවැන්නක් කිව්වේ නැහැ. කිසිම ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක් වරකට කිලෝවක් එහෙම නැත්නම් ග්‍රෑම් පන්සියයක් තරම් ප්‍රමාණයකුයි භාණ්ඩ මිලදී ගන්නේ. මේ මිල අධිකවීම නිසා එක දවසක් භාණ්ඩ ගත්තාම පසුවදට නැවත ඒ භාණ්ඩ ගන්නට ශක්තියක් නැහැ. එම නිසා ලංකාවේ පාරිභෝගික ජනතාවගේ යහපත පිණිස මේ අලෙවි මධ්‍යස්ථාන ඉතාමත් අවශ්‍යයි. එම නිසා ක්‍රමවත් ක්‍රියාමාර්ගයක් යටතේ මේවා නැවතත් ඉදිරියට ගෙන යන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි.

ගරු ඇමතිතුමා යටතේ නැව් සංස්ථාවත්, වරාය කටයුතුත් තිබෙන නිසා ගාල්ලේ වරාය ගැනත් වචනයක් කියන්නට ඕනෑ.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

වරාය මට නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ගාල්ලේ වරායේ තත්ත්වය මොකක්ද ? එතැනට නැව් යනවාද කියා මම දැනගන්නට කැමතියි. එතැනට නැව් කීයක් යවනවාද ?

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

නැව් යවනවා. වරාය අයිති ආරක්ෂක ඇමතිතුමාටයි.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඒකත් මට මහා ලොකු ප්‍රශ්නයක්. නැව් අයිති වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශයටයි. වරාය අයිති ආරක්ෂක අමාත්‍යාංශයටයි. එක්කෝ නැවුත් එතැනට දෙන්න ඕනෑ. එහෙම නැත්නම් වරායත් මෙතැනට දෙන්න ඕනෑ.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

ආරක්ෂක හේතූන් මතයි එහෙම කර තිබෙන්නේ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මට තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. ගාලු වරාය සේවකයන් සම්බන්ධයෙන් දැන් සැහෙන අන්දමේ ප්‍රශ්නයක් තිබෙනවා. රබර් පිටරට පැටවීම සඳහා ගාලු වරායට නැව් යවන ලෙස පසුගිය වාරයේත් මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව සාකච්ඡා කළ අවස්ථාවේදී මම ඉල්ලා සිටියා. දැන් ඒ ගාලු වරායේ වැඩ කරන සේවකයන් උදේට එහි ගොස් අත්සන් කර පැයක් දෙකක් එහි ගතකර ආපසු යනවා. දැන් ඒ සේවකයනුත් ඒ වැඩේට කැමති නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ මේ තත්ත්වය පවතිනවා. රුපියල් කෝටි ගණනක් වියදම් කරලයි මේ ගාලු වරාය ප්‍රතිසංස්කරණය කළේ. නමුත් අද තත්ත්වය මොකක්ද ? ගාලු වරායට නැව් යවන්නේ නැත්නම් ඒ වියදම් කළ මුදලින් ප්‍රයෝජනයක් ලැබෙනවාද ? එම නිසා එතැනට නැව් යවන්නට ඕනෑ. පිටරටින් භාණ්ඩ ගෙනෙන නැව් හෝ එහි යවන්නට කටයුතු කරන්න. සමහරවිට දැනට පහසුකම් නැත්නම්, ඒවා එතැන ගොඩ බා තොග රැස්කර තබන්න. අඩුතරමින් ඒ සඳහාවත් පහසුකම් ඇති කරන්න ඕනෑ. රබර් වාගේ පිටරට යවන වෙළඳ ද්‍රව්‍යයක් ගාලු වරායෙන් යවන්න පුළුවන්. ඒ වාගේම කුරුඳු යවන්නත් පුළුවන්. කුරුඳු විශාල වශයෙන් තිබෙනවා දකුණු පළාතේ. ඒ නිසා ගාලු වරායේ තත්ත්වය දියුණු කරන්න ගරු ඇමතිතුමා කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන්ම ගාලු දිස්ත්‍රික්කයේ එකම ඇමතිතුමා නිසා, එකම කැබිනට් ඇමතිතුමා නිසා අපි බලාපොරොත්තු වෙනවා මෙය කරදෙයි කියා. තමුන්නාන්සේගෙන් තම පවතින්නෙ ඒ ප්‍රදේශයට සැහෙන තරම් වැඩ කොටසක් කළොත් පමණයි. එනිසා විශේෂයෙන්ම ගාලු ප්‍රදේශයට මේ වරාය අංශයෙන් විශාල වැඩ කොටසක් ඉටුකර දෙයි කියා ඒ ප්‍රදේශයේ ජනතාව බලාපොරොත්තු වෙනවා. ඇත්තවශයෙන්ම කැබිනට් ඇමතිතුමෙක් හිටියෙ නැහැ, කලින්.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

ලංකවටම සේවය කරන්නයි ඇමතිවරු ඉන්නෙ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඒක සාමාන්‍ය සිරිතක්. නමුත් බුදුහාමුදුරුවො වුණත් තමන්වහන්සේගේ උපන් භූමියට තමයි ඉස්සරවෙලාම වැඩි සැළකිල්ලක් දක්වූවෙ. ඒ නිසා තමුන්නාන්සේට ගාල්ලට ගිහිල්ලා ඔහොම කියන්න බැහැ.

එම්. එස්. අමරසිරි ම. .තා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

ඔය කථාව අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කියන්නෙ නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

කමක් නැහැ, ගාල්ල වරායට නැව් යවා ඒ වරායේ කටයුතු යම්කිසි දියුණු තත්ත්වයකට ගෙනෙන්න කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඊළඟට මම කුරුඳු ගැන කියන්නට ඕනෑ. දීර්ඝ කාලයක් තිස්සේ කුරුඳුවලට බොහොම අමාරු තත්ත්වයක් තිබුණා. නමුත් දැන් තරමක් සතුටුදයක තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මෙක්ෂිකෝව කුරුඳු ලබාගැනීම නතර කළ නිසා කුරුඳුවලට ලොකු අයහපත් තත්ත්වයක් ඇතිවුණා. විශේෂයෙන්ම ගාලු දිස්ත්‍රික්කයේ කුරුඳු වගා කරන අය සැහෙන තරම් අමාරු තත්ත්වයකට පත්වුණා. දැන් නැවත වතාවක් තරමක් දුරට සතුටුදයක තත්ත්වයකට පත්වී තිබෙනවා. නමුත් නැවත වතාවක් අර පරණ තත්ත්වය ඇති වුණොත් විශේෂයෙන්ම පසුගිය කාලයේ ඇතිවුණා වාගේ තත්ත්වයක් ඇතිවුණොත් කුරුඳු වගාව සම්පූර්ණයෙන්ම විනාශ වී යන්නට ඉඩ තිබෙනවා. ගරු ඇමතිතුමනි, අම්බලන්ගොඩ කුරුඳු වවන්නන්ගේ සංගමයක් තිබෙනවා. ඒ අය ඉල්ලීම් රාශියක් ඉදිරිපත් කර තිබුණා, කුරුඳු වගාව බේරාගන්නට කටයුතු කරන්නය කියා. මෙවැනි වෙළඳ භාණ්ඩ සඳහා ස්ථාවර වෙළඳපොලක් ඇති කරගෙන මේ වගාකරුවන්ට ඒ තත්ත්වය ආරක්ෂා කර දෙන්න කියා මම ඇමතිතුමාගෙන් ඉල්ලන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මම වඩා දීර්ඝ ලෙස කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ ආසනයට බලපාන කරුණු දෙක තුනක් ගැන පමණක් කථා කරන්න කැමතියි. අක්මීමන ආසනයේ කලහේ තිබුණු රෙදි මුද්‍රණ කම්හල මගේවත් දැනුමක් නැතුව දැන් වසා දමා තිබෙනවා. කවුරුවත් දන්නෙ නැහැ මේක කවදා වැසුවාද, එහි වැඩ කළ සේවකයෝ කොහේ ගියාද කියලා. මේක විශාල ගොඩනැගිල්ලක්; දීර්ඝ කාලයක් මේ කම්හල පවත්වාගෙන ආවා. ගොඩනැගිල්ල හැදුවේ පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය යටතේ. නමුත් මේක විවෘත කළේ තමුන්නාන්සේලාගේ කාලයේ. දන්නෙම නැහැ, දැන් ඒක වසා දමා තිබෙනවා. ගොඩනැගිල්ල පමණයි තිබෙන්නෙ. මට මතකයි මම අමාත්‍යාංශයේ දී ඇමතිතුමා හමුවුණ දවසෙදී මට කිව්වා මේක වසන්නේ නැත කියා. නමුත් දැන් වසා දමා තිබෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරන්න කැමතියි, නැවත වතාවක් මේ කර්මාන්ත ශාලාව විවෘත කරන්න කියා. ඒ කරගෙන ආ අංශයෙන්ම කටයුතු කරන්න බැරි නම්, වෙනත් කර්මාන්තයක් සඳහාවත් විවෘත කරන්නය කියා මම ඉල්ලනවා, මොකද, මේක මගේ ආසනයේ තිබෙන විශාල කර්මාන්ත ශාලාවක් නිසා.

ගරු සභාපතිතුමනි, මගේ ආසනයේ කර්මාන්ත ශාලා රාශියක් වසාගෙන යනවා. ගිනිකුරු කම්හල වැසුවා, සිට්‍රස් තේ කම්හල වැසුවා, මම ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වුණාට පසුව මේවා සිද්ධවෙනවාද කියා මට තේරුන්නෙ නැහැ. ගාලු දිස්ත්‍රික්කයේ තිබෙන ලොකුම තේ කම්හල, සිට්‍රස් තේ කම්හල වසාදමා තිබෙනවා. ඊටපසුව ගිනිකුරු කම්හල වැසුවා. දැන් තමුන්නාන්සේලාගේ අමාත්‍යාංශයෙන් මේ රෙදි මුද්‍රණ කම්හලත් වසා දමා තිබෙනවා. මම පුළුවන් තරම් උත්සාහ කරනවා මේ වැසූ ඒව විවෘත කරන්න. නමුත් අභාග්‍යයකට වාගේ පළාතේ මන්ත්‍රීවරයා දන්නෙත් නැහැ මේවා වසා දමනවා. එනිසා මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රිචඩ් පතිරණ මහතා]

ඉල්ලීමක් කරන්න කැමතියි ගරු ඇමතිතුමාගෙනුත්, නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් කරුණාකර මේ ගැන පරීක්ෂාකර බලා මේ කම්හල ඉතා ඉක්මණින් විවෘත කිරීමට කටයුතු කරන්න කියා. ඒ මගේ කාරුණික ඉල්ලීමක්. මන්ද ? ඒ කාර්මාන්ත ශාලාව වසා දැම්ම නිසා ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල අසාධාරණයක් සිදු වී තිබෙනවා.

ඊළඟට මහපොළ ලොතරැයිය ගැන. මහපොළ ලොතරැයිය අක්මීමන ආසනයේ කලහේ මහා විද්‍යාලයේ පැවැත්තුවා. පසු ගිය අය වැය විවාදයේදී මා විසින් මතු කළ ප්‍රශ්නයකට පිළිතුරු දුන් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා එහි පැවති මහපොළ ලොතරැයියෙන් රු. 66,000ක් ඉතුරු වී තිබෙනවාය කියා. ඒ මුදල් ප්‍රමාණය ගැන මම සෑහීමකට පත් වෙන්නෙ නැහැ. ඒ සම්බන්ධ නොයෙක් කරුණු තිබෙනවා. දැන් ඒවා අවුස්සන්න කාලය නොවෙයි හුඟක් කල් පහුවෙච්ච නිසා. කෙසේ වෙතත් ඇතුළු වීමේ ටිකට්පත් විකිණීමේදි සෑහෙන තරම් දූෂණ ඇති වන බව දැනගන්න ලැබී තිබෙනවා. එම නිසා මහපොළ භූමියට ඇතුළුවීම සඳහා විකුණන ටිකට් පත් ගැන ඉතාමත්ම ප්‍රවේසම් වෙන්න ඕනෑ. මේ කාර්‍ය්‍ය සඳහා තමුන්නාන්සේ කමිටුවක් පත් කර ඒ කමිටුවට බලය දෙනවා ඒ කාර්‍ය්‍ය කරන්නය කියා. ඒ අය සමහර විට වලංගු නොවන රිසිට් පතක්—පිටිපස්සෙ මුද්‍රාවක් ගැසූ රිසිට් පතක් අත්සනක් නැතිව—තිකුත් කර කඩ බදු දී තිබෙනවා පමණක් නොවෙයි ඇතුළුවීමේ ටිකට් පත් පවා විශාල සංඛ්‍යාවක් විකුණා තිබෙනවා. මේක දැන් අතීත කතාවක්. ඒ දේ සිද්ධ වුණ බව මට හොඳටම විශ්වාසයි. මෙන්න මේ වාගේ කටයුතු ඉදිරියට සිද්ධ නොවෙන්න වග බලාගන්න ඕනෑ.

මේ මහපොළ කියන එකෙන් විශාල ආදායමක් ලැබෙනවා. ඒ ඔය භූමියට ඇතුළු වෙන්න විකුණන ටිකට්වලින්. මේක වංචා කරන්න ගියොත් අද මේ මහපොළ ලොතරැයිය කෙරෙහිත් මහපොළ ශිෂ්‍යත්ව කෙරෙහිත් මහජනයා තුළ තිබෙන විශ්වාසය නැති වී යාමට ඉඩ තිබෙනවා. අපි මේ මහපොළ ක්‍රමය අගය කරනවා. අපි විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් වුණත් මේ මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය ඉතාමත්ම අගය කරනවා. මන්ද මේ රටේ සාමාන්‍ය දුප්පත් පවුල්වල දරුවන්ට අත් වන යහපත නිසා. මම දුප්පත් පවුලක ඉපදුණ කෙනෙක් හැටියට—මම ගුරුවරයෙක් වශයෙන් විශ්ව විද්‍යාලයට උගන්වන්නට ගියා, මට පඩි ලැබුණා—මම දක්කා විශ්ව විද්‍යාලවල ඉගෙනුම ලබන ළමයින් විඳින දුක. ඒ ගැන අපට හොඳ පැහැදිලි අවබෝධයක් තිබෙනවා. ඒ නිසා මේක හොඳ කාර්‍ය්‍යයක් හැටියට අපි ආරක්ෂා කරගන්න ඕනෑ. කපටින්ට වංචාකාරයන්ට තමන්ගේ ප්‍රයෝජනයට තම අභිමතාර්ථයන් ඉෂ්ට කර ගැනීමට ඉඩ දුන්නොත් එතකොට මේකෙ හොඳ නම නරක් වෙනවා.

උදාහරණයක් වශයෙන් අපි බැලුවොත් වෙනත් තැන්වල ලැබුණු ආදායම කොපමණද කියා හබරාදුවෙ ආසනයෙ තිබ්බ වෙලාවෙ රු. 3,00,000ක පමණ ආදායමක් ලැබී තිබුණා. නමුත් බලන්න අක්මීමන ආසනයේ මහපොළෙන් ලැබුණේ රු. 66,000ක් පමණයි. මේකෙන් පේනවා වෙනස. [බාධා කිරීම්] නැහැ, මම ඒ කාලෙ සංවිධායකයෙක් නොවෙයි. මා ඒ කාලේ විදුහල්පතිවරයෙක්. මම පාර්ලිමේන්තුවට ආවෙ ඊට පස්සෙ. ඔය ඇමතිතුමාගේ ආසනයෙත් අවුරුදු පහක් හිටිය මම. එතුමා දන්නවා මා ගැන.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

එතුමා බොහොම හොඳට වැඩ කළා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

මම එතුමාට කියන්නෙ මේ හොඳ දේවල් පිළිබඳව තිබෙන හොඳ නම ආරක්ෂා වන පරිදි පවත්වාගෙන යන්න ඕනෑ බවයි. අසුවල් නිලධාරියා මෙහෙම කළාය කියා මම කියන්නෙ නැහැ. ඒක කියන්න දැන් වෙලාව නොවෙයි. නමුත් මම ගරු වෙළඳ ඇමතිතුමාගෙන් ඉල්ලන්නේ මේ රු. 66,000 හේ මුදල කලහේ මහා විද්‍යාලයේ පුස්තකාලයක් සෑදීම සඳහා දෙන්නය කියායි. ඒ මොකද ? ඒ ළමයි මේ සම්බන්ධයෙන් හුඟක් මහන්සි වුණා. ඒ නිසා ඒ ළමයින්ගේ අධ්‍යාපනයේ දියුණුව සඳහා ඒ මුදල ලබා දෙනවා ඇතැයි මම විශ්වාස කරනවා.

ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම ඉතාමත් සන්තෝෂ වෙනවා එතුමාට මේ තත්ත්වය ලැබීම ගැන. එතුමා දීර්ඝ කාලයක් තිස්සේ බොහෝම මහන්සි වෙමින් ආසනයේ වැඩ කටයුතු කරනවා. එතුමා සේවය කරන හැටි අපි දන්නවා. එම නිසා එතුමාගෙ කටයුතුත් නියෝජ්‍ය ඇමතිතුමාගේ කටයුතුත් සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරන අතර ජනතාවගේ මූලික අවශ්‍යතාවක් වූ බඩු මිල අඩු කර රටේ සාමාන්‍ය ජනතාවට මීට වඩා යහපත් තත්ත්වයකින් ජීවත් වීමට අවකාශය සැලසීමට භාග්‍යය ලැබේවායිද ප්‍රාර්ථනා කරනවා.

පූ. භා. 9.24

දයා සේපාලි සේනාධීර මහත්මිය (කරන්දෙනිය)
(திருமதி தயா சேபாலி சேனாதீர — கரந்தெனிய)
(Mrs. Daya Sepali Senadheera–Karandeniya)

ගරු සභාපතිතුමනි, මට අවස්ථාවක් ලබා දීම ගැන තමුන්නාන්සේට පළමුකොටම ස්තුතිවන්ත වෙනවා. වෙළඳ අමාත්‍යාංශය යටතේ මේ රජය භාර දූර කාර්‍ය්‍යයන් රාශියක් ඉටු කරන බව අපි කවුරුත් හොඳට දන්නවා. මෙම අමාත්‍යාංශය යටතේ සංස්ථා රාශියක් හා දෙපාර්තමේන්තු 15 ක් පමණ තිබෙනවා. අලුතෙන් ආරම්භ කළ මහපොළ ඒ වගේම අපනයන සංවර්ධිත ගම්මාන වගේ වැඩපිළිවෙළවල් රාශියක්ම ක්‍රියාත්මක කෙරෙන්නෙ වෙළඳ අමාත්‍යාංශයෙනුයි. ඇත්තවශයෙන්ම මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය සම්බන්ධයෙන් අපි මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ධන සම්පත නැති, බුද්ධි සම්පත ඇති අප දරුවන්ට උදව් කිරීමේ බලාපොරොත්තුවක් ඇතිවයි ගරු ඇමතිතුමා එය ක්‍රියාත්මක කළේ. ඒ වගේම වෙළඳ අමාත්‍යාංශය යටතේ මේ තරම් භාරදූර කාර්යයන් රැසක් කරගෙන එන්නට පුළුවන්කම ලැබුණේ ඉතාම දක්ෂ බුද්ධිමත් ඇමතිවරුන් දෙපොළක් සිටීම නිසා බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, නව වෙළඳ ඇමතිතුමා ගැන මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ඇත්තවශයෙන්ම අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරන මහතා) කිව්වා වාගේ ගාල්ලෙ දිස්ත්‍රික් සංවර්ධන සභාව නියෝජනය කරන එකම කැබිනට් ඇමතිවරයා ලෙස එතුමා හඳුන්වන්න පුළුවන්. ඒ වගේම එතුමා ප්‍රථමයෙන්ම කළුතර—තොටමුන විවිධ සේවා සමූපකාර සමිතියේ සාමාන්‍යාධිකාරිවරයා හැටියට පත්වී විශාල සේවයක් කළා. ඊළඟට පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, පසුව වෙළඳ නියෝජ්‍ය ඇමති තනතුරේ කටයුතු කාර්යක්ෂම ආකාරයෙන් ඉටු කරමින් විශාල සේවයක් කළ එතුමා අද වෙළඳ ඇමති තනතුරට පත්ව සිටිනවා. විශේෂයෙන් ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මා ඒ ගැන සන්තෝෂ වෙනවා.

ඊළඟට මා සඳහන් කරන්න කැමතියි, පාරිභෝගික කමිටු පිහිටුවීමේ ගෞරවය එතුමාට හිමි විය යුතු බව. ඒ පාරිභෝගික කමිටු පිහිටුවීමට කටයුතු කලේ එතුමාගේ අධීක්ෂණය යටතේයි. ඒ වගේම මිල පාලන දෙපාර්තමේන්තුව මීට වඩා ක්‍රියාත්මක වෙන්න ඕනෑ බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ඇත්තවශයෙන්ම ඒ සඳහා වෙනම නිලධාරීන් තෝරාපත් කරගෙන ඒ අයට දිරිගැන්වීමේ දීමනා ක්‍රමයක් ඇති කලොත් මීට වඩා සාර්ථකව එය කරන්නට පුළුවන් වෙන බව මගේ හැඟීමයි.

ඊළඟට මම අලෙවි සැල් ගැන මතක් කරන්න ඕනෑ. කරන්දෙනිය මැතිවරණ කොට්ඨාශයේ මහජ්දණ්ඩ නගරයේ අලෙවි සැලක් තිබෙනවා. ඒ අලෙවි සැලේ සේවකයන් සිටිනවා. නමුත් භාණ්ඩ නැහැ. භාණ්ඩ තිබෙනවා නම් එම නගරයේ තිබෙන වෙළඳ සැල ඉතාමත් දියුණු තත්ත්වයකට පත්වෙන්න පුළුවන්. ඒ නිසා ඒ වෙළඳ සැල මීට වඩා හොඳින් ක්‍රියාත්මක කරන්නට කටයුතු කර දෙන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපනයන සංවර්ධන ගම්මාන දියුණු තත්ත්වයකට පත් කිරීම ගැන අපි මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එයින් මේ රටට විශාල ප්‍රයෝජනයක් සැලසී තිබෙනවා. මුළු රටටම එය ආශිර්වාදයක් වී තිබෙනවා. මුලින්ම අපනයන ගම්මානය ඇති කලේ 1981 දී දඹදෙනිය ආසනයේයි. බොහෝ කාලයක් තිස්සේ නැති නාස්ති වී ගිය එහෙත් පිටරට යැවීමට පිළිවෙලක් නොතිබුණු එළවළු මිරිස් ආදී දේවල් පිටරට යැවීමට අවස්ථාව ලැබුණේ මේ ක්‍රමය නිසයි. විශේෂයෙන් සුළු අපනයන භෝගයක් වශයෙන් පිටරට යවන බුලත්වලින් වෙළඳ අමාත්‍යාංශයට විශාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විදේශ විනිමයක් සපයා ගැනීමට මාර්ගය පැදුනේ මේ නිසයි. ඒ වගේම ගරු ඇමතිතුමා පාරම්පරික නොවන අපනයන භාණ්ඩ පිටරට යවා විදේශ විනිමය ලබා ගැනීමටත් කටයුතු කර තිබෙනවා. ඒ භාණ්ඩවලින් ලැබෙන ලාභය කෙලින්ම එන්නේ නිෂ්පාදකයාටයි. අතරමැදියා පිටුදකින ව්‍යාපාරයක් එයින් ඇතිවී තිබෙනවා. ඒ මගින් නිෂ්පාදකයාට සාධාරණ මිලක් ලබා ගැනීමට හැකිවී තිබෙන බව මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, අපනයන සංවර්ධන ගම්මාන ඇති කිරීමෙන් බලාපොරොත්තු වන්නේ නිකම්ම විදේශ විනිමය වැඩි කිරීම පමණක් නොවෙයි. අපි බලාපොරොත්තු වන්නේ භාණ්ඩ අපනයන කිරීමේදී ලැබෙන මුදලින් සැහෙන කොටසක්—දැනට ලැබෙන කොටසට වැඩි කොටසක්—අපේ ගැමි ජනතාවට ලබා දීමය. මීට කලින් සිදු වුණේ ගොවි ජනතාව මහන්සි වෙනවා. අපනයන කරුවන් විසින් ඒ අයගේ නිෂ්පාදන පිටරට යවා රටට විදේශ විනිමය ලබා ගන්නවා. නමුත් ගොවියන්ගේ තත්ත්වයේ කිසිම වෙනසක් සිදු වුණේ නැහැ.

ඊළඟට මම කරත්දෙකිය මැතිවරණ කොට්ඨාශය ගැන කථා කරන්න බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම කරත්දෙකිය මැතිවරණ කොට්ඨාශයේ විශාල පිරිසක් ජීවනෝපාය වශයෙන් කරන්නේ කුරුඳු කර්මාන්තයයි. එය ඒ අය සුළු අපනයන බෝගයක් වශයෙන් කරගෙන යන්නේ. පසුගිය කාලයට වඩා හොඳ මිලක් අද කුරුඳු වගා කරන ජනතාවට ලැබී තිබෙන බව මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මේ සඳහා ස්ථිර මිලක් ලබා දුන්නොත් ඉදිරියේදී මේ කර්මාන්තය මීටත් වඩා සාර්ථකව කංවාලීමට පුළුවන්ය කියා මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා. ඉදිරියේදී කරත්දෙකිය මැතිවරණ කොට්ඨාශයේ කුරුඳු සංවර්ධන අපනයන ගම්මානයක් ආරම්භ කරන හැටියටත් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මා දීර්ඝ වශයෙන් මේ අවස්ථාවේදී කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එහෙත් මේ අවස්ථාවේදී මතක් කළ යුතු දෙයක් තිබෙනවා. එනම් පසුගිය කලබල කාලසීමාව තුළදී ඉතාමත් ක්‍රමවත් ලෙස ආහාර බෙදදීම සිදු කළා. ඒ නිසා ඒ පිළිබඳව ගරු ඇමතිතුමාටත්, සතොස නිලධාරී මණ්ඩලයටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. අවසාන වශයෙන් නව ගරු වෙළඳ ඇමතිතුමාටත් එතුමාට සහයෝගය දෙන ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, වෙළඳ අමාත්‍යාංශයේ සියලුම නිලධාරී මහත්වරුන්ටත්, මගේ ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම ඉතා කැපවීමකින් වැඩ කරන අවංකව සේවය කරන සතොස සභාපතිතුමාටත්, ක්‍රියාකාරී අධ්‍යක්ෂ අල්විස් වීරක්කොඩි මැතිතුමාටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරන අතර ඔබතුමන්ලා ගෙන යන මේ ව්‍යාපාරය ධෛර්යමත්ව කරගෙන යාමට දෙවියන්ගේ ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

පූ.භා. 9.31

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Mr. Chairman, I am very happy that we have two new faces in the Ministry of Trade and Shipping. I wish the new Minister as well as his Deputy all the best for a successful period and good tenure of service to this country. Now, Sir, we all know that new brooms sweep well. Therefore I think at this time we have to bestow on them laurels rather than give them brickbats. I suppose the brickbats will come after one year. Yet, I wish that they would not get brickbats but laurels all along the line.

At the same time, I notice that the previous Minister of Trade, who is the Minister of National Security, made a statement in this House saying that the prices of goods fluctuate due to the weather. That is one of the reasons. If we are gonig to think in terms of weather and weather alone, the prices of goods will never fall.

**මන්ත්‍රීවරයෙක්**
**(அங்கத்தவர் ஒருவர்)**
(A Member)

Weather and seasonal.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

We have all seen the famous letter written by Mr. Esmond Wickremasinghe, a working committee member of the UNP, and it has been distributed to the working committee members. In that letter we have seen his name. Specially mentioned is the name of Mr. Amarasiri with whom he has had verious discussions pertaining to bringing down the cost of living. These are well known things. These are not mere questions of "How do you know ?" and all that. It has come to the forums and copies are available to various people. It is on a very important subject, I believe, that Mr. Wickremasinghe has had discussions with Mr. Amarasiri.

Now, Sir, before I come to the cost of living, I do not know what caused him to make that first pronouncement of his that within three months or six months or something he would bring down the cost of living. I do not know whether that is correct.

**එම්. එස්. අමරසිරි මහතා**
**(திரு. எம். எஸ். அமரசிறி)**
(Mr. M. S. Amarasiri)

Bring down the speed of the cost of living.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

That is a reasonable way of putting it, perhaps because he has an intention of bringing it down. But according to the discussions he has had with Mr. Esmond Wickremasinghe, it does not prove that weather has played any part in that. There the entire blame has been laid by Mr. Wickremasinghe on one factor, and that is devaluation. Even in the discussion that he had with Mr. Wickremasinghe this aspect of devalution is something that they should have looked into. I have been all alone saying that as long as you are thinking of devaluation, as long as you are thinking of factors pertaining to tariff and so on, the price of goods cannot come down. The only way to bring down the price of goods is to go for a revaluation. Not only a revaluation, but you should also have a two-tiered tariff system, which the Hon. Minister of Fiance is now operating. It is not officially announced, it is not officialy known, but we know it very well that like the old FEEC system he has worked it through the tariff system. That is one thing the Hon. Minister would have to look into because that is a very important aspect – whether he can establish a dual exchange system where the rate has to be established, and secondly whether a revaluation is possible.

Now, Sir, what happened to that Rs. 100 that we got ? We got it last month. This month the cost of living has gone up. By next month it will go up some more. By

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ලක්ෂ්මන් ජයකොඩි මහතා ]

the next month perhaps the rate may slow down, but yet it will go up. Within a period of three months the Rs. 100 will be absorbed. For the balance nine months how is the Hon. Minister going to bring down the cost of living because there will not be a tangible rise in the salary structure ? Let us now at least concentrate on one thing. We know that the Hon. Minister of Finance is not going to give us another pay rise. He has frozen the salaries, and we know that no one is going to get additional pay after 1st January 1985 till 1st January 1986. So it is the duty of the Hon. Minister to consider certain aspects of the matter.

Obviously, one way would be to step up production, but production in what areas ? This is important. The other day I referred to the famous letter of Esmond Wickremasinghe. It is a very famous letter because I think in the compilation of this letter he has had the good offices of the Hon. Minister because he says, "I have had various discussions with Mr. Amarasiri". I think he knows very well that the Hon. Minister is one person who knows about the internal distribution of goods. I suppose he knows more about the internal distribution of goods. I suppose he knows more about the internal distribution rather than going in for international trade.

What has happened is that even today in this Ministry international trade is being looked into – and quite rightly, I do not say no because it is Cabinet responsibility and a Cabinet form of Government – by a person who knows the subject of international trade. So it is being looked after by the Hon. Minister of National Security. When one looks at Esmond Wickremasinghe's letter, he says he has had various discussions and also discussions with some members of the COPE, though not with us. He has had discussions with members of the COPE and has laid down guidelines on how to bring down the cost of living.

One of his proposals is to revalue the rupee, and this is what I have been saying right along the line. The second proposal is to have a dual exchange rate. That has been the policy of the SLFP Government and that is why the FEEC system was there. Here is a gentleman, a working committee member of the UNP, a very powerful member, who has given advice to the Government on how to bring down the cost of living. He says on page 9, item 11 –

"The largest savings of all will come if there is a phased ban on the import of all foodstuffs that Sri Lanka grows on the lines of Your Excellency's plan of 1966 which was only partially accepted by the then UNP Government.."

I do not know how you can accept something partially and not wholly !

". . . . and as a result of which in 1967 the UNP Government imposed a phased ban on the import of potatoes. I understand from the Director-General and senior technical officers of the Mahaweli Authority that the following crops can be grown to supply all the requirements of Sri Lanka and even for export."

This is just what the hon. Deputy Minister was saying : "Why not do it ? Why not expand ?" What are the items they want to expand on ? Chillies, potatoes, soya beans, black gram, green gram, cotton, cowpeas, Bombay onions, sugar cane, gingelly, Lanka parippu, cashew, fodder, pulses, maize, sorghum and a whole range of vegetables, fruits, flowers, etc. This is the scheme laid down for the Mahaweli area in order to bring down the cost of living, but what steps have you taken ? As far as we know, the price of chillies has gone up. What are your plans for chillie cultivation in the Mahaweli area ? You are saying you must bring the cost of living down. – (*Interruption*). Please let us not argue on this matter.

**මහේන්ද්‍ර විජේරත්න මහතා**
**(திரு. மகேந்திர விஜேரத்ன)**
(Mr. Mahendra Wijeratne)

I am also a cultivator.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

We want to see that potato price come down, but there is another school of thought that from the potato farmer's point of view you must strike a balance. How are you going to strike a balance ? In that case you have to forget the supply and demand system. If you forget the supply and demand system you can strike a balance, but then it becomes a controlled economy. It will no more be liberalized. All this goes hand in hand. – (*Interruption*). Please do not disturb me. You can reply later. It goes to prove that the Government must take a genuine stand on this.

Now, who is going to grow these vegetables and fruits ? I only request this government not to give it over to foreign organizations or multi-nationals. We have seen what has happened. We have seen the price of milk going up when the cost of living is so important. It was Rs. 4.50, and has now shot up to Rs. 15. We have seen yarn prices going up. We have seen cloth prices going up from Rs. 7 to Rs. 21 or Rs. 28. We have seen in every sphere, whenever the foreign national take over, that the price of all those items have gone up. In those areas where foreign nationals have not taken over the prices have been stable up to a point. Those days there was a thing called the ABM formula, i.e. අල බතල, මඤ්ඤොක්කා formula. if අල was Rs. 3, බතල must be Rs. 2 and මඤ්ඤොක්කා must be Re. 1 – 3 :2 :1. Today if මඤ්ඤොක්කා is Re. 1.50, බතල has gone up to Rs. 5, and අල has shot up to Rs. 18. Then that formula is not operating any more.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මහේන්ද්‍ර විජේරත්න මහතා**
**(திரு. மகேந்திர விஜேரத்ன)**
(Mr. Mahendra Wijeratne)

Whose formula is that ? Your party formula ?

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

No, no, it was a formula of 1966. This was a formula started in 1966 when the importation of potatoes was banned. Now do not laugh at this.

If you want to bring down the price of food, you have to consider to whom you are going to give the production of these commodities. That is important, because of the factor that everybody is thinking in terms of various export villages and various formats of sending these goods abroad as exports. I have a feeling that it has a bearing on our local food. Take fish for instance. The price of fish has gone up. Why ? Recently because we could not get the North and the East to work on it. But previous to that problem when the tourist industry declined, fish prices too came down because of the demand went down. It is high time the Hon. Minister considered all these. Speak to Mr. Edmond Wickremesinghe, take his advise, take it to the Cabinet and try to bring down the cost of living which has assumed very serious proportions.

Secondly, I wish to bring up the matter of setting up a bank for the local mudalalis. It is not that I have a love for the mudalalis, but a proposal has been sent up by the Sinhala people of this country to have a bank of their own. Up to this date that bank has not been set up, and because of that the ordinary people and the ordinary traders have not been able to have such a facility for the importation of cheaper goods. The cost of money is high – about 52 per cent today. I think the Hon. Minister must take the initiative in creating a bank to service them.

There is another matter which I would like to raise with him, but before I go to that I would like to answer the charge that has been made by the Member for Agalawatte, who is not here. On the 4th of September he made a statement to say that the food cannery that has been set up at Attanagalla was originally meant for Agalawatte but once Dr. Colvin R. de Silva went away from there it was taken over to Attanagalla. I must put the record straight. Dr. Colvin R. de Silva left the Government somewhere in 1975. The construction work of the Attanagalla Cannery was started on the 29th of March 1973. Dr. Colvin R. de Silva left in 1975. The Cannery was opened in 1976. One cannot argue and say that we closed down the Cannery. That is not correct. It may be that he did not start one in Agalawatte. Certainly start a Cannery in Agalawatte if you can find sufficient raw material. But my fear is that – even the hon. Deputy Minister knows this – there is no production to serve these places. But Attanagalla is fairly lucky not because of passion fruit but because of pineapple. We have fair quantities of pineapple in that area and this Cannery can be run at a profit. Now that this factory has been handed over to the private sector it is being run reasonably satisfactorily. But I have a feeling that if the machinery and the work done there is not looked after well, we may have to close down the Cannery in spite of the fact that a little filip has been given by handing it over to the private sector. But if there is to be progress the raw materials should be there.

I think the hon. Member for Kalawana raised the question with regard to the privatization of insurance. I hope the Hon. Minister will resist privatization because we have seen how useful the Insurance Corporation has been during the time of the troubles. We have seen how the co-operative sector has been useful during the time of the troubles. We have seen how the National Insurance has been useful during the time of the troubles. We have seen how the C.W.E. worked during the time of the troubles. We have seen how the Marketing Department worked during the time of the troubles. I think all these institutions were started by various governments to get the necessary assistance and help during crisis periods. I hope the Hon. Minister will not be pressurized on this question of privatization of insurance. Keep the Insurance Corporation going. Help the Insurance Corporation to strengthen itelf.

Yesterday or the day before, we had a discussion at the Consultative Committee of the Ministry of Traue and Shipping at which the Hon. Minister and the Deputy Minister were present and the question was raised as to why the prices of rubber were low and why the smallholder was not getting a good price. Of course, we had different views on this question. One reason adduced was that there was not enough production. But I feel there is a way out. First and foremost, we have not only to educate the persons concerned but action must be taken to see that the sheet rubber that is produced is of good quality. That is the first thing that must be done. The second thing is that you must see that there are enough funds available for the purcahse of rubber from the smallholder. It is true he does not get a fair price and these check stalls put up by the Department of Commodity Purchase are not strong enough. In all these depots you must start a sorting point. Please purchase sorted rubber or pay the person an advance once the rubber is brought to the depot. Let there be a sorter to sort the rubber, and once the rubber is sorted out, pay them off. If there is R.S.S. 1 rubber, pay them R.S.S.1. Pay them off according to the grade. In other words, you do a sorting at that very same

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ලක්ෂ්මන් ජයකොඩි මහතා ]

point. (*Interruption*) – They do, sometimes, they do by bulk. It is not sorted rubber. Please, Deputy Minister, you must get yourself educated a little more because it is a large subject.

Secondly, Sir, we find that every time in all these places if you do not do it, the produce that is taken over is always down-graded. The reason why this is being down-graded is the person who purchases there does not want to give the best to them, but he wants to give the best to his organization. Therefore it is down-graded.

Thirdly, Sir, whatever they say, there is still the export duty operating in a very peculiar way. Though we have reduced the export duty, it has not yet gone down to the purchasing point. So the only thing to do is to start your export unit as a check vis-a-vis the other shippers. Start your shipping unit. The other day I mentioned that you must strengthen the Consolexpo's Division. I even said that they should go down to the village level and do the purchases. That is one way out. Another way out is, if you are thinking in terms of strengthening the Commodity Purchase Department, then consider the export of rubber yourself, whatever quantities that you get. You might not get anything more than 2,000 to 3,000 tons, most probably, or a little more than that and start the export unit. You must also get your finances, not at this very high rate of interest. Today cost of finance, as I said, is about 52 cents per rupee. So it is a very high cost. Therefore that has to be worked out. Also please see that the rubber is not sold but rubber is marketed. You can sell any produce that you have, but you must think in terms of marketing of rubber. We have got used to a particular system of selling rubber to the Rubber Commissioner, but not marketing rubber at the village level. Therefore I think, we should start the marketing of rubber at the village level. In order to do that what should you do ?

First and foremost, Sir, for all these places where you get the Commodity Purchase Department buying rubber, please get the Central Bank to finance you on the concessionary terms of finance. That is one thing that you should do. The second thing that you should do is reduce the freight rates. There are ways and means of reducing the freight rate. I am not going to tell you to reduce the freight rate from Colombo to London ; no, that is not what I mean. The rate where freight is concerned does not only mean the distance, but even where packing is concerned. Pack the rubber in such a manner as to bring down freight rates. Therefore, I would tell the Hon. Minister, consider packing like in the system of SMR packing, not in the same old way in which these rubber bales are packed, but pack according to the SMR system.

Thirdly, Sir, you have to organize all producers, big and small, in the village into groups or organizations. (*Interruption*). I am very happy, Sir, that you are doing it, but let it be done in another manner. Not only among themselves, but do it in the co-operative way. Now, Sir, this is where I want the Hon. Minister to study this aspect of it. At the moment the Hon. Minister is buying rubber straight from the producer into the depot. He knows that there are certain shortcomings at the top level, but why would you not think of a co-operative way of purchasing and working together ? That is one way. The other way is the organizations of the producers – smallholders. (*Interruption*). I know you have now taken certain steps to do that. You have got various RRI and various people to come and speak to them and all that to educate them in that manner. But I find that the intensity and the velocity in doing this are not good enough. Thirdly, Sir, I think even at the village level they should know what they call the international world market. All these Mudalalis or whoever buy rubber hide the correct prices. It is only a person who listens to the radio who will be able to find out that the price was so much on the previous day. (*Interruption*) Yes, the newspapers carry it. Even though the newspapers carry it, they have various other means of reducing the price. They will say, "Look, what about the transport charges ? What about this and what about that ?" Therefore, Sir, I think they must know the correct international price.

I suppose now the Hon. Minister is thinking in terms of group purchasing also. I hope he does that. I am making these suggestions to him because at a Consultative Committee meeting about two days ago we were going in circles to find out how we should do this. So let us work out these systems that we have submitted.

There is another department that comes under the Hon. Minister, that is the Department of Internal Trade. This is a very useful sector because I think it is from that that even the provisions of the Consumer Protection Ordinance are being carried out. I found in the Daily News of Wednesday 5th December, 1984, the price tags have been given.

"Pre X' Mas Bargains. Visit RAJABDEEN & SONS"

Under the consumer protection law whenever you advertise, the price of each item must be noted in the newspapers. If you do not do that you are subject to a penalty.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)

What is the date of this newspaper ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Wednesday-5th December 1984.

Mr. Rajabdeen's organization has done the correct thing.

"*Hardware*
Floor Hinges Rs. 3,200/- and so on.
Yale Mortice Locks Rs. 350.
Pantry Decorative Trims for Hedges/ and so on and so forth. He has done it correctly. I must congratulate him for having all–

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! The Hon. Speaker will take the Chair now.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වුයෙන් කථානායකතුමා [ඊ. ඇල්. සේනානායක මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, சபாநாயகர் அவர்கள் [திரு. ஈ. எல். சேனநாயக்க] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. SPEAKER [MR. E. L. SENANAYAKE] *took the Chair.*

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

Mr. Chairman, I have been quoting a newspaper where I said that a company has quite correctly and genuinely put down the prices of all the commodities that they are going to sell. In the very same paper I found an advertisement by Associated Electrical Corporation Limited.

"YAMAHA Self-Priming Kerosene Water Pumps".

Now Sir there, he says,

"Prices : Rs. 7,500 upwards." For Better Yields,. . . . .

Then of course he has got the water pump also being fixed with the engine. When you put down as Rs. 7,500 upwards what does it mean ? When you go there he may quote even Rs. 20,000 or Rs. 30,000. I would like the Hon. Minister to buy this for me for Rs. 7,500, this Yamaha Self-Priming Kersene water pump, because I am also a cultivator and I also would like to have that water pump. I hope the Hon. Minister will look into this aspect. When some say it is Rs. 7,500 upwards it can even be one lakh of rupees. While Rajabdeen & Sons do it in the correct way, here we find the Associated Electrical Corporation Limited doing it in the wrong way. These people are liable under the Consumer Protection Act–I think this must be brought to the notice of the authorities and see that these people do not violate the Act. I have noticed that in various other places. Therefore, I would like the Hon. Minister to look into that aspect also.

The other day, I think, the Hon. Minister mentioned to us about the exports of minor food crops. The only way out that I could submit is–especially after the hon. Fair Member for Karandeniya mentioned about cinnamon, cloves and various other commodities–by having an export floor price and strengthening the auction system. In other words, you must have an export floor price and strengthen the auction system so that by the time you go to the auctions, you will find the export floor price operative and you just cannot buy it at a lower price. Or, if that is not possible, let us have an export floor price with a technical committee to monitor the international market. This is where you can consider a method as to how you can get a good price for your minor export crops.

I would like to stress again : have an export floor price and strengthen the auction system–with an export floor price, you strengthen the auction system–or, knock off the export floor price and have a technical committee to monitor the international market ; have one of these two methods. If you do that, I suppose, you might be able to get a fair price for your commodities that are for sale.

Secondly, I have noticed that the market information service is very poor. Whatever is said and done, it is extremely poor. Every person who purchases any commodity must send a daily return to the organization that controls this, giving the FOB price, the CIF price for the day and the Forward price for the ensuing period. That must be stressed very carefully with the exporter–that every exporter shall give the FOB price, the CIF price and the Forward price for the day, and it must be for the following commidities : pepper, coffee, cardamoms, cloves, cocoa, cinnamon, cashew, citronella, nutmeg. papaw, mango, passion fruit.

The other day we found it very difficult to know whether there was enough passion fruit available for the international market. A person had come to this country and asked for 50,000 gallons of passion fruit juice. They were not geared to give that amount. When they come for commidities of this nature, they come for big amounts. Therefore, I think the Government must be geared to do that, if at all, they think of exporting minor crops which comprise a very valuable sector where foreign exchange is concerned today. The Government must concentrate more on them.

Lastly, I am coming to a matter pertaining to the Companies Law. When the Companies Law came before Parliament–I think it is the biggest Act that I have ever seen ; there are some 500 odd clauses and it is an unwieldy thing–all the Government Members voted for it, but I abstained from voting. you might recollect that I abstained from voting ; the Sri Lanka Freedom Party did abstain from voting. Why did we abstain ? Because we knew that it cannot be operated. That was the reason that we gave–that you cannot operate this



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ලක්ෂ්මන් ජයකොඩි මහතා ]

Companies Act as it is, unless you are prepared to implement the clauses in that Act. Two or thre years have elapsed up to now, but the operation or the working of this Act has not taken effect.

I will give you one example about the implementation of Part V of the Act regarding "Insider Dealing." We find no action has been taken against certain activities that have taken place where the shareholders are concerned. In the stock-exchange we know that there is a big battle going on at the moment between two parties who want to take control of the stock exchange. We know that. At the same time we find that these two groups have gone into certain compaines and obtained control of those compaines including banks and finance compaines. In other words, there are cartles being formed. There are big financiers who have taken control of various finance companies, banks and other companies that are being quoted in the stock exchange. This Act was prepared to counter it, but it is now happening.

Sometimes, private dealings are going on in some of the unquoted companies and companies outside. That is permitted. After all, a private company can have private dealings ; a partnership can have a private dealing. But in a public company you cannot have that. I feel that there should be some way to stop this type of cartel formation in these companies. Otherwise, in the end, as in Pakistan, you will find that there are a few families controlling various companies. There will be interlocking directorates in various companies. Therefore, I would suggest that no family or group should have anything more than 20 per cent of the shares in a public company. No person, no family, no group, cartel should have more than 20 per cent of the shares in a public company. It is happening now, you can do it and a battle is going on between two groups each of which feels that it should have supremacy. Therefore, I would like the Hon. Minister to look into the working of the Companies Act.

I am not very happy about the working of the Companies Act. I know that it is unworkable. It is unwieldy and certain changes are necessary, but this is not the way to do it and I hope he will go deep into this aspect of the Companies Act so that there will not be any formation of massive organizations within the public quoted companies.

පූ. භා. 10.10

**යූ. බී. විජේකෝන් මහතා (යාපනයේ දිසා ඇමතිතුමා)**
**(திரு. யூ. பீ. 'விஜேகோன் — யாழ்ப்பாண மாவட்ட அமைச்சர்)**
(Mr. U. B. Wijekoon–District Minister, Jaffna)

සභාපතිතුමනි, වෙළෙඳ හා නාවුක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය භාර ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ වැඩ භාර ගත්තාට පස්සේ අයවැය විවාදයක පළමුවෙන්ම සහභාගි වන්නේ මේ අවුරුද්දේය නිසා මම හිතනවා. ඒ නිසා පළමු කොටම, ඒ දෙපොළට මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ඉතාමත් හොඳින්, සාර්ථකව කරගෙන යන්න හැකි වේවායි මම ප්‍රාර්ථනා කරනවා; ආශිංසනය කරනවා.

මේ අමාත්‍යාංශය මහජනතාවගේ එදිනෙද ජීවිතයට විශාල සම්බන්ධයක් තිබෙන අමාත්‍යාංශයක් බව අපි කවුරුත් දන්නවා. මේ අමාත්‍යාංශයේ ක්‍රියා දමය තුළින් සාමාන්‍ය මහජනතාවට විශාල සේවයක්, විශාල සහනයක් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා.

1977 දී අපේ රජය බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන්ම වෙළෙඳ අමාත්‍යාංශයේ විශාල පරිවර්තනයක් ඇති කොට තිබෙනවා, සාමාන්‍ය මහජනතාවගේ හිත – සුව පිණිස. ඒ නිසාම මේ රටේ ජනතාව මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සම්බන්ධයෙන් බොහෝ දුරට සෑහීමකට පත් වී සිටින බව අපි දන්නවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) එතුමාගේ කථාවේදී ජීවන වියදම ගැනත් මතක් කර සිටියා. අද ජීවන වියදම් අංකය සෑහෙන තරම් දුරට ඉහළ නැග තිබෙනවායයි එතුමා කීවා. ඒ නිසා ඒ ජීවන වියදම අඩු කිරීම සඳහා පුළුවන් තරම් කටයුතු කරන හැටියටත් එතුමා ඉල්ලා සිටියා. ඇත්ත වශයෙන්ම අප කාගේත් විශේෂ අවධානය යොමුවන කාරණයක් තමයි, මේ ජීවන වියදම් ප්‍රශ්නය. මැතිවරණ කාලවලදී, බලයේ සිටින පක්ෂයට විරුද්ධව ගෙන යනු ලබන වැඩ පිළිවෙලවලදී විශේෂයෙන්ම විවේචනයට ලක් කරනු ලබන්නේ ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නයයි. නමුත් මෙතෙක් බලයේ සිටි කිසිම රජයකට ජීවන වියදම නැතිනම් ජීවන අංකය පහළ හෙළන්නට පුළුවන්කමක් නොතිබුණු බව මම සඳහන් කරන්නට කැමතියි. එම නිසා ජීවන වියදම ගැන කථා කිරීමෙන් අපේ කාලය අනවශ්‍ය ලෙස මිඩංගු කරන බවයි මගේ පෞද්ගලික හැඟීම. ඇත්තෙන්ම කාටවත් පුළුවන්කමක් නැහැ, ජීවන වියදම එක්දහස් නවසිය පණස් ගණන්වල තත්ත්වයට එක් දහස් නවසිය අසූ ගණන්වලදී බස්සන්නට.

අපේ රට සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිත නම් පිටස්තර රටවල් සමග ජාත්‍යන්තර මට්ටමෙන් කරන වෙළහෙළදාමෙන් අප රට යැපෙන්නේ නැතිනම්, අපට පුළුවන්කම ලැබෙනවා,ජීවන වියදමේ ඉහළ නැඟීම පාලනය කරන්නට. නමුත් ජාත්‍යන්තර වෙළදාමට අපි ඇබ්බැහි වී සිටින නිසා, ජීවන වියදම වැඩි වීම නතර කරන්නට, පහළ දමන්නට අපට පුළුවන්කමක් නැහැ. එසේ වුණත් රට තුළ කෙරෙන නිෂ්පාදන හැකි තරම් දුරට වැඩි කිරීමෙන්, එමගින් ජනතාවගේ ආදායම් තත්ත්වය වැඩි කරදීමෙන්, වැඩි වන ජීවන වියදමට අදාළ වන සේ ජීවිත හැඩ ගස්සා ගැනීමට අපට හැකි වෙනවා. එසේ ක්‍රියා කරන්නේ නැතුව අප කවුරුත් කථා කරන මේ ජීවන වියදම වැඩි වීම නතර කරන්නට බොහොම අමාරුයි. එම නිසා හැම දෙනාම, හැම පක්ෂයක්ම දන්වත් පිළිගත යුතුව තිබෙනවා, ජීවන වියදම අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වෙනවා මිස අඩු කිරීම එතරම් ලෙහෙසි පහසු කාර්යයක් නොවන බව.

ගරු සභාපතිතුමනි, වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ සාකච්ඡා කරන මේ වේලාවේදී විශේෂයෙන්ම එම අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක කරගෙන එන, ඉතාමත්ම වැදගත්, ඒවාගේම අලුත් වැඩ පිළිවෙළක් වන අපනයන නිෂ්පාදන ගම්මාන වැඩ පිළිවෙල සම්බන්ධයෙනුත් කරුණු කීපයක් මතක් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. අපේ රටේ අපනයන දියුණු කිරීමේ වැඩ පිළිවෙලට ග්‍රාමීය මට්ටමෙන් සහභාගිත්වය කෙළින්ම ලබා ගැනීමට කටයුතු කර තිබෙන්නේ අපේ රජයයි. විශේෂයෙන්ම අපේ හිටපු වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමා තමයි, මෙම සංකල්පයේ නිර්මාතෘවරයා. එතුමා ආරම්භ කළ ඒ වැඩ පිළිවෙල අපේ වර්තමාන ඇමතිතුමා ඒ ආකාරයෙන්ම සාර්ථකව පවත්වා ගෙන යනවා. එම නිසා ඒ දෙපොළටම අපේ ස්තුතිය පුද කළ යුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මෙම වැඩ පිළිවෙල මුලින්ම, ඒ කියන්නේ 1981 දී පමණ, ආරම්භ කළේ මගේ මැතිවරණ කොට්ඨාශයේ දඹදෙනියේයි. එදා පටන් ගත් මේ ව්‍යාපාරය අද බොහෝ මැතිවරණ කොට්ඨාශවලට ව්‍යාප්ත වී ඇති බව අපට පෙනී යනවා. අපට දැන ගැනීමට ලැබුණු කරුණු අනුව අද ඒ විධියේ අපනයන නිෂ්පාදන ගම්මාන 23 ක් පමණ ක්‍රියාත්මක වෙනවා. අද ඒ අපනයන ගම්මාන ජනතා සමාගම් බවට පත්වෙලා. විශේෂයෙන්ම ගම්බද ජනතාව ඒ සමාගම් ක්‍රමය කෙරෙහි ක්‍රම ක්‍රමයෙන් දැන් ඇබ්බැහි වී තිබෙනවා. ඒ ගැන අපි ඉතාමත් සන්තෝෂ වෙනවා. මේ අපනයන ගම්මාන 23 හි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාමාජිකයන් හය දහකට වැඩි ප්‍රමාණයක් සිටිනවා. ඒ වාගේම මෙම අපනයන ගම්මානවලින් 1983 අවුරුද්දේ රුපියල් ලක්ෂ 30 ක් පමණ වටිනා භාණ්ඩ අපනයන කර තිබෙනවා. ඒ වාගේම 1984 අවුරුද්දේ දී රුපියල් ලක්ෂ 40 ක පමණ භාණ්ඩ අපනයනය කිරීමට බලාපොරොත්තු වෙනවා.

මේ වැඩපිළිවෙල මා කලින් කියූ පරිදි මුලින්ම ආරම්භ කළේ දඹදෙණිය මැතිවරණ කොට්ඨාශයේ. මේ මැතිවරණ කොට්ඨාශයේ බහුලව තිබෙනවා බුලත්. මේ බුලත් අපනයනය කිරීමෙන් තමයි පළමුවෙනි අපනයන නිෂ්පාදන ගම්මානය දඹදෙණිය ආසනයෙන් ආරම්භ කළේ. ඒ අතරතුරේදී අපට හමුවුණා ඊට වඩා වැඩි ආදායමක් ලබා දෙන ඒ වාගේම මහජනතාව අතර තවත් ව්‍යාප්ත කර නිෂ්පාදනය කරන්න පුළුවන් භාණ්ඩයක්. ඒ භාණ්ඩය තමයි තල්කොළ. ඇත්ත වශයෙන්ම අද තල්කොළ පෙට්ටි වුවමනා තරම් නිෂ්පාදනය කරන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා. ඒ තරම්ම අද ඒ භාණ්ඩවලට පිටරටවලින් ඉල්ලුමක් තිබෙනවා. දඹදෙණිය මැතිවරණ කොට්ඨාශය තල් ගස් සම්බන්ධයෙන් විශාල ප්‍රසිද්ධියක් දරනවා.

ගරු සභාපතිතුමනි, අපේ ඉතිහාසය අනුව තමුන්නාන්සේ දන්නවා ඇති මාතලේදී බුද්ධඝෝෂ හාමුදුරුවෝ ත්‍රිපිටකය ප්‍රථම වරට ග්‍රන්ථාරූඪ කළ බව. එසේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට තල් කොළ තමයි උපයෝගී කරගෙන තිබෙන්නේ. මා නියෝජනය කරන දඹදෙනිය මැතිවරණ කොට්ඨාශයේ අලව්ව ප්‍රදේශයේ ගලතරේ කියන ගම ප්‍රසිද්ධයි තල් කොළවලට. පසුගිය කාලයේ ඒ තල් කොළවලින් අපි භාණ්ඩ නිෂ්පාදනය කරන තෙක් ඒ තල් ගස්වලින් ඒ තරම් ප්‍රයෝජනයක් ලබා ගත්තේ නැහැ. මිනින්දෝරු මහත්වරුන් වෙනුවෙන් කැලෑවල සාදන තාවකාලික නිවාසවලට ඒ තල් කොළ පාවිච්චි කළා. ඒ හැර තනා සුළු සුළු දේවල්වලට තල් කොළ පාවිච්චි කළා මිසක් ඒවායින් සැහෙන ප්‍රයෝජනයක් ගන්නට අවස්ථාවක් තිබුණේ නැහැ. නමුත් අද අපේ මේ අපනයන නිෂ්පාදන ගම්මානය නිසා තල් කොළවලට විශාල වැදගත්කමක් ලැබී තිබෙනවා. රටටත් එමගින් විශාල ආදායමක් ලැබෙනවා. මේ ව්‍යාපාරය නිසා අද මගේ මැතිවරණ කොට්ඨාශයේ විශාල පිරිසකට රක්ෂා පහසුකම් ලැබී තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා අද රැකීක්ෂා සම්බන්ධව විශේෂයෙන්ම ගම්බද තරුණ තරුණියන් අතර විශාල ඉල්ලුමක් තිබෙන බව. මේ සමාගම බොහෝ දුරට ඉවහල් වී තිබෙනවා අපේ ගම්බද තරුණ තරුණියන්ගේ රක්ෂා ප්‍රශ්නය බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට.

ගරු සභාපතිතුමනි, අපි මේ සමාගම පටන් ගත්තේ සාමාජිකයන් 528 දෙනෙකුගෙන්. ඒ අය අතර රු. 10/– කොටස් බෙදුවා. මූලික කොටස් වශයෙන් අපට රු. 16,000/– ක මුදලක් ලැබුණා. ඒවාගේම ඒ රු. 16,000/– ට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලයෙන් රු. 15,000/– ක් ලැබුණා. එතකොට සමාගම ආරම්භයේදී මුළු ප්‍රාග්ධනය රු. 31,000/– යි. ඒ රු. 31,000/– න් පටන් ගත් මේ සමාගමෙන් පළමුවන අවුරුද්ද තුළ අපට පුළුවන් වුණා රු. 1,12,000/– ක ලාභයක් ලබා ගන්නට. එයින් සියයට 25 කට කිට්ටු ප්‍රමාණයක් 1982–83 වර්ෂය තුළදී ලාභාංශ වශයෙන් කොටස් හිමියන්ට බෙදා දුන්නා. මෙම පෙට්ටි යොදා ගත්තේ තේ ඇසිරීමටයි. මේ පෙට්ටි අපි කෙලින්ම අපනයනය කළේ නැහැ. කොළඹ "ස්ටැසන් එක්ස්පෝට්ස්" සමාගම සම්බන්ධ කරගෙන තමයි අපි මේ අපනයනය ව්‍යාපාරය කළේ. නමුත් මා කියන්නට කැමතියි තේවලට හැර පෙට්ටිවලින් පමණක් අපට විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන්කම ලැබුණු බව. මේ අවුරුදු දෙක තුළදී රු. 20,00,000/– ක පමණ ආදායමක් විදේශීය විනිමය වශයෙන් අපට ලැබී තිබෙනවා. මේ අවස්ථාවේදී මා මතක් කරන්නට කැමතියි කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවත් ලක්සලත් එවැනි භාණ්ඩ පිටරට යවන බව. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව හා ලක්සල අප වගේ එක භාණ්ඩයක් නොවෙයි, භාණ්ඩ රාශියක් පිටරට යවනවා. නමුත් අපේ සමාගම දැනට පිටරට යවනු ලබන්නේ එක භාණ්ඩයක් පමණයි. අපට දැන ගන්නට ලැබී තිබෙන අන්දමට කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවත් ලක්සලත් පසුගිය අවුරුද්දේ අපනයන භාණ්ඩවලින් ලක්ෂ 30 ක් පමණ උපයා තිබෙනවා. මේ අවුරුද්දේ ලක්ෂ 40 ක් පමණ ඉපැයීමට බලාපොරොත්තු වෙනවා. නමුත් අපේ දඹදෙනිය අපනයන නිෂ්පාදන භාණ්ඩ සමාගම මේ එක භාණ්ඩයකින් පමණක් රුපියල් ලක්ෂ 20 ක් පමණ උපයා තිබෙන බව මම ආඩම්බරයෙන් කියන්න කැමතියි.

අපේ සමාගමට ගොඩනැගිලි නැහැ. එහි කළමනාකාරිත්වය දුර්වලයි. ප්‍රවාහන පහසුකම් නැහැ. දුරකථන සේවා කිසිවක් නැහැ. ඒ පහසුකම් තිබෙන කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව හා ලක්සල වැනි ආයතන හා සංස්ථාවල කර බලන විට ඒ කිසිවක් නැතිවත් පසුගිය අවුරුදු දෙක තුන තුළ අපේ මේ සමාගමේ නිෂ්පාදන කටයුතු අපි ඉතාමත් යහපත් සේ ප්‍රයෝජනවත් වන පරිදි කර තිබෙන බව මම මතක් කරන්නට කැමතියි. මෙයින් මා පෙන්වන්න අදහස් කරන්නේ මෙයයි : මේ ව්‍යාපාරය පුළුල් කළොත් තවත් අලුත් අලුත් දේවල් පිටරට යැවීමට හැකි වෙනවා මෙන්ම එයින් අපේ ගම්බද ජනතාවට විශාල සේවයකුත් සිදු වෙනවා. රැකීරක්ෂා ප්‍රශ්නයත් ලෙහෙසියෙන්ම විසඳා ගන්නටත් පුළුවන්කම ලැබෙනවා. එමෙන්ම මහජනතාව අපට තව තවත් ළං කර ගෙන ඔවුන්ගේ ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීමේ මාර්ග සකස් කරන්නටත් පුළුවන් වෙනවා.

අපි මේ නිෂ්පාදනය කරන භාණ්ඩවල තත්ත්වය තවමත් පිටරට යවන භාණ්ඩවල තිබිය යුතු තත්ත්වයට උසස් වී නැති බව අපේ මේ කටයුතුවලදී මට පෙනී ගිය දෙයක්. ඒ දුර්වලතාවය අපට තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් මේ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා පුහුණු වීමේ ආයතනයක් ඇති කළොත් හොඳ යයි මම යෝජනා කරන්න කැමතියි. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් හෝ වෙළඳ අමාත්‍යාංශය මගින් හෝ එවැනි පුහුණු මධ්‍යස්ථානයක් ඇති කර ඒ සම්බන්ධයෙන් පුහුණුවක් ලබා දුන්නොත් ඒ භාණ්ඩවල තත්ත්වය බොහෝ දුරට උසස් කර මීට වඩා විශාල සේවයක් හා විශාල යහපතක් ඇති කරන්නටත් විශාල විදේශ විනිමයක් ලබා ගන්නටත් අපට පුළුවන්කම ඇති වෙනවා. ඒ මගින් ගම්බදව අපේ රැකීරක්ෂා ප්‍රශ්නයත් බොහෝ දුරට විසඳා ගන්නටත් පුළුවන් වෙනවා.

අපේ මේ සමාගමේ වැඩ කටයුතු කරගෙන යැමේදී බොහෝ දෙනෙක් උපකාරී වුණා. පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් විශේෂයෙන් වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේ ඒ අයට ස්තුති කිරීමට මගේ යුතුකමක් තිබෙනවා. විශේෂයෙන් මෙහි නිර්මාතෘවරයා වන එමෙන්ම මේ සම්බන්ධයෙන් ඉතාම කැක්කුමකින් වැඩ කළ හා වැඩ කරන, අපේ හිටපු වෙළඳ හා නාවික අමාත්‍ය වර්තමාන ජාතික ආරක්ෂක අමාත්‍ය ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට මේ සමාගම වෙනුවෙන් අපේ ප්‍රශංසාව පුද කළ යුතුව තිබෙනවා. එමෙන්ම ඒ වැඩ කටයුතු ඒ ආකාරයෙන්ම කරගෙන යමින් මෙය තව තවත් පුළුල් කිරීමට කටයුතු කරන අපේ වර්තමාන ඇමතිතුමාටත් එම නියෝජ්‍ය ඇමතිතුමාටත් අපේ ප්‍රශංසාව පුද කරනවා. එමෙන්ම මෙය කිරීමේදී අපට අත හිත දුන්නේ අපනයන සංවර්ධන මණ්ඩලයයි. තමන්ගේ කාලය සම්පූර්ණයෙන් මිඩංගු කරලා තමන්ගේ දෙයක් වගේම සලකා ළදරු අවස්ථාවේ පටන්ම එහි තත්ත්වය වැඩි දියුණු කිරීමට මහන්සිවන අපනයන සංවර්ධන මණ්ඩලයේ තිලකරත්න මහත්මයාට, වික්‍රමරත්න මහත්මයාට, චන්ද්‍රරත්න මහත්මයාට සහ අනෙක් මහත්වරුන්ට මම ස්තුති වන්ත වෙනවා. ඒවාගේම අපේ වාසනාවට ලැබුණු සීමාසහිත කොළඹ පැෂන් එක්ස්පෝට් සමාගම ගැන මතක් කරන්නට ඕනෑ. එහි අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපතිතුමා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ජයවර්ධන මහත්මයා විශේෂයෙන් ස්තුති පූර්වකව මතක් කරන්න ඕනෑ. ඒවාගේම අපේ සමාගම ගැන නිතරම සොයා බැලීමෙක් වුවමනා කරන මුදල් හදල් දීමෙන් හා දිනපතා රැස්වීම් කැඳවීමෙන් අපට සහයෝගය ලබා දෙන එහි අධ්‍යක්ෂ සකී අලිප් මහත්මයා විශේෂයෙන් මේ අවස්ථාවේදී සිහිපත්කළ යුතුයි. පළාතේ මන්ත්‍රීවරයා වන මටත් වඩා ඒ මහත්මයා මේ සමාගම දියුණු කිරීමට විශාල මහන්සියක් ගන්නවා. ඒ මහත්මයාටත් අපේ ගෞරවය මේ අවස්ථාවේදී හිමි කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, ක්‍රියාකාරී අධ්‍යක්ෂ මණ්ඩලය, පළාතේ උප දිසාපතිතුමා, විමල් අබේසේකර මහත්මයා සහ අනෙක් පිරිස නිසා තමයි අද මේ සමාගම මේ තරම් උසස් තත්ත්වයට පත් වී තිබෙන්නේ. එම නිසා මේ වැඩපිළිවෙල තවත් පුළුල් කළහොත් අපේ රටට විශාල සේවයක් කරන්නට පුළුවන්කම තිබෙනවා. අළුත් දේ නිෂ්පාදනය කර පිටරට යවා විශාල මුදලක් හොයා ගන්නට පුළුවන් කම තිබෙනවා. මම කලින් මතක් කළ පරිදි ඒ මාර්ගයෙන් අපේ ප්‍රදේශයේ ජීවත්වන විශාල පිරිසකට රැකීරක්ෂා ලබා දීමටත් පුළුවන් කම තිබෙනවා.

මේ කරගෙන යන වැඩපිළිවෙල අනුව අවුරුදු දෙක් තුන තුළ අඩුම ගණනේ තරුණ තරුණියන් පත් දහකටවත් ගමේ ගෙදර ඉඳගෙන කිරීමට හැකි රැකියාවක් ලබා දීමට අපේ බලාපොරොත්තුවක් අරමුණක් තිබෙනවා. විශේෂයෙන් මේ අළුත් වැඩ පිළිවෙල ගැන ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය යොමු කර තමන්ගේ ප්‍රදේශවල නිෂ්පාදනය කරන්නට පුළුවන් මොනවාද අපනයන කරන්නට පුළුවන් මොනවාද කියා සොයා බලා කටයුතු කරන ලෙස මතක් කරනවා. වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශය මහජනතාවගේ එදිනෙදා ජීවිත සමඟ විශාල සම්බන්ධ කමක් තිබෙනවා. ඒ අමාත්‍යාංශයේ වැඩපිළිවෙල අනුව මහජනතාවගේ යහපත සඳහා එදිනෙදා ජීවත්වීම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[යූ. බී. විජේකෝන් මහතා]

විශාල සේවයක් කරන්නට පුළුවන් කම තිබෙනවා. මහජනතාව බලාපොරොත්තුවන ඒ සේවය එම අමාත්‍යාංශයෙන් මීටත් වඩා හොඳින් ඉටුවේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**බෙනට් ගුණසේකර මහතා (මීනුවන්ගොඩ)**
**(திரு. பெனற் குணசேக்கர — மினுவாங்கொடை)**
(Mr. Bennet Gunasekera–Minuwangoda)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාවක් ලබාදීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් ලංකාවේ තිබෙන සෑම අමාත්‍යාංශයක් සමගම වාගේ මේ වෙළඳ අමාත්‍යාංශය සමඟත් මහජනතාව කොයි පිළිවෙලකින් හෝ සම්බන්ධ වෙනවා. එම නිසා මෙය ඉතා වටිනා අමාත්‍යාංශයක් බව අපිට පේනවා.

පසුගිය කාලසීමාව ඇතුලතදී ඉතාමත් දක්ෂ ලෙස ගරු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා වැඩ කටයුතු කර තිබෙනවා. එතුමන්ලා දෙපළට ඊටත් වඩා දක්ෂ ලෙස තමන්ට භාර වැඩ කොටස ඉෂ්ට කිරීමට ඉදිරියටත් අවස්ථාව ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා. අපේ රටේ වෙළඳාම සිංගප්පූරුව, හොංකොං වැනි නගර වල පවතින තත්ත්වයට නංවා ලන්නට ඕනෑ. අවශ්‍ය පහසුකම් ඒ සඳහා තිබෙන්නට ඕනෑ. නිදහස් වෙළඳාම සම්බන්ධව රජය දරන ආකල්පය ගැන අද හිතන පිළිවෙල සම්පූර්ණයෙන් වෙනස් වන්නට ඕනෑ. මොනද අපි බොහෝම හෙමින් වැඩ කලත් අද අපි එදාට වඩා පුළුල් අන්දමින් වෙළඳාම කරන නිසා තීරණ ගැනීම් ආදී අපේ සෑම කටයුත්තක්ම ඊට වඩා වේගයෙන් කෙරෙන්න ඕනෑ. එවිට පමණයි, අපට ලෝක වෙළඳ පොළත් එක්ක තරග කරන්න පුළුවන් වන්නේ. මේ සඳහා අවශ්‍ය වන පහසුකම්වලින් ඉතාම වැදගත් දේ තමයි, බැංකු පහසුකම්. නමුත් විශේෂයෙන්ම අපනයනය සඳහා ලැබෙන බැංකු පහසුකම් ඉතාම අල්ප බව කියන්න පුළුවනි. අපි අපනයනය සඳහා බැංකුවකින් ණය මුදල් ලබාගතිතොත් ඒ සඳහා සියයට විසි හතරක පමණ පොලියක් ගෙවන්න සිදු වෙනවා. සියයට විසි හතරක පොලියට ණය මුදල් ලබාගෙන ලෝකයේ අනෙක් රටවල් එක්ක තරග කරලා අපේ අපනයනය ලාභයක් ඇතුව කරන්න පුළුවන් වේයයි හිතන්න බැහැ.

මේ අංශයේ හුඟක් දේවල් ගැන අපට කතා කරන්න පුළුවන් වුවත් මේ අවස්ථාවේදී අපි කර්මාන්ත දෙකක් තුනක් ගැන පමණක් කල්පනා කර බලමු. මේ රටේ තිබෙන පොල් කර්මාන්තය ගැන බලන්න. අද ජීවන වියදම බොහෝම වැඩියයි අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) අක්මීමන මන්ත්‍රීතුමාත් (රිචඩ් පතිරණ මහතා) ආදී මන්ත්‍රීවරුන් කිව්වා. ඇත්තටම ජීවන වියදම වැඩියි. ලෝකයේ මහජනයාගේ ජීවන තත්ත්වය උසස් වන විට පඩි-නඩි වැඩි වන විට යම්-යම් දේවල් නිෂ්පාදනය කිරීමට වැඩි වියදමක් යනවා. ඒ අනුව නිෂ්පාදනය වන භාණ්ඩයේ මිලත් වැඩි වෙනවා. ඒ අනුව ජීවන වියදමත් වැඩි වෙනවාට කිසිම සැකයක් නැහැ. එය අඩුකිරීමත් ඒතරම් පහසු වැඩක් නොවෙයි.

අපේ ඩෙසිකේටඩ් කොකනට් හෙවත් දිසිදි පොල් ගැන කල්පනා කර බලමු. පිලිපීන් දූපතේ නිපදවෙන දිසිදි පොල් කිලෝ එකක් අලෙවි වන්නේ රුපියල් හතලිස් හතරකට පමණ. නමුත් අපේ රටේ දිසිදි පොල් කිලෝ එකක් අලෙවි වන්නේ රුපියල් තිස් හයකට පමණ. සමහර විට ඊටත් වඩා අඩු ඇති. මීට කිසිම හේතුවක් අපට හොයා ගන්න නැහැ. මීට හේතු වශයෙන් පෙන්වන්න පුළුවන් යම් දෙයක් රජයවත් තවම හොයාගෙන තිබෙනවාද මම දන්නේ නැහැ. පොල් හිඟ වර්ෂවල තත්ත්වය මෙහෙම නම් අනෙක් කාලවලදී මොන තත්ත්වයක් ඇති වෙයිද ? එන වර්ෂයේ සමහර විට පොල් නිෂ්පාදනය වැඩි වෙන්න පුළුවන්. එසේ වැඩි වන විටත් මේ තත්ත්වය දිගටම පැවතීමට ඉඩ දුන්නොත් ගරු මුදල් ඇමතිතුමා බලාපොරොත්තු වන රුපියල් දෙදාහේ අවම ගණනවත් අපට ලැබේදැයි කියන්න බැහැ. ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කිරීමට වැඩ කටයුතු කරන ලෙස මම වෙළඳ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ රටේ නිපදවෙන දිසිදි පොල්, පිලිපීනයේ නිපදවෙන දිසිදි පොල්වලට වඩා හොඳයි. ඒ නිසා අපේ පොල්වල මිල පිලිපීන් දූපතේ පොල්වලට වඩා අඩු වීමට කිසිම හේතුවක් නැහැ. වෙළඳ අපනයනය කරන අයගේත් ඒ ඒ රටවල භාණ්ඩ ගෙන්වන අයගේත් යම්-යම් කුටෝපක්‍රම නිසා මිස වෙනත් කිසිම හේතුවක් අපට පෙන්නේ නැහැ. ඒ නිසා මේ කාරණය ඉතාම අවශ්‍ය දෙයක් හැටියට සලකන්න ඕනෑ. මීට එක් හේතුවක් හැටියට පෙන්නා දෙන්න පුළුවන් කාරණයක් තිබෙනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශය යටතේ තිබෙන 'කොන්සල් එක්ස්පෝ' එකෙන් ගිය වර්ෂයේදී 1983-දී දිසිදි පොල් කිලෝග්‍රෑම් හය ලක්ෂ ගණනක් අපනයනය කර තිබෙනවා. 1984 සැප්තැම්බර් මාසය වන විට අට ලක්ෂ ගණනක් අපනයනය කර තිබෙනවා. එම වැඩිවීම බොහෝමත් හොඳයි. මේ තත්ත්වය මීට වඩා දියුණු කරන්න ඕනෑ. මේ ව්‍යාපාරයේදී පෞද්ගලික අංශය සෑහෙන තරමකට පාලනය කරන්න පුලුවන් වන්නේ, මේ අංශයේ සෑහෙන පාලනයක් කරන්න පුළුවන් ශක්තිය තිබෙන රාජ්‍ය ආයතනයක් තිබෙනවා නම් පමණයි. ඒ නිසා මේ ගැන හොඳින් සොයා බලා පුළුවන් ප්‍රමාණයකින් මේ සඳහා ඉදිරිපත් වන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අද මෝල් හිමියන් විශාල ගණනක් අමාරුවේ වැටී සිටිනවා. වෙළඳාම් කරන උදවිය සෑහෙන ගණනක් අමාරුවේ වැටී සිටිනවා. වතුවල පොල් පැලවෙනවා. පොල් පැලවන විට ඒවායින් ලැබෙන ආදායම රටට ලැබෙන්නේ නැහැ. එයින් විශාල පාඩුවක් සිදු වෙනවා. තේ රබර් දෙක විශාල වශයෙන් විදේශික සුදු මහත්වරුන්ට අයිති වී තිබුණු නිසා ඒවා නියම පිළිවෙලට සකස් වී තිබෙනවා. පොල් ලාංකික සුළු මිනිහාගේ, — සිංහලයාගේ — වැවිල්ලක් නිසා මේකට කිසිම කෙනෙක් අතගහන්නේ නැහැ. අද මෙම ව්‍යාපාරයට, වෙළඳාමට කිසිම වැඩ පිළිවෙලක් නැහැ; කිසිම නීතියක් නැහැ. එක් එක්කෙනාගේ හිතු මතයට තමයි, වෙළඳාම හා ඒ පිළිබඳ අනිකුත් වැඩ කටයුතු කෙරෙන්නේ.

ඇහැලියගොඩ ගරු මන්ත්‍රීතුමා ( ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා) ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ කණ්ඩලයේ – SLECIC – සභාපති වශයෙන් සිටි කාලයේදී, බඩු පිටරට යැව්වාම ඒ සඳහා මුදල් ලැබුණේ නැත්නම් එය ආරක්ෂා කර දීමේ වැඩ පිළිවෙලක් ඇති කලා. නමුත් අද මේ රටේම කෙනෙකුට බඩු ටික විකුණුවාම ඒ සඳහා තමන්ට සල්ලි ලැබෙන තුරු කිසිම විශ්වාසයක් නැහැ. ඒ අය මොකද කරන්නේ ? බඩු ටික ලබාගෙන ඒවා පිටරට යවා මුදල් ලබාගෙන වෙනත් වෙනත් වෙළඳාම් කරනවා. ඒ මුදල් ලබා දීමට, ලංකාවේ සිටින සුළු වෙළෙන්දන් ආරක්ෂා කිරීමට කිසිම වැඩ පිළිවෙලක් සකස් කර නැහැ. එමනිසා මේ සම්බන්ධයෙන් යම් වැඩ පිළිවෙලක් ඇතිකරන ලෙසත් එවැනි අයුතු වැඩ කරන ව්‍යාපාරිකයන්ට භාණ්ඩ අපනයනය කිරීමට ඉඩ නොදෙන ලෙසත් මම වෙළඳ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට කිව යුතුව තිබෙන්නේ රබර් ගැනයි. රබර් සම්බන්ධයෙන් තිබුණු අපනයන බද්ද එක් වතාවක් රුපියල් දෙකකින් පමණ අඩු කළ බව අපේ ගම්බද ජනතාවත් දන්නවා. ඒ වාගේම ගරු මුදල් ඇමතිතුමා මෙවරත් අපනයන බද්ද රුපියල් හතරකින් පමණ අඩු කර තිබෙනවා. නමුත් පිටිසර පළාත්වල රබර් මිල තවමත් ඒ විධියටම තිබෙන බව අපට පෙනෙනවා. ඒ මොකද කියා ඇසුවාම, ගන්න කෙනෙක් නැහැයි කියනවා, සල්ලි නැහැයි කියනවා. එහෙම නැත්නම් සල්ලි දෙන්නේ නැහැයි කියනවා. මීට කලින් කථා කළ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේ කාරණය ගැන කිව්වා. අද ඒ වෙළඳුන් හිතුමතයටයි බඩු ගැනීම් කරන්නේ. සල්ලි දෙන්නේ ඒ අයට හිතුණු වෙලාවටයි. ඒ පිළිබඳව කිසිම වැඩ පිළිවෙලක් නැහැ. එම නිසා මේ ගැන හොයා බලා නියම මුදල ලැබෙන අන්දමේ වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන් අද ගම්බදව සුළුවෙන් රබර් නිෂ්පාදනය කරන අයගේ රබර් අලෙවි කර ගැනීමට ස්ථිර වැඩ පිළිවෙලක් නැහැ. කොටින්ම කියනවා නම් දුප්පත් මිනිහාගේ රබර් ගන්නේ නොම්මර හතරට නැත්නම් පහටයි. ඒවා කොපමණ හොඳට නිෂ්පාදනය කළත් කවදාවත් නොම්මර එකට, දෙකට නම් විකුණන්නට බැහැ. එම නිසා ගරු ඇමතිතුමා මේ පිළිබඳව පරීක්ෂා කර බලනවා නම් හොඳයි කියා මම හිතනවා.

මීළඟට කියන්නට තිබෙන්නේ අපනයන සංවර්ධන මණ්ඩලය ගැනයි. එය ඉතා විශාල වැඩ කොටසක් කරන බව අපි දන්නවා. මම කලින් සඳහන් කළ පිළිවෙලට මුදල් නැතිකම නිසා සියයට විසිහතරේ පොලියට වෙළඳ බැංකුවලින් ණය මුදල් ලාබාගෙන ව්‍යාපාරික කටයුතු කරගෙන ගිය ආයතනවලට ඒවා නඟා සිටුවීම සඳහා කීප විටක්ම විශාල උදව් කර තිබෙන බව අපි දන්නවා. සමහර විට ඒවා කරන්නට ගිහින් අමාරුවේ වැටෙන්නටත් බැරිකමක් නැහැ. ඒ විධියට කටයුතු කර එම ව්‍යාපාර ශක්තිමත් කර තිබෙන බව අපට පෙනෙනවා. එම නිසා වෙළඳ ව්‍යාපාර නඟා සිටුවීම සඳහා එවැනි ආයතනයක් ඇති කිරීම ගැන අපි ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එය දැනට වඩා ව්‍යාප්ත කරනවා නම් ඉතාමත් හොඳයි කියා මම හිතනවා. එතකොට ඒ පිළිබඳව ස්ථිරත්වයක් ඇති වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද මේ පළාතේ සිටින සිංහල වෙළඳුන්ටයි වැඩි වශයෙන් වෙළඳ කටයුතු කරගෙන යාමේ අපහසුව තිබෙන්නේ. අද එම වෙළඳුන්ට අත දීමට කෙනෙක් නැහැ. ව්‍යාපාරිකයන් සඳහා—වෙළඳාම සඳහා—බැංකුවක් පිහිටුවීමට ඕනෑ බවක් කලිනුත් මට අසන්නට ලැබුණා. අද බැංකුවකින් සුළු මුදලක් ලබා ගැනීමට ගිය විටයි, අමාරුව තිබෙන්නේ. විශාල මුදලක් ගැනීමට එතරම් අමාරුවක් ඇත්තේ නැහැ. විශාල මුදලක් ලබා ගත්තත් ඒ අයගේ පොත්වල ලියන්නේ එක පේළියයි. ඒ වාගේම රුපියල් දහදාහක්, පහළොස් දාහක් තරම් සුළු මුදලක් ලබා ගත්තත් ලියන්නේ එක පේළියයි. සමහර විට රුපියල් දහදාහක්, පහළොස් දාහක් දුන් විට ඒ මුදල ආපසු ලබා ගන්නට අමාරුයි. විශාල වශයෙන් මුදලක් ණයට ගත් ආයතනයකින් ඒ මුදල් ලබා ගැනීමට පහසුයි. ඒ නිසා බැංකුත් නිතරම සූදානම් වන්නේ විශාල මුදල් ණයට දෙන්නටයි. ඒ අයට විශාල වශයෙන් මුදල් ලබා දී අපි මේ තරම් විශාල මුදලක් ණයට දී තිබෙනවා යයි ඒ බැංකු ප්‍රකාශ කරනවා. එම නිසා මේ සුළු ව්‍යාපාරිකයන්ට ණය මුදල් ලබා ගැනීම සඳහා යම් වැඩ පිළිවෙළක් ඇති කරන්නට ඕනෑ. එහෙම නැත්නම් ඒ සඳහා විශේෂ පහසුකම් සලස්වන ලෙස බැංකුවලට දන්වන්න ඕනෑ.

ගරු වෙළඳ ඇමතිතුමා සමුපකාරය ගැන හොඳට දන්නා නිසා අද සමුපකාර සමිතිවලට ව්‍යාපාරික කටයුතු සඳහා ණය මුදල් ලැබෙන්නේ කොයි තරම් අධික පොලියකටද කියන එක දන්නවා ඇති. මා හිතන විධියට නම් සියයට විසි හතරක පොලියට වෙන්න ඕනෑ. එහෙම අරගෙන තරග කරන්නේ කොහොමද ? සාමාන්‍ය ව්‍යාපාරිකයන් වගේ නොවෙයි, සමුපකාරය බිට්ටි වගේ දේවල් හරියට ගෙවන්නට ඕනෑ ; බිල්පත් ලියන්නට ඕනෑ. පුද්ගලික අංශයේ එක් පුද්ගලයෙක් කරන වැඩට සමුපකාරයට හතර පස් දෙනෙක් ඕනෑ. පුද්ගලික ව්‍යාපාරයක ඒ කටයුතු කෙරෙන්නේ අවංකකම, එහෙම නැත්නම් විශ්වාසය උඩයි. නමුත් සමුපකාරවල එහෙම කරන්නට බැහැ. එය හරියට රජයේ ආයතනයක වගේ ගණන්හිලව් පොත්පත්වල ලියා කටයුතු කරන්නට ඕනෑ. එම නිසා විශේෂයෙන් ඒ පොලිය සමුපකාර සඳහා අඩු කිරීමේ වැඩ පිළිවෙළක් ඕනෑ.

මම සොයා බැලුවා ග්‍රාමීය බැංකුවලට මුදල් ලැබෙන්නේ කීයේ පොලියටද කියා. ඒවාට ලැබෙන්නේ සියයට 24 ටයි. ග්‍රාමීය බැංකුව සියයට 28 ක පොලියකටයි, ඒවා සාමාන්‍ය මිනිසාට දෙන්නෙ. සියයට 28 ක පොලියකට මුදලක් අරගෙන යම් ව්‍යාපාරයක් කර, කීයක් ලාභ තබා ගන්නද ? සියයට 50 කවත් ලාභයක් ලබාගන්නට ඕනෑ. එහෙමත් බඩු විකුණන්න පුළුවන්ද ? එම නිසා කොයි ක්‍රමයකින් හෝ සාධාරණ පොලියකට සුළු ව්‍යාපාරිකයාට මේ මුදල් ලබා ගැනීමේ පහසුකම් සලසා දෙන්නට ඕනෑ. එය සමුපකාර බැංකුවෙන් වෙන්න පුළුවන් ; ග්‍රාමීය බැංකුවෙන් වෙන්න පුළුවන් ; වෙනත් ක්‍රමයකින් වෙන්න පුළුවන්. කොහොම නමුත් යම්කිසි වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ඊට හේතුව මොකක්ද ? මේ එක්සත් ජාතික පක්ෂයේ රජය බලාපොරොත්තු වන්නේ වැඩි හරියක් පුද්ගලික අංශය ලවා රට සංවර්ධනය කරවන්නයි. එසේ පුද්ගලික අංශය ලවා රට සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා නම් ඒ අයට හැකි තරම් පහසුකම් ලබා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ව්‍යාපාර කරන්නේ කොයි විධියටද ? ඒවා තවම තිබෙන්නේ ඉස්සර පිළිවෙළට නම් අපේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරගෙන යන්න බැහැනේ ? අපේ ප්‍රතිපත්තියට සරිලන පිළිවෙළට අපේ වැඩ කටයුතු, සිතුම් පැතුම් ආදී සැම එකක්ම වෙනස් වෙන්නට ඕනෑ. මම හිතනවා අපේ ගරු ඇමතිතුමාට මේ ගැන මම කියන්න ඕනෑ නැහැ. එතුමා සාමාන්‍ය දුප්පත් මිනිහා ගැන මට වඩා හොඳට දන්නවා. ඒ නිසා මේ වැඩ කටයුතු ගැන තමුන්නාන්සේ යම් වෙනසක් කරාවි කියා මම බලාපොරොත්තු වෙනවා.

අනෙක් කරුණ මේ නැවියන් පුහුණු කිරීමේ ආයතනය ගැනයි. මා දන්නා හැටියට පුහුණුව සඳහා අවුරුද්දකට බඳවා ගන්නේ සියයට අඩු ගණනක්. එය දැනට වඩා ව්‍යාප්ත කළොත් හොඳයි කියා අපට පෙනෙනවා. විශාල වශයෙන් අපට ඉල්ලුම් තිබෙනවා නැවියන් පුහුණු කරවන්නය කියා. ඒ අය කියන්නේ, " අපට රක්ෂාව තුදුන්නාට කමක් නැහැ, අපි රක්ෂාවල් සොයාගන්නම්, අපට පුහුණුව ලබා දී සහතිකය දෙන්න " කියායි. මම හිතනවා මේ වැඩ පිළිවෙළ ව්‍යාප්ත කිරීමට එතරම් අපහසුවක් නැත කියා. ඒ නිසා එය සෑහෙන ප්‍රමාණයකට දියුණු කර, අවුරුද්දකට පන්සියයක් පමණවත් පුහුණු කරවීමට කටයුතු කරන්න. දැන් ගරු ඇමතිතුමා ලෝකයේ නොයෙකුත් රටවලට ගිහින් කොන්ත්‍රාත් අත්සන් කර තිබෙනවා අපේ නැවියන් යවන්නට පුළුවන් අන්දමට ලංකාවේ නැව් ලියාපදිංචි කිරීම සඳහා. නමුත් එයින් ප්‍රයෝජනයක් ගැනීමට නම් අපි ඒ වේගයෙන්ම නැවියන් පුහුණු කිරීම වැඩි කරන්නට ඕනෑ. ඒ මන්ද, මම නැවතත් ඒක කියන්නට ඕනෑ. අපේ සිතුම් පැතුම්, වැඩ කටයුතු ආදිය රජය බලාපොරොත්තු වෙන තරම් වේගයෙන් කෙරෙන්නෙ නැති එක විශාල පාඩුවක්. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ " මර්චන්ට් නේවි සීමන් " නැත්නම් මේ නැවියන් පුහුණු කරවීමේ වැඩ පිළිවෙළ මීට වඩා ඉක්මන් කර, ඒ ආයතනයට බඳවා ගන්නා සංඛ්‍යාව වැඩි කරන්න කියලයි.

ගරු සභාපතිතුමනි, තවත් කාරයක් තමයි මේ පොල්තෙල් මිල. මට දැනුයි, ඒක මතක් වුණේ. මේ පොල්තෙල් මිල දැන් සෑහෙන ප්‍රමාණයකින් අඩු වී තිබෙනවා. සමහර විට ලෝක වෙළඳපොළේ මට්ටමටම වාගේ අඩු වී තිබෙනවා. ඊට එක හේතුවක් මේ රටේ පොල් තෙල් තිබියදී නොයෙක් තෙල් ජාති මේ රටට ගෙන්වීම. පාම් ඔයිල් එනවා ; ටැලෝ එනවා ; කෝන් ඔයිල් එනවා. ඒ වාගේ නොයෙක් ජාතිවල තෙල් එනවා. එසේ තෙල් එනවා පමණක් නොවෙයි, ලාභ තෙල් අරගෙන පොල් තෙල්වලට මිශ්‍ර කර විකුණනවා. මම හිතන්නෙ නැහැ ඒවා පරීක්ෂා කර බලන්නට වැඩ පිළිවෙළක් තිබෙනවාය කියා. තමුන්නාන්සේලාගේ සමාගමක් තිබෙනවා මේ කලවම් කළ ඒවා ගැන පරීක්ෂණ පවත්වා ඒ අය අල්ලා නඩු පැවරීමට. නමුත් එය සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. අද රටේ තත්ත්වය අනුව ඒවා වෙනස් වෙන්නට ඕනෑ. මම ඒ ගැන වැඩදුර කථා කරන්න යන්නෙ නැහැ. නමුත් වෙළඳ ඇමතිතුමා ඒ ගැන පරීක්ෂා කර බලනවා නම් හොඳයි. අපේ පළාතෙත් අපි නොයෙක් ඒවා අල්ලා දුන් නමුත් අපට පෙනෙන්නෙ නැහැ, යම්කිසි ක්‍රියාත්මක වැඩ පිළිවෙළක් සිදු වුණාය කියා. එනිසා පොල් තෙල් මිල ස්ථාවර කිරීම සඳහා පිටරටින් තෙල් වර්ග ගෙන්වීම නතර කරනවා නම්, නැත්නම් පාලනය කරනවා නම්,—පාලනය කිරීමක් මේ රජය කරන්නේ නැහැ—ඊට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කර ගන්නවා නම් හොඳයි. එහෙම නැත්නම් අපේ තෙල් මිල බහිනවා. අපි පිටරටින් තෙල් ගෙනෙන කොට එහෙම වෙනවා.

අනික් කාරණය, අපනයන ගම්මාන. අපේ යාපනේ දිසා ඇමතිතුමා ඒ ගැන දීර්ඝ වශයෙන් කිව්වා. මම ඒ ගැන නැවත විස්තර කරන්න යන්නෙ නැහැ. ඒ මොකද, මිනුවන්ගොඩ ආසනයේ නව අපනයන ගම්මාන කීපයක් ඇති කිරීමට අපි වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. ඒ කජු පිටරට යැවීම සම්බන්ධවයි. ඒ ගැන අපි සාකච්ඡා කීපයක් පැවැත්තුවා. නමුත් අවාසනාවකට වගේ සිද්ධ වුණේ මොකක්ද ? මේ වර්ෂයේ මුළු රටේම කජු සෑදී නැහැ, වැස්ස වැඩිකමට. මල් සේදී ගොස් කජු පළ ගැනීම නැවතුණා. මම හිතනවා ලබන වර්ෂයේ දී අපට එය ක්‍රියාත්මක කරන්න පුළුවන් වේවි කියා.

අනික් කාරණය නිදහස් වෙළඳ කලාපයේ මැහුම් පුරුදු පුහුණු වූ ගැහැණු ළමයින් ගැනයි. දැනට එහෙත් අස් වී ගෙදර සිට මැෂින් 4 ක්, 5 ක් තබාගෙන ඇඟළුම් කර්මාන්තයේ යෙදෙන ගැහැණු ළමයින් පිරිසක් අපේ ආසනයේ ඉන්නවා. ගම් දෙක තුනකම සමහර විට දහක් හමාරක් ඒ රක්ෂාවේ යෙදී සිටිනවා. පසුගිය වර්ෂවල බොහොම දියුණු තත්ත්වයෙන් ඒ වැඩේ කරගෙන ගියා. නමුත් වර්තමාන තත්ත්වය තුළ කොළඹ මිනිස්සු තොග තියාගන්න හයයි. ඒ නිසා මේ නත්තල් සමයේ දී වුණත් ඒ අයට ඒවා විකුණා ගන්නට අපහසු තත්ත්වයක් තිබෙනවා. අර අපනයන ගම්මාන වාගේ මේ ඇඟළුම් ව්‍යාපාරයත් ගෙදර සිට ඒ ආකාරයෙන් කරන්න පුළුවන් විධියට ව්‍යාප්ත කරන්න පුළුවන් නම් හොඳයි. ඒවා අලෙවි කිරීම කන්සල් එක්ස්පෝ මගින් හෝ වෙනත් ක්‍රමයකින් හෝ කරන්න පුළුවන්ද කියා ගරු ඇමතිතුමා අවධානය යොමු කර බලන්න. හැබැයි, පිටරට යවන විධියට, අර තේ සම්බන්ධයෙන් කරන්නා වාගේ සකස් වෙන්න ඕනෑ. කුඩා නිෂ්පාදනය කිරීමත් මේ ක්‍රමයට සකස් වී තිබෙන නිසා ඒ වාගේ කීපයක්ම මෙයට සම්බන්ධ කරන විධියේ වැඩ පිළිවෙළක් ඇති කරන්න පුළුවනි.

ඊළඟට බුලත් ගැන සඳහන් කරන්න කැමතියි. කන්සල් එක්ස්පෝ මාර්ගයෙන් බුලතුත් සෑහෙන ප්‍රමාණයක් යවනවා. 1983 දී කිලෝග්‍රෑම් ලක්ෂ 7 ක් විතර යවා තිබෙනවා. 1984 සැප්තැම්බර් මාසය වන විට කිලෝග්‍රෑම් ලක්ෂ 9 ක් පමණ යවා තිබෙනවා. මම හිතනවා මේක මීට වඩා ව්‍යාප්ත කළොත් හොඳයි කියා. මිල අඩු වුණත් කමක් නැහැ, යවන ප්‍රමාණය වැඩි කරගන්නට පුළුවන් නම් හොඳයි. මැද පෙරදිග ඉන්න ඔක්කොටම බුලත් කන්න පුරුදු කරනවා නම් හොඳයි. මෙය විශාල ව්‍යාපාරයක් වෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ තමයි, අවුරුදු ගණනක් තිස්සේ බුලත් වවන්නෙ. මිල වැඩියෙන් ඕනෑ නැහැ. නිෂ්පාදනය වන වැඩි ප්‍රමාණයක් යැවීමට හදගන්න තිබෙන්නේ. පෙලක් කාලවලට රුපියල් එකසිය ගණන්වලට යනවා. පෙලක් කාලවලට විකුණා ගන්නත් බැහැ. යවන්න අවස්ථාව තිබෙනවා නම් අපේ ගොවි මහත්වරුන්ට වවන්න පුළුවනි. දැන් පැෂන් ෆෲට් සම්බන්ධව වුණත්, අලෙවි කරගන්න පුළුවන් නම් අපේ ගොවි මහත්වරු ඒවා වවනවා ඇති. දැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බැනට් ගුණසේකර මහතා]

විකුණාගන්න බැහැ කියනවා. නමුත් විකුණාගන්න අවස්ථාව සැලසෙනවා නම් ඕනෑ තරම් වවයි. ආණ්ඩුවේ උදව් ඕනෑත් නැහැ. වවන්න. උක් වගාව වුණත් එහෙමයි. අලෙවි කිරීමේ පහසුකම් දෙන්න ඕනෑ. ස්ථිර මිළකට ඒ නිෂ්පාදන ද්‍රව්‍ය හැම කාලෙටම අලෙවි කරගන්න පුළුවන් නම් අපේ ආසනවල උදවිය රජයේ රක්ෂා සොයන්නෙ නැහැ. එක කාලෙකට හොඳට මිළක් ලැබුණත් තවත් සමහර කාලවලට නොලැබෙන ස්ථාවර භාවයක් නැති නිසායි ඒ උදවිය රජයේ හෝ වෙනත් ස්ථිර ආයතනයක රක්ෂා බලාපොරොත්තු වෙන්නෙ.

මා ඉදිරිපත් කළ මේ අදහස් සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

පූ. භා. 10.58

**අශෝක ඩබ්ලිව්. සෝමරත්න මහතා (රත්ගම)**
**(திரு. அசோக டபிள்யு. சோமரத்ன — றத்கம)**
(Mr. Asoka W. Somaratne-Ratgama)

Mr. Chairman, I must congratulate the Hon. Minister of Trade for the excellent manner in which he has performed as a Minister during the past one year. It was with a great sense of delight that we watched his work in the revamping of the Marketing Department which had helped many areas in several ways.

Today I have particularly decided to speak a few words to bring to the notice of the Hon. Minister a few matters where our electorates, the oountry as a whole, can be helped in a great way.

The hon. Member for Minuwangoda who spoke a little earlier said a very important thing. I also would like to say a few words on the same thing. He said that some people say that passion fruit can be grown and that it can be sold, and if somebody can help us to sell whatever we produce, then there is absolutely no difficulty in producing as much as anybody wants. To quote his own words, he said "annasi". He said he can grow any amount–but where is the market ? Sometimes they buy and sometimes they do not buy.

Sir, if you look at any of our electorates you will would find that the same system is prevalent all over the country. In the case of vegetable growers, they will grow some vegetables and when the season comes–during the season–large quantities of those vegetables are available. Then because of the availability of a large quantity there is a drop in price. Therefore the incentive to grow those vegetables also will become lessened to that extent during that time, and the middleman operating further exploits the situation, which necessarily demoralizes the grower in getting into production of that particular item.

Various mechanics have been adopted in many countries to overcome such problems in agriculture. In our country also we have certain schemes. The only scheme that we have been adopting during the past few years has been the system of guaranteeing the price of any item–a guaranteed price scheme.

We had that system for paddy for many years. Anybbody producing a quantity of paddy can bring it to a certain place and sell it to the Paddy Marketing Board. There had been the guaranteed price for a bushel of paddy and they buy at that guaranteed price. But in my personal view, still the operation of the middleman in a guaranteed price scheme has not been altogether eliminated.

I produce a small quantity of paddy ; the purchasing centre is 25 miles away ; I am a villager in a remote area ; I do not have lorry transport ; I do not have other facilities to see that these commodities are taken to the centres of marketing. Then the middleman come in, collect all the small quantities of all the farmers and they in turn take them to the centres where the guaranteed price scheme operates, and thereby they still stand to benefit and the full benefit does not fall on the farmer.

If you examine some of the schemes and systems prevalent in other parts of the world, say, for example USA or Canada or the European Economic Community, you will see that where the farmers and other producers are concerned they have a specific system called the price support scheme. Now, what is this price supprot scheme ? Let us take the example of pineapple that my learned Friend gave earlier. In the case of pineapple the Government will declare a total national market quota for pineapple for 1985. Let us say that that scheme is in operation and we are going to have a price support system in Sri Lanka. The Government of Sri Lanka has taken such a decision. Then what the Government would do would be to pronounce it to the country giving a sufficient amount of publicity saying that it would 100,000 tons of pineapple for the year 1985, invite the various pineapple growers to come forward with an application for a certain quantity and then allocate a certain quota to each farmer. Now, Sir, in such a situation you might find about 20 farmers coming forward. One farmer would say that he would supply 3,000 tons of pineapple, another farmer would say that he would supply 5,000 tons of pineapple and yet another farmer would say that he would suply 6,000 tons of pineapple. Now, the 100,000 tons of pineapple will be distributed among the farmers who make their applications, depending on their credentials as to whether they are genuine growers of pineapple and they own the land and the rest of it. By such a scheme you are doing a significant thing by keeping the middleman out.

A guaranteed price scheme operates after the harvesting is completed; you come to deal with the customer when he is at your door step with the product or the commodity that he has produced. I am a cultivator of paddy. After the harvest I come to your counter with the produce and then only I will be entitled to the guaranteed price.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Now, here is a case where beforehand you meet the people who are to be growers of pineapple. You decide on them and in turn the grower also will be able to plan his crop for the next year. He is certain of what he is going to get ; he is certain of what he is going to earn. Therefore, without any interference by the middleman, with a certain sense of certainty, you can get on with the business of growing, knowing how much you are going to earn.

In the case of a guaranted price scheme you will see that the Government would find it difficult, not knowing what quantity would be brought to be sold, to decide on a proper allocation of money for the purchase of a commodity. Then there is also the difficulty of dealing with a variety of what is grown. For example, you may have pineapple, passion fruit, brinjal and a variety of other vegetables. Therefore it is difficult on an allocated budget to systematically encourage the growth of a variety of items in this country.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

**අශෝක ඩබ්ලිව්. සෝමරත්න මහතා**
**(திரு. அசோக டபிள்யு. சோமரத்ன)**
(Mr. Asoka W. Somaratne)

Now, Sir, as I mentioned earlier, this is esentially a matter of trading. People are producing as independent individuals in different parts of the country and market forces, seen and unseen, are driving them to decide on the direction that they should go ; the margin of profit that they should have ; the motivation that should be given to them without any State intervention in an effective manner. Tht is why I say that if the Hon. Minister can evolve a plan, a scheme in every electorate, bringing into effect such a concept, I am certain that it would help the growers in this country to overcome that problem in a big way.

Then we also have the question of trade in various other commodities. As an example, in my own electorate there was a certain section which was producing a very large amount of salt bags. In simple terms they are called ලුණු මලු . At one time the Salt Corporation bought them on a large scale, but then came polypropylene bags. The people said that it was cheaper. It might be cheaper than the ලුණු මලු . They also said that it saved a certain amount of wastage and therefore ලුණු මලු was effectively knocked out by the polypropylene bag in packing salt. But, Sir, ලුණු මලු are now being widely used in other areas.

Now the production of wood charcoal has come to stay in this country. Apparently, packing of wood charcoal in ලුණු මලු looks a better proposition and even packing vegetables in ලුණු මලු looks a better proposition. It may be that in some other countries where they want to pack coal or something like that, there is the possibility that ලුණු මලු can do a better job of work.

Now, if you look at the entire production units in my electorate, you will see that in little pockets, in various parts of the electorate, they produce ලුණු මලු with two machines in one place, with three machines in another place and with five machines in yet another place and so on. All of them are trying to market these products independently but the production is large when you look at the village as a whole. It may be that they can produce about 500,000 ලුණු මලු for a month if you take the electorate as a whole. The individual people who are trying to market them may be trying to market a thousand bags, two thousand bags, three thousand bags, four thousand bags and five thousand bags at a time. You will thus see that there is a lack of cohesiveness, the lack of some organisation to keep them together and some system to promote their trade necessarily hampers their production, with the result that I find that in my electorate a large number of people are thrown out of employment. That is because there is not effective manner of marketing their ලුණු මලු . It may be that if they are available there may be so many people to buy them. I checked this up with the estate sector. They say that it can be used for packing tea leaves. Similarly there are many other products in every parts of this country like handicrafts, handlooms and all manner of things. These products can be sold in two different ways. As in the period of 1977, even now sometimes we push some organisation to buy the product and it tries to find some buyer for that. A State Sector organisation buys the product and then goes on looking for a buyer. It results in certain difficulties in locating a person. There is also the question of quality control and various other factors, with the result that you end up sometimes with the State Sector organisation getting into difficulties.

Now, the proposition that I am putting forward is this. For example, district auctions can be set up by the State Sector itself for auctioning such products, with facilities for storage and then if the products are not sold they can be given back to the people. The traders can come to these auctions centres on day in the week or one day in the month and people might find them to be effective centres of trading. Let us take the Galle District. Let us say there are some people who are producing *wetakiya* products, like *wetakiya* bags, some are producing wood products. If under some trading organization a centre has been established in the Galle District where they can hand over their products to that

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අශෝක ඩබ්ලිව්. සෝමරත්න මහතා]

trading centre, with a certain commission or a percentage being kept back by the state trading sector for marketing the product, and all the products of the people are auctioned on a specific date by giving country wide publicity in a public auction, giving a floor price, you might suddenly find many traders from Colombo, Pettah etc. coming to this trading centre as a practice and possibly buying whatever they wish to buy from the trading centre it could relieve the people of a great difficulty. Sir, it has a two sided effect. On the one side, it will prevent the state sector from tying up money on useless items, storing them unnecessarily, incurring losses, having to pay money and other things, when people go to sell items saying "This quality is not proper", I am not saying bribery. Sometimes Salusala people have that problem. They take the handicrafts to the Salu Sala and when they say "This quality is not up to the standard", the matters has to be decided on the discretion of a particular individual. Therefore, Sir, all that can be avoided. The interests of the producer and interests of the State can both be looked after in an absolutely precise manner. Here the producer will find a good place to store his product and that this central organization is doing the advertising of his products, by putting an advertisement in the news papers that an auction will be held on a particular day in the Galle District for the marketing of given quantities of particular products. All traders are invited to come to that district and participate in these auctions. Thereby you will find that you might be able to give relief to a very large number of producers of various other products as well.

Now, Sir, we have to think of an organization as well. The Hon. Minister would see that he has a wonderful organization under him called the State Trading Corporation. In the 1970s, when this organization was established, it was established with a specific intention of knocking the monopoly out of any particular individual on the one side. Secondly, eleminating the middlemen in the business of trading. Thirdly, to ensure fair competition. Now, Sir, if you look at the list of items that the State Trading Corporation is importing it is only concentrating on trading in certain aspects only. Maybe it wants to reduce the price of motor spares and therefore imports large quantities of motor spares. Maybe it is importing large quantities of hardware items. In other words, it is confining itself only to a limited area of marketing and competing in a limited area, leaving a much larger hemisphere of the country out of this operation. Therefore, it is my proposal that it is better if the State Trading Corporation can have their branches in every district, fairly large warehouse under their command. Maybe an officer who takes anybody's product and if it is not being sold to return the product to the producer. If such auctions and trading centres are established, I am sure the production of the country can be increased an trading activities can be helped to a very great extent.

While talking of trading, I must also say something about cinnamon trading. In our areas large quantities of cinnamon are being produced and all being sold through agents in Colombo. If you go to some street like Bankshall Street or the Fort, you would find somebody having a small office with a telephone. All small producers do not know the international prices and how this operation is going on. Now, they come to these places in Pettah, the Fort and other places and these few individuals buy these products by putting small deals through and stand to earn millions whereas the producers is being exploited ! Therefore, Sir, it is my suggestion if you are having a compulsory auction for tea and other things that it might be better if we can examine, in the case of cinnamon and other products, to have district auctions where the producer will find it easy and convenient to go to such auctioning centres to obtain better marketing information and also to see that they get the best possible price. The trading in this country will then operate on a much better understanding which will be better for the trader himself who is a direct trader and the producer as well.

I decided to make these few comments because I am certain, Sir, having seen the Hon. Minister in action for the past one year. He has had a very practical approach to problems. I have seen many times that many things he has done, which I do not want to enumerate, had directed your entire Ministry on a practical line. That is why I decided to place these few points before this House because I am quite certain that, being a practical person, he will certainly find them to be useful suggestions.

පූ. භා. 11.19

**දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)**
**(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)**
(Mr. Dinesh Gunawardene-Maharagama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ පළමුකොටම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන ප්‍රධාන ප්‍රශ්නය තමයි, අද පවතින ජීවන වියදම් ප්‍රශ්නය. ගරු ඇමතිතුමාට ජීවන වියදම පාලනය කර ගන්නට නොහැකි තත්ත්වයන් තිබෙන පුළුවන්. නමුත් අපේ රටේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම පිළිබඳව කාලයක් තිස්සේ මතු වී තිබෙන කරුණු නැවත සිහිගැන්වීමට මම මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. අද රටේ වෙසෙන අතිමහත් ජනතාවට—බහුතරයට—ජීවත්වීම සඳහා තමන්ගේ ආහාර ද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින බව අපි කවුරුත් පිළිගන්නට ඕනෑ. හේතුව, එහි මිල ගණන් වැඩිවීමයි. ඒ නිසා මේ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම පිළිබඳව වෙළඳ අමාත්‍යාංශයේ අවධානය යොමු විය යුතුව තිබෙනවා. එම ද්‍රව්‍ය සැපයීම පමණක් තුළාට මදි. එම භාණ්ඩ මිළදී ගැනීමට හැකි මිලකට සැපයීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියලයි මා ඉල්ලන්නේ.

අපට පෙන්විය හැකි හොඳම උදාහරණයක් තමයි, නමුන්නාන්සේගේ යටතේ ඇති සමූපකාර තොග වෙළඳ ආයතනය. අපි වැඩි උදාහරණ ගන්න ඕනෑ නැහැ. මැනදී පරිප්පු මිල කෙළින්ම වැඩි කරන්නේ නැතිව, වෙනත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රමයකට එහි මිල වැඩි කර එහි බර මහජනයාගේ කර පිටට දැම්මා. වෙනද විකුණන ප්‍රමාණයට වඩා සුළු ප්‍රමාණයේ පැකට් සකස් කර ඒවා සැබෑ ප්‍රමාණයත් වෙනද විකුණන මිලට වඩා වැඩි මිලකට විකිණීම ආරම්භ කර තිබෙනවා. ගරු ඇමතිතුමා ඒ ගැන සොයා බලන්න. මම සඳහන් කළ කාරණය ගරු ඇමතිතුමාට තේරුනේ නැතිවා වාගෙයි. මම කියන්නෙ මෙයයි. පැකට්වල අසුරන ග්‍රෑම් ප්‍රමාණය අඩු කර මිලගණන වැඩි කර තිබෙනවා. ගරු ඇමතිතුමා මේ ගැන සොයා බලන්න. ඒ ක්‍රමයට මිල වැඩි කර තිබෙනවා. මෙය බොහොම දක්ෂ වෙළඳ උපායක්. වෙනද ග්‍රෑම් 500 පැකට් වික්කා. දැන් ග්‍රෑම් 500 පැකැට් විකුණන්නෙ නැහැ. ග්‍රෑම් 250 පැකට් විකුණනනවා. නමුත් ඒ ග්‍රෑම් 250 පැකට් දෙකක මිල එකතු කර බලන විට එද ග්‍රෑම් 500 පැකට් එකක් ගන්න මිලට වැඩි මිලක් දී තිබෙනවා. ගරු ඇමතිතුමාට මම මේ උදහරණය දැක්වූවේ මොකද ? මෙය බොහොම දක්ෂ වෙළඳ උපක්‍රමයක්. අපි ඒ දක්ෂ වෙළඳ උපක්‍රමය අනුගමනය කළාට කමක් නැහැ. නමුත් රටේ සාමාන්‍ය ජනතාවට ඔරොත්තු දෙන ආකාරයට මේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ගණන් වැඩිකිරීම කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු වෙන්න ඕනෑ.

මම පසුගිය අයවැය ලේඛන විවාදයේදීත්—වෙළඳ අමාත්‍යාංශයේ හා ආහාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ—මේ ප්‍රශ්නය මතු කළා. ඒ වගේම මේ ප්‍රශ්නය මම අද නැවත වරක් මතු කරනවා. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය යම්කිසි ප්‍රමාණයක් ස්ථාවර මිලකට, ගන්න පුළුවන් මිලකට, සැපයීම කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු වෙන්න ඕනෑ. මේ ළඟදී ගෞරවනීය මඩිහේ පඤ්ඤාසීහ ස්වාමීන් වහන්සේ ඉදිරිපත් කළ "Basket of good" කියන අදහස් යටතේ කිව්වෙත් එයයි. මහජනතාවට ඔවුන්ගේ ජීවිතය ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය කීපයක් මිලදී ගැනීමට හැකි මිලකට සපයන්න ඕනෑ. තමුන්නාන්සේලා ආණ්ඩුවේ විවෘත වෙළඳාම යටතේ හැම දෙයක්ම කරන්න බැරිව ඇති. එය අපට තේරෙනවා. තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්ති යටතේ කරන්න බැරිව ඇති. නමුත් මහජනයාට ජීවත්වෙන්න පුළුවන් තරමට අවශ්‍ය ප්‍රමාණයක්වත් සැපයීම සම්බන්ධයෙන් සහතික වෙන්න ඕනෑ. මන්ද ? අද මෙය මහජන ජීවිතයට හානිදයක ලෙස බලා බලපා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහ බැංකු වාර්තාවල් නැවත නැවත කියවන්න අවශ්‍ය නැහැ. මන්දපෝෂණය වැඩිවෙමින් පවතින බවක් පෙනෙනවා. සාමාන්‍ය අඩු ආදායම් ලබන්නන්ගේ පෝෂ්‍යදයක ආහාර වට්ටෝරුව පහත වැටෙන්න පටන් ගෙන තිබෙනවා. මේවා සාධක සහිතව ඔප්පුවී තිබෙනවා. ඒ නිසා මේ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියා ඉල්ලා සිටිනවා.

ඇත්තවශයෙන්ම කියනවා නම් මේ ජීවන අංකය සැකසීමේ පදනම අදට හරියන්නෙ නැති බව ගරු ඇමතිතුමාත් පිළිගන්නවා ඇති. අදට හරියන ආකාරයෙන් නොවෙයි එය සැකසී තිබෙන්නෙ. 1952 දී දැරූ පදනම අදට හරියන්නෙ නැහැ. අප විසින් එයට අන්තර්ගත කළ යුතු සංයෝගයන් රැසක් තිබෙනවා. අද එදට වඩා හුඟක් වෙනස් තත්ත්වයකුයි තිබෙන්නෙ. මහජන ජීවිතයේ විශාල වෙනස්කමක් ඇතිවී තිබෙනවා. ඒ නිසා අද තිබෙන ජීවන අංකය ඇත්තවශයෙන්ම සැබෑ ජීවන අංකයක් නොවෙයි. ඇත්ත තත්ත්වය බැලුවොත් මීට වඩා ජීවන අංකයක් තමයි පවතින්නෙ. එම නිසා මේ ජීවන අංකය වර්තමාන මිල ගණන් අනුව සැකසීමට කටයුතු කළ යුතුයි. ද්‍රව්‍ය පාලනය කිරීම පිළිබඳ මිල ගණන් ප්‍රකාශ කරන්නේ තමුන්නාන්සේ යටතේ තිබෙන දෙපාර්තමේන්තුවකින්. බොහෝවිට ඒ මිල ගණන්වලට බඩු ගන්න බැහැ. එම නිසා මා කියා සිටින්නේ ජීවන අංකය පිළිබඳ මීට වඩා සැබෑ තක්සේරුවක්, ප්‍රායෝගික තක්සේරුවක් කළ යුතු බවයි.

මීට ප්‍රථම ගරු මන්ත්‍රීතුමන්ලාත් ප්‍රකාශ කළා වාගේ මේ රටේ වෙළඳ රටාවේ තිබෙන ඒකාධිකාරී බලය පිළිබඳව මා ගරු ඇමතිතුමාගේ අවධානය නැවත යොමු කරවන්න කැමතියි. කිහිප දෙනෙකුගෙන් මේ අදහස් පළවෙලා තිබෙනවා. අපේ ගරු කර්මාන්ත ඇමතිතුමාත් මා හිතන්නේ මීට පෙර කිහිප අවස්ථාවක්ම අපේ රටේ විජාතිකයින්ගේ තිබෙන වෙළඳ අධිකාරිය පිළිබඳව සඳහන් කර තිබෙනවා. මේ වෙළඳ අධිකාරිය කඩන බවට තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙත් කිහිප වතාවක් කිව්වා. දේශීය වෙළඳ ව්‍යාපාරිකයින්ට ඒ ක්ෂේත්‍රයට ඇතුළුවීමට තිබෙන අවස්ථාව තවමත් පාලනය කරනවා. කලබල සමයෙන් පසුව පිටකොටුවේ වෙළඳ අධිකාරිය දේශීය වෙළෙන්ද විසින් පාලනය කරනවාය කියා හුඟක් අය පෙන්නුම් කළා. නමුත් සම්පූර්ණයෙන් එවැනි තත්ත්වයක් ඇතිවෙලා නැහැ. එවැනි තත්ත්වයක් ඇති නොකර අපේ රටේ බඩු හිඟය සහ මිල පාලනය කිරීම ඇති කර ගන්නට බැරි තත්ත්වයක් පවතින බව අපි පිළිගන්න ඕනෑ. එම නිසා මෙම වෙළඳ අධිකාරිය කැඩීම සඳහා වෙනදට වඩා වැඩි උනන්දුවක් ගන්නය කියා ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මෙය ඔබතුමාට තනිවම කරන්න බැහැ. බැංකුවල සහාය ඕනෑ. ඒ අකාරයේ වෙනත් ආයතනවලින් තල්ලුවක් අවශ්‍යයි. ඒවා අවශ්‍ය බව අපි පිළිගන්නවා. ඒ ආකාරයෙන් එය කෙරුණේ නැත්නම් මේ රටේ ආර්ථික රටාවේ ප්‍රයෝජනය මේ රටේ ජාතික ව්‍යාපාරිකයින්ට ගන්න අවස්ථාවක් ඇතිවෙන්නේ නැතිවා වාගේම එයින් සාමාන්‍ය පාරිභෝගිකයාටත් සහනයක් ඇතිවෙන්නේ නැහැ.

මම හොඳ උදාහරණයක් ගරු ඇමතිතුමාට පෙන්වන්නම්. සීනි නිෂ්පාදනය ගැන බලන්න. අපේ රටේ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ ගබඩාවල සීනි විශාල තොගයක් තිබියදී සීනි ආනයනය කරන්නට ඉඩදීම නිසා පසුගිය කාලයේදී විශාල සීනි අතිරික්තයක් ඇති වුණා. මේ නිසා සීනි සංයුක්ත මණ්ඩලයට ඒවා එළියට දමන්න බැරි තරම් තත්ත්වයකට සීනි මිල බැස්සා. එපමණක් නොව පෞද්ගලික ව්‍යාපාරිකයන් ඔවුන් එළඹ සිටි කොන්දේසිවලට පටහැනිව ක්‍රියා කරන්නට පටන් ගත්තා. මේ හේතුව නිසා අපේ රටේ දේශීය සීනි නිෂ්පාදනය ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයකට පත් වුණා. මේ තත්ත්වය බොහොම සැලසුම් සහගත වෙළඳ ඒකාධිකාරිය විසින් ක්‍රියාත්මක කළා. එම නිසා මේ ක්ෂේත්‍රය පිළිබඳව අපි වෙනදාට වඩා වැඩි උනන්දුවක් දක්වන්න ඕනෑ. දේශීය නිෂ්පාදනය කෙරෙහි අපි විශ්වාසයක් තබනවා නම්, අපේ රටේ ආර්ථිකයට ඒ තුළින් සහනයක් ඇති කරන්නට අපි බලාපොරොත්තු වෙනවා නම් දේශීය නිෂ්පාදකයාට දෙන ආවරණ සහ සහතික පිළිබඳව මීට වඩා උනන්දුවක් අපි දක්වන්නට ඕනෑ. ඒ වාගේම තවත් ද්‍රව්‍යයන් ගණනාවකම ඒ තත්ත්වය පවතිනවා. නමුත් මේ සියලු දේවල මූලිකත්වය පවතින්නේ අපි කොතරම් දුරට මේ විජාතික වෙළඳ ඒකාධිකාරය බිඳ දමන්නට සූදානම්ද කියන තත්ත්වය මතයි.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳවත් මා ගරු ඇමතිතුමාගේත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානය ළක් කරන්න කැමතියි. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ සැල් ගණනාවක් වසා දමන්නට ගිය අවුරුද්දේ මුල් කාලයේදී තිබුණු අදහස් අත්හැර දමා දැන් ඒ වෙළඳසැල් ප්‍රතිසංවිධානය කරගෙන යනවා. අලුත් උනන්දුවක් අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඇතිකරගෙන යනවා. නමුත් ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ගොවීන්ගේ පැත්තෙන් ප්‍රධාන ප්‍රශ්නයක් තිබෙනවා. ගොවීන් මේ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නේ බොහොම අමාරු තත්ත්වයන් යටතේයි. පොහොර ආදී සියල්ලකම මිල අධික වී තිබෙන අවස්ථාවකදියි, ඒවා නිෂ්පාදනය කරන්නේ. නමුත් ඒ ගොවීන්ගේ නිෂ්පාදන භාණ්ඩ ප්‍රශ්න කිහිපයකට ගොදුරු වී තිබෙනවා. තමන්ගේ ද්‍රව්‍ය සාධාරණ මිලකට විකුණා ගැනීමේ මාර්ගයක් නැති වී තිබෙනවා. ඒ ද්‍රව්‍ය මිලදී ගැනීමට ඉදිරිපත් වන වෙළඳුන් විසින් ඒ ගොවීන්ට හරි මිලක් නොගෙවීම නිසා බොහෝ විට ඒ ගොවීන්ට සැහෙන ආදායමක් ලබා ගන්නට බැරි වෙනවා. එමනිසා ඊළඟ වාරයේ වගා කිරීමටත් ඔවුන් තුළ තිබෙන උනන්දුව අඩු වෙනවා.

තවත් විශාල ප්‍රශ්නයක් තමයි, ගොවි නිෂ්පාදන නාස්ති වී යාම. වෙළඳුන් නියම මිලකට ගොවි ද්‍රව්‍යයන් මිලට ගන්නේ නැත්නම් ඒවා විනාශ වී යන බව අපේ ඇස්වලින්ම දැක තිබෙනවා. ලක්ෂ ගණන් වටිනා ද්‍රව්‍ය එසේ විනාශ වෙනවා. ඒ විනාශ වෙන්නේ රටේ ධනයයි. එවැනි තත්ත්වයක් ඇති වෙන්නට තවත් ප්‍රධාන හේතුවක් තමයි, ගබඩා කිරීමේ පහසුකම් සහ සුරක්ෂිත කිරීමේ පහසුකම්—ශීතකරණ පහසුකම්—නොමැතිවීම. අවශ්‍ය ස්ථානවල ශීතකරණ ගබඩා පහසුකම් ඇති කරනවා නම් මේ ද්‍රව්‍ය රැකගෙන අවශ්‍ය වේලාවට වෙළඳ පොළට නිකුත් කරන්නට පුළුවනි. මේ කාරණය සම්බන්ධව අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේත් වෙළඳ අමාත්‍යාංශයේත් විශේෂ අවධානය යොමු කරනවා නම් හොඳයි. විවිධ දේවල් නිෂ්පාදනය කර අපනයනය කරන්නය කියා තමුන්නාන්සේලා මහජනතාවට කියනවා. නමුත් ඒ ද්‍රව්‍ය රැස්කර ගබඩා කරන්නටවත් සුරක්ෂිත ලෙස තබා ගන්නටවත් පහසුකම් නැහැ. ඒ සඳහා ස්ථාවරව මෙන්ම ජංගම වශයෙන්ද විශාල ගබඩා සහ ශීතකරණ පහසුකම් අවශ්‍යයි. එවැනි වැඩපිළිවෙළක් තුළින් පාරිභෝගිකයාටත් නිෂ්පාදකයාටත් ආධාරයක් ලැබෙන අතර එමගින් අද සිදුවන විශාල නාස්තිය වළක්වා ගැනීමට පුළුවනි. විශේෂයෙන්ම වියළි ද්‍රව්‍යයන් නොව වඩා කල් තබා ගත නොහැකි ගොවි ද්‍රව්‍ය ඒ අන්දමට ගබඩා කර ගැනීමේ පහසුකම් ඇත්නම් ඒවා අපනයනය කිරීමටත් හැකියාවක් ලැබෙන බව මා පෙන්වා දෙන්නට කැමතියි. අද ඒ කිසිවක් කෙරෙන්නේ නැහැ. අද වෙළඳ ව්‍යාපාරිකයන්ගේ අතට ඒක සීමා වී තිබෙනවා. නිෂ්පාදකයාත් පාරිභෝගිකයාත් යන දෙදෙනාම අද සම්පූර්ණයෙන්ම වෙළඳුන්ගේ අණසකට යට වී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

අනික් ප්‍රශ්නය මෙයයි. මේ සම්බන්ධයෙන් පසුව මා ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. අද ආණ්ඩුවට විශාල බලපෑමක් තිබෙනවා, ළදරු කිරි පිටිවල මිල ඉහළ දමන්නය කියල. අපි මේ කාරණය ගැන නිතර නිතර මතක් කර තිබෙනවා. මෙරටට පැමිණ සිටින බහු ජාතික සමාගමක් – නෙස්ලේ සමාගම – ළදරු කිරි පිටිවල මිල ඉහළ දමන්නය කියනවා. ඒක මේ අමාත්‍යාංශයට කෙලින්ම සම්බන්ධ නොවුවත් සමහර විට තමුන්නාන්සේට සිද්ධ වේවි ඒ බලපෑමට ගොදුරු වී ළදරු කිරි පිටි වර්ගවල මිල වැඩි කරන්නට. මා ගරු ඇමතිතුමාගෙන් දැනගන්නට කැමතියි, ආණ්ඩුව එවැනි දෙයක් කරන්නට බලාපොරොත්තු වෙනවාද කියල.

අද මේ රටේ සාමාන්‍ය ජනතාවට විශේෂයෙන්ම නාගරික ජනතාවට අපි පුරුදු කර තිබෙනවා, මේ කිරි පිටි වර්ග පාවිච්චි කරන්නට. මේවායේ මිල වැඩි කරන විට භුක්ති විඳින ප්‍රමාණයත් අඩු වෙනවා. ඒක අපේ දරුවන්ගේ ජීවිතයට බලපාන දෙයක්. බහු ජාතික සමාගම්වල වුවමනාවන්ට වඩා අපි උනන්දුවක් දක්වන්නට ඕනෑ, අපේ රටේ ජනතාවගේ ආහාරයෙහි පෝෂ්‍යදායක සහ ගුණාත්මක වර්ධනය ගැන. මේක ජනතාවගේ සෞඛ්‍යයට බලපාන දෙයක්. දැන් අපි කීප වතාවකදීම මේ ප්‍රශ්නය ඇසුවා. නමුත් කිසිම කෙනෙකු පිළිතුරු දෙන්නේ නැහැ. ග්‍රාමීය කර්මාන්ත ඇමතිතුමාගෙන් ඇසුවාම, "මේ නෙස්ලේ සමාගම ඇවිත් ඉන්නේ අපට විශාල සේවයක් කරන්න, අපේ කිරි නිෂ්පාදනය වැඩි කරන්න" ආදී වශයෙන් බොහොම ලක්ෂණ උත්තර දෙනවා. නමුත් නෙස්ලේ සමාගම කියනවා කිරි පිටි මිල වැඩි කළයුතුමය කියල. අපි එය පුවත්පත්වලින් දක්කා. ඒ සම්බන්ධව ගරු ඇමතිතුමාගේ අදහස ප්‍රකාශ කරනවා නම් අපි එය ඉතා අගය කරනවා. ග්‍රාමීය කර්මාන්ත ඇමතිතුමාට නම් බොහොම හොඳට උත්තර දෙන්නට පුළුවනි. [බාධා කිරීමක්] එතුමා නමයි, දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පවත්වාගෙන යන්නේ. ග්‍රාමීය කර්මාන්ත ඇමතිතුමා නැතිව අද තමුන්නාන්සේලාට ආණ්ඩුව ගෙන යන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ ගැන අපි වෙන අවස්ථාවක සාකච්ඡාවක් කරමු. ඒකට අවස්ථාවක් එයි. මම කියන්නට ආවේ ඒක නොවෙයි.

පොලොන්නරුවේ උකුකිරි කම්හලට සිදු කරගෙන යන දේ, මේ රටේ කිරි මණ්ඩලයට සිදු වී තිබෙන දේ හා මේ රටේ කිරි කර්මාන්තයට සිදු කරගෙන යන දේ පසුගිය දිනක ත්‍රිකුණාමලේ දිසා ඇමතිතුමාත් කිව්වා. මම ඒවා නැවත කියන්නට ඕනෑ නැහැ. මම ගරු ඇමතිතුමාගේ අවධානයට ගෙනෙන්නට හදන්නේ නැව් සංස්ථාව පිළිබඳවයි. එමෙන්ම නැව් සංස්ථාව ගැන එකින් එක කරුණු කියන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මෙන්න මේ කරුණ ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙසයි, මම ඉල්ලන්නේ.

නැව් සංස්ථාව මගින් නැව් සඳහා විවිධ ආයෝජනයන් කර තිබෙනවා. සමහර ඒවා කුමන ආකාරයකින් කෙරී තිබෙනවාද කියන එක දැන් පරීක්ෂණවලින් සොයාගෙන තිබෙනවා. විශේෂයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ—කාලයකට පෙර ගරු ඇමතිතුමා සභාපති ධුරය දැරූ කාරක සභාවක්—වාර්තාවලින් නැව් සංස්ථාවේ යම් යම් උල්ලංඝණය කිරීම් ගැන පැහැදිලි කර තිබෙනවා. ඒවා ගැන අපි අවධානයක් යොමු කරන්නට ඕනෑ. මිලදී ගත්තාට පසුව බලාපොරොත්තු වූ ආකාරයෙන් ක්‍රියා කරන්නට බැරි තත්ත්වයේ සමහර නැව් මිලදී ගෙන තිබෙනවා. එමෙන්ම ඒවා මිලදී ගෙන සුළු කාලයකින් ඒවා අලුත්වැඩියා කිරීම සඳහා විශාල ධනස්කන්ධයක් වියදම් කරන්නටත් සිදු වී තිබෙනවා.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු ඇමතිතුමා නැහැයි කියනවා නම් ගරු ඇමතිතුමාට කරුණෙන් කරුණ ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් පොදු ව්‍යාපාර පිළිබඳ කරක සභාවේ වර්තා අරගෙන බැලුවොත් ගරු ඇමතිතුමාට නියම තත්ත්වය පෙනේවි. සමහර ආයෝජන පිළිබඳව පරීක්ෂණ කරන විට එම ආයතනවල සභාපතිවරු රට අත්හැර දමා ඉගිල්ලීලා යනවා. මෙන්න මෙවැනි සිද්ධි ගණනාවක් මේ නැව් සංස්ථාවට සම්බන්ධ ආයතනවල කෙරී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවට සම්බන්ධ පාලනයක් තිබෙන මුදල්, පාර්ලිමේන්තුවේ අනුමැතියක් ඇතිව ආයෝජනය කරන මහජන මුදල්, වෙනත් ආකාරයකින් වෙනත් සමාගම් පනත් යටතේ ආයෝජනය කරගෙන යනවා. මේ නිසා නැව් සංස්ථාව පිළිබඳව දැඩි පාලනයක් ඇති කර ගන්නට ඕනෑ. මා එසේ කියන්නේ විශාල මුදල් ප්‍රමාණයක් ආයෝජනය කරන්නට පටන් ගෙන තිබෙන නිසයි. [බාධා කිරීමක්] ආර්ජන්ටිනාවේ දැනට නැති සමහර සමාගම් සමගත් ගිවිසුම් ඇති කරගෙන තිබෙන බවයි, අපට දැනගන්නට ලැබී තිබෙන්නේ. ඒ සමාගම් සොයන්නත් නැහැ. සමහරවිට ආණ්ඩු පෙරළීම් සමගම ඒවාත් යන්නට ඇති. ඒකාධිපති ආණ්ඩු යටතේ තිබුණු ඒ සමාගම් අතුරුදහන් වෙලා. එවැනි සමාගම් සමගත් යම් යම් කොන්දේසිවලට ඇවිත් තිබෙනවා. නැව් සංස්ථාවේ ක්‍රියාකාරීත්වය ගැන මම කියන්නේ මෙන්න මේ නිසයි. මෙය ඉතාම වැදගත් ආයතනයක්. අපේ රටට සේවයක් සිදු කරන ආයතනයක්. අපේ රටේ බඩු අපනයනයට මෙන්ම ආනයනයටත් වැදගත් සේවයක් කරනවා. මෙය විශාල ලෙස ලාභ ලබන, කළමනාකාරීත්වයේ දියුණු අදියරකින් පවත්වා ගෙන යායුතු ආයතනයක්. ඒ නිසා මහජන මුදල් වැරදි ආයෝජනවල යෙදවීම්වලට ඉඩ තබන්නට එපා කියන එකයි මම කියන්නේ. [බාධා කිරීමක්] වැරදි ආකාරයේ ආයෝජනයක් සිදු වී නැතැයි ගරු ඇමතිතුමා බොහොම හොඳට කියනවා. මම පුද්ගලයින් ගැන මොකවත් කියන්නට යන්නේ නැහැ. හැබැයි, ඒ පිළිබඳව සොයා ගැනීම් කර තිබෙන නිසා ගරු ඇමතිතුමා කියන සම්පූර්ණ දේ පිළිගන්නට නම් මම ලැහැස්ති නැහැ.

මෙන්න මේ කාරණයත් මම ගරු ඇමතිතුමාගේ අවධානයට ගෙනෙන්නට කැමතියි. තුර්කියේදී නැව් සංස්ථාවේ නැවකින් තේ පිළිබඳ අර්බුදයක් ඇති වුණා. මම මේ කියන්නට එන්නේ ඒ අර්බුදය ගැන නොවෙයි. ඒ අවස්ථාවේ තුර්කි ආණ්ඩු විසින් එහි නාවිකයින් ගණනාවක් අත් අඩංගුවට ගත්තා. මම ගරු ඇමතිතුමාට කියන්නේ මෙයයි. නැව් සංස්ථාව ඒ පිළිබඳව පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණය අනුව සොයාගෙන ඇති, මෙහි සැබෑ කොටස්කාරයෝ කවුද කියා. ඒ සම්බන්ධයෙන් අද දුක් විඳින්නට සිදු වී තිබෙන්නේ එහි සැබෑ කොටස්කාරයින්ට නොවන බව මම ගරු ඇමතිතුමාට කියන්න කැමතියි. ලංකාවට අද ඇවිත් සිටින නැවියන් එහි හවුල්කාරයින් නොවන බවට කට උත්තර දී තිබෙනවා. ඒ ගැන පරීක්ෂණයක් කර තිබෙනවා. නමුත් ඒ අයට නැව් සංස්ථාවේ නැවකට ගොඩ වෙන්නටත්වත් නොදෙනවා පමණක් නොවෙයි, ඒ අයට ලංකාවේ නාවික බලපත්‍රය නිකුත් කිරීමේ අවසරය පවා අත්හිටුවා තිබෙනවා. ඒ නිසා මේ ගැන සොයා බලන්න. ඒ නැවියන්ට ලංකාවේ නැව්වලට ගොඩ වෙන්නට අවසරය දෙන්න බැරි නමුත් විශේෂ කීප දෙනෙකුට ඒ අවසරය දීලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් - යම් බලපෑම් ඇති. ඒ නැවේ ගිය කීප දෙනකුට පමණක් විශේෂ අවසරයක් දී තිබෙනවා. ඒ අයගෙන් සමහර දෙනෙක් නැව් සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පවා සේවය කරනවා. නමුත් ඒක වෙනම ප්‍රශ්නයක්. ඒ නාවිකයන් වෙනුවෙන් මම ඉල්ලා සිටින්නේ මෙයයි : ඒ අයට වෙනත් විදේශීය නැව්වල සේවය කිරීමට හැකි වන පරිදි අවසර පත්‍ර නිකුත් කරන හැටියට කරුණාකර අදාළ බලධාරීන්ට උපදෙස් දෙන්න. ඒ මොකද කීවොත් ඒ සම්බන්ධයෙන් පැවැත්වුණු පරීක්ෂණයේදී ඔවුන් නිරදෝෂී බව ඔප්පු වී තිබෙන නිසයි. සැබෑ වරදකරුවන් කවුදැයි සොයා ගන්න ඇමතිතුමාට පුළුවන්කම තිබෙනවා.

අපේ රටේ නාවිකයන්ට විදේශීය නාවික සමාගම් ගණනාවකටම අයත් නැව්වල සේවය කිරීමේ අවස්ථාව ලබා දීම සඳහා පසුගිය කාලයේදී අලුත් උත්සාහයක් ගෙන තිබෙනවා. එය ඉතාමත් ප්‍රශංසනීය වැයමක්. ඒ නිසා අපේ නාවිකයන් විශාල පිරිසකට හැකියාව ලැබී තිබෙනවා, යුරෝපයේ නාවික සමාගම් ගණනාවකටම අයත් නැව්වල සේවය කරන්න. නමුත් ඒ පනත් කෙටුම්පත විවාද කරන අවස්ථාවේදීත් අපි ඉල්ලා සිටියා, යම්-යම් ජාත්‍යන්තර නීති සම්ප්‍රදායයන් උල්ලංඝනය කරමින් අපේ නාවිකයන්ගෙන් අයුතු විධියට සේවය ලබා ගන්න ඒ නැව් හිමිකරුවන්ට අවකාශ ලැබෙන විධියට ගිවිසුම්වලට එළඹෙන්න එපාය කියා. එය ඉතාමත් වැදගත් දෙයක්. ඒ මොකද කීවොත් අද බොහෝ නාවිකයන්ට තමන්ට නීත්‍යානුකූලව හිමි විය යුතු ආදායම නොලැබෙන නිසයි. ඇතැම් අවස්ථාවල අපේ සමහර නාවිකයන්ට සිදු වී තිබෙනවා, තමන් මාස ගණනාවක් තිස්සේ ඉපැයූ ආදායමවත් නොලබාම ඒ නැව්වලින් දොට්ට බහින්න. එවැනි තත්ත්වයන් උදා වන්නේ ගිවිසුම්වලින් ලැබෙන ආවරණයේ දුර්වලතා නිසයි. ඒ නිසා ගරු ඇමතිතුමාගේ අවධානය ඒ ගැනත් යොමු වේයයි මම විශ්වාස කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවසාන වශයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න සිදු වී තිබෙනවා, ඉතා වැදගත් කාරණයක් සම්බන්ධයෙන්. ඒ, රක්ෂණ සංස්ථාව සම්බන්ධයෙනුයි. අපේ රටේ පමණක් නොව ලෝකයේ ඕනෑම රටක, ආර්ථික ශක්තිය ගොඩ නංවන්න පුළුවන් මාර්ගයක් තමයි, රක්ෂණ ව්‍යාපාරය. පසුගිය රජයේ ආර්ථික ප්‍රතිපත්තිය අනුව සැකැසුණු ජනසතු කිරීමේ මාර්ගය තුළින් එවකට වෙළඳ ඇමති හැටියට සිටි ටී. බී. ඉලංගරත්න මහතා රක්ෂණ ආයතනයන් ජනසතු කොට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඇති කළා. නමුත් දැන් තත්ත්වය මොකක්ද ?

ගරු මුදල් ඇමතිතුමා කියනවා, ලාභ ලබන්නේ නැති රාජ්‍ය ආයතන පිළිබඳව, ඉතා හොඳ මූල්‍ය පාලනයක් නැති රාජ්‍ය සංස්ථා පිළිබඳව වහාම සලකා බලන්න සිදු වී තිබෙනවාය කියා. ඒ එක පැත්තක්. නමුත් ලාභ ලබන, මේ රටේ ජනතාවට සේවය කරන, මහාභාණ්ඩාගාරයට හා ඒ මඟින් රාජ්‍ය ආදායමට විශාල පරිත්‍යාගයන් කරන, සමස්තයක් වශයෙන් මුළු මහත් රටටම අති විශාල සේවයක් කර තිබෙන රාජ්‍ය ආයතනයක්—ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව—පෞද්ගලික අංශයට දෙන්නේ ඇයි කියන ප්‍රශ්නයයි, මම ගරු ඇමතිතුමාගෙන් අහන්නේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කාලයක් තිස්සේම ඔප්පු කර තිබෙනවා, මේ රටේ ආර්ථික සංවර්ධනය සඳහා, රාජ්‍ය ආදායම තර කිරීම සඳහා, ඒ ආයතනය කොයි තරම් දායක වී තිබෙනවාද කියා. රාජ්‍ය ආයතන ගණනාවකම තිබෙනවා, ඒ ආයතනයේ ආයෝජන. ඒ ආයතනය—ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව—පාඩු ලබන ආයතනයක් නොවෙයි.

විශේෂයෙන් 1983 ජූලි අර්බුදකාරී අවස්ථාවේ ඇති වුණු තත්ත්වය සම්බන්ධයෙන් පවා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තමන්ගේ යුතුකම් මැනවින් ඉෂ්ට කර තිබෙනවා. ඒ නිසා ඒ අවුරුද්දේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ආදයම පහළ වැටෙන්න පුළුවනි. නමුත් හුදෙක් ඒ හේතුවම පාවිච්චි කරමින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ක්‍රියාත්මක වුණු ක්ෂේත්‍රය පෞද්ගලික අංශයට පවරා දෙන්න යනවා නම් එය කොයි තරම් බරපතල වරදක්ද ? ඇත්ත වශයෙන්ම ඒ තීරණය ගැන අපි ඉතාමත් කනගාටු වෙනවා. ඒ තීරණය නිසා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කරන සේවකයන් සේවයෙන් ඉවත් කරනු ලබන තත්ත්වයක් ඉදිරි කාලයේ දී අනිවාර්යයෙන්ම උදා වෙනවා. ඒ අතර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නිසා යම්කිසි විධියක ස්ථාවර සහතිකයන් ලැබූ හා ලබන්න සිටින ව්‍යාපාරිකයන්ට හා සාමාන්‍ය මහජනතාවටත් ඒ තත්ත්වය නැති වෙන්න පුළුවන්.

උදාහරණයක් වශයෙන් 1983 ජූලි මාසයේ ඇති වුණු කලබලකාරී තත්ත්වය ගත්තොත්—එවැන්නක් ඉදිරි කාලයේ දී ඇති නොවේවායි අපි ප්‍රාර්ථනා කරනවා—එවැනි විනාශ කිරීම් වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මෙන් වන්දි ගෙවන්න පෞද්ගලික සමාගම්වලට හැකි වන්නේ නැති බව පෙන්වා දෙන්න කැමැතියි. අද ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඉෂ්ට කරන සේවය ඉෂ්ට කරන්න කිසිම පෞද්ගලික සමාගමක් ඉදිරිපත් වන්නේ නැහැ. ඒ තත්ත්වය යටතේ ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය අනිවාර්යයෙන්ම විදේශික සමාගම් විසින් ගිල ගනු ලැබීමට පාත්‍ර වෙනවා. අද රජය ගෙන තිබෙන තීරණය, අනුගමනය කරන ක්‍රියාමාර්ගය නිසා මාවත කැපී ඇත්තේ ඒ දෙසටයි. මේ රටේ රාජ්‍ය හා දේශීය ව්‍යාපාරික අංශයේ රක්ෂණ කටයුතු පැවරී තිබුණු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එයින් ඉවත් කොට එකී රක්ෂණ ව්‍යාපාරය පෞද්ගලික අංශයට පවරනවාය කියන්නේ ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය නැවතත් විදේශීය ව්‍යාපාරිකයන්ට භාර දීමක් බව පෙන්වා දෙන්න කැමතියි. මෙය ඉතා අවාසනාවන්ත ක්‍රියාවක්. එම නිසා ගරු ඇමතිතුමාගෙන් අප ඉල්ලා සිටිනවා, මෙම ක්‍රියාවලිය අත්සිටුවීමට වැඩ කරන්නය කියා. මා දන්නා විධියට පසුගිය ජූලි අර්බුදයේදී වන්දි ඉල්ලා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ඉල්ලුම් පත් දෙදහස් දෙසීයක් පමණ ලැබුණා. එයින් සියයට අසූවකට අනූවකට පමණ වන්දි ගෙවා තිබෙනවා. මේ වාගේ විශාල ක්‍රියාවක නිරත වුණත්, ඒ වන්දි ලබන්නන් රාජ්‍ය ආයතනවලට ගෙවන්න තිබෙන රුපියල් ලක්ෂ ගණන් මුදල් තවම ගෙවා නැහැ.

මේ සම්බන්ධයෙන් එක් උදාහරණයක් දෙන්නම්. වැල්ලවත්ත රෙදි මෝල වසා දැමීමට එක් ,හේතුවක් හැටියට පාවිච්චි කරනවා, එහි ණයකරුවන් හැටියට සිටි අයගේ ව්‍යාපාර ජූලි අර්බුදයේදී ගිනිගත් නිසා ඒ අය එයට ගෙවන්නට තිබුණු රුපියල් කෝටි ගණනක මුදල ගෙවන්නට නොහැකිව ගියාය කියන කාරණය. තම ව්‍යාපාර ගිනිගත් අය ඒ සඳහා රක්ෂණ සංස්ථාවෙන් වන්දි ලබා ගෙන තිබුණත් ඔවුන් වැල්ලවත්ත රෙදි මෝලට ගෙවන්න ඇති ණය ගෙවා නැහැ. මේ ව්‍යාපාරිකයන් රක්ෂණ සංස්ථාවෙන් ගන්න පුළුවන් සියලුම වන්දි ලබා ගන්නා. තමන් විසින් රාජ්‍ය ආයතනයකට ගෙවන්නට තිබෙන කොටස නොගෙවීම හේතු කොට දැන් එම රාජ්‍ය ආයතනය වැසී යෑම නිසා එතැන සේවයේ යෙදී සිටි තුන් දහසකට පමණ රක්ෂා නැතිව අද මහා පාරට බහින්නට සිදු වී තිබෙනවා. මේක පමණක් හේතුව හැටියට කියන්නේ නැහැ. නමුත් ගෙවන්නට ඇති මුදල් ඒ ව්‍යාපාරිකයන් එම ආයතනයට ගෙව්වා නම්, මා හිතන්නේ වැල්ලවත්ත රෙදි මෝල තව කාලයක් පවත්වා ගෙන යන්නට තිබුණා. මා දන්නා හැටියට බනිජ තෙල් නීතිගත සංස්ථාවටත් මේ වගේ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමන්ට ලැබෙන්නට ඇති මුදල් නොලැබී යාමට අමතරව තවත් හේතුවක් හැටියට පෙන්වනවා, රක්ෂණ සංස්ථාවෙන් එම වන්දි ගෙවීම් හරියාකාරව නොකෙරුණාය කියන කාරණය. බොහෝ අයට රක්ෂණ සංස්ථාවෙන් වන්දි ගෙවා තිබෙනවා. නමුත් එසේ වන්දි ලබා ගත් අය රාජ්‍ය ආයතනවලට ගෙවන්නට තිබෙන මුදල් නොගෙවා මගහැර සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රක්ෂණ ව්‍යාපාරයේ විවිධ ක්ෂේත්‍ර තිබෙනවා. මේ එක් එක් අංශ ගැන මම විස්තර කරන්නට යන්නේ නැහැ. ඒ සෑම අංශයකටම අවතීර්ණ වී අවුරුදු විස්සකට වඩා කාලයක්, ඉතා සාර්ථක ලෙස රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන ඇවිත් තිබෙනවා. මෙය විසුරුවා හැරීමට දරන උත්සාහයේ පළමුවන පියවර තමයි, පෞද්ගලික ව්‍යාපාරිකයනට එයට අවතීර්ණ වෙන්නට ඉඩ දීම. එහෙම නම් අප පැහැදිලිව දැනගන්නට කැමතියි මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද යන වග. ආණ්ඩුව කියනවා, රාජ්‍ය භාණ්ඩාගාරයට බරක් වන පාඩු ලබන ආයතනයක් තිබෙනවා නම් එය පෞද්ගලික අංශයට දෙන්නට ඕනෑය කියා. එහෙම නම් මේ රක්ෂණ සංස්ථාව එවැනි තත්ත්වයකට වැටී තිබෙනවාද ? ඇත්තෙන්ම තමන්ගේ ව්‍යාපාරික ඉතිහාසේ කිසිම අවස්ථාවක එවැනි තත්ත්වයකට ඒ සංස්ථාව වැටී නැහැ. එහෙම නම් මෙම ආයතනය ඉෂ්ට කරන සේවාව හදිසියේම පෞද්ගලික ව්‍යාපාරිකයන් කීප දෙනෙකු අතට පවරා දීමට වැඩ කටයුතු කර ගෙන යන්නේ මන්ද ? මෙම ප්‍රශ්නය අපි නැගුවේ, අපේ රටේ රක්ෂණ ව්‍යාපාරය ඉදිරි කාලයේදී නැවත වරක් විදේශීන්ගේ අතට පවරන්නට ඉඩ ඇති නිසයි. ඒ සම්බන්ධයෙන් මෙයට අමතරව කරුණු ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ගරු ඇමතිතුමාගේ අවධානය තවත් එක් කරුණක් කෙරෙහි යොමු කරවන්නට මා බලාපොරොත්තු වෙනවා. මට ලැබී ඇති මේ ලිපි සියල්ලම කියවීමෙන් අර්ථයක් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ අභ්‍යන්තරයේ මූල්‍යමය වශයෙන් විශාල නාස්තියක් සිද්ධ වෙගෙන යනවා. එතුමාට අවශ්‍ය නම් ඒ සම්බන්ධව ලිඛිතව කරුණු ඉදිරිපත් කරන්නට පුළුවනි. ඒවා මේ සභාවේදී කියවන්නට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මා හිතන හැටියට විශේෂයෙන්ම මුදල් සම්බන්ධයෙන් දැනට වඩා දැඩි පාලනයක්, පවත්වා ගෙන යන්න ඕනෑ. මෙම ආයතනය ජාත්‍යන්තර ගණුදෙනු ගණනාවක්ම පවත්වාගෙන යනවා. යම් යම් නිලධාරීන් ගිහින් ඒ සමාගම් සමග සාකච්ඡා කර ජාත්‍යන්තර ගණුදෙනුවලින් ලැබෙන්නට ඇති එම මුදල් පිටරටවලදීම නාස්ති කර දමා එනවා. ඒවාත් මේ ආයතනයට ලැබෙන්නට තිබෙන ආදයම්. මෙන්න මේ වාගේ සිද්ධීන් ගණනාවක්ම තිබෙනවා. ඒවා ගැන සොයා බලා නිසි අන්දමට ක්‍රියා කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

වෙළඳ ප්‍රතිපත්ති අතින්, වෙළඳ ද්‍රව්‍ය මිලදී ගැනීම අතින් එතුමාගේ අමාත්‍යාංශය යටතේ ඇති "එක්ස්පෝට් ඩිවලප්මන්ට් බෝර්ඩ්" එක කුමන ආකාරයට තම කටයුතුවලට අවතීර්ණ වනවාද කියන කාරණය, ප්‍රශ්නයක් හැටියට එතුමාගෙන් අහන්නට කැමතියි. මන්ද, එම ආයතනය විවිධ ක්ෂේත්‍රවලට අද අවතීර්ණ වෙලා, ආයෝජනය කරනවා. ව්‍යාපාරිකයන්ට එම ආයතනය මඟින් යම් යම් සහනයන් ගන්නට බැහැ. නමුත් එම ආයතනය මේ රටේ වෙනත් ක්ෂේත්‍රවල ආයෝජනය කරන්නට පටන් ගෙන තිබෙනවා. විශේෂයෙන් චිත්‍රපට කර්මාන්තයෙහි ආයෝජනය කරන්නට පටන් ගෙන තිබෙනවා. මෙය ඉදිරියට ඔබතුමාට ලොකු ප්‍රශ්නයක් වෙනවා. මේ ආයතනයටත් එය ලොකු ප්‍රශ්නයක් වෙනවා. මේ ආයතනය චිත්‍රපට කර්මාන්තයෙහි ආයෝජනය කරන්නට පටන් ගත්තාම චිත්‍රපට කර්මාන්තකරුවන් වැල නොකැඩී එතැනට එන්නට පුළුවන්. මේ වගේ තීරණ ගන්නේ කුමක් නිසාද කියන ප්‍රශ්නය අපි අහන්නට ඕනෑ. ඊට වඩා වෙනත් වැදගත් ක්ෂේත්‍ර සඳහා උපයෝගී කර ගැනීමටයි, මෙම ආයතනය ආරම්භ කළේ. මෙම ආයතනය තමන්ගේ කාර්යයන්වලදී නිවැරදිව ප්‍රමුඛත්වය දෙන්නට ඕනෑ කුමන ක්ෂේත්‍රයටද කියන එක ගැන කල්පනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මන්ද, සීමාසහිත ආයෝජනයක් කරන්නට හැකියාව තිබෙද්දී මේ රටේ වෙනත් නිෂ්පාදන ක්ෂේත්‍රවල එම ආයෝජනයන් කරන්නට යෑම ගැන – චිත්‍රපට කර්මාන්තය වගේ දේවල විශාල ආයෝජනයක් කිරීම ගැන – සොයා බලන්නටය කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අපේ රටේ ජනතාවගේ පැත්තෙන් මේ රටේ ද්‍රව්‍ය සැපයීම අද විශාල අර්බුදයකට මුහුණ පා තිබෙනවා. ඔබතුමාගේ ප්‍රතිපත්ති යටතේත්, සමූපකාර තොග වෙළඳ ආයතනයෙන් පෞද්ගලික වෙළඳුන්ට පෙරවරු කාලයේ, යම් යම් ද්‍රව්‍යයන් නිකුත් කර ලීමට අවසර දී තිබෙනවා. තමුන්නාන්සේ ඒ ගැන සොයා බලනවා නම් හොඳයි. පෙරවරුවේ පැය කීපයක් තුළ පෞද්ගලික වෙළෙන්දන්ට යම් යම් ද්‍රව්‍යයන් ගන්නට පුළුවන්. නමුත් ඒවා යන්නේ ඒ අයගේ කඩවලට නොවෙයි. පෞද්ගලික වෙළෙන්දන් ඒ ද්‍රව්‍යයන් අරගෙන පැය කීපයකට පස්සේ වැඩි මිළට තොග වශයෙන් විකුණනවා. ඒ සඳහා අවශ්‍ය ලියකියවිලි මම තමුන්නාන්සේට දෙන්නම්. මේ තීරණය ගෙන තිබෙන්නේ යම්කිසි මුදල් ප්‍රමාණයක වටිනාකමට ලියාපදිංචි වුණු පෞද්ගලික වෙළඳුන් කීප දෙනෙකුට ද්‍රව්‍යයක් ලබා ගන්නට පුළුවන් විදියටයි. ඒ අය විසින් පැය කීපයක් ඇතුළතදී ඒ ද්‍රව්‍යයන් වැඩි මිළකට තොග ගණනේ නැවත විකුණනවා. එම නිසා සුළු, වෙළෙන්දන්ට නොවෙයි, මෙයින් සහනයක් වෙලා තිබෙන්නේ. සුළු වෙළෙන්දන්ට මේ විධියේ සහනයක් දුන්නොත් සමූපකාර තොග වෙළඳ ආයතනයට ද්‍රව්‍ය සැපයීමේදී යම් යම් මිළ ගණන් මීට වඩා පාලනය කර ගන්නට පුළුවන් තත්ත්වයකට එනවා. මේවා නිකුත් වන්නේ සුළු වෙළඳුන්ට නොවෙයි. මැද වෙළඳුන්ටයි. ඔවුන් විසින් වෙළඳ ව්‍යාපාරයක් නොවෙයි කරන්නේ. වැඩි සහනදායක ලෙස ගන්නට පුළුවන් බඩු ප්‍රමාණය අරගෙන පැයක් දෙකක් ඇතුළතදී විශාල මිළකට නැවත වෙළඳුන්ට විකුණනවා. මේ ගැන සොයා බලන්න ඕනෑ.

**එම්. එස්. අමරසිරි මහතා**
**(திரு. எம். எஸ். அமரசிறி)**
(Mr. M. S. Amarasiri)

අපි ඒක කරන්නේ උප දිසාපති වාර්තා අනුවයි.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

මම ඒ උප දිසාපති වාර්තා ගැන මොනවාවත් කියන්නේ නැහැ. වාර්තාවත් ගන්නට පුළුවන් හුඟක් ක්‍රම තිබෙනවා. ඒ ක්‍රමය ගැන නොවෙයි, මම කියන්නේ. මේ සිද්ධ වෙන්නේ මොකක්ද කියලා බලන්න කියලයි මම කියන්නේ. සමූපකාර තොග වෙළඳ ආයතනයේම නිලධාරීන් කීප දෙනෙකු යවලා එතැනදීම සිදු වන ගනුදෙනු පිළිබඳව සොයා බලන්නටය කියා මම ඉල්ලා සිටිනවා. රටේ මහජනතාව පරිභෝග කරන ද්‍රව්‍යවල මිළ ගණන්වලට ඒක බලපාන අන්දම එතැනදී අපට පැහැදිලිව පේනවා. එම නිසා ඒ ගැන සොයා බලන ලෙස ඉල්ලා සිටිනවා. මහජනයාට අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණයන් මිළ දී ගන්නට පුළුවන් තත්ත්වයකට සෑහෙන ප්‍රමාණයකට මිලෙහි අඩු කිරීමක් කරන ලෙස ඉල්ලමින් මම නිහඬ වෙනවා.

පූ. භා. 11.52

**පී. එස්. එල්. ගලප්පත්ති මහතා** (දෙවිනුවර)
**(திரு. பீ. எஸ். எல். கலப்பத்தி — தெவிநுவர)**
(Mr. P. S. L. Galappatthy–Devinuwara)

ගරු සභාපතිතුමනි, වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ව්‍යාපාරිකයෙකු වශයෙන් වචන කීපයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන් තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා.

මහපොළ ශිෂ්‍යත්ව සංකල්පය ගැන හිටපු වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාටත්, එද නියෝජ්‍ය අමාත්‍යව සිට අද වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍ය ධූරය උසුලන තමුන්නාන්සේටත් මගේ ගෞරවය මේ අවස්ථාවේදී පුද කළ යුතුයි. ජනතාවගේ අභිවෘද්ධිය සඳහා ගරු ඇමතිතුමා වෙළඳ ක්ෂේත්‍රය ගෙන යන ආකාරය මේ අවස්ථාවේදී ප්‍රකාශ වුණා. 1983 ජූලි මාසයේ දී ඇති වුණු කරදර කාලයේදී හිටපු වෙළඳ ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත් දින දෙක-තුනක් ඇතුළතදී ජනතාවගේ අසහනකාරී තත්ත්වය දුරු කරමින් ලංකාවේ කිසිම තැනක ආහාර හිඟයක් ඇති නොවන අන්දමට කටයුතු කළ හැටි මම මගේ ඇස් දෙකෙන්ම දැක්කා. ඒ ගැන අපි බොහෝම සන්තෝෂ වෙනවා. ඒ ගෞරවය හැමදම ආරක්ෂා කරගැනීමේ වගකීම දැන් සිටින වෙළඳ ඇමතිතුමාටත්, එතුමාගේ නියෝජ්‍ය ඇමතිතුමාටත් භාර වී තිබෙනවා.

විශේෂයෙන්ම සඳහන් කළ යුතුව තිබෙන්නේ මේ කාරණයයි. වෙළඳ ක්ෂේත්‍රයේ එක්තරා දියුණුවක් ඇති වෙමින් පවතින මේ අවධියේ ක්‍රමවත් සැලැස්මක් නැති නිසා දේශීය නිෂ්පාදකයන් අසහනකාරී තත්ත්වයකට පත් වී සිටින බව දැන් ගරු මන්ත්‍රීවරු කීපපොලක්ම සඳහන් කළා. ව්‍යාපාරවලට සම්බන්ධ පුද්ගලයෙකු වශයෙන් මම ඇත්ත වශයෙන්ම එය අනුමත කරනවා. එහෙම නම් අපි ඒ සම්බන්ධයෙන් කරන්න ඕනෑ මොකක්ද කියන කාරණය ගැන මේ අවස්ථාවේදී තීරණයක් ගන්න ඕනෑ. කර්මාන්ත හා වෙළඳ ක්ෂේත්‍රය ක්‍රමවත් කිරීමට නම් ගරු ඇමතිතුමාගේ කාරුණික අවධානය යොමු වී එය විමධ්‍යගත කළ යුතු බවයි, මගේ විශේෂ හැඟීම. ගමේ ව්‍යාපාරිකයන් ගම් මට්ටමින් ඒකරාශී කොට ව්‍යාපාර හා කර්මාන්ත සඳහා ඒ පුද්ගලයන්ට දිය හැකි උපරිම සහයෝගය හා ආධාරය ලබා දෙන අතර ඒ අයගේ සිතුම්-පැතුම් අනුව දේශීය සම්පත්වලින් ලබාගන්නට පුළුවන් උපරිම සේවය ලබා ගැනීම සඳහා ක්‍රමවත් සැලැස්මක් ඇති කර සාකච්ඡා මාර්ගයෙන් කරුණු අවබෝධ කරගෙන කටයුතු කරතොත් මේ අංශවල මීට වඩා දියුණුවක් ඇති කරන්න පුළුවන් බව මම මේ ගරු සභාවේදී සඳහන් කරන්න ඕනෑ.

මේ අංශ මෙසේ විමධ්‍යගත කරන්න ඕනෑයයි මම කියන්නේ ඇයි ? මා හිතන හැටියට අතීතයේදී ශ්‍රී ලංකාවේ වෙළඳ හා කර්මාන්ත ක්ෂේත්‍රයේ තුන් ලක්ෂයක පමණ ජනතාවක් සිටියා. 1977 දී ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්ගේ නායකත්වයෙන් පිහිටවූ එක්සත් ජාතික පක්ෂ රජයේ ක්‍රියාදාමය යටතේ දැන් කර්මාන්ත හා වෙළඳ ක්ෂේත්‍රයේ පත් ලක්ෂයක් පමණ දෙනා නිරත වී සිටිනවා. ජනගහනය අනුව එය පත් ලක්ෂයක් වුවත් ඒ මඟින් ලැබී තිබෙන රැකිරක්ෂා අනුව ගණන් බලන විට තවත් දශ ලක්ෂයක් පමණ දෙනා ඊට එකතු වෙනවා. එහෙම නම් ඒ අයගේ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රමවත් සැලැස්මක් සකස් කර දීම අපේ යුතුකමක්. ඒ තයින් ක්‍රියා කළොත් මේ වැඩ පිළිවෙළ විධිමත් වෙනවා. එසේ නැත්නම් මේ තිබෙන සූරාකෑම කවදාවත් නැති නොවන බව අපි කල්පනා කරන්න ඕනෑ.

මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටින්නේ මෙයයි. ගම් මට්ටමින් මෙය විමධ්‍යගත කිරීම සඳහා නියම විධියේ සැලැස්මක් සකස් කරන්න. ඊට සහයෝගය දීමට වෙළඳ මන්ත්‍රණ සභාවන් බැඳී සිටිනවා යයි මම විශ්වාස කරනවා. වෙළඳ මන්ත්‍රණ සභාවේ සහයෝගයත් ලබාගෙන ගම් මට්ටමට ගොස් ආසන මට්ටමෙන් ක්‍රමානුකූල සැලැස්මක් දියත් කළොත් ඉතා සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්. විශේෂයෙන්ම උද්ධමනකාරී තත්ත්වයක් පවතින මේ අවස්ථාවේදී මෙවැනි වැඩ පිළිවෙළක් ඉතාම වැදගත් වෙනවා.

අහිංසක ව්‍යාපාරිකයන් චෝදනාවට ලක් කරන පුවත් මේ ඊයේ පෙරේදා පත්තරයක පළ වී තිබෙනවා මම දැක්කා. ව්‍යාපාරිකයන්ට චෝදනා කරමින් ඔවුන් මහා දමරිකයන් වශයෙන් නැත්නම් ත්‍රස්තවාදීන් වශයෙන් පෙන්නීමට මේ පත්තර කටයුතු කරන බව මම දැක තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ තත්ත්වය දැක්කාම බොහෝම කනගාටුයි. නියම තත්ත්වය හරිහැටි නොදන්නා නිසායි ඒ පත්තරකාරයන් ඒ විධියට කරුණු පළ කරන්නේ. කෙසේ වෙතත් ගරු ඇමතිතුමා මා සඳහන් කළ අන්දමේ සියුම් සැලැස්මක් සකස් කළොත් යථා කාලයේදී මේ තත්ත්වය වෙනස් වෙයි.

ඇයි මම එහෙම කියන්නේ ? ගමේ සම්පත්වලින් ගම් මට්ටමෙන් සකස් කෙරෙන කර්මාන්ත තිබෙනවා. මම මීට එක් උදාහරණයක් කියන්නම්. ගරු ඇමතිතුමා පසුගිය දවස්වල මාතර ගියා. මම ඒ අවස්ථාවේදීත් එතුමාට මේ කාරණය ප්‍රකාශ කළා. ධීවර කර්මාන්ත ක්ෂේත්‍රයේ එක්තරා දියුණුවක් පවතින මේ යුගයේදී දෙවිනුවර ආසනයේ ජනතාවගේ උනන්දුව තුළින් උම්බලකඩ මෙට්‍රික් ටොන් දහක් පමණ නිපදවන්නට මට පුළුවන් වුණා. මම මේ ගැන බොහෝම ආඩම්බර වෙනවා. මෙහෙම කළොත් ඒ ඒ අංශවලින් රට ස්වයංපෝෂිත වෙනවා. විදේශවලට යන මුදල් දසලක්ෂ හැටක් පමණ ඉතිරි කර ගන්නට ඒ මඟින් මට පුළුවන්කම ලැබුණා. එහෙම නම් අපි ඒ කාර්මිකයන්ට ධෛර්ය දෙන්නට ඕනෑ. ඒ සඳහා පාරිභෝගිකයාට අසහනකාරී තත්ත්වයක් ඇති නොවන අන්දමින් උම්බලකඩ පිටරටින් ගෙන්නීම හැකිතාක් දුරට සීමා කිරීම ගැන ගරු ඇමතිතුමාගේ වගකීමක් බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මතක් කරන්න ඕනෑ. කාර්මිකයා ධෛර්යවත් වන්නේ එහෙම වුණොත් පමණයි. උට්ඨාණ වීර්යයෙන් ස්වශක්තියෙන් මේ රට ස්වයංපෝෂිත කිරීමට ව්‍යාපාරිකයා ක්‍රියා කරන්නේ එවිටයි.

ඒ එක්කම මම තවත් එක් කාරණයක් තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටින්නට කැමතියි. තමුන්නාන්සේ පිටරටින් මේ රටට අර්තාපල් ගෙන්වීමත් සීමා කරන බව මට දැන ගන්නට ලැබුණා. ඒ වාගේම මේ රට දේශීය සම්පත්වලින්, නිෂ්පාදනවලින් ස්වයංපෝෂිත කරන්නට ඕනෑ නම්, දේශීය නිෂ්පාදකයාට තැන දෙන්නට ඕනෑ නම් ධීවර කර්මාන්තය අතින් ස්වයංපෝෂණය වන මේ අවස්ථාවේදී – කරවල කෑල්ලක් නොකෑවාට මිනිහෙක් මැරෙන්නේ නැහැ – ඒ පිළිබඳව අවධානය යොමු කර මෙරටට කරවල ගෙන්වීමත් හැකි තරම් දුරට සීමා කිරීමට කටයුතු කරන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. දේශීය නිෂ්පාදනයන්ගෙන් ලංකාව බොහෝ දුරට ස්වයංපෝෂිත වන මේ අවස්ථාවේදී මේ ක්‍රියාදාමයන් අනුගමනය කළොත් එය මේ රටේ නිෂ්පාදකයිනට විශාල රුකුලක් වන බව ලංකාවේ ව්‍යාපාරිකයෙකු වශයෙන් මම තමුන්නාන්සේට කියන්නට කැමතියි. එසේ කළහොත් ගරු කර්මාන්ත ඇමතිතුමාත්, වෙළඳ ඇමතිතුමාත් අතිකුත් ගරු ඇමතිතුමන්ලාත් මේ රට සංවර්ධනය කිරීම සඳහා ගන්නා උත්සාහයන්ට ලංකාවාසී ජනතාව දෙන සහයෝගය තුළින් මේ රට ස්වයංපෝෂිත කර ජනතාවගේ අභිවෘද්ධිය සැලසීමට තමුන්නාන්සේලාටත් අපටත් හැකි වෙනවා වගේම තමුන්නාන්සේලාගේ මාර්ගයෙන් ජනතා ප්‍රසාදය දිනා ගැනීමට අපටත් පුළුවන් වෙන බව මේ අවස්ථාවේදී සන්තෝෂයෙන් මතක් කරමින් මගේ වචන ස්වල්පය නතර කරනවා. ස්තුතියි.

අ. භා. 12.01

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා (ඇහැලියගොඩ)**

**(கலாநிதி விமல் விக்ரமசிங்ஹ—எஹெலியகொட)**

**(Dr. Wimal Wickremasinghe – Eheliyagoda)**

Mr. Deputy Chairman, whilst congratulating the Hon. Minister of Trade & Shipping and the Deputy Minister of Trade & Shipping on the new roles that they are called upon to play in the sphere of trade and shipping, I must place on record the excellent work that has been done by the Hon. Minister Athulath Mudali during his tenure of office.

Of course, the Hon. Minister of Trade & Shipping is hailed as a person from the Galle District. I do not want to consider him as a parochial figure. He is a national figure and he is liked by everybody, and I think he will deliver the goods in terms of national priorities.

At this time I wish to say a few words about the excellent work done by Hon. Athulath Mudali. His work was commended by everybody, both friend and foe, and in fact he has brought in an array of innovations into the sphere of trade and shipping, apart from launching a new and liberal trade policy that eliminated distortions both in the trade and production sectors. He has been able to rationalise the tariff structure. He has also been able to update all commercial law by way of introduction of a new Companies Act, the Consumer Protection Act, and the Consumer Credit Act. He has even introduced a new patents and trade marks law, the Code of Intellectual Property Act, and in fact he has created a number of new institutions for the promotion of export in Sri Lanka such as the Export Development Board and the Sri Lanka Export Credit Insurance Corporation. In addition, he has established the Trade & Shipping Information Service and the National Insurance Corporation which now works in collaboration with the private sector. Furthermore, he has established a number of subsidiaries such as the Sathosa Printers Ltd., Sathosa Motors Ltd., Sathosa Computer Services Ltd., Lanka Milk Food (CWW) Ltd., and Lanka Canneries Ltd.

I know that the Ministry of Trade & Shipping is about to convert the National Prices Commission into a Fair Trade Practices Commission, and there are innovations by the Ministry such as the Export Production Villages, Exporters' Forum, Mahapola Scholarships, and Mahapola Fairs.

At this time I would also wish to say something about a proposal that was made by me during the course of my speech on the budget *per se*. In fact I proposed the establishment of an Export Development Bank. This proposal was originally made at the meeting of the Consultative Committee on Finance and Planning and I have already brought it to the notice of the Consultative Committee on Trade & Shipping as well. What I suggested was that the Government establish an Export Development Bank either as a subsidiary or as an independent organization to cater exclusively to the requirements of the exporter community in Sri Lanka. As all hon. Members are aware, the commercial banks are reluctant to finance the export sector. Perhaps financing the import sector may be more remunerative, and the export sector has been neglected to a certain extent.

As I indicated earlier, many persons have argued that we "export or perish". But much has not been done for the purpose of promotion of exports. In regard to the Export Development Bank, I think there were some constraints that were enumerated, one of which was finance.

As hon. Members are aware, the Hon. Minister of Finance and Planning is now drawing about Rs. 1,650 million from the Central Bank by way of profits to the Treasury, perhaps in order to bridge the gap in the Budget. But he should obviously be able to procure about Rs. 500 million for the establishment of this new Bank, because we have noticed that the level of credit that has been given to the export sector, in terms of the total credit that has been given to the economy, is disastrously low, and even the level of interest that is charged by the commercial banks makes the export uncompetitive in international trade. Therefore, I would earnestly request the Hon. Minister of Trade & Shipping to consider the establishment of an Export Development Bank, in collaboration with the Ministries of Finance and Planning and even Industries and see that this proposal is made a reality.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා]

Commenting on the National Export Development Plan that has now been launched by the Export Development Board, I should say that there is a target. Perhaps that target is called the minimum required growth tate of 10.94 per cent. An average annual export growth of 10.94 per cent or 11 per cent is expected in ordr to ensure availability of imports at a reasonable level. Apart from that the Export Development Board is planning an investment of Rs. 12 billion–40 per cent from the public sector, 35 per cent from the private sector and 25 per cent from foreign investments. If we are to achieve such targets, facilitation of finance to the export sector is a prerequisite. That is why I have emphasized this point. The progress report that has been presented to us today, says :

"An Advisory Committee on the National Export Development Plan was also established to co-ordinate the work of the Sectoral Task Forces as well as monitor export policy and finance."

I know that the Export Development Plan is in force but there is no monitoring that has been done. I would request the Hon. Minister to keep us informed of the details of the progress of this Export Development Plan. Otherwise, as other plans that have been put forward, it might not become workable in the longrun.

In fact, many hon. Members spoke on the encouragement of exports at the production level. Therefore, as I have already suggested, I would once again request the introduction of a LC system for the facilitation of production at the grassroot level. Export is possible only if production is available and, therefore, it is necessary for the Ministry of Trade and shipping, in collaboration with the Central Bank and the Ministry of Finance and Planning, to work out a domestic letter of credit system by which not only the exporter, but even the producer is able to obtain or procure finance at a concessionary rate of interest from the commercial bank because under this scheme even the producer who is the beneficiary of a letter of credit that is open in his favour by the exporter in Sri Lanka might be able to obtain more finance.

The concept of export promotion villages is an excellent idea. In fact many such export promotion villages have come into operation. Therefore, We would request the Hon. Minister to apprise us with more details regarding the operation of export promotion villages. Even in my electorate I propose to start three export promotion villages. One for the export of betel leaf is already in operation although it has not been officially opened. I propose to start a block rubber export village, and another for the export of spices in my electorate.

I would like to make a few suggestions at this moment to the Hon. Minister. Firstly, I would suggest the introduction of a Commercial Code in Sri Lanka. Yesterday when the Votes of the Ministry of Justice were taken up I referred to this proposal and argued for the establishment of a Commercial Code in Sri Lanka. This proposal is now being looked into by the Consultative Committee on Finance and Planning. I presume that the Hon. Minister of Trade and Shipping would also explore the possibility of helping the Government to establish a Commercial Code because there are many trade matters which have to be taken into consideration in the establishment of a Commercial Code.

The Hon. Minister is aware that I functioned under him and the Hon. Minister of National Security as Chariman of the Sri Lanka Export Credit Insurance Corporation. I am glad that the SLECIC is working well. I would wish at this moment to make a few proposals which I had in mind at the time I reverted back to the Central Bank.

The first proposal is the introduction of a Domestic Credit Insurance Scheme. Many hon. Members of this House spoke for the equitable distribution of goods in the economy. I suggest that a Domestic Credit Insurance Scheme be devised by SLECIC and I hope the Hon. Minister will look into this matter.

The other schemes I would like to propose for operation by SLECIC are, an insurance scheme for employment abroad, an insurance scheme for the repair of vessels in Colombo Port, gurantee facility for medium and long term finance, operation of an export re-finance scheme for deferred payment in collaboration with ESCAP, provision of all types of gurantee facilities to FCBUs, provision of gurnatee facilities to local companies through commercial banks for construction and engineering projects in Sri Lanka, such as the Mahaweli project undertaking which is financed by foreign governments and foreign companies.

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා (නියෝජ්‍ය කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)

(திரு. என். டென்சில் பெர்ணண்டோ — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் பிரதி அமைச்சர்)

(Mr. N. Denzil Fernando Deputy Minister of Industries & Scientific Affairs)

What about interest rates ?

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා**
**(கலாநிதி விமல் விக்ரமசிங்ஹ)**
**(Dr. Wimal Wickremasinghe)**

Obviously, that is why I have argued the case for an Export Development Bank because the level of interest rates in Sri Lanka is very high. We have examined this matter. When gurantee facilities are made available by the SLECIC or any other organization, it is possible for any exporter or any other client to obtain finance at the concessionary rate of interest. I would even suggest the provision of gurantee facilities for the purpose of leasing or hiring machinery and equipment to export-oriented projects.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Then the other is a new bank financing scheme for gem miners. In fact I was about to launch a scheme for the gem miners who are now being exploited by the middlemen, and this scheme was to be developed in collaboration with the People's Bank, the Bank of Ceylon and the State Gem Corporation. I do not think that this scheme came into operation. I would request the Hon. Minister to look into this matter. In addition, finance facilities should be made available for *geuda* treatment and for the lapidary industry. The Hon. Minister will appreciate that if we develop *geuda* treatment and the lapidary industry in Sri Lanka, there is potential employment for at least 50,000 people. This is a matter that should be considered seriously because much foreign exchange is being drained out of the country by Thaisand others. If we help *geuda* treatment and the lapidary industry, we should be able to conserve a fair amount of foreign exchange.

In regard to some organizations like the CWE, I must say that their performance has been very satisfactory but the Hon. Minister should note that there is no shortage of lentils or masoor dhal, dry fish and onions which are crucial to our day-to-day living. I would also suggest that Consolexpo develop a more effective selling campaign by exploring markets. I am thankful to the Hon. Minister for endeavouring to re-organize the activities of the Marketing Department.

There is also good potential in Sri Lanka for ship-breaking. The hon. Member who will follow me will perhaps elucidate the point that ship-breaking would also be a profitable industry. The hon. Member for Maharagama (Mr. Dinesh Gunawardena) referred to monopoly practices that now exist in the trade. I am happy that the Ministry of Trade and Shipping is about to introduce a Fair Trade Practices Commission which would certainly, I presume, control monopolies, mergers and anti-competitive practices.

Lastly, I would like to speak a few words on the issue of the privatisation of insurance. The hon. Member for Akmeemana (Mr. Richard Pathirana) said that the policy of the Government is to transfer public sector organizations to the private sector. Of course, there are arguments for and against the privatisation of insurance. There are many groups which are against this. For example, the unions in the ICSL and the NIC are aginst the privatisation of insurance. I presume the National Chamber of Commerce has also vehemently argued against the privatisation of insurance. On the other hand, principal agents, except perhaps Acland Finance and Investments Limited have argued for the case privatisation of insuranc. In this sphere, I would urge the Ministry to think of introducing a new Control of Insurance Act. There is no such thing at the moment and even the office of the Controller of Insurance has to be re-organized. In many countries, the Controller of Insurance is a technical person who is primarily preoccupied with the insurance business. If privatisation takes place, there is the possibility of a number of companies mushrooming and it would ultimately bring about disastrous results.

If you are to consider the matter further, you may think of a Re-insurance Corporation which will re-insurance business in the field of insurance in Sri Lanka. I would ask the the Hon. Minister not to rush into this matter because it is a matter that has caused concern in many circles. There are now pressure groups operating everywhere who want to see that the private sector is given a fair slice of the business.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பொர்ளுண்டோ)**
(Mr. N. Denzil Fernando)

The hon. Member is now arguing against Government policy. The Government has already decided on this.

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා**
**(கலாநிதி விமல் விக்ரமசிங்ஹ)**
(Dr. Wimal Wickremasinghe)

No, it is not so. The Government may have decided. But I am referring to the implementation. That is more important. It is not the policy that ultimately brings in results, it is the implementation. Privatization can be done, but how it should be done is more important than what you are trying to say.–(*Interruption*)–Obviously if insurance has been–

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා**
**(திரு. என். டென்சில் பொர்ளுண்டோ)**
(Mr. N. Denzil Fernando)

You spoke about *uberrima fide* contracts. The latest Companies Act presented by Hon. Lalith Athulathmudali, the present Minister of National Security contains most of those provisions that are necessary. They provide for *uberrima fides* contracts. That is insurance.

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා**
**(கலாநிதி விமல் விக்ரமசிங்ஹ)**
(Dr. Wimal Wickremasinghe)

All right, but I do not know what you are trying to drive at but I think your remarks do not fall within the scope of the subject which I am now dealing with in my speech. That is all I wish to say about this matter.

Of course, there have not been innovations in the insurance field because this monopoly was enjoyed by the NIC and ICSL. Of course if it is privatized there is the possibility that innovations would come into the picture. There is no campaign for life insurance policy in Sri Lanka at the moment. The campaign is very, very unsatisfactory. Certainly if there is competition between the two, the private sector and the Government

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා]

sector, I am sure that more innovations would be brought into the field of insurance. That is why I wish to say that there are arguments for and against it. Obviously the Cabinet Ministers has taken a decision to consider the issue of privatization, but it has not demarcated the lines on which it should be done. So I wish to say something about it.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order, please! Hon. Member, there are so many other hon. Members who would like to participate in the Debate.

**ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා**
**(கலாநிதி விமல் விக்ரமசிங்ஹ)**
(Dr. Wimal Wickremasinghe)

Sir, I would take only about five minutes more.

The hon. Member for Attanagalla once argued for revaluation and again argued the case for a dual exchange rate. He knows that when he was in the previous government the Hon. Minister of Finance, Mr. Felix Dias Bandaranaike revalued I think by about 18 to 20 per cent somewhere in March 1979, and became the laughing stock! I do not understand why the hon. Member is now arguing for a revaluation at this time. Obviously there is a balance between economics and politics. As an economist I would rather argue the case for a devaluation, but as a politician now I would be more cautious when I have to say something about devaluation because as you are all aware, in many countries devaluation has brought disastrous effects to the economy. I remember reading an article by Harry Cooper somewhere in the 1970s, where he had done a study on the effects of devaluation in about sixty odd countries of the world and ultimately he concluded that devaluation is politically disastrous. In fact, he went into details to find out what happened to government after devluation, what happened to ministers of finance after devaluation, and ultimately concluded that devaluation is politically disastrous. But, of course, from an economic point of view it is better to devaluate now than later. Otherwise, there will be a series of shocks to the economy when devaluation is inevitable. I will give you one good reason. When India devalued in 1966 and we devalued in 1967 Pakistan refused to devalue but ultimately what happened? They went into a lonely devaluation of 56.5 per cent in 1972. So obviously we need a rational and proper rate of exchange, which is a must. I presume this government would by way of a trawling peg ensure a realistic rate of exchange. That is all I wish to say at this moment and I would wish quite sincerely that the Hon. Minister of Trade and Shipping and his Hon. Deputy Minister would really do the work that has been assigned to them and make Sri Lanka a prosperous country. Thank you.

අ. භා. 12.24

**ජී. වී. එස්. ද සිල්වා මහතා (හබරාදූව)**
**(திரு. ஜீ. வீ. எஸ். த சில்வா—ஹபரதுவ)**
**(Mr. G. V. S. de Silva – Habaraduwa)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැදගත් අවස්ථාවේදී විශේෂයෙන්ම රටටම බලපාන අමාත්‍යාංශයක් ගැන කථා කරද්දී මගේ ප්‍රීතිය ප්‍රකාශ කරන්ට ඕනෑ ගාලු දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්, අළුත් කැබිනට් ඇමති කෙනෙක් වශයෙන් පත් කරනු ලැබ ඒ කටයුත්ත ඉතාමත්ම සාර්ථක අන්දමට කරගෙන යාම ගැන. ගාලු දිසාවේ ඡන්දදායකයින් සියලුදෙනාම මේ ගැන තමන්ගේ ඉමහත් ප්‍රීතිය ප්‍රකාශ කරන බව මේ අවස්ථාවේ මතක් කරන්නට ඕනෑ. එතුමාගේ දක්ෂකම මීට පෙරත් කිහිපවිටක් පෙන්නුම්කර තිබෙනවා. විශේෂයෙන්ම දෙවිනුවර ගරු මන්ත්‍රීතුමාත් (ඊ. එස්. එල්. ගලප්පත්ති මහතා) කිව්වා 1983 කලබල සමයේදී අපේ ගරු ඇමතිතුමාත්, ඒ අවස්ථාවේ මෙම අමාත්‍යාංශයේ හිටපු ඇමති ගරු ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාත් නිසා අපේ ප්‍රදේශයේ ජනතාවට කිසිම කරදරයක් නැතිව අවශ්‍ය බඩුබාහිරාදිය ලබාගන්නට පුළුවන් වුණාය කියා. නොයෙක් විධියට සමහරුත් වැඩි ගණන්වලට විකුණන්නට බලාපොරොත්තුවුණු බඩු පවා බොහොම පහසුවෙන් නියමිත මිලට ලබාගන්නට පුළුවන් වුණා. ඒ නිසා අපේ ප්‍රීතිය ගාලු දිස්ත්‍රික්කයේ ඡන්දදායකයින් වෙනුවෙන් අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒ සමගම ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් මේ වැඩ කටයුතු ඉතාමත්ම සාර්ථක අන්දමට ඉදිරියට ගෙන යාමට හැකිවේවායි අපි සුභ ප්‍රාර්ථනා කරනවා.

ඒ සමගම මම වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තුවෙනවා "ෂිප් බ්‍රේකිං" ආයතනය ගැන. අපේ ඇහැලියගොඩ ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය විමල් වික්‍රමසිංහ මහතා) දැන් ඒ ගැන මතක් කළා. මෙය ගාල්ලේ පටන්ගන්නට බලාපොරොත්තුව සිටියා. අපි ඒ ගැන ලොකු බලාපොරොත්තු තබාගෙන සිටියා, ඉක්මණටම පටන්ගනීවි කියා. නමුත් ඒ අවස්ථාවේදී ගාල්ලේ සමහර සංවිධාන මේකට විරුද්ධ වුණා. එසේ විරුද්ධවෙලා ගරු ලලිත් ඇතුලත් මුදලි ඇමතිතුමත් සමග සාකච්ඡා කරන අවස්ථාවේදී එතුමා කිව්වා මේක ගාල්ලට ඕනෑ නැත්නම් අපි ත්‍රිකුණාමලේට ගෙන යනවා කියා. නමුත් මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා යම්කිසි විධියකින් එය ක්‍රියාත්මක කරනවා නම් කරුණාකර ගාල්ලට දෙන්නටය කියා. අපේ පලාත්වල අය, අපේ කම්කරුවන්, අපේ රක්ෂා නැති අය හුඟදෙනෙක් බලාපොරොත්තුවෙනවා අපේ ගරු ඇමතිතුමා ගාලු දිස්ත්‍රික්කයේ ඇමතිවරයකු වශයෙන් මේ කටයුත්ත ගාල්ලේම පටන්ගනීවි කියා. අපට පෙනෙනවා මේ මගින් රක්ෂාවල් පමණක් නොවෙයි, අපේ පලාතට විශාල සේවයකුත් කර ගන්නට ඉඩ තිබෙනවා කියා.

ඒ වාගේම මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (බැනට් ගුණසේකර මහතා) මතක් කළ පරිදි නාවිකයන් පුහුණු කිරීම සම්බන්ධව මමත් කියන්නට ඕනෑ. අපට ආරංචි හැටියට මේ ආයතනයට අවුරුදුපතා ගන්නේ බොහොම සුළු සංඛ්‍යාවක්. මම හිතන්නේ එක් ආසනයකින් තුන් දෙනෙක් පමණ ගන්නෙ. ඒ සඳහා ඉල්ලීමක් අපෙන් කර තිබුණා. නමුත් අපට පෙනෙනවා අපේ තරුණයින් බොහෝ දෙනෙක් මේ සම්බන්ධව ලොකු බලාපොරොත්තුවක් තබා තිබෙන බව. මේ පුහුණුව ලබාගත්තොත් ලංකාවේ පමණක් නොවෙයි, පිටරටවල පවා ඒ අයට රක්ෂා ලබා ගන්නට පුළුවන් වෙනවා. අපට දක්ෂ ළමයින් සිටිනවා. දැනට පාසල්වලින් පිටවෙන තරුණ ළමයි උසස් මට්ටමකින් කටයුතු කරන්න පුළුවන් අය. දැන් පාසල්වලින් පිටවෙන ඒ උසස් ගණයේ සිසුන්ට අපි අවස්ථාවක් දෙන්නට ඕනෑ. ඒ නිසා මේ නාවික පුහුණු මධ්‍යස්ථානය මීට වඩා පුළුල් කර, මීට වඩා වැඩි දෙනකුට, අඩු ගණනේ එක ආසනයකින් 10 කට 15 කට වත්, අවස්ථාව ලබාදුනහොත් එය වාසනාවක්ය කියා අපි ගරු ඇමතිතුමාට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ පලාත්වල අපට නොයෙක්විට අසන්නට ලැබෙන දෙයක් තමයි — අපේ ගරු ඇමතිතුමාත් මේ ගැන දන්නවා ඇති, නියෝජ්‍ය ඇමතිතුමාටත් මම නොයෙක් අවස්ථාවල මතක් කරනවා — මේ ලක්ස්ප්‍රේවල මිල වැඩිවීම. නමුත්තාන්සේලාගේ "ප්‍රොග්‍රෙස් 84" කියන පොතේ 76 වැනි පිටුවේ මෙහෙම කියා තිබෙනවා :

"The Full Cream Milk powder market in Sri Lanka has become a highly competitive business with leading international brands competing against our brand "Lakspray"."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

We quite understand your difficulty but unfortunately as this is a commodity that has been need in the village and lot of people have been complaining against this increase in price we would request you to look into it. It continues :

> "At the commencement of our Company the price of our Company the price of "Lakspray" was Rs. 23.50 and was increased to Rs. 24.50. Then after sometime to Rs. 26 and now the price of 500 grm. packet of "Lakspray" is Rs. 29.10."

I know that you have been speaking about the packing. We quite understand your difficulty. But I would request the Hon. Minister to give his attention to this matter. Let us have a cheaper packing. I do not know whether it is possible, but I would request you to make a cheaper packing and give it cheaper than what it is, because as was mentioned by some hon. members earlier, it is what the poor people use in the village. Lakspray is the cheapest as far as possible. Now, I would make an earnest request not to increase the price but, if there is a possibility, see that this price is brought down, because it is very essential. A lot of people in our villages have complained about this and have made requests to approach you and make representation on their behalf. I think I would sincerely request the Hon. Minister to look into it because, according to your report, the factory came into commercial production on 1.3.83 and the accounts for the first financial year, that is for our month show that there had been a Rs. 1.9 million profit. It is a very creditable thing. Let the benefit of the profits be given to the consumers also. I do not know whether you can do it, but anyway this is my request on behalf of the poor people in the village.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order, please ! the sitting is suspended till 1.30 p.m.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, ප. භා. 1.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [නෝමන් වෛද්‍යරත්න මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி. ப. 1.30 வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்ன] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *in the Chair.*

**ජී. වී. එස්. ද සිල්වා මහතා**
**(திரு. ஜீ. வீ. எஸ். த சில்வா)**
**(Mr. G. V. S. de Silva)**

Sir, when we adjourned I was speaking on milk foods. Milk foods are consumed by everybody in the Island. It is important in one diet. The Hon. Minister of Health was very worried about malnutrition. I think everybody is aware that there is a very high percentage of malnutrition, especially among children. Therefore milk is an essential food.

I know that there are a lot of difficulties in producing milk foods, but all the same what the people say is that there is no reason to increase the price of Lankspray to the extent of Rs. 29.10 for 500 kilogrammes. We were under the impression that the packing cost quite a lot of money. It looks very attractive and beautiful in the tin foil. But I am told that the packing costs only Rs. 1.30. It is felt that if inferior packing is used the keeping quality will be low. I quite understand the situation. But all the same, this is a request that we make to the Hon. Minister. He is aware of the difficulties of the poor people in his electorate as well as everywhere else. In every household, in addition to feeding the children, there in the need of milk foods. Just as sugar and rice are wanted milk is essential. This is a thing the Hon. Minister should take cognizance of.

I know that we have a very able and experienced chairman at Lanka Milk Foods (C.W.E.) Limited. He is a very good advertisement for milk. He is a fine specimen of a human being. Not only is he a kind-hearted man, he knows how the poor people suffer. I think the chairman is in the box and listening to me. I would request him to make every possible endeavour – now that he has got Rs. 1.9 million for the first month and in addition to that the company has obtained tax exemption under Section 31 of the Inland Revenue Act and a number of facilities have been given by the Government – to bring down the price. We are indeed grateful to the Hon. Minister of Finance for giving all these facilities. I quite understand the other difficulties. I appreciate them. But in consultation with the other companies that are importing milk food, I would request that an attempt be made to reduce the price of milk because this is part of the poor man's food. As said the other day, "ජනතාව ස්වයංපෝෂිත කිරීමට, ජනතාවගේ දියුණුවට කටයුතු කිරීමට ඕනෑයයි කිව්ව නිසා මේ ගැන හොයා බලන්නට අපට යුතුකමක් තිබෙනවා."

I must also congratulate the Ministry for the progress that they have made in shipping. I am told that they have earned about Rs. 75 million profit this year for the first nine months. We have got a very experienced and able chairman, Mr. Lionel Fernando. He is an experienced administrator, having worked in a number of organizations. I must congratulate the Hon. Minister and the Deputy Minister for putting him on to this line.

I do not think I will speak at length, but I must make a request to the Hon, Minister regarding cinnamon prices. The cinnamon trade had a very bad time, but things have improved a little, but all the same our people are not very happy. As the Hon. Minsiter is aware, the Galle District, in particular the Karandeniya, Ambalangoda and Habaraduwa Electorates, have a large acreage of cinnamon. Of course, the prices have improved recently through the efforts of the Ministry, but unfortunately, although the prices have gone up, the people who are at it do not get



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජී. වී. එස්. ද සිල්වා මහතා]

much benefit out of it. In fact, some of the people who are in this industry want to give it up. In my own electorate, Habaraduwa, the people are uprooting the cinnamon. I must add that in Balapitiya also there is a large acreage of cinnamon. When I say so I am speaking on behalf of our Deputy Speaker, Mr. Norman Waidyaratna. I want to bring to the notice of the Hon. Minister that a lot of people in my electorate are uprooting cinnamon and are planting the land with tea. It is a bad outlook, and therefore something that the Hon. Minister should look into.

In conclusion I must voice the sentiments of all the school-children in the Island, and in doing so I must congratulate the Hon. Lalith Athulath Mudali, the present Minister of Trade and Shipping and his Deputy, for the interest they are taking in the Mahapola Exhibition. Never in the history of Sri Lanka have we had such an organization. There is improvement in it every month and every year. A large number of schools have benefited by it. In fact, a large number of school-children benefited by the Mahapola Exhibition conducted in my electorate. We have been able to put up two or three libraries, and I think we have collected about 3 1/2 lacks. The most important aspect of this Mahapola Exhibition is the granting of scholarships to children. I think every Hon. Member speaks very highly of this. On this I am voicing the sentiments of the entire student population and all those who speak well of this. I wish you will further improve this, and I wish the Hon. Minister, the Deputy Minister and all the officials in the Ministry all success. I hope that when we speak on these Votes next year we will be able to say something still better.

Thank you very much.

අ. භා. 1.37

**එච්. ජී. පී. නෙල්සන් මහතා (ත්‍රිකුණාමලය දිසා ඇමතිතුමා)**
**(திரு. எச். ஜீ. பீ. நெல்சன் — திருகோணமலை மாவட்ட அமைச்சர்)**
(Mr. H. G. P. Nelson District Minister, Trincomalee)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් වෙළඳ හා නාවුක කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. මෙම අමාත්‍යාංශය භාරව පසුගිය රජය කාලයේ සිටි ඇමතිවරුන්ගේ ක්‍රියා කලාපය එම රජයවල් පවා පරාජය වීමට හේතුවුණා. ඒ වාගේම ඒ කාලයේ මෙම අමාත්‍යාංශය භාරව කටයුතු කළ ඇමතිවරුන්ට නොයෙක් අන්දමේ නම් පවා පටබැඳ තිබුණා. එවැනි අමාත්‍යාංශයක් මෙම රජය බලයට පත් වූවාට පසුව නව තැම්මකට යොමු කර මුළු ලංකාවේම ජනතාවගේ සුභසිද්ධිය සඳහා කටයුතු කරන මහජනතාවගේ සේවයට කැප වූ අමාත්‍යාංශයක් බවට පත් කර තිබෙනවා.

මීට කලින් මෙම අමාත්‍යාංශය භාරව සිටියේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමායි. අපේ හිතවත් එම්. එස්. අමරසිරි මැතිතුමා එදා නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් ක්‍රියා කළා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු කිරීමේදී මේ රටට ඔබින මේ රටේ ජනතාවට අවශ්‍ය වන තත්ත්වයෙන් මෙම අමාත්‍යාංශය සකස් කර දුන්නා. එතුමා මෙම අමාත්‍යාංශයෙන් ඉවත් වුණත් විශේෂයෙන් භාරධූර කටයුත්තක් භාරගත් බව සඳහන් කරන්නට ඕනෑ. එතුමා දුන් මෙම අමාත්‍යාංශයේ සේවයට මගේ භක්ති ප්‍රණාම ගෞරවය මේ අවස්ථාවේදී එතුමාට පුද කරන්නට ඕනෑ.

එතුමාගෙන් පසුව මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු භාරගත්තේ වර්තමාන ඇමතිතුමා වන අමරසිරි මැතිතුමායි. අවුරුදු ගණනාවක් තිස්සේ එතුමා මම ළඟින්ම ඇසුරු කර තිබෙනවා. එතුමා පොදු මහජනතාවගේ දුක දන්නා, ඒ වාගේම මහජනතාව සමඟත් නිලධාරීන් සමගත් කිට්ටු සම්බන්ධතාවයකින් වැඩ කටයුතු කරන ඇමතිවරයෙක්. එතුමාගේ අමාත්‍යාංශයේ වැඩ කරන සියලුම නිලධාරීන් එතුමාට සහයෝගය දෙමින් ජනතාවගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වැඩ කටයුතු කරනවා. පසුගිය රජය කාලයේදී බොහෝ භාණ්ඩ සුඛෝපභෝගී භාණ්ඩ හැටියට හඳුන්වා ඒවා මහජනතාවට ලබා ගැනීමට අපහසු තත්ත්වයක් ඇති කර තිබුණා. කුරුඳුවත්තේ අයට එහෙම නැත්නම් ධනපතියන්ට පමණයි, ඒවා එදා ලබා ගැනීමට පුළුවන්කම තිබුණේ. අත්‍යවශ්‍ය භාණ්ඩයක් වූ ගුවන්විදුලි යන්ත්‍රයක්වත් මේ රටේ ජනතාවට එද පහසුවෙන් ලබා ගැනීමට පුළුවන් වුණේ නැහැ. නමුත් මෙතුමා ඒ තත්ත්වය වෙනස් කර මෙම අමාත්‍යාංශයේ වැඩ කටයුතු මාර්ගයෙන් එද මහජනතාව පෝලිම්වල සිට ලබා ගත් බඩු අද ගමේ ගොඩේ ඕනෑම කඩයකින් ඕනෑ තරමක් ලබා ගන්නට පුළුවන් තත්ත්වයක් ඇති කර තිබෙනවා. ත්‍රස්තවාදීන් කොයි තරම් ගැහැව්වත්, ගංවතුර කොයි තරම් ගැලුවත් වෙන වෙන ප්‍රශ්න කොයි තරම් ඇති වුණත් අද ගබඩාවල ඕනෑ තරම් හාල් තිබෙනවා, සීනි තිබෙනවා; පරිප්පු තිබෙනවා; ඕනෑම දෙයක් ගැනීමට අවස්ථාව තිබෙනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) පසුගිය රජය කාලයේ නියෝජ්‍ය ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කළ බව මම දන්නවා. එද මේ රටේ මොන තරම් ප්‍රශ්න තිබුණාද කියන එක එතුමා දන්නවා ඇති. අද ඒ ප්‍රශ්න කිසි දෙයක් නැහැ. එද කුප්පි ලාම්පු එළියෙන් අධ්‍යාපනය ලැබූ මගේ ආසනයේ ශිෂ්‍යයින් අතරින් අද දොස්තරවරුන් ඉංජිනේරුවන් බිහි වී තිබෙනවා. එමනිසා විශේෂයෙන් ඒ ප්‍රදේශයේ ගොවි ජනතාව වෙනුවෙන්, ඒ දරුවන් වෙනුවෙන් මෙම අමාත්‍යාංශයට මගේ ගෞරවය පිරිනමනවා.

ඒ වාගේම තැව්යන් පුහුණු කිරීම ගැන බලන විට අපේ ගමේ ගොඩේ තරුණයන් අද නැව්වල යනවා. එද එය කුරුඳුවත්තේ අයට පමණයි සීමා වී තිබුණේ. ත්‍රිකුණාමලේ මැතිවරණ කොට්ඨාශයේමයි, ඒ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය තිබෙන්නෙ. මහා පරිමාණයේ ගොඩනැගිල්ලකයි එය පවත්වන්නේ. ඒ ප්‍රදේශයට එය ලබාදීම ගැනත් කෘතඥවෙමින් සභාපතිතුමාටත් ගෞරවය පිරි නමමින් මම නිහඬ වෙනවා.

**අමරසිරි දෙඩන්ගොඩ මහතා (බද්දේගම)**
**(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)**
(Mr. Amarasiri Dodangoda Baddegama)

ගරු සභාපතිතුමනි, මේ සාකච්ඡාවේදී ඉතාම කෙටියෙන් කරුණු කීපයක් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන් මිල පාලනය කිරීම ගැන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. සාමාන්‍ය ජනතාවට බලපාන හෝටල්වල සහ කෑම විකුණන අනෙකුත් ස්ථානවල අද පවතින මිල ගණන් අනුව තේ ටිකක් කෑම ටිකක් ගැනීමේදී අධික මිල ගණන් ගෙවන්න වෙනවා. එයින් සාමාන්‍ය ජනතාවට සැහෙන අපහසුවක් වෙනවා. ඒ නිසා මේ හෝටල්වල සහ තේ පැන් ශාලාවල තේ වල කෑමවල මිල පාලනයක් කරන්නට පුළුවන්නම් [බාධාකිරීම්] දැනට තිබෙනවා නම් තවදුරටත් එය ක්‍රියාත්මක වන පරිදි කරන්න පුළුවන්නම් එය ඉතාමත් වැදගත් වෙනවා. ඒ මොකද ? මේ සකස් කළ කෑම වර්ගවල මිල ගණන් අඩු ආදායම් ලබන අයට මූලිකව බලපාන ප්‍රශ්නයක් වී තිබෙනවා. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ඊ ළඟට මම කියන්න කැමතියි, දක්ෂ සභාපතිවරයෙක් සිටින සමුපකාර තොග වෙළඳ සේවයේ කටයුතු ප්‍රශංසනීයයි කියා. ඒ වාගේම ඒ සතොස බෙදා හැරීම් ගම් මට්ටමට ව්‍යාප්ත කරන්න පුළුවන්නම් කොළඹ නගරයට වාගේ පහසුකම් ගම්වලටත් ලබා දෙන්න පුළුවන්නම් ඒ සඳහා කටයුතු කරන්නය කියා මේ අවස්ථාවේදී මම ගරු ඇමතිතුමාට මතක් කරනවා.

රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව පිළිබඳව සැහෙන විවේචනයක් ඒ සේවකයන් තුළ තිබෙනවා. පසුගිය සතියේ " සිළුමිණ " පත්‍රයේ පළවුණු " මුරකරුගේ ප්‍රාණ ඇපකරුවකු වූ ලොක්කා " කියන සටහන් පාඨයෙනුත් [illegible] වෙනවා. එය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවට සම්බන්ධ වූ [illegible] හැටියටයි එහි කෙරෙන විස්තරයෙන් පැහැදිලි වන්නේ.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
එහෙම නම සඳහන් කර තිබෙනවාද ?

. අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
එහෙම නම සඳහන් වී නැහැ. මේක අර " උකුස්සා " යනුවෙන් පළවන තීරුවක් වාගේ " කවුළුව " යනුවෙන් පළවන තීරුවකයි තිබෙන්නේ. කෙසේ වෙතත් මේ ගැන සොයා බලන ලෙසයි ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නේ.

ඊළඟට වරාය අධිකාරියේ සේවය කළ සේවක මහත්වරු 5 දෙනෙක් ගැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ ලිපිය මම ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරන්නම්. මේ සේවක මහතුන් 5 දෙනා බොහෝ කාලයක සිට වරාය අධිකාරියේ සේවය කළ සේවක මහත්වරු. ඒ අය විශ්‍රාම වැටුප් අහිමි තත්ත්වයකයි අද ඉන්නෙ. මම මේ ලිපිය ඔබතුමාට ඉදිරිපත් කරන්නම්.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
වරාය අධිකාරියේ නිසා ආරක්ෂක අමාත්‍යාංශයට දෙන්න.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
කොහොම වුණත් තමුන්නාන්සේත් අවධානය යොමු කළොත් හොඳයි.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
යොමු කරන්නම්.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
මොකද ? මේ පස් දෙනාම ගාලු දිස්ත්‍රික්කයෙන්. ඒ පස් දෙනා නම්, ඩී. එල්. ජී. සිරිපාල, ඩබ්. කේ. විල්සන්, ඩී. කුරුනේරු, ඒ. ආර්. ලක්ෂ්මන් සහ එස්. ජී. ඩොලිසින් යන පස් දෙනයි. ඒ සියලු දෙනාම ගාල්ලේ අය නිසා තමුන්නාන්සේගෙන් වගකීමක් තිබෙනවා.

එම්. එස්. අමරසිරි මහතා
(திரு. எம். எஸ். அமரசிறி)
(Mr. M. S. Amarasiri)
හොඳයි.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
අනික් කාරණය වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ රබර් ගබඩා ගැනයි. අද මේ ගබඩා හුඟක් වැහිලා. සමහර තැන්වලට රබර් අරගෙන ගියාම ඒවා පෞද්ගලික තැන්වලට ගෙනියන්නය ඒ තැන්වල වැඩියෙන් ගෙවනවාය කියනවා. අපේ ප්‍රධාන අපනයන ද්‍රව්‍යයන් එකතු කිරීමේ කාර්ය භාරය රජය සතුව තිබියදී පෞද්ගලික අංශය ඇවිත් ඒ වරප්‍රසාද භුක්ති විඳීම නවත්වන්න පුළුවන්. වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව විධිමත්ව පවත්වාගෙන යනවා නම්. ඒ කාරණය කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන හැටියට ඉල්ලනවා.

අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳවත් මම කියන්න කැමතියි. ඒ වෙළඳ සල් සැහෙන දුරට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ඉතාමත් හොඳයි. විශේෂයෙන්ම ආහාර බෙදා හැරීම පිළිබඳ ප්‍රශ්න මතු වුණ අවස්ථාවලදී ඒ පිළිබඳ සාර්ථක සේවයක් පෙන්නුම් කර තිබෙන්නේ ආණ්ඩුවේ ආයතන පමණයි. බඩු සඟවා ගැනීම් ආදී වශයෙන් පෞද්ගලික අංශය විසින් කරන ලබන දූෂණවලට එරෙහිව ජනතාවගේ අවශ්‍යතාවන් පදනම් කරගෙන සමුපකාර තොග වෙළඳ සංස්ථාව හා වෙළඳ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු බඩු බෙදා හැරීම කර තිබෙනවා. අපේ රටේ පසුගිය දිනවල ඇති වූ තත්ත්වයත්, වර්තමාන තත්ත්වයත්, ඉදිරි තත්ත්වයත් ගැන සලකා බලන විට වෙළඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රජයේ බෙදා හැරීමේ ආයතන සියල්ලක්ම පුළුවන් තරම් ශක්තිමත් කොට වැඩි දියුණු කිරීම සුදුසු බව මගේ හැඟීමයි.

තමුන්නාන්සේගේ අමාත්‍යාංශය පසුගිය දිනවල සම්මත කරගත් ජාතික මිල කොමිෂන් සභා පනතේ 17 වැනි හා 18 වැනි වගන්ති සම්බන්ධයෙන් මා යමක් කියන්න කැමතියි. එම වගන්ති වලින් කියැවෙන්නේ ඒකාධිකාරය වැළැක්වීම පිළිබඳ පියවර ගැනීම ගැනයි. එහෙම නැත්නම් ඒකාධිකාරියක් ඇති කර තරගකාරීත්වය ඉවත් කිරීම සඳහා කටයුතු කරන ආයතනවලට විරුද්ධව කොමිෂන් සභාවට ගත හැකි ක්‍රියා මාර්ගය පිළිබඳවයි. නමුත් රජයේ ව්‍යවසායික අංශය එහි බලපෑමෙන් ඉවත් කරන්න ඕනැ. ඒ කියන්නේ සමහර විට සංස්ථාවක් නිපදවන, බෙදා හරින, සපයන දේවල් පිළිබඳව සංස්ථාවක ඒකාධිකාරයක් ගොඩ නැඟුණත් එයින් හානියක් සිදු වෙන්නේ නැහැ. පෞද්ගලික අංශයෙන්, එහෙම නැත්නම් පෞද්ගලික සමාගමකින් ඒකාධිකාරියක් බිහි වුණොත් තමයි හානියක් සිදු වෙන්නේ. ඒ නිසා මිල කොමිෂන් සභා පනතේ ඇති 17 වන, 18 වන වගන්ති වලින් කියැවෙන තරගය වළක්වා ඒකාධිකාරියක් බිහිවීම රජයේ සංස්ථාවල් සම්බන්ධයෙන් බල නොපාන්නට කටයුතු කරන ලෙස මතක් කරමින් මා නිහඬ වෙනවා.

අ. භා. 1.50

මහේන්ද්‍ර විජේරත්න මහතා (නියෝජ්‍ය වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ඇමතිතුමා)
(திரு. மகேந்திர விஜேரத்ன — வர்த்தக, கப்பற் போக்குவரத்துப் பிரதி அமைச்சர்)
(Mr. Mahendra Wijeratne Deputy Minister of Trade & Shipping)
ගරු සභාපතිතුමනි, වෙළඳ හා නාවික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ එම අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් මට වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන පළමුවෙන්ම මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. මට ප්‍රථමයෙන් කථා කළ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) මිල පාලනය සම්බන්ධව කථා කළා. මගේ විශ්වාසය හැටියට අපි 1977 දක්වාම මිල පාලනය සම්බන්ධයෙන් හැම අවස්ථාවේදීම කථා කළ නිසා තවමත් එතුමා කල්පනා කරන්නේ මේ රටේ හැම ද්‍රව්‍යයක්ම මිල පාලනයට යටත් වෙනවා කියා විය හැකියි. නමුත් දැන් ඇත්ත වශයෙන්ම මිල පාලනයට යටත් වන්නේ භාණ්ඩ තුනක් පමණයි. එනම් පාන්, පරිප්පු, පිටි යන වර්ග තුන පමණයි.

අද අපේ ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම මෙම අමාත්‍යාංශය යටතේ තමන්ගේ අදහස් ප්‍රකාශ කළා. නමුත් මෑත ඉතිහාසය ගැන කල්පනා කර බලන විට විශේෂයෙන්ම වෙළඳ හා නාවික අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කරද්දී අදට වඩා හාත්පසින්ම වෙනස් තත්ත්වයකිනුයි. එදා කථා කළේ. 1970 සිට 1977 දක්වා සිටි ඇමතිවරුන් නොයෙක් නම්වලින් හඳුන්වන්න යෙදුණා. ඒ වගේම ඒ අයට නොයෙක් විධියට දොස් පවරන්න යෙදුණා. නමුත් එවැනි තත්ත්වයක් නැහැ.

අද විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් වැදගත් අදහස් රාශියක් ඉදිරිපත් කළා. ඒ වාගේම මෙම අමාත්‍යාංශය 1977 සිට අද දක්වා කරගෙන ගිය හොඳ වැඩපිළිවෙළවල් පිළිබඳවත් එතුමන්ලා ප්‍රශංසා කළා. මම නාවික අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් පත් වී දැනට මාස පහක් පමණ ගත වී තිබෙනවා. 1977 සිට අපේ ගරු ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාත්, ඒ වාගේම දැනට ඉන්න ඇමතිතුමාත්, මේ අමාත්‍යාංශයේ සැහෙන වැඩ කොටසක් කර තිබෙනවා පමණක් නොව, නව පෙරළියක් ඇති කර මේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩ හා පිටරටින් ගෙන්වන භාණ්ඩ මේ රටේ පාරිභෝගික ජනතාව අතර සාධාරණ ලෙස බෙදා හැර කාගෙත් සතුටට ලක් වී සිටිනවා.

මේ අමාත්‍යාංශයෙ යටතේ ආයතන රාශියක් තිබෙනවා. මේ අමාත්‍යාංශයේ සේවය කරන නිලධාරි මහත්වරුන් ඉතාමත් උනන්දුවක් දක්වා වැඩ කරනවා පමණක් නොව, එතුමන්ලාගේ කාලය නිකරුණේ ගත නොකර විවේක කාලයක් ලැබුණොත් ඒ කාලය තුළදී මහජනයාගේ හොඳ හිත දිනා ගැනීමට අද වැඩ එතුමන්ලා කර තිබෙන බව මේ අවස්ථාවේදී මා විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ මහේන්ද්‍ර විජේරත්න මහතා ]

අලෙවි සංවර්ධන මණ්ඩලය ගැන ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙකුගෙන්ම කියවුණා. ක්‍රම ක්‍රමයෙන් පසුගිය කාලයට වඩා හොඳ තත්ත්වයක් මේ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඇති කරන්නටයි, අපි බලාපොරොත්තු වෙන්නේ. එළවළු, කුළුබඩු සාධාරණ ලෙස මහජනයාට බෙද හැරීමට අපි කටයුතු කරනවා.

හදිසි අවස්ථාවකදී මහජනයාගේ යහපත සඳහා පාරිභෝගික ද්‍රව්‍ය බෙද හැරීමට රජයේ ආයතන වශයෙන් සතොස සහ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව සැලසුම් වී තිබෙන්න ඕනෑය කියා බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩංගොඩ මහතා) පෙන්නුම් කලා. පසුගිය අවුරුද්දේ හදිසි තත්ත්වය පැවති අවස්ථාවේදී එවකට සිටි ගරු ඇමතිතුමාත්, දැන් සිටින ගරු ඇමතිතුමාත් නිලධාරි මණ්ඩලයත් විධිමත් පියවර අරගෙන පාරිභෝගිකයින්ට අවශ්‍ය දේවල් පැය 12 ක් යන්න ප්‍රථමයෙන් ලබා දුන්නු බව අපි කවුරුත් දන්නා කාරණයක්.

මම දීර්ඝ ලෙස කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විරුද්ධ පාර්ශවයේත්, අපේ ආණ්ඩු පක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා අපේ අමාත්‍යාංශයට ප්‍රශංසා කලා. එතුමන්ලා දුන්න අදහස් පිළිබඳව විමසිල්ලෙන් බලා ඒවා හැකි පමණින් ක්‍රියාත්මක කරන්න උනන්දු වෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 1.56

**එම්. එස්. අමරසිරි මහතා (වෙළෙඳ හා නාවුක කටයුතු පිළිබඳ ඇමතිතුමා)**
**(திரு. எம். எஸ். அமரசிறி—வர்த்தக, கப்பற்றுறை அமைச்சர்)**
(Mr. M. S. Amarasiri - Minister of Trade and Shipping)

ගරු සභාපතිතුමනි, නාවුක හා වෙළඳ ඇමතිවරයා හැටියට වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව මා පළමුවෙන්ම කරන කථාව ගැන තමුන්නාන්සේ සතුටු වෙනවා ඇති.

**ජී. වී. එස්. ද සිල්වා මහතා**
**(திரு. ஜீ. வீ. எஸ். த சில்வா)**
**(Mr. G. V. S. de Silva )**

අපි කවුරුත් සතුටු වෙනවා.

**එම්. එස්. අමරසිරි මහතා**
**(திரு. எம். எஸ். அமரசிறி)**
(Mr. M. S. Amarasiri)

පාර්ලිමේන්තුවේ සියලුම ගරු මන්ත්‍රීවරු ඒ සම්බන්ධව සතුටු වන බව මා දන්නවා.

**ජී. වී. එස්. ද සිල්වා මහතා**
**(திரு. ஜீ. வீ. எஸ். த சில்வா)**
**(Mr. G. V. S. de Silva )**

We are proud of you.

**එම්. එස්. අමරසිරි මහතා**
**(திரு. எம். எஸ். அமரசிறி)**
(Mr. M. S. Amarasiri)

මට දක්වන හිතවත්භාවය ගැන කරුණාව ගැන, මා ඉතාම ගෞරවයෙන් ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. ඒ සමඟම මා ඇමති ධුරයකට පත් කිරීම ගැන අපේ ගරු ජනාධිපති උතුමාණන්ද මා මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. ඒ සමඟම මා කෘතවේදීව සිහිපත් කරනවා මගේ පූර්වප්‍රාප්තිය ජාතික ආරක්ෂක ඇමතිතුමා සහ ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා වන ගරු ලලිත් ඇතුලත් මුදලි ඇමතිතුමාත්. අද දින එතුමා ප්‍රකාශ කලා වාගේ බයිසිකලයක රෝද දෙක වාගේ අපි බොහොම සමීපව හිතවත්ව අපේ නිලධාරි මණ්ඩලයත් සමග එකතුව මෙම අමාත්‍යාංශයේ වැඩ කලා. අප දෙදෙනා අවුරුදු හතක් තුළ අයවැය කාරක සභා අවස්ථාවේදී වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධව මේ සභාවේදී විවාද හතකට සහභාගී වුණා. එම නිසා එතුමා ගැන මා විශේෂයෙන් සඳහන් කරනවා. එතුමා සමග එවකට කටයුතු කිරීමෙන් ලැබුණු ආභාෂය, පළපුරුද්ද සහ අත්දැකීම් මගේ අමාත්‍යාංශයේ කටයුතු තවදුරටත් කාර්යක්ෂම [illegible] ප්‍රයෝජනවත් වෙනවාය කියා මා සිතනවා.

ගරු සභාපතිතුමනි, වෙළඳාම පිළිබඳවත් සමුපකාර කටයුතු පළිබඳවත් මා තුළ සාමාන්‍ය අත්දැකීමක් තිබුණා. මා පළමුවෙන්ම එම කටයුතුවලට බැස්සේ 1958 කාලයේ හදිසි නීතිය සහ අඳුරු නීතිය පැවති අවස්ථාවේයි. එවකට මා අපේ ගම් ප්‍රදේශයේ සමුපකාර සමිතියේ සභාපතිවරයා වශයෙන් කටයුතු කලා. ඉන්පසු පසුගිය තිස් වසර තුළ නොයෙක් අවස්ථාවල සමුපකාර ක්ෂේත්‍රයේ කටයුතුවල යෙදෙමින් පාරිභෝගික භාණ්ඩ බෙද හැරීම යනාදිය ගැන සෑහෙන අත්දැකීමක් ලබා ගන්නට මට පුළුවන් වුණා. ඒ පළපුරුදුකම් සහ අත්දැකීම් සියල්ලමත් උපයෝගී කරගෙන මගේ කාර්යාලයේ කටයුතු කරගෙන යන අතර දිනපතාම අලුත් දෙයක් ඉගෙන ගැනීමටයි මා උත්සාහ කරන්නේ. පුළුවන් තරම් දැනුම ඇති අය සොයා ගෙන තව තවත් කරුණු සොයා ගෙන පූර්ණකාලීනව සාර්ථක ලෙස අපි මේ අමාත්‍යාංශය වැඩ කටයුතු කරගෙන යන නිසයි අද පාර්ලිමේන්තුවේදී සියලුම ගරු මන්ත්‍රීවරු—විරුද්ධ පක්ෂයේත් ආණ්ඩු පක්ෂයේත් සියලුම ගරු මන්ත්‍රීවරු—මෙම අමාත්‍යාංශය ගැන ඉතාම සාර්ථක විවේචන සහ ප්‍රසංශාවන් දක්වූයේ. මගේ නියෝජ්‍ය ඇමතිතුමා හැර ගරු ඇමතිවරු සහ ගරු මන්ත්‍රීවරු—දිසා ඇමතිවරු ඇතුළත්ව—දහතර දෙනෙකු අද මේ විවාදයට සම්බන්ධ වුණා. වෙළඳ අමාත්‍යාංශය තවදුරටත් සාර්ථක කරගෙන යැමට උපයෝගී කරගත හැකි වැදගත් උපදේශ යෝජනා සහ සාර්ථක විවේචන—හිතවත්භාවයෙන් දක්වන විවේචන—ඒ සියලු දෙනාගෙන්ම ඉදිරිපත් වුණා. එසේ කරුණු ඉදිරිපත් කළ ආකාරය ගැන මා ඒ ගරු ඇමතිවරුන්ට සහ ගරු මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, මෙම විවාදය ආරම්භ කරමින් වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂවලින් රු. 10 ක මුදලක් කපා හැරිය යුතුය කියා කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) යෝජනා කළ අවස්ථාවේදී මා සභා ගර්භය තුළ සිටියේ නැත. අපට දැනුම් දී තිබුණේ මෙම විවාදය හරියටම පෙරවරු 8.45 ට ආරම්භ කරනවාද කියායි. තමුන්නාන්සේ ඊට කලින් විවාදය ආරම්භ කල නිසා මට ඒ අවස්ථාවේදී සභා ගර්භය තුළ ඉන්නට බැරි වුණා. නමුත් එතුමා ඉදිරිපත් කල කරුණුවලින් ප්‍රධාන කාරණය වශයෙන් එතුමා ගත්තේ රක්ෂණය අවසතු කිරීමට රජය ක්‍රියා මාර්ගයක් ගන්නවාය කියන එකයි. අවසතු කිරීම කියන්නේ නැවත ජනසතු කිරීමෙන් ඈත් කිරීමයි. අපි මේ රටේ ජනසතු ව්‍යාපාර අද ඊයේ නොවෙයි, දීර්ඝ කාලයක සිට පවත්වාගෙන එනවා. එම ව්‍යාපාර සාර්ථකව පවත්වාගෙන යැමට විවිධ අංශවලින් පරීක්ෂණ පවත්වා කරුණු සොයා බලා ඒවා තවදුරටත් සාර්ථකව කරගෙන යැමට අලුත් අදහස් එකතු කරගෙන ක්‍රියා කරනවා.

අපි පළමුවෙන්ම බස් ජනසතු කලා. 1965 එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව බලයට පත් වූ විට ඒ ජනසතු කිරීම් ආපසු අවසතු කරයි කියා හිතුවා. නමුත් එහෙම වුණේ නැහැ. ඒ ජනසතු ව්‍යාපාර ඒ ආකාරයෙන්ම කරගෙන ගියා. ඊට පසුව 1970 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව ඒ අයත් ඒ ආකාරයෙන්ම ඒවා පවත්වා ගෙන ගියා. ඊට පසුව 1977 දී බලයට පත් වූ අපිත් ඒවා ඒ විධියටම කරගෙන යනවා. ඒ අතර ඒවා සාර්ථකව කරගෙන යැමට තරගකාරී පිළිවෙළක් ඇති කලා. අප පමණක් නොවෙයි ජනසතු ව්‍යාපාර ගැන ලෝකයේ නොයෙක් රටවල් බලන අලුත් බැල්මක් තිබෙනවා. ජනසතු ව්‍යාපාර කෙළින්ම රාජ්‍ය ව්‍යාපාර වශයෙන් පවත්වාගෙන යැමේදී තනිකර ඒකාධිපති ස්වරූපයෙන් තිබුණොත් ඒවායේ ඵලදායීත්වය අඩු වෙනවා කියන හැඟීමක් තිබෙනවා. දීර්ඝ කාලයක් යන විට රාජ්‍ය අංශය වුවත් දුර්වල වූ ඇතැම් අවස්ථා තිබෙනවා. ඒ නිසා ජනසතු ව්‍යාපාර ඇති කල දියුණු වූ රටවලුත් තරගකාරී ස්වරූපයක් ඇති කරන අන්දමට ඒ ජනසතු ව්‍යාපාරවල ගමන යම් යම් සාර්ථක ක්‍රමවලට හැඩගස්වනවා. රක්ෂණ ක්‍රමය වෙනුවෙන් අපි යෝජනා කර තිබෙන්නේ අන්න ඒ විධියේ වැඩ පිළිවෙළක්.

රක්ෂණ සංස්ථා දෙකක් තිබෙනවා. එක සංස්ථාවක් පටන් ගත්තා 1963 රක්ෂණය ජනසතු කිරීමේදීම. එද සිට එම සංස්ථාව වැඩ කරගෙන ගියා පසුව මහජනතාවගෙන් යම් යම් යෝජනා හා පැමිණිලි ආවා. මගේ පූර්වප්‍රාප්තික වර්තමාන ජාතික ආරක්ෂක ඇමතිතුමා ඒ අවස්ථාවේ කල්පනා කලා, පෞද්ගලික අංශයත් තරමක් දුරට මෙයට සම්බන්ධකර ගන්නට. ඒ අනුව රජයේ තීරණය පරිදි—කැබිනට් මණ්ඩලයේ තීරණය පරිදි—ජාතික රක්ෂණ සංස්ථාව ආරම්භ කලා. පෞද්ගලික අංශයේ ප්‍රධාන නියෝජිතයින් 8 දෙනෙක් පත් කරගෙන ඒ අයගේ මාර්ගයෙන් පෞද්ගලික [illegible] සම්බන්ධ කරගෙන. ඒ විධියට රක්ෂණ සංස්ථා දෙක අතර තරගකාරී තත්ත්වයක් ඇති කලා. එහෙම කරගෙන යන විට පසුගිය කාලයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති වූ කලබලවලින් සිදු වූ පාඩුවලට හා ආපදවලට වන්දි ගෙවීමේදී විශාල මුදලක් ගෙවන්නට මේ සංස්ථාවට සිදු වුණා. වන්දි ගෙවීම් බොහොම හොඳට කර තිබෙනවා. ඒ සංස්ථා බොහොම හොඳට කටයුතු කර තිබෙනවා. ඒ අතරතුර තවත් මතයක් ඇති වුණා.

ලංකාවේ ජනගහණයෙන් රක්ෂණය කර තිබෙන්නේ කී දෙනාද ? රක්ෂණය ලැබිය යුතු ජනගහණය කොච්චරද ? ලංකාවේ ජනගහණය පවුල් ලක්ෂ 50 ක් සිටිනවා නම් ඒ ලක්ෂ 50 න් ජීවිත රක්ෂණයක් ලබාගෙන තිබෙන්නේ කී දෙනාද ? අලුත් සමාජ රක්ෂණ ක්‍රම ඇතුළත් වෙනවාද ? මෙන්න මේ විධියේ අද සමාජයට ගැලපෙන විධියට අලුත් අදහස් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සාමාන්‍ය ප්‍රතිපත්ති තීරණයක් අරගෙන තිබෙනවා, කොයි ක්‍රමයට මේ රක්ෂණ කටයුතුවලට සහභාගී වෙනවාද කියා සලකා බලන්නට පෞද්ගලික අංශයට ආරාධනා කරන්නට. ඒ ගැන තවම තීරණයක් කර නැති නිසා ඒ ගැන පසුව සාකච්ඡා කරන්නට අපට පුළුවන්. නමුත් විරුද්ධ පැත්තේ ගරු මන්ත්‍රීවරු මතු කළ අදහස් ගැන මම කියන්නට කැමතියි. ජනසතු ව්‍යාපාර හැමදම ජනසතුව පවත්වාගෙන යෑමට කිසිම ආණ්ඩුවක් හෝ කිසිම රටක් හෝ ක්‍රියා කරන්නේ නැත කියා. එංගලන්තයේ ජනසතු ව්‍යාපාර පටන් ගත්තේ කම්කරු ආණ්ඩු කාලයේදීයි. නමුත් අද ජනසතු කිරීමේ සම්බන්ධයෙන් කම්කරු පක්ෂයේ අදහස් කොහොමද ? දැනට කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මහතා) මේ ගරු සභාවේ නොසිටියත් ජනසතු කිරීම් සම්බන්ධයෙන් එක් කාරණයක් මතක් කරන්න කැමතියි. විශේෂයෙන් එතුමාගේත් දැන ගැනීම සඳහා. 1984 සැප්තැම්බර් 24 වැනි ද එංගලන්තයේ ' ටයිම්ස් ' පත්‍රයේ මේ විධියට සඳහන් වී තිබෙනවා. කම්කරු පක්ෂයේ නියෝජ්‍ය නායක හැටර්ස්ලිගේ ප්‍රකාශයක් :

"Hattersley moves to shift Labour on nationalization. . . . Mr. Hattersley, the Deputy Party Leder and the shadow Chancellor of the Exchequer told the Socialist Economic Review Conference in London that a society in which a higher percentage of productive capacity was owned by the State was unlikely to be highly efficient or true or free. He said he went to argue for an increase in social ownership. But he says "I do not propose an extension of nationalization. If all we espouse was the creation of more government monopolies, some of our opponents' criticisms might be justified."

එංගලන්තයේ ජනසතු කිරීම් ආරම්භ කළ කම්කරු පක්ෂයේ අදහසුත් දැන් ඒ විධියට වෙනස් වී තිබෙනවා. ඒ රටවල ඇති සමාජවාදී පක්ෂ පවා දැන් උත්සාහ කරන්නේ ජනසතු ව්‍යාපාර තුළ ඒකාධිකාරීත්වයක් ඇතිවීම වළක්වා තරගකාරී තත්ත්වයක් ඇති කරන්නයි. අපිත් බලාපොරොත්තු වන්නේ, ජනසතු ව්‍යාපාර රැක ගන්නා අතරම තරගකාරී තත්ත්වයක් ඇති කොට ඒ මගින් ජනතාවට වඩාත් ඵලදායී සේවයක් ලබා දීමටයි. ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරු කීප දෙනෙක්ම අදහස් දැක්වූවා. ඒ විධියට තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීම ගැන මම එතුමන්ලාට කෘතඥ වෙනවා.

දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා (පී. එස්. එල්. ගලප්පත්ති මහතා) අදහසක් පළ කළා. පෞද්ගලික අංශයේ වෙළෙඳ මහතුන් සංවිධානය විය යුතුය කියා. විශේෂයෙන් හදිසි අවස්ථාවකදී – ආපදවකදී – රට පුරා පාරිභෝගික භාණ්ඩ බෙද හැරීමේදී, සංවිධානය වුණු ආයතන සමග කටයුතු කිරීම රජයට පහසු බව අපි කවුරුත් දන්නවා. ඒ කාරණය ඔප්පු වුණා, 1983 ජූලි කලබල ඇති වුණු කාලයේදී. අපේ රටේ තිබෙන සංවිධානය වුණු රාජ්‍ය ආයතන වන ස.තො.ස., අලෙවි ශාඛා හා සමුපකාර සමිතිත් ඒ හදිසි අවස්ථාවේදී ඉතාමත් ඉක්මනින් සංවිධානාත්මකව ඒ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බෙද හැරීමට කටයුතු කළා.

නමුත් පෞද්ගලික අංශයේ එවැනි සංවිධානයක් මෙතෙක් ඇති වී නැහැ. අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බෙද හරින පෞද්ගලික ආයතන 50,000 කට වඩා ලංකාවේ තිබෙනවා. වෙනත් භාණ්ඩ බෙද හරින පෞද්ගලික ආයතනත් 50,000 ක් පමණ තිබෙනවා. සුළු වෙළෙඳ සල් සියල්ලත් ඊට එකතු කළාම පෞද්ගලික අංශයේ වෙළෙඳ සල් ලක්ෂ දෙකකට වඩා ලංකාවේ තිබෙනවා. ඒවා කටයුතු කරන්නේ තනි – තනිවයි. ඒ මිස සංවිධානය වී නැහැ. මේ නිසා හැම දමත්, යම්කිසි හදිසි අවස්ථාවක්, බඩු බෙද හැරීමේ උග්‍ර අවස්ථාවක් ඇති වුණාම ඒ පෞද්ගලික වෙළෙන්දන්ට තරක නාමය ලැබෙනවා.

ඒ නිසා මගේ යෝජනාවක් අනුව දැන් වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා, ඒ සම්බන්ධයෙන්. මුළු ලංකාව පුරාම ඇති සියලුම පාර්ලිමේන්තු මැතිවරණ කොට්ඨාශවල වෙළෙඳ සංගම් ඇති කොට [illegible] ඇති කරන්න කටයුතු කරගෙන යනවා. සියලුම පෞද්ගලික වෙළෙන්දන් ඒ ඒ වෙළෙඳ සංගම්වල–ප්‍රාදේශීක වශයෙන්–සාමාජිකයන් කර ගන්න ඕනැ. එවැනි සාමාජික වෙළෙන්දෙක් සංගමයේ තීරණවලට හෝ වෙළෙඳ රීතිවලට හෝ පටහැනිව ක්‍රියා කරනවා නම් එක්කෝ ඔහු සාමාජිකත්වයෙන් ඉවත් කරනවා, එහෙම නැත්නම් තාවකාලිකව ඔහුගේ සාමාජිකත්වය අත්හිටුවනවා. ඒ විධියට යම්-යම් විනයානුකූල ක්‍රියා මාර්ග ගන්නවා, වැරදි වැඩ කරන වෙළෙන්දන්ට විරුද්ධව. ඒ විධියට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් වෙන්න ඕනැ. මෙතෙක් හැම දමත් අපි කළේ මොකක්ද? අපට නිදහස ලැබුණු ද සිට මේ දක්වා වූ අවුරුදු හතළිස් ගණන ඇතුළත පෞද්ගලික වෙළෙන්දන්ගේ වැඩ ගැන අපි සාකච්ඡා කළා, විවේචනය කළා. විනා ඔවුන් සම්බන්ධයෙන් ක්‍රමවත් සංවිධානාත්මක වැඩ පිළිවෙළක් ඇති කරන්න කටයුතු කළේ නැහැ. යම්කිසි හදිසි ආපදවක්, හදිසි අවස්ථාවක් මතු වුණාම තමයි, විශේෂයෙන් පෞද්ගලික වෙළෙන්දන් ගැන මතක් වන්නේ. අපිට පෞද්ගලික වෙළෙන්දන් ඉවත් කරන්න බැහැ. ඒ අයත් මේ රටේ වැදගත් ජන කොටසක්. ඒ අය සංවිධානය වී නැති නිසයි, බොහෝ විට චෝදනාවලට ලක් වන්නේ.

පසුගිය දවසක සමුපකාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට භාජන වූ අවස්ථාවේ පළ වූ අදහස් මොනවාද ? ඒ අවස්ථාවේදී අපි දැනගත්තා, සමුපකාර සමිතිවලින් සියයට හතළිහක් පමණ අක්‍රිය තත්ත්වයකට පත්ව ඇති බව. එහෙම නම් ඒ පළාත්වල පාරිභෝගික භාණ්ඩ බෙද හරින්නේ කොහොමද ? ඒ නිසා ඒ ඒ පළාත්වල සමුපකාර සමිතිවල කටයුතු යථා තත්ත්වයට පත් කරන තුරු, එම ප්‍රදේශවල වෙළඳ සංගම් පිහිටුවා, පාරිභොගික භාණ්ඩ බෙද හැරීමට අපි දැන් වැඩ පිළිවෙළක් යොදගෙන යනවා. අන්න එවැනි වැඩ පිළිවෙළක් අපට සකස් කර ගන්නට පුළුවන් වුණොත්, සමස්ථයක් හැටියට ලංකාව පුරා ජනතාවට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ බෙද හැරීම ක්‍රමවත් කරගෙන යන්නට පුළුවන් වෙයි.

ගරු සභාපතිතුමනි, සමුපකාර තොග වෙළඳ සංස්ථාව මගින් රටට ප්‍රමාණවත් තරමින් පාරිභෝගික භාණ්ඩ ආනයනය කරනවා ; අපේ රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව මගින් වෙනත් භාණ්ඩ ආනයන කරනවා. මේ අනුව සාමාන්‍යයෙන් මාස තුනකට රටට වුවමනා තරම් භාණ්ඩ ගෙනැවිත් ගබඩා කරගෙන තිබෙනවා. නමුත් මේ භාණ්ඩ බෙද හැරීමේදී නොයෙකුත් බාධා ඇති වෙනවා. එසේ බාධා ඇති වන විට ඇතැම් භාණ්ඩවල මිල ඉහළ යනවා. දැන් නිදර්ශනයක් හැටියට පෙන්වන්නට පුළුවනි, පසුගියද එක දිගට වැටුණු දින හතරක නිවාඩුව. ඒ නිවාඩු දවස් හතර තුළ සමුපකාර වෙළඳ ශාලාවල වාගේම රාජ්‍ය වෙළඳ ශාලාවලත් සේවකයන් නිවාඩු ලබා ගත්තා. මේ දින හතර තුළ මුස්ලිම් උත්සව දිනයත්, උඳුවප් පුර පසළොස්වක පොහොය දිනයත් සති අන්ත නිවාඩු දිනයක් වන සෙනසුරාද හා ඉරිද දින වැටුණා. මේ නිසා රාජ්‍ය අංශයේ වෙළඳ ශාලා වැසුවාම පෞද්ගලික අංශය මගින් අලෙවි කරන භාණ්ඩවල මිල වැඩි කරනවා. රු. 7.50 ට තිබුණු හාල් සේරුව, රු. 8.50 සිට රු. 10 දක්වා වැඩි කළා. සමුපකාර ගබඩා සහ රාජ්‍ය අංශයේ අනිකුත් වෙළඳ ශාලා විවෘත කළාට පස්සෙ කලින් වාගේම නැවතත් මිල පහත බැස්සා. එහෙම නම් මේවා ක්‍රමවත්ව සංවිධානය කර එමගින් වැඩ ගන්නා ක්‍රමයක් අපි සකස් කරන්නට ඕනැ.

මගේ බලාපොරොත්තුවක් තිබෙනවා, දැන් සමුපකාර අංශය සහ රාජ්‍ය අංශය සංවිධානය කර තිබෙනවා වාගේම පෞද්ගලික අංශයත් සංවිධානය කර, එය ඒ අයගේම සංවිධානයක් බවට පත් කර, කිසියම් විනයක් හා පාලනයක් ඇති කර ගනිමින්, රටට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ පෞද්ගලික අංශය මගිනුත් බෙද හැරීමට. දැන් විවෘත වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන නිසා, රාජ්‍ය අංශය හා සමුපකාර අංශය සමග පෞද්ගලික අංශයත් තරඟකාරී ස්වරූපයෙන් වැඩ කෙළොත්, ඒ අනුව පෞද්ගලික අංශය රාජ්‍ය අංශය හා සමුපකාර අංශය අතර භාණ්ඩ බෙද හැරීමේ වැඩ කොටස් බෙදී යන විට, එයින් වාසි සැලසෙන්නේ පාරිභෝගිකයාටයි. දැන් පවත්නා විවෘත වෙළඳ ප්‍රතිපත්තිය අනුව බොහෝ විට රාජ්‍ය අංශය මගින් කෙරෙන බෙද හැරීම් දුර්වල වෙන්නට පුළුවනි. පසුගිය දවස්වල රටඑණු ආනයනය කළ වෙලාවේදී අපට ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වුණා. රාජ්‍ය අංශය විශාල ප්‍රමාණයක් රටඑණු ගෙන්නුවාම නරක් වී යන ප්‍රමාණයත් වැඩියි. අන්න එවැනි අවස්ථාවලදී පාරිභෝගිකයා රාජ්‍ය අංශයට දොස් කියනවා. මෙවැනි තත්ත්වයන් ඇති වන නිසා අපි කල්පනා කළා, පෞද්ගලික අංශයටත් මේ භාණ්ඩ ආනයනය කරන්නට අවකාශයක් ලබා දෙන්නට. ඒ අවස්ථාව අපි ලබා දුන්නා. සාමාන්‍යයෙන් පෞද්ගලික අංශය භාණ්ඩ ගෙන්වන්නේ රාජ්‍ය අංශය [illegible] විශාල ප්‍රමාණවලින් නොවෙයි. රාජ්‍ය අංශය ටොන් පත් දහසක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. එස්. අමරසිරි මහතා]

ගෙන්වනවා නම්, පෞද්ගලික අංශය වරකට ගෙන්වන්නේ ටොන් පන්සියයක් වෙන්නට පුළුවනි. මේ නිසා තරඟ වී යන ප්‍රමාණය අඩු වෙනවා. අපේ එම වැඩ පිළිවෙළ සාර්ථක වී ඇති අතර රටළු‍ණු මිල සම තත්ත්වයකින්—රු 10 සිට 15 දක්වා ප්‍රමාණයකින්—පවත්වා ගෙන යන්නට පුළුවන් වී තිබෙනවා. එක් අවස්ථාවකදී වෙළඳුන්, රටළූ‍ණු කිලෝව රු. 50 කට තරම විකුණුවා. මේ නිසා අපට සිදු වුණා මේ භාණ්ඩ ගෙන්වීම විවෘත වෙළඳ ආර්ථික ක්‍රමයකට යොමු කරන්නට.

මෙතනදී අපට තවත් ප්‍රශ්නයක් මතු වෙනවා. අපට සිදු වෙනවා, දේශීය නිෂ්පාදන ගැනත් සොයා බලන්නට. ගරු සභාපතිතුමනි, අපේ ගම්බද ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා මේ භාණ්ඩ නිෂ්පාදනය කරන්නන් ගැන කථා කරනවා ; ඒ අයගේ ප්‍රශ්න ගැන අදහස් දක්වනවා. නාගරික ප්‍රදේශවල—කොළඹ නගරයේ සහ වෙනත් නාගරික ප්‍රදේශවල—මන්ත්‍රීතුමන්ලා පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා ගැන විශේෂ උනන්දුවක් දක්වනවා. මෙතනදී වෙළඳ අමාත්‍යාංශයට සිදු වෙනවා, දෙපැත්තම සමබරතාවයෙන් තබාගෙන, දෙපක්ෂයම රැකගෙන යාමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට. මෙය ඉතාමත්ම අමාරු කාර්යයක්. වෙළඳ අමාත්‍යාංශයට පමණක් තනිකරම මෙම වගකීම භාර ගන්නට බැහැ. ආහාර හා සමුපකාර අමාත්‍යාංශයත්, කෘෂිකාර්ම අමාත්‍යාංශයත් මේ වැඩ පිළිවෙළට සම්බන්ධ වෙන්නට ඕනෑ. මුදල් ගණුදෙනු ආනයන කටයුතුවලට ඇතුළත් වන නිසා, රේගුවත් මෙයට සම්බන්ධ කරගන්නට සිදු වෙනවා. මෙවැනි අවස්ථාවලදී අමාත්‍යාංශ ගණනාවක් සම්බන්ධ වී කටයුතු කරන්නට සිදු වෙනවා.

බොහෝ විට අපට පෙනී ගිය කාරණයක් තමයි, පාරිභෝගික භාණ්ඩ බෙද හැරීමේදී නිෂ්පාදකයාටත් තම නිෂ්පාදන සඳහා නියම මිලක්, ලබා දෙන්නට ඕනෑ බව. දැන් අපේ රටේ මිරිස්, අර්තාපල් සහ එළවළු ආදී ද්‍රව්‍ය නිෂ්පාදන කරනවා. එසේ වුණත්, හැම දෙනාගේම අවශ්‍යතාවන් සපුරාලන්න, දේශීය අවශ්‍යතාවත් පිරිමසන්න, ඇතැම් භාණ්ඩ අපට ආනයනය කරන්නත් වෙනවා. අපට මාසයකට වුවමනා කරන්නේ ටොන් දෙදහසක් නම්, දේශීය වශයෙන් නිෂ්පාදනය කරන්නේ ටොන් දහසක් නම් ඉතුරු ටොන් දහස ආනයනය කරන්න සිද්ධ වෙනවා. මිරිස් නිෂ්පාදනය ගෙන බැලුවොත්, දේශීය නිෂ්පාදනය අඩු වන කාලයේදී පිටරටින් ගෙන්වන ප්‍රමාණය වැඩි කරන්නට සිදු වෙනවා. මෙන්න මේ කාරණා ගැන නිතරම අප සෝදිසියෙන් සිට අවශ්‍ය කටයුතු කළොත්, පාරිභෝගික හා නිෂ්පාදක යන දෙපක්ෂයම රැකගෙන, සමතුලිතතාවයකින් වැඩ කරගෙන යන්නට පුළුවනි. මේ අන්දමට පාරිභෝගියාටත් සහනයක් සලසන්නට වෙළඳ අමාත්‍යාංශය නිතරම කටයුතු කර ඇති බව මෙයින් පැහැදිලි වෙනවා.

මේ විධියට කටයුතු කළේ අද ඊයේ සිට නොවෙයි. පසුගිය අවුරුදු හත ඇතුළතදීම මේ විධියට කටයුතු කළා. ඒ නිසා තමයි පසුගිය අවුරුදු හත ඇතුළතදීත් මේ කාලයේත් නිෂ්පාදකයාත් බේරාගන පාරිභෝගිකයාත් ආරක්ෂා කර ගෙන කටයුතු කරන්නට පුළුවන් වෙලා තිබෙන්නේ. නිෂ්පාදකයාගේ භාණ්ඩ මිලදී ගැනීම අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන එකතු කරන මධ්‍යස්ථාන විසින් කරනවා. මෙහිදී තනි නිලධාරියෙකුගේ නිගමනයෙන් තීරණයන් ගන්නට සිදු වෙනවා. ඒ සඳහා තනි නිලධාරියෙකු ප්‍රමාණවත් නොවන බව පෙනීයන හෙයින් මේ ගැන සොයා බලා, ඒ සඳහා අවශ්‍ය අධීක්ෂණ කමිටු පිහිටුවන්න ඉදිරිකාලයේදී කටයුතු කරනවා. නිෂ්පාදන ප්‍රදේශවල නිෂ්පාදකයින්ගේ කමිටු ඇති කර ඒ අයගේ අධීක්ෂණය යටතේ එකතුකරන මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑමටත් අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව ඒ මඟින් භාණ්ඩ මිලයට ගැනීමටත් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

භාණ්ඩ බෙද හැරීමේ මධ්‍යස්ථාන ගැනත් කිවයුතුයි. සමුපකාර තොග වෙළඳ සංස්ථාව මඟින් භාණ්ඩ බෙද හැරීමේ සිල්ලර ශාඛා ඇති කර තිබෙනවා. ඒවාගේම අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේත් ඒ විධියේ ශාඛා තිබෙනවා. ඒ භාණ්ඩ බෙද හැරීමේ මධ්‍යස්ථානවල කටයුතු අධීක්ෂණය සඳහා පාරිභෝගික ආරක්ෂක නියෝජිතයිනුත් වෙනත් රජයේ නියෝජිතයනුත් සම්බන්ධ කර අධීක්ෂණ කමිටු පිහිටුවන්නට යනවා. එතැනදී බෙද හැරීමත් සෝදිසියකට ලක් වෙනවා. මේ නිසා බෙද හැරීමේ ආයතනය භාරව සිටින නිලධාරියාට තනි තීරණයක් ගෙන එයින් අයුතු ප්‍රයෝජන ගන්න තිබෙන අවස්ථාව අඩු වෙනවා.

නිෂ්පාදන ද්‍රව්‍ය මිලයට ගැනීමත්, ද්‍රව්‍ය බෙද හැරීමත් එක හා සමානව දූෂණවලින් තොරව ගෙනයාමට බලාපොරොත්තු වෙනවා. පාරිභෝගික භාණ්ඩ බෙද හැරීම සම්බන්ධයෙන්—සමුපකාර ආයතන ගැනත්, පෞද්ගලික අංශයේ බෙද හැරීමේ ආයතන ගැනත්—සොයා බලන්න සංවිධාන පත් කර තිබෙනවා. ඒ කියන්නේ සෑම දිසාපති කොට්ඨාශයකම පාරිභෝගික ආරක්ෂක කමිටු ඇති කර තිබෙනවා. ප්‍රාදේශීය උපදිසාපතිතුමාගේ සභාපතිත්වයෙන් පිහිටුවා ඇති එම කමිටුවල ලේකම්වරුන් හැටියට අභ්‍යන්තර වෙළඳ දෙපාර්තම්න්තුවේ නිලධාරීන් පත් කර සිටිනවා. එහි නියෝජිතයන් වන්නේ පාරිභෝගික ආරක්ෂක කමිටුවල නියෝජිතයෝයි.

ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගේ නියෝජිතයෙක්, අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ නිලධාරියෙක්, සමුපකාර සමිතිවල සභාපතිවරු හා සාමාන්‍යාධිකාරිවරු යන විධියේ අයගෙන් සමන්විත බෙද හැරීමේ ආයතන ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා. වෙළඳ සංගමයක් පිහිටෙව්වාම ඒ වෙළඳ සංගමයේ නියෝජිතයන් ආදී හැම දෙනෙකුටම මේ විධියට රැස්වෙලා ඒ ඒ ප්‍රදේශවල භාණ්ඩ බෙද හැරීම ගැන සාකච්ඡා කරන්න පුළුවන්. එවිට කිසිම කැඩීමක් නැතිව භාණ්ඩ බෙදහැරීමක් ඇති වන්නට පුළුවන්. ඒ අතරදී සමහර අවස්ථාවල ඒ සමිතිවලට මුදල් අමාරුකම් ඇති වෙනවා. එවැනි සමිති බැංකුවලට සම්බන්ධ කර දිසාපතිතුමා නැත්නම් දිසා ඇමතිතුමාගේ සහයෝගය ලබාගෙන ඒවාට උපකාර කිරීමේ ක්‍රමයක් මීට වඩා ක්‍රමවත් වැඩපිළිවෙළක් යටතේ සකස් කර ගෙන යනවා.

මේ අතර විශේෂ වැඩපිළිවෙළක් තිබෙනවා. මේ සියළුම පාරිභෝගික භාණ්ඩ බෙද හැරීම ගැන සොයා බැලීමට. ඒ සඳහා වෙළඳ අමාත්‍යාංශය මඟින් විමර්ශන කමිටුවක් ඇති කර තිබෙනවා. යම්කිසි තැනකින් පැමිණිල්ලක් ලැබුණු වහාම ඒ ගැන කටයුතු කිරීම සඳහා මේ විධියේ විමර්ශන කමිටු සෑම දිස්ත්‍රික්කයකම ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා. පාරිභෝගික ආරක්ෂක කමිටුවලට ඉදිරිපත් වන පැමිණිලි ගැන වහාම සොයා බලා යම්කිසි ප්‍රතිකර්මයක් යෙදීමට ඒ ඒ ආයතන මඟින් පත් කරන කමිටුවලට හැකි වෙනවා. මේ වැඩපිළිවෙළ නිසා අපිට හුඟක් දුරට පාරිභෝගික සහන ඇති කිරීමට පුළුවන් වෙනවා. භාණ්ඩ බෙද ගැනීමේදී ඇතිවන අඩුපාඩු මඟ හැරීමටත් හැකි වෙනවා.

පසුගිය වකවානුවේදී ජීවන වියදම වැඩිවන ලකුණු පහළ වෙලා තිබුණා. අපි ඒ ගැන අධීක්ෂණ කමිටු පිහිටුවීම නිසා වැඩිවන ජීවන වියදම පාලනය කිරීමට අපට පුළුවන් වෙලා තිබෙනවා. එම නිසා ජීවන වියදම වේගයෙන් ඉහළ යාම අඩු කරන්න පුළුවන් වෙලා තිබෙනවා. මම වෙළඳ අමාත්‍ය ධුරය භාරගත් දිනයේම මම කිව්වා, ජීවන වියදම ඉහළ යාම අඩු කරනවාය කියලා. ඒක දැන් අපි අඩු කර තිබෙනවා. අවුරුදු 10 කට පස්සේ සැප්තැම්බර් මාසයේ ජීවන වියදම පෙර මාසයට වඩා අඩුවුණු අවස්ථාවක් වුණා. ඒ නිසා අපිට පේනවා, භාණ්ඩ බෙද හැරීමේදී ඇතිවන දුර්වලතා නිසා මේ ජීවන වියදම වැඩිවීමේ වේගය ඉහළ යනවා කියා. එය පාලනයක් කිරීමට නිතර අධීක්ෂණයක් කෙරෙනවා නම් ඒකක හතරක පහක වෙනසක් නවත්වා ගන්න පුළුවන්. ඒ ගැන දැනට ඉතා උනන්දුවෙන් සොයා බලාගෙන යනවා.

මෙතැනදී අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඒ සියලුම කරුණුවලට උත්තර දෙන්නට අවස්ථාව නොලැබුණත් වැදගත් කරුණු දෙක තුනක් ගැන කිය යුතුයි. ගරු අත්තනගල්ලේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේ ගරු සභාවේ සිටින නිසා එතුමා යෝජනා කළ කරුණු කීපයක් ගැන මතක් කරන්න කැමතියි. එතුමා රබර් කර්මාන්තය ගැන අදහස් දක්වූවා. එතුමාගේ ඒ අදහස් වැදගත්. ඒවා උපදේශක සභාවට ඉදිරිපත් කර තිබෙනවා. කරුණු සොයා බලා අපි කටයුතු කරනවා.

රබර් වෙළඳ පොළට ඉදිරිපත් කිරීම ගැන එතුමා කරුණු ඉදිරිපත් කළා. කුඩා ඉඩම් හිමියන්ට මීට වඩා ඵලදායක ක්‍රමයක් ඇති කරන්නේ කොහොමද යන කාරණය අපි උපදේශක සභාවේදීත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙනවා. මන්ත්‍රීතුමන්ලා කීපදෙනකුගෙන්ම අපට රබර් ගැන කරුණු ඉදිරිපත් වුණා. රබර් සම්බන්ධයෙන් දැනට අපි ගෙන යන වැඩ පිළිවෙළ එතුමන්ලාට දැනගන්නට නොලැබුණාවත්දැයි මම දන්නේ නැහැ. පසුගිය මාස පහ ඇතුළතදී අපි වැඩිපුර රබර් මිලයට ගැනීමට වැඩ පිළිවෙළක් යෙදුවා. 1984 ජනවාරි මාසයේදී වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුව කිලෝග්‍රෑම් හාරදස් හාරසියක් ගත්තා. සැප්තැම්බර් මාසය වන විට ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රමාණය ලක්ෂය දක්වා වැඩිකර තිබෙනවා. සාමාන්‍යයෙන් වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුවේ රබර් ගබඩාවලත් දැන් මිලට ගැනීමේ ප්‍රමාණය වැඩිකර තිබෙනවා. නමුත් ඒ වැඩි කිරීමෙන් පමණක් අපි සෑහීමට පත්වන්නේ නැහැ. වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුවට සියලුම රබර් මිලයට ගන්නත් බැහැ. නමුත් පෞද්ගලික වෙළෙන්ද නිපදවන්නාට හානියක් වන අන්දමේ වැඩ පිළිවෙලක් යොදතොත් එතැනදී අපි නිපදවන්නාට පුළුවන් තරම් සහනයක් දීමට කටයුතු කරනවා. ඒ අතින් අප ගන්නා උත්සාහයේ ප්‍රතිඵල ඇති වන්නේ නිපදවන්නාට සහනයක් ඇති වන විටයි.

තවත් ගරු මන්ත්‍රීවරයෙක් නැව් සංස්ථාව ගැන කරුණු ඉදිරිපත් කළා. නැව් සංස්ථාව ගැන මම මේ කරුණ කියන්න කැමතියි. නැව් සඳහා මුදල් ආයෝජනය කිරීමේදී ඉතාම කල්පනාකාරීව කමිටු කීපයකින් ඒ ගැන සාකච්ඡා කොට කැබිනට් මණ්ඩලයේ තීරණය අනුව ඒ කාලයේ තිබුණු තත්ත්වය උඩ ඉතාම හොඳ චේතනාවෙනුයි ඒ මුදල් ආයෝජනය කළේ. ආයෝජනය කළ ඒ මුදල් නැති නොවන්නට ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළකුත් නැව් සංස්ථාව ක්‍රියාත්මක කරගෙන යනවා. අපි නැව් සංස්ථාවේ ලාභ අලාභ ගැන පමණක් සලකා බැලුවාට මදි. නැව් සංස්ථාවෙන් සිදු වන සේවය ගැනත් කල්පනා කරන්න ඕනෑ. දේශීය නිෂ්පාදන අපනයනය කිරීමේදී නැව් සංස්ථාවෙන් විශාල සේවයක් සිදු වෙනවා. නැව් සංස්ථාව විසින් ලංකාවේ ධජය දැන් ලෝකයේ සියලුම වරායවලට ගෙන ගොස් නැව් සංස්ථාව ගැනත් අපේ රට ගැනත් කීර්තියක් පැතිරවීමට කටයුතු සලසා තිබෙනවා.

දැන් අලුත් ගමන් මාර්ග කීපයක් ඇති කරන්න කටයුතු කරගෙන යනවා. ඕස්ට්‍රේලියාවටත් අමෙරිකාවටත් අලුත් ගමන් මාර්ග ආරම්භ කරන්න යනව. කොරියාවේ වෙළඳ ඇමතිතුමා ළඟදී ලංකාවට පැමිණියා. එතුමා සමගත් සාකච්ජා පවත්වා අපේ නැව් ගමන් මාර්ගය කොරියාවටත් දීර්ඝ කිරීමට වැඩ පිළිවෙලක් දැන් යොදගෙන යනවා.

ඒ නිසා නැව් සංස්ථාවේ අනාගතය හොඳයි. එය රාජ්‍ය ආයතනයක් හැටියට තිබෙන නිසා ඕනෑම හදිසි අවස්ථාවකදී බඩු ගෙනයෑම පැත්තකට දමා රටේ සේවය සඳහා නැව් යොදවන්නත් අපට පුළුවන් වෙනවා. ජාතියේ සේවය සඳහා යොදවන්නත් පුළුවන් වෙනවා. ඒ නිසා නැව් ආරක්ෂා කිරීමට කටයුතු යෙදීම අතිශයෙන් ම අවශ්‍ය වී තිබෙනවා.

තවත් අදහස් කීපයක් ඉදිරිපත් වුණා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරණ මහතා) එතුමාගේ සළුසල ශාඛාව ගැන කරුණු ඉදිරිපත් කළා. අපි ඒ පළාතේ ආරම්භ කර තිබුණා රෙදි මුද්‍රණය කිරීමේ ඒකකයක්. එයින් 1983 වර්ෂයේදී රුපියල් පන් ලක්ෂයක් පාඩු වුණා. ඒ නිසා එය තාවකාලිකව වසා දමා තිබෙනවා. එහි සේවකයන්ට කිසිම හානියක් නැහැ. අපි ඒ ගැන ගරු මන්ත්‍රීතුමා සමගත් සාකච්ජා කොට එය පලදායක අන්දමට පවත්වාගෙන යන්න පුළුවන්දැයි සොයා බලන්න බලාපොරොත්තු වෙනවා.

පරිප්පු පැකට් කිරීමේදී එහි බරේ හා මිලේ වෙනසක් සිදුවීමක් ගැන මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කරුණු සඳහන් කළා. එහෙම දෙයක් වෙලා නැහැ. මම හොයා බැලුව. සිදු වී තිබෙන්නේ මෙයයි. අපි පළමුවෙන් පරිප්පු පැකට් කළේ ග්‍රෑම් 500 බැගින්. නමුත් දැන් එය සුළු මිනිසාටත් මිලට ගන්න පුළුවන් වන අන්දමට ග්‍රෑම් 250 ටත් පැකට් කරනව. මිල පාලනයක් තිබෙන නිසා ඒ ගණන හරියට දෙකට බෙද විකුණනවා. යම් කෙනෙක් ඊට වැඩි මිලකට විකුණනවා නම් මිල පාලන දෙපාර්තමේන්තුව මඟින් ඒ අයට දඬුවම් කරන්න පුළුවන්. නමුත් එවැනි අසාධාරණයක් වී නැති බව මම කියන්න කැමතියි.

අක්මීමන ගරු මන්ත්‍රීතුමා ගාලු වරාය ගැන කතා කළා. ගාලු වරාය හුහාක් දියුණු කරන්න ඕනෑ. ඒ ගැන උනන්දුවෙන් ක්‍රියා කිරීම සඳහා සාකච්ජා පවත්වාගෙන යන බව මම කියන්න කැමතියි. මෙම අමාත්‍යාංශය පිළිබඳව විවාදය දෙකහමාරට අවසන් කළ යුතුව තිබෙන නිසා මට කථා කරන්නට තිබෙන වෙලාවත් අවසන් වේගන යනවා. ගරු මන්ත්‍රීවරුන් හුඟක් කරුණු ඉදිරිපත් කළා. එයින් දැන් මේ අවස්ථාවේදී මගෙන් පිළිතුරු නොලැබුණු කරුණුවලට පිළිතුරු සති දෙකක් ඇතුළත ඒ ගරු මන්ත්‍රීතුමන්ලාට සපයන බව මම මතක් කරන්නට කැමතියි.

විශේෂයෙන් අභ්‍යන්තර වෙළඳාම ගැන මගේ තිබෙන පළපුරුද්දත්, බාහිර වෙළඳාම ගැන තව තවත් සැලකිල්ල දැක්වීමත් ගැන අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කියවුණු [illegible] ඉදිරිපත් කිරීම ගැන මම සතුටු වෙනවා. එතුමා කිව්වා වගේ අභ්‍යන්තර වෙළඳාම ගැන මට දැනුමක් තිබුණා වගේම විදේශීය වෙළඳාම ගැන තිබුණු දැනුමේ අඩුවක් තිබුණා කියා. ඒ මොකද කියනවා නම් මම වැඩි කාලයක්ම ගත කළේ අභ්‍යන්තර වෙළඳ කටයුතු සම්බන්ධවයි. මම දැන් හුඟක් දුරට විදේශීය වෙළඳ කටයුතු ගැන අධීක්ෂණය කරගෙන යනවා, අධ්‍යයනය කරගෙන යනවා. පසුගිය දවස්වල නමුත්නාත්සේ අපිව අන්තර් පාර්ලිමේන්තු සම්මේලනයට පිටත් කළා. එහි ගිය වෙලාවේ වෙළඳ හා මිල ගණන් පිළිබඳව ගිවිසුමේ – General Agreement on Tariffs and Trade – ආයතනයට මම ගියා ඒ ආයතනයේ ප්‍රධානීන් හමු වුණා. අපේ රටේ වෙළඳ කටයුතුවලට ප්‍රයෝජනවත් හුඟක් දේවල් සාකච්ජා කළා. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ වෙළඳ හා සංවර්ධන සම්මේලනයේ – UNCTAD – ප්‍රධාන නිලධාරියා වන ආචාර්ය ගාමිණී කොරයා මැතිතුමා හමු වුණා. දැනට තිබෙන තත්ත්වය උඩ වෙළඳ කටයුතු වලින් අපේ රටට ලබා ගන්නට පුළුවන් වාසිදායක තත්ත්වයන් මොනවාද කියා එතුමාත් සමඟ අපි දීර්ඝව සාකච්ජා කළා.

ඒ වාගේම එම ආයතනයේම කොටසක් වන ආසියාතු පැසිෆික් කලාපයේ ආර්ථික හා සමාජයීය කොමිෂන් සභාවේ – ESCAP – නිලධාරීන් හමු වුණා. අපේ රටට වෙළඳ කටයුතුවලදී ලබා ගත හැකි සහයෝගය ගැන අපි ඒ අයත් සමග සාකච්ජා කළා. ඒ වාගේම ලෝක බුද්ධිමය දේපොල සංවිධානයේ – World Intellectual Property Organization – නිලධාරීන් සහ අධ්‍යක්ෂවරුන් සියලු දෙනාම හමු වී සාකච්ජා කළා. ඒ වාගේම ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ – International Trade Centre – නිලධාරීන් සියලු දෙනා හමු වී අපේ රටට වෙළඳ අංශවලින් ලබා ගත හැකි ප්‍රයෝජන ගැන හුඟක් දුරට සාකච්ජා කර ඒ කරුණු මම ඉගෙන ගත්තා. ඒ වාගේම විදේශීය වෙළඳාම ගැන තව තවත් දන්නා, ඒ ගැන පළපුරුදු ලංකාවේ අය සමඟ නිතර සාකච්ජා කර, කරුණු අධ්‍යයනය කර මගේ අමාත්‍යාංශය කාර්යක්ෂමව කරගෙන යාමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා බව මම මතක් කරන්නට කැමතියි.

අවසන් වශයෙන් තව එක් කරුණක් කිව යුතුව තිබෙනවා. අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳව කරුණු සොයා බැලීමට කමිටුවක් පත් කළා. වර්තමාන සෞඛ්‍ය ඇමති දොස්තර රංජිත් අතපත්තු මැතිතුමා අනුරාධපුර දිසා ඇමති කේ. ඩී. එම්. සී. බණ්ඩාර මැතිතුමා, රාජ්‍ය පරිපාලන නියෝජ්‍ය ඇමති හරින්ද්‍ර කොරයා මැතිතුමා, ගමනාගමන මණ්ඩල නියෝජ්‍ය ඇමති එච්. බී. අබේරත්න මැතිතුමා, දේශීය වෛද්‍ය ඇමති වී. ජ. මු. ලොකුබණ්ඩාර මැතිතුමා ඇතුළු මැති ඇමතිවරුන් ඉදිරිපත් කළ යෝජනා ඉතාම අගය කර, එම යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරගෙන යනවා. ඒ වාගේම පසුගිය දවස්වල සතොස මඟින් රටලූනු ආනයනය කිරීමේදීත් අපට ගැටළු මතු වුණා. ඒවා පරීක්ෂා කරන්නට අපි කමිටුවක් පත් කළා. වත්තල ගරු මන්ත්‍රීතුමා (ජේ. ඒ. ඊ. අමරතුංග මහතා) අගලවත්ත ගරු මන්ත්‍රීතුමා (මෙරිල් කාරියවසම් මහතා) සහ රත්ගම ගරු මන්ත්‍රීතුමා (අශෝක සෝමරත්න මහතා) ඒ කමිටුවට ඇතුළත් වුණා. මේ මහත්වරු ඉතාමත්ම වැදගත් යෝජනා ඉදිරිපත් කර තිබුණා. වෙළඳ අමාත්‍යාංශයේ යහපත සඳහා අපි ඒවා ක්‍රියාත්මක කරන්නට කටයුතු කරගෙන යනවා.

මෙම කටයුතුවලට සහභාගි වන—විශේෂයෙන් මම ජාතික සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වන—ආහාර හා සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු එතුමාගේ නිලධාරි මණ්ඩලයටත් කෘෂිකර්ම හා කෘෂිකර්ම පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු එතුමාගේ නිලධාරි මණ්ඩලයටත්, වී අලෙවිකිරීමේ මණ්ඩලයේ නිලධාරි මහතුන්ටත් සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මහා බැංකුවේ නිලධාරි මහතුන්ටත් මේ ආදී වශයෙන් අපට උපකාර කළ ආයතනවල සියලුදෙනාටමත් මම විශේෂයෙන් ස්තුති කරනවා. ඒ වාගේම අපේ සංස්ථාවලට බාහිරව අපට විශේෂයෙන් උපකාර කරන තවත් ආයතන රාශියක් තිබෙනවා. ඒ සියලුම ආයතනවල නිලධාරි මහතුනට මම ස්තුතිවන්ත වෙනවා. මගේ අමාත්‍යාංශයේ වැඩකටයුතු කරගෙන යාමට මට බොහොම උපකාර කරන මගේ නියෝජ්‍ය ඇමතිතුමා ගැන මම සඳහන් කරන්නට ඕනෑ. එතුමා පත්කළ වෙලාවේම ජනාධිපතිතුමා මට දුරකථනයෙන් කථාකර කිව්වා මහෙන්ද්‍ර විජේරත්න මැතිතුමා පත්කළ බව. එවිට මම කිව්වා, මම නායකයෙක් හැටියට වරක් භාරගෙන සිටි පිලිප් ගුණවර්ධන මැතිතුමාගේ බෑනා වන මහෙන්ද්‍ර විජේරත්න මැතිතුමා පත්කිරීම මට ලොකු ශක්තියක්ය කියා. මම ඉතාම ගෞරවයෙන් එතුමා ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### 62 වන ශීර්ෂය—සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන—සමාගම් සහ අන්‍ය ආඥපනත් පරිපාලනය—පුනරාවර්තන වියදම, රු. 27,39,000

### தலைப்பு 62.—கம்பனிகள் பதிவாளர் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—கம்பனி, பிற கட்டளைச் சட்டங்களின் நிருவாகம்—மீண்டுவரும் செலவு, ரூபா 27,39,000

### HEAD 62.–DEPARTMENT OF THE REGISTRAR OF COMPANIES

Programme 1.–Administration of Companies and other Ordinances–Recurrent Expenditure, Rs. 2,739,000

"62 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 27,39,,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

62 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 62, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 27,39,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 62, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,739,000 for Head 62, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 62, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

### 63 වන ශීර්ෂය—රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන—සැපයීම් සේවා පරිපාලනය—පුනරාවර්තන වියදම, රු. 85,93,000

### தலைப்பு 63.—அரசாங்க வழங்கல்கள் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—வழங்கற் சேவைகளின் நிருவாகம்—மீண்டுவரும் செலவு, ரூபா85,93,000

### HEAD 63.–DEPARTMENT OF GOVERNMENT SUPPLIES

Programme 1.–Administration of Supply Services.–Recurrent Expenditure, Rs. 8,593,000.

"63 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 85,93,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

63 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 63, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 85,93,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 63, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 8,593,000 for Head 63, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 63, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන—සැපයීම් සේවා පරිපාලනය—මූලධන වියදම, රු. 30,76,000

நிகழ்ச்சித் திட்டம் 1.—வழங்கற் சேவைகளின் நிருவாகம்—ஆக்கப்பொருட் செலவு, ரூபா 30,76,000

Programme 1.–Administration of Supply Services.–Capital Expenditure, Rs. 3,076,000

"63 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 30,76,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

63 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 63, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 30,76,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 63, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,076,000, for Head 63, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 63, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 64 වන ශීර්ෂය.—ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—ආනයන හා අපනයන පරිපාලනය—පුනරාවර්තන වියදම, රු. 30,18,000

### தலைப்பு 64.—இறக்குமதி ஏற்றுமதிக் கட்டுப்பாட்டாளர் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—இறக்குமதி, ஏற்றுமதி நிருவாகம்—மீண்டுவரும் செலவு, ரூபா 30,18,000

### HEAD 64.–DEPARTMENT OF CONTROLLER OF IMPORTS AND EXPORTS

Programme 1.–Administration of Imports and Exports–Recurrent Expenditure, Rs. 3,018,000

"64 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 30,18,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

64 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 64, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 30,18,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 64, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,018,000, for Head 64, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 64, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—ආනයන හා අපනයන පරිපාලනය—මූලධන වියදම, රු. 60,000

நிகழ்ச்சித் திட்டம் 1.—இறக்குமதி, ஏற்றுமதி நிருவாகம்—ஆக்கப்பொருட் செலவு, ரூபா 60,000

Programme 1.–Administration of Imports and Exports–Capital Expenditure, Rs. 60,000

"64 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 60,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

64 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 64, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 60,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 64, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 60,000 for Head 64, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 64, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 65 වන ශීර්ෂය.—අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—අලෙවි පාලනය—පුනරාවර්තන වියදම, රු. 14,48,000

### தலைப்பு 65.—சந்தைப்படுத்தல் அபிவிருத்தித் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—சந்தைப்படுத்தல் நிருவாகம்—மீண்டுவரும் செலவு, ரூபா 14,48,000

### HEAD 65.–DEPARTMENT OF DEVELOPMENT OF MARKETING

Programme 1.–Market Administration–Recurrent Expenditure, Rs. 1,448,000

"65 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 14,48,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

65 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 65, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 14,48,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 65, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,448,000, for Head 65, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 65, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1 වන වැඩ සටහන.–අලෙවි පරිපාලනය–මූලධන වියදම, රු. 70,000

நிகழ்ச்சித் திட்டம் 1.—சந்தைப்படுத்தல் நிருவாகம்—ஆக்கப்பொருட் செலவு, ரூபா 70,000

Programme 1.– Marketing Administration– Capital Expenditure, Rs. 70.000

"65 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 70,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

65 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 65, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 70,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 65, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question "That the sum of Rs. 70,000 for Head 65, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 65, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 66 වන ශීර්ෂය.–වාණිජ දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.–වෙළඳ සංවර්ධනය–පුනරාවර්තන වියදම, රු. 1,14,29,000

### தலைப்பு 66.—வர்த்தகத் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—வியாபார மேம்பாடு—மீண்டுவருஞ் செலவு, ரூபா 1,14,29,000

### HEAD 66.–DEPARTMENT OF COMMERCE

Programme 1.–Trde Promotion–Recurrent Expenditure, Rs. 11,429,000

"66 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,14,29,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

66 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 66, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,14,29,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 66, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 11,429,000, for Head 66, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 66, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

### 67 වන ශීර්ෂය.–අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.–මිළ පාලන, කිරුම් හා මිණුම් සහ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත් පරිපාලනය–පුනරාවර්තන වියදම, රු. 1,21,20,000

### தலைப்பு 67.—உள்ளக வியாபாரத் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—பாவனையாளர் பாதுகாப்புச் சட்டங்கள், அளவைகள், நிறைகள், விலைக்கட்டுப்பாடு ஆகியவற்றின் நிருவாகம்—மீண்டுவருஞ் செலவு, ரூபா 1,21,20,000

### HEAD 67.–DEPARTMENT OF INTERNAL TRADE

Programme 1.–Administration of Price Control, Weights and Measures and Consumer Protection Laws–Recurrent, Expenditure, Rs. 12.120,000

"67 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,21,20,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

67 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 67, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,21,20,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 67, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 12,120,000, for Head 67, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 67, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.–මිළ පාලන, කිරුම් හා මිණුම් සහ පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත් පරිපාලනය–මූලධන වියදම, රු. 19,40,000

நிகழ்ச்சித் திட்டம் 1.—பாவனையாளர் பாதுகாப்புச் சட்டங்கள், அளவைகள், நிறைகள் விலைக்கட்டுப்பாடு ஆகியவற்றின் நிருவாகம்—ஆக்கப்பொருட் செலவு, ரூபா 19,40,000

Programme 1.– Administration of Price Control, Weights and Measures and Consumer protection Laws–Capital Expenditure, Rs. 1,940,000

"67 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 19,40,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

67 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

" தலைப்பு 67, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 19,40,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 67, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs.1,940,000 for Head 67, Programme l, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to

Head 67, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

### 68 වන ශීර්ෂය.–පේටන්ට් බලපත්‍ර සහ වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කාර්යාලය

1 වන වැඩ සටහන.–බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පිළිබඳ පනත පරිපාලනය–පුනරාවර්තන වියදම, රු. 15,86,000

### தலைப்பு 68.—ஆக்கவுரிமை, வியாபாரச் சின்னப் பதிவகம்

நிகழ்ச்சித் திட்டம் 1.—புலமைச் சொத்துச் சட்டக் கோவையின் நிருவாகம்—மீண்டுவருஞ் செலவு, ரூபா 15,86,000

### HEAD 68.– REGISTRY OF PATENTS AND TRADE MARKS

Programme 1.–Administration of the Code of Intellectual Property Act–Recurrent Expenditure, Rs. 1,586,000

"68 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 15,86,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

68 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 68, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 15,86,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 68, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,586,000, for Head 68, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 68, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

### 69 වන ශීර්ෂය.–වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.– රබර්, තේ, පොල් නිෂ්පාදන අතිකුත් වෙළඳ ද්‍රව්‍ය සහ ෆොර්මික් සහ ඇසිටික් ඇසිඩ් මිළයට ගැනීම හා විකිණීම–මූලධන වියදම, රු. 1,00,000

### தலைப்பு 69.—வியாபாரப் பொருட்கள் கொள்வனவுத் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—இறப்பர், தேயிலை, தெங்கு உற்பத்தி, பிற வியாபாரப் பொருட்களும், போயிக், அசெட்டிக் அமிலம் ஆகியவற்றின் கொள்வனவும் விற்பனையும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 1,00,000

Programme 1.– Purchase and Sale of Rubber, Tea, Coconut products, Other Commodites and Formic and Acetic Acids–Capital Expenditure, Rs.100,000

"69 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 1,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

69 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 69, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 1,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 69, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question,"That the sum of Rs.100,000, for Head 69, Programme 1, Capital Expenditure be inserted in the Schedudle", put and agreed

Head 69, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**162 වන ශීර්ෂය.–සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා**

1 වන වැඩ සටහන.–සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා–පුනරාවර්තන වියදම. රු. 99,67,000

**தலைப்பு 162.—பண்பாட்டு அலுவல்கள் அமைச்சர்**

நிகழ்ச்சித் திட்டம் 1.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—மீண்டுவருஞ் செலவு, ரூபா 99,67,000

HEAD 162.–MINISTER OF CULTURAL AFFAIRS

Programme 1.–General Administration and Staff Services–Recurrent Expenditure, Rs. 9,967,000

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Now we take up Heads 162 to 166 under the Ministry of Cultural Affairs. The vote will be taken at 6 p.m.

**දිනේෂ් ගුණවර්ධන මහතා** (මහරගම)
**(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)**
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු සභාපතිතුමනි, රුපියල් 10 ක කැපීමක් සංස්කෘතික අමාත්‍යාංශ වැය ශීර්ෂයට යෝජනා කරමින් එතුමාගේ අමාත්‍යාංශය මගින් ඉටු කරන සේවාවට පළමුකොටම මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ සේවාව අපි අගය කරන්නට ඕනෑ. ඒ වාගේම එම අමාත්‍යාංශය මගින් ඉටු කරන්නට පුළුවන් වැඩ කටයුතු රාශියක් වැය ප්‍රශ්නයක් නිසා ඉටු කිරීමට නොහැකිව තිබෙන බව අපි මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ.

සංස්කෘතික අමාත්‍යාංශයේ වැඩි සැලකිල්ලක් යොමු කරන්නෙ, මේ අමාත්‍යාංශයේ වැඩපිළිවෙළ ප්‍රධානත්වය දී තිබෙන්නෙ සංස්කෘතික ත්‍රිකෝණයටයි. එම සංස්කෘතික ත්‍රිකෝණයේ වැඩ පිළිවෙළ ගැන, එහි වැය කරන ප්‍රමාණයන් පිළිබඳව විවිධ ආයතන මගින් විවිධ විවේචකයන් මගින් නොයෙක් ප්‍රකාශ කර තිබෙනවා. ඒ වුණත් එම වැඩපිළිවෙළ මගින් ඉටු වෙන සේවය ඉදිරි කාලයේදී සාර්ථකව රැකබලා ගැනීම සඳහා එහි පදනම ඊට වඩා පළල් කර ගැනීමට කාර්යක්ෂම කර ගැනීමට අපට ගැකිවේවා කියා අපි ප්‍රාර්ථනා කරන්න ඕනෑ. ඒ මොකද ? අපි සංස්කෘතිය හැටියට දකින්නේ අපේ ගොඩනැගිලි, ප්‍රාකාර ආදිය පමණක් නොවෙයි. ජනතාවක් තමන්ගේ ශක්තිත් තමන්ගේ පෝෂණදායකභාවය සහ තමන්ගේ වස්තූන් දියුණු කරගත් අවදිවලදී තමයි, විශේෂයෙන් කලාව සහ නිර්මාණ ක්ෂේත්‍රය බිහි වුණේ. ඕනෑම රටක තත්තවය ඒකයි. ඒ අනුව බලන විට අපේ රටේ ජනතාව කෘෂිකාර්මික පදනමක් මත වැව් අමුණු ගොඩනඟා ගෙන රටේ සියලු ප්‍රදේශවල තමන්ගේ සියලු සංස්කෘතික දායාදයන් ඉතිහාසයට ඉතිරි කරගොස් තිබෙනවා. මම ගරු ඇමතිතුමාගේ අවධානය විශේෂයෙන් යොමු කරන්නේ මෙන්න මේ පදනම මතයි.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண்ட் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES (MR. EDMUND SAMARAWICKREMA) *took the Chair.*

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ලෝකයේ අනික් රටවල සංස්කෘතීන් සමග සසඳා බලනවිට ආදර්ශයට හා ගෞරවයට පාත්‍රවෙන අන්දමේ සංස්කෘතියක් අපටත් ගොඩනැගී තිබෙන බව පේනවා. අන්න ඒ සංස්කෘතියට අයිති මිනිස් පැවැත්ම, මිනිස් හැසිරීම, මිනිස් ගතිපැවතුම් ආදියෙහි පදනම් අද වෙනදට වඩා වේගයෙන් කඩා වැටෙමින් තිබෙනවාය කියන දේ අපි කවුරුත් පිළිගත යුතුයි. මෑත කාලයේදී බටහිර ලෝකයේ ආක්‍රමණයත් නිසා අපේ ජාතික සංස්කෘතියේ ඉතිරි වුණු දේවල් වේගයෙන් තර්ජනයකට මුහුණ පා තිබෙනවා. අන්න ඒ පැත්ත දිහා අපි වෙනදට වඩා බලන්න ඕනෑ. එය ඔබතුමාගේ අමාත්‍යාංශයේ කාර්යභාරයට සම්පූර්ණයෙන් හසුනොවුණත්, ඔබතුමාගේ අමාත්‍යාංශයේ කාර්යභාරයේ බලපෑමක් ඒ කෙරෙහි ඇති කරන්න ඕනෑ.

අපි රූපවාහිනිය අරගෙන බලමු. රූපවාහිනිය තුළින් පතුරුවන්නේ කුමන සංස්කෘතියක්ද ? මේ රටේ ජනතාවට ජාතික සංස්කෘතියේ දායාදයන් පතුරුවන්නට, ස්ථාපිත කරන්න, ඉදිරියේදී තව තව නිර්මාණ කරන්නට එයින් උදව් කරනවාද ? එසේ නැත්නම් බටහිර ලෝකයේ පරගැති තුප්පහි සංස්කෘතිය නැවතත් මේ රටේ ජනතාවට සහ දරුවන්ට බෝකිරීමක්ද ඒ මගින් කරන්නේ කියන එක ගැන අපි විශේෂයෙන් කල්පනා කළ යුතුයි. තුට්ටු දෙකට ගන්නා චිත්‍රපටිවලින් මේ රටේ රූපවාහිනිය නරඹන්නන්ගේ සිත් පිනවීම තුළින් අද ගොඩනැගෙන දරුවන් අනාගතයේ කුමන මාවතකටද හරවන්න හදන්නෙ කියන එක ගැන තමයි අපි අද කල්පනා කළ යුතුව තිබෙන්නෙ. ඒ වගේම විවිධ පොත්පත් සඟරාවල් පළ වෙනවා. මේවා දෙස සංස්කෘතියේ හැටියට අපි බලනවා නම් මෙන්න මේ තත්ත්වය ගැන අපි හිතන්න ඕනෑ. එවැනි තත්ත්වයක් නැතිව ගියොත් සංස්කෘතිය හැටියට රඳා පවතින්නේ, ඉතිරි වෙන්නේ සංචාරකයින්ට බලන්නට තිබෙන ගොඩනැගිලි සහ නටඹුන් පමණයි.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා (සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா — கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)**
(Mr. W. M. G. T. Banda–Deputy Minister of Cultural Affairs)

රූපවාහිනිය අපට අයිති නැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම පැහැදිලිව කියන්න ඕනෑ, රූපවාහිනිය තමුන්නාන්සේලාට අයිති නැහැ. සංචාරක ව්‍යාපාරය තමුන්නාන්සේලාට අයිති නැහැ. තමුන්නාන්සේලාට කිසිම දෙයක් ඒ අනුව අයිති නැහැ. නමුත් ජාතික සංස්කෘතිය පිළිබඳ අමාත්‍යාංශයක් 1956 දී ඇති කළේ මොකටද ? ජාතික සංස්කෘතිය ගොඩ නැඟීමටයි. එය ආරක්ෂා කරන්නටයි. මේ රටේ බෞද්ධ ශිෂ්ටාචාරය පුනර්ජීවනය කරන්නටයි. ඒ සිතුම් පැතුම් ගොඩ නගන්නටයි. ඒ කාර්යයන් අපට අයිති නැහැ කියා නිහඬව ඉන්න නොවෙයි. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයේ ත්‍රිකෝණයේ ප්‍රධානත්වයක් දරන කඹුරුපිටියේ වනරතන ස්වාමීන් වහන්සේ බොහොම එඩිතරව තමන්ගේ අදහස් ප්‍රකාශ කරනවා.

අද තිබෙන මත් ද්‍රව්‍ය උවදුර ගැන බලන්න. තමුන්නාන්සේලාට අයිතියක් නැතැයි කීවාට සංස්කෘතික ක්ෂේත්‍රයෙන් බැලුවොත් ඒ ගැන බලන්න අයිතියක් තිබෙනවා. ඒ පදනම රැක ගන්නට අපි සහයෝගය දෙනවා. එම නිසා ඒ පදනම රැක ගන්නට වැඩ කරන්න. එසේ නොකළොත් ජාතියක් හැටියට අපේ විනාශය වේගයෙන් සිදු වෙනවා. අන්න ඒකයි ප්‍රශ්නය. තමුන්නාන්සේලා දන්නවා විදේශ ආක්‍රමණයෙන් පසුව අපේ රටට සිදු වූ විනාශයන්ගෙන් ගොඩ එන්නට තමයි, සංස්කෘතික දෙපාර්තමේන්තුව හා ඊට සම්බන්ධිත පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විශාල කැනීම් කර, සොයා ගැනීම් කර තමන්ගේ ඉතිහාසය පිළිබඳ සත්‍යතාවය රටටත් ලෝකයාටත් හෙළිදරව් කර තිබෙන්නේ. නමුත් ඒ සත්‍යයන්ට අද අභියෝග කරනවා. ඒ සත්‍යයන්ට අද පරිභව කරනවා. ඒ සත්‍යයන් අද ප්‍රතික්ෂේප කරන්න හදනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා ඇසූ ප්‍රශ්නයකට එතුමා පිළිතුරු දුන්නා. ඒ දුටු ගැමුණු හෂ්මාවශේෂ පිළිබඳ ප්‍රශ්නයයි. ගරු ඇමතිතුමා ඒ අවස්ථාවේදී මින්නේරියේ සිටියේ. ඒ අවස්ථාවේදී එතුමා මේ සභාවේ සිටියා නම් නියෝජ්‍ය ඇමතිතුමා දුන්න උත්තරයමයි දෙන්නේ. දුටුගැමුණු හෂ්මාවශේෂ මේ රට වටේ අරගෙන ගිහින්, ඒ හෂ්මාවශේෂ පිළිබඳ විශේෂ පරීක්ෂණ කමිටුවක් හද, මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ගේ එකතු කළ ලිපි හා සොයා ගැනීම්වලින් අච්චුවේ ගැසූ විශේෂ අතිරේකය සලකා බලා, දුටු ගැමුණු හෂ්මාවශේෂ විශේෂ ස්ථානයක තැන්පත් කිරීම සඳහා මාළිගාවක් හදන්න කළ යෝජනාවට අද සිදුවෙලා තිබෙන්නේ මොකක්ද ? ඇයි අපි ඒ ගැන නිහඬව ඉන්නේ. කොහේ හරි පොතක් පතක් අනුව මේ දුටු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

ගැමුණු හෂ්මාවශේෂ නොවෙයි කියා කවුරු හරි මේ රටේ සංස්කෘතියට පරිභව කරන කෙනෙක්, මේ රටේ මුළු ඉතිහාසයම වලලා දමන්න හදන කෙනෙක්, පුවත් පතකට ලියා බලවතුන් ලඟ ගිහින් බලපෑම් කළ පසුව දුටු ගැමුණු හෂ්මාවශේෂ තැන්පත් කිරීම පිළිබඳ මකටයුත්ත අයින් කර දමා තිබෙනවා. මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, ඔය ත්‍රිකෝණ වැඩ පිළිවෙල නවත්වලා හරි මේ දුටු ගැමුණු හෂ්මාවශේෂ තැන්පත් කිරීමේ මාලිගාව ඉදි කිරීමේ කටයුතු ජාතිය වෙනුවෙන් කරන්නය කියා. එය අපි ඉෂ්ට කලේ නැත්නම් මේ රටේ මුළු උරුමයටම අපි පයින් ගැහීමක් කරන්නේ. අද පුවත්පත්වල අලුතින් දේ ලියනවා. අලුතින් මතු වන ඇතැම් ඉතිහාසඥයින් ලියන පෙවත්පත්වල මේවා ඔප්පු කරන්න බැහැ කියා ලියා තිබෙනවා. එහෙත් ශ්‍රී ලංකාවේ මෙන්ම මුළු ආසියාවේම ශ්‍රේෂ්ඨතම පුරාවිද්‍යාඥයෙක් හැටියට පිළිගන්නා කෙනෙක්, මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්. එපමණක් නොව ඔබතුමා පත්කළ මේ කමිටුවේ ඉන්න සියලු දෙනාම මේ විෂයය පිළිබඳව දන්නා කිසිම කෙනෙකුට දෙවෙනි වන අය නොවෙයි. මේ සියලු දෙනාම පුරා විද්‍යාව, ඉතිහාසය හා එවැනි කැණීම් පිළිබඳ දන්නා විශේෂඥයින්. ඒ කමිටුව, මේ පිළිබඳ විශේෂඥයින්ගෙන් හා මහාචාර්යවරුන්ගෙන් සමන්විත කමිටුවක්. මා අත තිබෙන මේ ලේඛනය මා කලිනුත් කියෙව්වා. මා එය නැවත කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඇයි මේ වැඩ පිළිවෙල යටපත් කර තිබෙන්නේ ? එය යටපත් නොකර වහාම ආරම්භ කරන්න. තමුනාන්සේලාට මෙය ආරම්භ කරන්න සල්ලි නැත්නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට දුටුගැමුණු හෂ්මාවශේෂ තැන්පත් කරන ඒ මාලිගාව ඉදි කිරීමට අපේ ආසනවලින් ඒ පරිත්‍යාග එකතු කර දෙන්න අපි සූදානම්. පැන නැගී තිබෙන ප්‍රශ්නය එය නම් අපට එය කරන්න පුළුවන්.නමුත් එය නොවෙයි පැන නැගී තිබෙන ප්‍රශ්නය. මා ගරු ඇමතිතුමාට විශේෂයෙන් මෙය මතක් කරනවා. මේ රට එක සේසත් කළ මේ රටේ ඉතිහාසයට පුනර්ජීවයක් දුන්න ඒ ශ්‍රේෂ්ඨ විරවරයාට අපි නිගා කරන්න හොඳ නැහැ. අපි එයින් දේශපාලන වාසියක් අරගෙන, එය අයින් කර දමා අද නිහඬ වෙලා ඉන්න හොඳ නැහැ. දේශපාලන වාසියක් ගන්න. අළුත් දේශපාලන වාසි සොයන මෙවැනි වේලාවල දුටු ගැමුණු හෂ්මාවශේෂ වලට මුලින් තිබුණු ගෞරවය නැතිකොට වෙනත් අයගේ බලපෑම්වලට අපි යටවිය යුතු නැහැ.

ඊළඟට මා ගරු ඇමතිතුමාට මතක් කරන්න ඕනෑ. මේ රටේ විදේශීය ආධිපත්‍යට විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයන්ට යටත්වන අවස්ථාවේදී අපේ රට පලාත් දෙකකට බෙදා තිබුණා, මුහුදුබඩ පළාත සහ කන්ද උඩරට පළාත වශයෙන්. ඉන්පසුව සුදු අධිරාජ්‍යයින් විසින් ඔවුන්ගේ වානිජමය හා ආර්ථික ආදයම් එකතු කර ගැනීම සඳහාත් අපේ රට පලාත් 5 කට බෙදුවා, උතුර, දකුණ, නැගෙනහිර, බටහිර සහ මධ්‍යම වශයෙන්. ඊට පසුව තමයි අපේ රටේ පලාත් බෙදුම ඇති වුණේ. අද ඒක දිස්ත්‍රික්ක 25 දක්වා වැඩි වී තිබෙනවා. අධිරාජ්‍යවාදීන්ට බෙදපු මූලික පලාත් බෙදුම මගින් අපේ රටට සංවිධානාත්මකව පහර ගහන්නට පටන ගත්තා. මුළු මහත් පදනමටම පහර ගහන්නට පටන් ගත්තා. ඊයේ පෙරේද මේ රටේ ඇති වූ සිද්ධීන් කීපයක් ගැන කරන ලද ප්‍රකාශයකින් අපේ රටේ සංස්කෘතියට අභියෝගයක් කළ පුද්ගලයකු පිළිබඳව — මේ සභාවේ නැති වුණත් ඔහු ගැන — මා මතක් කරන්නට ඕනෑ. අපි ඒ ප්‍රකාශයට උත්තර දෙන්නට ඕනෑ. උතුරු ප්‍රදේශයේ කෙන්ට් පාම් සහ ඩොලර් පාම් යන ස්ථානවල වූ සිද්ධිය සම්බන්ධයෙන් පුවත්පත් මාධ්‍යයට, ජාත්‍යන්තර ලෝකයට ප්‍රකාශයක් කර තිබෙන මේ සභාවේ හිටපු විපක්ෂ නායක ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායක අමිර්තලිංගම් මහත්මයා — හෙට අර වට මේසයට රිංගා ගන්නා අමිර්තලිංගම් මහත්මයා — කියා තිබෙනවා, "සිංහලයන් ඒ ප්‍රදේශවල පදිංචි කරනවාට අපි විරුද්ධයි, මෙහෙම කැරලි ගහන්න සිංහලයන් ඝාතනය කරන්න අවසරයක් තිබෙනවා" කියා. ද්‍රවිඩ ජනතාව මේ ප්‍රදේශවල ජීවත් වුණත් වෙන කිසිම තැනක ජීවත් වුණත් ඔවුන් ඔවුන්ව ඝාතනය කළයුතුය කියා මේ රටේ ඉතිහාසයේ අපි කවදාවත් උද්ඝෝෂණය කර නැහැ. නමුත් සිංහල ජනතාව ජීවත් වූ ගම්මානවලින් ඒ අය එළවා දැමීම, ඝාතනය කර ඔවුන් විනාශ කිරීම සාධාරණය කියන, ඒ වාගේ ත්‍රස්තවාදී වැඩ කිරීම සාධාරණය කියන උදවියගේ දේශපාලන අරමුණු මොනවාද කියන එක අපි කල්පනා කරන්නට ඕනෑ.

පුරා විද්‍යාඥයන්ට අපේ රටේ ඉතිහාසයට සම්බන්ධ නෂ්ටාවශේෂ සොයා ගෙන තිබෙනවා. ඉතිහාසයේ ඒ සාක්ෂි උතුරු නැගෙනහිර ප්‍රදේශවලින් වේගයෙන්, බලහත්කාරයෙන් නැති වේ ගෙන යනවා. ඒවා නැති කර මේ රටේ මුළු ඉතිහාසයම විකෘති කරන්නට උත්සාහ කරනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ඇමතිවරු—

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)**
**(திரு. ஈ. எல். பி. ஹூருள்ளே — கலாசார அலுவல்கள் அமைச்சர்)**
(Mr. E. L. B. Hurulle–Minister of Cultural Affairs)

මම එක පැහැදිලි කිරීමක් කරන්නට සතුටුයි. දුටු ගැමුණු හෂ්මාවශේෂ ඒ සුදුසු පිළිවෙළට තැන්පත් කිරීම සඳහා ස්ථම්භයක් නැතහොත් කෞතුකාගාරයක් ඉදි කිරීම පිණිස දන් සැලැස්මක් හරිගස්සා ගෙන යනවා. අපි කිසිම කෙනෙකුගේ බලපෑම්වලට යට වෙන්නෙ නැහැ. විශේෂයෙන්ම මා කියනන්නට කැමතියි, 1977 සිට මේ දක්වා උතුරේත් නැගෙනහිර ප්‍රදේශවලත් කෝවිල් ඉදි කර තිබුණු සිද්ධස්ථාන නහනම් කර ඒවා සංස්කරණය කරන්නට ක්‍රියා කලේ මා බව. නමුත් ගිය ආණ්ඩුව කාලයේදී ඒ සිද්ධස්ථානවල කෝවිල් ඉදි කරන්නට ඉඩ දුන්නා. කිලිවෙඩ්ඩි බෝධිය කපන්න ඉඩ දුන්නා. එය එතැනින් ඉවත් කරන්නට ඉඩ දුන්නා. නමුත් මා එවැනි දේවල්වලට ඉඩ දෙන්නෙ නැහැ. මා කියන්නට කැමතියි මා කිසිම කෙනෙකුට යටත් නැති බව. තර්ජන ගර්ජනවලින් අපේ සංස්කෘතිය සහ අපේ භාෂාව විනාශ කරන්නට මා ඉඩ දෙන්නේ නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

හෙට වට මේස සාකච්ඡාවේදීත් ඔය වාගේ වැඩ කරන්නට ඉඩ දෙන්නට එපා.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹூருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

මගේ ප්‍රතිපත්ති ඒකයි. 1956 සිටම මා ප්‍රතිපත්ති වෙනස් නොකළ පුද්ගලයකු බව මුළු ලංකාවම දන්නවා. ඒ වාගේම මා කියන්නට කැමතියි උතුරු නැගෙනහිර ප්‍රදේශවල වැඩිපුරම පුරා විද්‍යා කැණීම් ආරම්භ කලේ මා බව. එම නිසා මා සංස්කෘතික ඇමති වශයෙන් කටයුතු කරන තාක් කල් මෙම රජය තිබෙන තාක් කල් අපේ සිංහලයන්ට, බෞද්ධ සංස්කෘතියට පහරක් වැදේවිය කියා කිසිම භයක් ඇති කර ගන්නට වුවමනාවක් නැහැ.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ගරු ඇමතිතුමාගේ ප්‍රකාශය ගැන මා බොහොම ස්තුතිවන්ත වෙනවා. පසුගිය කාලයේදී මෙන්ම අනාගතයේදීත් ඔබතුමාට එහෙම ක්‍රියා කරන්නට හැකි වේවායි මම ප්‍රාර්ථනා කරනවා. නමුත් එසේ කරන්නට හැකි වෙයිද කියන එකයි, අපට තිබෙන සැකය. ඉතිහාසයේ දෛවය විසින් අපේ ඉරණම වෙනස් කරන්නට යන වෙලාවක ඔබතුමාට තවදුරටත් එසේ ක්‍රියා කරන්නට පුළුවන් වේවායි අපි ප්‍රාර්ථනා කරනවා. නමුත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු වෙනත් කෙනෙකුට පැවරුවොත් එම බලතල තමුන්නාන්සේගෙන් අරන් වෙනත් කෙනෙකුට පැවරුවොත් තවදුරටත් අපේ සංස්කෘතිය හෝ නටබුන් හෝ වෙනත් පුරා විද්‍යාත්මක ස්ථාන ගැන හෝ සොයන්නට ඒ සීමාවෙන් එහාට යෑම නහනම් වෙන්නට පුළුවනි. අන්න ඒකයි අපට තිබෙන සැකය. ඒ සීමාව මොකක්ද කියා තමුන්නාන්සේ දන්නවා. ඇති කරන්නට යන දේවලින් ගරු ඇමතිතුමාගේ බලතල අරගෙන, දෙන්නට හදන දේවල් මොනවාද කියන එකත් දන්නවා. ඒවා දුන්නොත් ගරු ඇමතිතුමාට ඔය අද කථා කළ දේවල් — දාගැබ්, විහාර, පන්සල්, කෝවිල් ආදිය — ගැන ඉදිරියේදී කථා කරන්නට පුළුවන් වෙයිද කියන එකත් අපට සැක සහිතයි. රජරට පුත්‍රයෙකු හැටියට ඇමතිතුමා කවදාවත් එවැනි දේවලට එකඟ වෙයි කියා මම හිතන්නේ නැහැ. නමුත් එවැනි දේවල් ක්‍රියාත්මක කරන්නට එකඟ වන්නට සමහර විට එතුමාට සිදුවේවි.

මම මේ කියා සිටියේ මේ රටේ ජනතාවගේ මේ උරුමය අයින් කර දැමීම සඳහා තිබෙන උත්සාහය ගැනයි. එයට ඉඩ තබන්නේ නැහැ කියන එක ඇමතිතුමා පිළිගන්නවා. එමෙන්ම සිංහල ජනයාට උතුරු නැගෙනහිර පලාත්වල පදිංචි වන්නට අයිතියක් නැතැයි ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකත්වය කරන ප්‍රකාශය අද මේ සභාවේදී ප්‍රතික්ෂේප කර දමනවාද නැත්නම් එය පිළිගන්නවාද ? එවැනි දේවල් කිරීම හරිය, එවැනි ක්‍රියාවල් කර සිංහල ජනතාව ඒ ප්‍රදේශ වලින් එළවා දැමීම හරිය කියන කථා අද උද වී තිබෙන්නේ මොකටද ? ඒවා උද වී තිබෙන්නේ මේ රටේ ත්‍රස්තවාදය ප්‍රාණවත් කරන්නයි. මේ රටේ ත්‍රස්තවාදය පණගැසීගෙන එන අවස්ථාවක, මේ රටේ සංස්කෘතික දයාදයන් විනාශ කර, මේ රටේ බහුතර ජනතාව ජීවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන තැන්වලින් ඒ අය එලවා දැමීම හරිය කියන අය මේ රටට සිදු කරන්නේ මොකක්ද කියන එකයි, අපි ප්‍රශ්න කරන්නේ. අපේ රටේ මුළු මහත් සංස්කෘතියම රඳාපවතින්නේ ඒ මතයි. කන්ද උඩරට සංස්කෘතිය අපේ රටේ සංස්කෘතියේ ඉතාමත් කලාත්මක මෙන්ම අපේ රටේ ඉතිහාසයේ අප කාගේත් ගෞරවයට පාත්‍ර වූ එක්තරා අවධියක්. ඒ කන්ද උඩරට සංස්කෘතික දයාදවලට ඉදිරි කාලයේදී කුමක් වෙයිද ? අපේ රටේ භූගෝලීය සිතියම වෙනස් කිරීමට යම් යම් තීරණ ගත්තොත් ඒ භූගෝලීය සිතියම වෙනස් වී උදාකරන යුගය කුමක්ද ? ඒ යුගය තුළින් මුළු මහත් සිංහල ජනතාව — මේ රටේ වැඩි ජනතාව වන සිංහල ජනතාව — දෙමළ හා මුස්ලිම් ජනතාව සමග සමගියෙන් ජීවත් වූ රටාව වෙනස් කර මේ රටේ සිංහල ජනතාවට තමන්ගේ දේශයේ තමන්ගේ උරුමයේ උරුමක්කාරකම නැති වන්නට හුහක් ඉඩ තිබෙනවා. මම ද්‍රවිඩ ජනතාවට විරුද්ධව හෝ මුස්ලිම් ජනතාවට විරුද්ධව හෝ වෙනත් ජන කොටසකට විරුද්ධව හෝ නොවෙයි, මේ කථා කරන්නේ. සිංහල මෙන්ම දෙමළ මෙන්ම මුස්ලිම් මෙන්ම මේ රටේ පුරවැසිකම දරන ඕනෑම ජන කොටසකට ලංකාවේ ඕනෑම තැනක ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු වී තිබෙන දෙයක්.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)
ඒක තමයි, රජයේ ප්‍රතිපත්තිය.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ඒක රජයේ ප්‍රතිපත්තිය වෙන්න පුළුවන්. ක්‍රියාත්මක කරන දේ ඊට වඩා වෙනස් වුණොත් ඒ ප්‍රතිපත්තියෙන් ඇති වැඩක් නැහැ. මේ රටේ ජනයාගේ පාරම්පරික ප්‍රදේශවලට යන්නට ඒ අයට තිබෙන අයිතිවාසිකම නැතිවී, ඒ ප්‍රදේශවලට ඇතුළුවීමේ අවස්ථාව නැති වී, රටේ ආරක්ෂක හමුදාව ඒ පළාත්වලින් ඉවත් වී, ඒ පළාත්වල පාලනය ආරක්ෂාව ආදී සියළු දේ වෙන කොටසකට භාර දුන්නොත් මේ සංස්කෘතික පුනර්ජීවයට ඇති කරන මේ ආයෝජනවලින් වැඩක් වෙන්නේ නැහැ.

මම ගරු ඇමතිතුමාට විශේෂයෙන් මේ කාරණය මේ අවස්ථාවේ මතක් කළේ මෙන්න මේ නිසයි. ගරු ඇමතිතුමාට ඒවා එකින් එක කියන්නට මම බලාපොරොත්තු වන්නේ නැහැ. මේ අවස්ථාවේදී තමුන්නාන්සේට ලිපියක් කියවන්නට මම කැමතියි. දීර්ඝ ලිපි කීපයක්ම පුවත්පත්වල පළ වී තිබෙනවා. මේ රටේ ශත වර්ෂයක් පැරණි කොළඹ පරම විඥානාර්ථ බෞද්ධ සමාගමේ ප්‍රධාන ලේකම් ජේ. එච්. කරුණාරත්න මහතා ගරු ජනාධිපතිතුමාට යැවූ සන්දේශයක් 1984.10.27 දින " දිවයින " පත්‍රයේ පළ වී තිබෙනවා. මම මෙය සම්පූර්ණ වශයෙන් කියවන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මම එහි එක වගන්තියක් පමණක් කියවනවා. එහි දෙවැනි පිටුවේ මෙය තිබෙන්නේ. එහි කොටස් කොටස් පමණයි, පළ වී තිබෙන්නේ. එහි අට වැනි කොටසෙයි, මෙය සඳහන් වන්නේ. හුහක් කොටස් කපලා. කැපූ මනුෂ්‍යයා නම් දන් බලයේ නැහැ. එහි සඳහන් මෙන්න මේ දේවල් ඔබතුමාට බල පාන ප්‍රශ්න. මේවා තමයි වෙනත් පාලනයකට පවරන්න යන්නෙ. 8 (iii) ආ සහ ඇ කොටස් මෙසේයි :

(ආ) සංස්කෘතික කටයුතු.

(ඇ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවටද ජාතික ලේඛනාගාරයටද, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවටද දැනට හිමි කටයුතු හා බලතල සියල්ල දැනටමත් අප පුරා වස්තු වලට සිදුවන විනාශය පිළිබඳව කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයෙක් පවා එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යා හා සංස්කෘතික සංවිධානයට ආයාචනයක් ඉදිරිපත් කර ඇත. කැබිනට් මණ්ඩලයද පැමිණිලි ඉදිරිපත් කර ඇත. මෙහෙව් තත්ත්වයක් තිබියදී සිංහල බෞද්ධයින්ට විරුද්ධව ලොව පුරා ප්‍රචාරය කරන්නාවූද, ලේඛනගත ලංකා ඉතිහාසය සම්පූර්ණයෙන් විකෘති කරන්නාවූද ජාතිවාදීන්ට මෙම කටයුතු පවරා දීම සලකා බැලිය හැක්කේ කෙසේද ?

" සලකා බැලිය හැක්කේ කෙසේද ? " මෙය මම සම්පූර්ණයෙන් කියවන්නෙ නැහැ. 1984 ඔක්තෝබර් මාසෙ 27 වෙනිදා " දිවයින " පත්‍රයේ මුළු සන්දේශයම තිබෙනවා ඔබතුමා දැකල ඇති. මෙහි තවත් කටයුතු ගණනාවක් තිබෙනවා. මෙම පරම විඥණාර්ථ බෞද්ධ සංගමය ලංකාවේ පැරණිම ආයතනයක්. එය මේ රටේ සංස්කෘතිය, භාෂාව, ජාතික හැඟීම් සහ මේ රටේ ජනතාවගේ වෙනත් සිතුම් පැතුම් පුනර්ජීවනය සඳහා ගොඩනැගුණ ආයතනයක්. ඒ කටයුත්ත ඒ උදවිය ඉෂ්ට කර තිබෙනවා. ඒ අයගේ සැකයත් මතු වී තිබෙන්නේ මේ ප්‍රශ්න සම්බන්ධවයි.

දෙසැම්බර් මාසේ 12 වෙනිදා " දිවයින " පත්‍රයේ 8 වන පිටුවේ කඳුකර ප්‍රදේශයේ පවතින තත්ත්වය ගැන සඳහනක් තිබෙනවා. මේ රටේ බෞද්ධ ජනතාවගේ ගෞරවයට පාත්‍ර වූ මාදුළුවාවේ සෝභිත හිමිපාණන් සමග පැවැත්වූ සාකච්ඡාවක් පිළිබඳවයි, එහි සඳහන් වෙන්නෙ. එහි 8 වෙනි පිටුවේ 5 වෙනි ඡේදයේ මෙන්න මේ විධියට පළ වී තිබෙනවා :

" මේ අතර මලයනාඩු නමින් කන්ද උඩරට වෙනම ද්‍රවිඩ ප්‍රාන්තයක් කර ගැනීමේ තවත් ව්‍යාපාරයක් ද්‍රවිඩ වතු කම්කරුවන් අතරින් මතුවී ඇත. මේ වතු කම්කරු ද්‍රවිඩ තරුණයන්ද දකුණු ඉන්දියාවේ පුහුණුව සඳහා යන බවට සත්‍ය තොරතුරු ලැබී ඇත. මෙසේ සලකා බලන විට ශ්‍රී ලංකාවේ සියළු ද්‍රවිඩයන් එකම අරමුණක් කරා ගමන් කරන බවත්, ඒ අරමුණ ජය ගනු සඳහා සන්නාහ සන්නද්ධව ඇති බවත් අප වටහා ගත යුතුය. "

මේ අපේ සංස්කෘතිය පිළිබඳව මතුවී තිබෙන සැකයක්. මේ මලයනාඩු ගැන කථා කරන විට, මේ සංවිධාන ගැන කථා කරන විට, තමුන්නාන්සේලාගේ ගරු ඇමතිතුමෙකු වන කර්මාන්ත ඇමතිතුමා මුද්‍රණය කර තිබෙන පොත් පිංචෙන් කොටසක් කියවන්න කැමතියි. මොකද, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති වෙනස් කරන්න උපාය කියන එකවත් ඉල්ලා සිටින්න. එදත් මේකෙන් කොටසක් කියෙව්වා ; අදත් කොටසක් කියවනවා. මෙම පොත මුද්‍රණය කර තිබෙන දිනය සහ ලිපිනය වශයෙන් තිබෙන්නේ 1984.06.14 වෙනි දින, 101, බාන්ස් පෙදෙස, කොළඹ. මම හිතන්නෙ එතුමාගේ නිවස වෙන්න ඇති, මේ ස්ථානය. මේ ස්වාමීන් වහන්සේ කියන එක මේකෙන් සනාථ කර තිබෙනවා. එහි 22 වෙනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා :

" **(ii) ලංකා වතු කම්කරු සංගමයේ ආකල්පය :—**

එස්. තොණ්ඩමන් මහතාගේ නායකත්වයෙන් යුත් ලංකා වතු කම්කරු සංගමයේ ආකල්පය කුමක්ද ? 1984 මැයි 10 — 12 දින දකුණු කොරියාවේ අගනුවර වන සූල් නගරයේ පැවැත් වූ අන්තර් ජාතික නිදහස් වෘත්තීය සමිති සංගම් සංයුක්තයේ (International Confederation of Free Trade Unions) 13 වැනි කලාපීය සම්මේලනයේ දී සම්මත කර ගන්නා ලද යෝජනාවකින් මොවුන්ගේ ආකල්පය හෙළිවේ. මෙය යෝජනා කරන ලද්දේ ලංකා වතු කම්කරු සංගමය නියෝජනය කළ සුන්දරම් නමැති ලන්ඩනයේ වෙසෙන නීතිඥයෙක් විසිනි. ඔහු ලංකා වතු කම්කරු සංගමයේ උප ලේකම් වන නීතිඥ පෙරී සුන්දරම්ගේ සොහොයුරෙකි. මේ සම්මේලනයේ දී සම්මත කර ගන්නා ලද යෝජනාවෙන් කුඩා කොටසක් පහත දැක්වේ. "

" කුඩා කොටසක් පහත දක්වේ " අපි දන්නෙ කුඩා කොටසක් පමණයි. මුළු කොටසම ඇමතිතුමාගෙන් ඔබතුමාට ගන්න පුළුවන්. මේ ශ්‍රී ලංකාවට විදේශ ආධාර වැළැක්වීම සඳහා කරන වැඩ. මෙන්න ඒ කුඩා කොටස :

" ශ්‍රී ලංකාව විසින් විදේශ ආධාර ඉල්ලා ඇති සියලුම රජයන් හා අන්තර් ජාතික ආයතන එම ආධාර දිය යුතු වන්නේ, මෙම සම්මත කරගන්නා යෝජනාවේ ඉහත ඡේදයේ සඳහන් පියවරවල් සාර්ථක ලෙස ගනහොත් පමණි. "

මේ කියන දේවල් බොරු නොවෙයි. මේ ස්වාමීන් වහන්සේ කියන දේවල් මෙයින් සනාථ කරනවා. මෙය මුද්‍රණය කර තිබෙන පොතක්. ඒ පැත්තෙ හිටියත්, කැබිනට් මණ්ඩලයේ සිටින ඇමතිවරයකු හැටියට මේ ගරු ඇමතිතුමා ඉතා නිර්භීතව සිංහල ජනතාවගේ ප්‍රශ්න ගැන කියා තිබෙන බව අපි කියන්න ඕනැ. නමුත් කැබිනට් මණ්ඩලයේ සිටින තවත් ඇමතිවරයෙකුගේ නායකත්වයෙන් තිබෙන සංවිධානයක් අර දේවල් කරගෙන යනවා. මේ නිසා අපට සැකයක් මතු වෙනවා. අපි සංස්කෘතිය ගැන කථා කරනවා. මෙහෙම ගියොත් අපට අන්තිමට මොනවද ඉතුරු වෙන්නෙ කථා කරන්න ?

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
**(Mr. W. M. G. T. Banda)**

ඔවා, තමුන්නාන්සේ වටමේස සාකච්ඡාවේදී ඉදිරිපත් කළ යුතු වැදගත් අදහස්.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

නියෝජ්‍ය ඇමතිතුමා වටමේස සාකච්ඡාවට ගියා නම් අද ඔය කථාව කියන්නේ නැහැ. වටමේසයේ කෙරෙන දේවල් අවුල් කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. වටමේස සාකච්ඡා මගින් මේ රටේ ජන වාර්ගික ප්‍රශ්නය සම්බන්ධයෙන් සාමකාමී, රටට හිතකර විසඳුමක් ඇති කරගන්න පුළුවන් නම් අපි කවදාවත් ඒකට විරුද්ධ වන්නේ නැහැ. නමුත් වටමේසයේ මුවාවෙන් මේ රටේ ජනතා අයිතීන් පාවා දෙන්න කටයුතු කරනවා නම් අපට සිදු වෙනවා, ඒකට විරුද්ධ වන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
(Mr. W. M. G. T. Banda)
ඉතින්, විරුද්ධ වෙන්න පුළුවන් නේ ?

අ. භා. 3. 00

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ඔව්, විරුද්ධ වෙනවා. තොණ්ඩමන් ඇමතිතුමාගේ නායකත්වය යටතේ කෙරෙන්නේ මොනවාද කියා මම කලින් උපුටා දක්වූ ඒ පොතේ පෙන්වා දී තිබෙනවා. එය ආණ්ඩු පක්ෂයේම කෙනෙකුගේ පොතක්. ඊටත් වඩා තවත් කැබිනට් ඇමතිවරයකුගේම පොතක්. අර ස්වාමීන් වහන්සේලා නගන ප්‍රශ්නය වන ' මලෙයි නාඩු ' කියන්නේ මොකක්ද ? උතුරේ අද ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද ? ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයා කියනවා, ' එක සිංහලයෙක්වත් ඒ ප්‍රදේශවල පදිංචි විය යුතු නැහැ, සිංහලයන් ඒ ප්‍රදේශවලින් එලවා දැමිය යුතුයි ' කියා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
(Mr. W. M. G. T. Banda)
අපි කියනවා, එය අසාධාරණ ප්‍රකාශයක්ය කියා.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඒක හඳුන්වනවා ත්‍රස්තවාදය ' යනුවෙන්. ඒ ත්‍රස්තවාදයේ නායකයා කියනවා, ඒ ප්‍රදේශයෙන් සිංහල ජනතාව ගහල එලවන්න ඕනැය කියා. නමුත් නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, මේ ගැන වටමේසයට ගිහින් සාකච්ඡා කරන්නය කියා. කොළඹ පරම විඥනාර්ථ බෞද්ධ සමාගම වැනි බෞද්ධ සංවිධාන ගණනාවක් රජයෙන් එක්තරා ඉල්ලීමක් කර තිබෙනවා. දෙසැම්බර් 12 වැනිද ' දිවයින ' පත්‍රයේ මුල් පිටුවේම ඒ ඉල්ලීම සඳහන් වී තිබෙනවා, මේ විධියට.

" එම යෝජනාව සම්පූර්ණයෙන් මෙසේය.

යෝජනාව

' මුළු රටේම ආරක්ෂාවට තර්ජනය වන තරම් දෙමළ ත්‍රස්තවාදය උග්‍රවන බැවින්ද, දෙමළ ත්‍රස්තවාදීන් මිනිසුන් ඝාතනය කරමින් පුද්ගලයින් දහස් ගණනක් අනාථ කර ඇති බැවින්ද, රාජකාරී කටයුතුවල නියැලී සිටින ආරක්ෂක භටයින් හා පොලිස් භටයින් සැමදම පාහේ මරා දමන බැවින්ද, මහජන දේපල විනාශ කිරීම හා මහජන මුදල් කොල්ලකෑම දිනපතාම සිදුවන බැවින්ද, යාපන අර්ධද්වීපයේ හා සෙසු පළාත්වල නොසන්සුන්කම් ඇතිකරමින් ඔවුන් විසින් ගෙන යන විනාශකාරී ක්‍රියා නිසාත්, ත්‍රස්තවාදීන් වතුකරයේ දෙමළ තරුණයින් සටන්වලට පුහුණුකර රජයට විරුද්ධව නැඟීසිටීමට සැරසී සිටින බැවින්ද, ' කෙන්ට් ' හා ' ඩොලර් ' ෆාම්හි සිටි අසරණ ගැහැණු හා ළමයින් මරා දැමීම අප්පපිල්ලේ අමිර්තලිංගම් මහතා එය යුක්ති සහගත ක්‍රියාවක් බව ප්‍රකාශ කර ඇති බව වාර්තාවී ඇති හෙයින්ද, මුළු රටේම අසිංසක ජනතාවට හිංසා පීඩා විඳීමට සිදුවී ඇති බැවින්ද, නීතිය හා සාමය යථා තත්ත්වයට ගෙන ඒමට රජය ක්‍රියා කරනු ඇතැයි විශ්වාස කර සිංහල ජනතාව ඉවසා සිටින හෙයින්ද, මෙවැනි තත්ත්වයකදී ත්‍රස්තවාදීන් දිනා ගන්නට අදහස් කරන සුළු ජාතින්ගේ ඉල්ලීම් සලකා බැලීමට සම්මේලනය පැවැත්වීම, මරුමුවට පත්අයටද අගෞරවයක් ගෙන දෙන බැවින්ද, සීමාසහිත කොළඹ පරම විඥනාර්ථ බෞද්ධ සමාගම පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කරන මෙන් රජයේන් ඉල්ලා සිටී.

1.

(අ) රටේ ස්ථාවර භාවයට හානිවන සේ දෙමළ ත්‍රස්තවාදීන් විසින් සිදු කරන ප්‍රචණ්ඩ ක්‍රියා නැවැත්වීමට ඔවුන්ගේ දේශපාලන පක්ෂ ක්‍රියා මාර්ගයක් ගන්නා තෙක් 1984 දෙසැම්බර් 14 දිනට පැවැත්වීමට නියමිත සර්වපාක්ෂික වටමේස සාකච්ජාව කල් දමන ලෙසද,

(ආ) ත්‍රස්තවාදය මෙරටින් තුරන් කිරීම සඳහා පැහැදිලි සැලැස්මක් සංවිධාන ඇතිකර, දැනට වඩා ක්‍රියාතමක පියවරක් ගන්නා ලෙස්ද,

(ඇ) රජයේ හා පෞද්ගලික ආයතනවල අවිශ්වාස දයක නිලධාරීන් හෝ සේවකයින් වගකිවයුතු ස්ථානවලින් ඉවත් කරන ලෙසද,

(ඈ) කෙලින්ම හෝ වක්‍රව හෝ දෙමළ ත්‍රස්තවාදීන්ට හා රට දෙකඩ කිරීමට අනුබල හා ආධාර දෙන පුද්ගලයින්ට හා සංවිධාන වලට විරුද්ධව දැඩි ලෙස ක්‍රියා කරන ලෙසද,

(ඉ) දැනට ඇති ප්‍රධාන ප්‍රශ්නය ත්‍රස්තවාදය සහමුලින්ම මැඩ පැවැත්වීම යයි, ගරු ජනාධිපතිතුමාගේ මූලික අරමුණ බව මෑතකදී කරණ ලද සාකච්ජාවේදී ජනාධිපති ලේකම් තුමා ප්‍රකාශ කර සිටි හෙයින්ද, රට දෙකඩ කිරීම සඳහා දෙමළ ත්‍රස්තවාදීන් විසින් ගෙන යන සාපරාධී ක්‍රියා නවත්වන තෙක් යෝජිත සර්වපාක්ෂික වටමේස සාකච්ජාව කල් දමන මෙන් නැවත වරක් සීමාසහිත කොළඹ පරම විඥනාර්ථ බෞද්ධ සමාගම රජයෙන් ඉල්ලා සිටී. ' "

ඉහතින් දක්වූ ඒ ඉල්ලීම කර තිබෙන්නේ පරම විඥනාර්ථ බෞද්ධ සමාගම පමණක්ම නොවෙයි. තවත් බෞද්ධ සමිති-සමාගම් මෙන්ම ගරුතර ස්වාමීන් වහන්සේලාත් ඒ ඉල්ලීම කරතිබෙනවා.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே )**
(Mr. E. L. B. Hurulle)
වතුකරයේ පමණක් නොවෙයි, ත්‍රස්තවාදීන් ඉන්නේ, අපේ සිංහල ප්‍රදේශවලත් ඉන්නවා, ඒ ත්‍රස්තවාදීන්ට සහයෝගය දෙන අය.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

එහෙම නම් ඒ ගැනත් කරුණු සහිතව පෙන්වා දෙන්න. අපි ළඟ තිබෙන කරුණු තමයි, අපි පෙන්වා දෙන්නේ. වෙනත් කැබිනට් ඇමතිවරයකුගේ නායකත්වයෙන් මේ වැඩ කෙරෙනවායයි ගරු සිරිල් මැතිව් ඇමතිතුමා කියන්නේ බොරුද ? බොරු නම් ඒ ඇමතිතුමාට කියන්න ඒ පොත ඉල්ලා අස් කරගන්නය කියා. ඇත්ත නම් ඊට වගකිව යුතු කැබිනට් ඇමතිවරයාට කියන්න, ගෙදර යන්න කියා. ඒකයි තමුන්නාන්සේලා රටවෙනුවෙන් කළ යුත්තේ. අනික් අයගේ කරපිටට ත්‍රස්තවාදය පටවා ප්‍රශ්නය මග හැරීම නොවෙයි කරන්ට තිනේනේ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)
වතුවලත් ත්‍රස්තවාදීන් ඉන්නා බව මන්ත්‍රීතුමා කියනවා. වතුවල පමණක් නොවෙයි, සිංහල ප්‍රදේශවලත්, සිංහල ත්‍රස්තවාදීන් ඉන්නවා, උතුරේ ත්‍රස්තවාදීන්ට සහයෝගය දෙන.

**දිනේෂ් ගුණවර්ධන මහතා**
**(திரு. தினேஷ் குணவர்த்தன)**
(Mr. Dinesh Gunawardene)

ඇමතිතුමා කියන දේ ඔප්පු කිරීම තමුන්නාන්සේලාටම පැවරී ඇති දෙයක්. නමුත් මම, කියන්නට ඕනැ, මේ රට දෙකඩ කිරීමකට හෝ දෙකඩ කිරීමක් සඳහා උදව් වන යෝජනාවකට හෝ අපි එකඟ වෙන්නේ නැති බව. බලයේ සිටින තමුන්නාන්සේලා ඒ සඳහා ක්‍රියා කරනවා නම්, රට ආරක්ෂා කර දීමට ක්‍රියා කරනවා නම් ඒකට අපේ සහයෝගය ලැබෙනවා. විවිධ මත පළ කරන අය රටේ ඉන්නට පුළුවනි. නමුත් මේ රට ආරක්ෂා කිරීම සඳහා, රටේ සංස්කෘතිය ආරක්ෂා කිරීම සඳහා, අපේ රටේ උරුමයන් රැක ගැනීම සඳහා ක්‍රියා කිරීම අපේ වගකීමක්, උතුරේ තවමත් තිබෙන නාගදීප විහාරය ඇති ස්ථානයට බුදුරජාණන් වහන්සේ වැඩම කළ බවට ඓතිහාසික වශයෙන් පිළිගතහැකි සාධක තිබෙනවා. නමුත් ඒ නාගදීප විහාරය ඉදිරියේදී සිද්ධ වෙන්නට යන්නේ මොනවාද ? අපි දන්නවා අනික් දේවලට සිදු වුණු දෙය. මේවා ගැන කථා කරන්නේ රට අවුස්සන්ට නොවෙයි. නමුත් සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මේ දෙය ගැනවත් අපි කිව්වේ නැතිනම්, මේ අමාත්‍යාංශයට ඉදිරියේදී රැක ගන්නට සංස්කෘතියක් ඉතුරු වෙන්නේ නැහැ ; අන්තිමට ඉතුරු වෙන්නේ ඔය ගොඩනැගිලි ටික විතරයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හෙට පැවැත්වීමට නියමිත වට මේස සාකච්ජාව කල් දමන ලෙස සිංහල බල මණ්ඩලය, ශ්‍රී ලංකා බෞද්ධ සම්මේලනය, ශ්‍රී ලංකා ජාතික බෞද්ධ සම්මේලනය සහ සීමාසහිත කොළඹ පරම විඥනාර්ථ බෞද්ධ සම්මිලනය අත්සන් කර ඇති ලියවිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා. එම නිසා මේ තත්ත්වය ගැන සලකා, අපේ රට ආරක්ෂා කරගන්නට නම්, ජාතික උරුමයක් රැකගන්නට නම්, රටේ සංස්කෘතිය රැකගන්නට නම්, මෙම ත්‍රස්තවාදීන්ගේ තර්ජන මත, ඒ අයගේ ඉල්ලීම් සම්බන්ධයෙන් ගණුදෙනු කිරීම නොවෙයි, කරන්නට තිබෙන්නේ. පළමුවෙන්ම රටේ සාමකාමී තත්ත්වයක් ගොඩනගා, ඉන් පසුව තමයි සාකච්ජා පවත්වන්නට ඕනැ කරන්නේ. එහෙම නොවුණොත් අප කාටත් කනගාටුවට පත් වෙන්නට දේවල් සිදු වෙන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමහර විට ආණ්ඩුව විශ්වාස කරනවා ඇති, අපේ උදව්වට ලොකු රටවල් ඒවිය කියා. ලොකු රටවල් කවදාවත් පුංචි රටවල උදව්වට ආවේ නැහැ. ආවා නම්, ඒක තාවකාලික පියවරක් හැටියටයි ආවේ. අපේ පුංචි රටවලට උදව් කරන්නට ඇවිත් අන්තිමේදී අපේ රටේ විනාශයටත් ඒ අයම හවුල් වෙයි. අපේ ඉතිහාසයේ සිදුවුණු දේවල් අනුවයි මම කථා කරන්නේ. අපට මහා සංස්කෘතික උරුමයක් තිබෙනවා. අපේ ජනතාවට යන්නට ලෝකයක් වෙනත් රටක් නැහැ. ඒ නිසා රට රැකගන්නට අපි වැඩ කරන්න ඕනෑ. විශේෂයෙන්ම සංස්කෘතික අමාත්‍යාංශය ඒ සඳහා ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය බවයි මා කියා සිටින්නේ.

මෙම ප්‍රශ්නය මම විශේෂයෙන්ම මතු කළේ හෙටට නියමිත, යෝජිත වටමේස ‍සාකච්ඡාව තාවකාලිකව කල් දමන ලෙස මේ රටේ උරුමය ආරක්ෂා කරන්නට කැප වුණු සංවිධාන ගණනාවක්—බෞද්ධ ජනතාවගේ, සිංහල ජනතාවගේ සංවිධාන ගණනාවක්—ඉල්ලීමක් කර තිබෙන නිසයි. එම ඉල්ලීම ඉෂ්ට කර, රටේ අද ඇති වී තිබෙන මේ නොසන්සුන් තත්ත්වය මෙල්ල කිරීම තුළින් තමයි, අපේ සංස්කෘතික දායාදයත් මෙන්ම මෙම ජනවාර්ගික ප්‍රශ්නය ගැන හරියාකාර විසඳුමක් සොයාගන්නට හැකි වෙන්නේ. එසේ නැතුව සුද්දන් විසින් වෙන් කරන ලද අපේ පළාත් ඒ වෙන් කළ සීමාවන් අනුව වෙනත් අයට භාර දීමකට අපි යොමු වුණොත් අපේ රටේ ස්වාධීනත්වය පමණක් නොවෙයි, ජාතික නිදහස පමණක් නොවෙයි, මේ රටේ සංස්කෘතිය සඳහා ඉතිරිව ඇති සියලුම උරුමයන් අපේ ජීවිත කාලය තුළදී අපට නැතිව යන බව බොහොම කනගාටුවෙන් යුතුව මතක් කරමින්, එය ආරක්ෂා කර දීමට සංස්කෘතික දෙපාර්තමේන්තුවේ පූර්ණ ශක්තිය යොදවන ලෙසත්, පවත්වන්නට අදහස් කරන වටමේස සාකච්ඡාව කල් තබන්නට බැරි නම්, එහිදී ඉදිරිපත් කරන ඕනෑම යෝජනාවක් රටපුරා පැවැත්වෙන ජනමත විචාරණයකට තබන ලෙසත් ඉල්ලා සිටින්නට කැමතියි.

මේ රටේ අයිතිය පිළිබඳව තීරණ ගැනීම එක් ප්‍රදේශයකට පමණක් අයිති දෙයක් නොවෙයි. මුළු රට වෙනුවෙන් ගන්නා තීරණවලට තමන්ගේ එකඟත්වය හෝ විරුද්ධත්වය හෝ පළ කරන්නට මුළු රටේම ජනතාවට අයිතියක් තිබෙනවා. එම නිසා, ඒ සඳහාවත් රජයේ එකඟත්වය පළ කිරීම රජයේ යුතුකම බව මතක් කරමින් මා නවතිනවා.

අ. භා. 3.9

**ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)**
(Mr. Lakshman Jayakody–Attanagalla)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ සංස්කෘතික අනාගතය ගැන ගරු මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) පැහැදිලි ප්‍රකාශයක් කළ බව ගරු ඇමතිතුමාට පේනවා ඇති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් අපිට කියන්නට තිබෙන්නේ යම් අවස්ථාවක මේ රටේ සිංහලයින්ට පහරක් වැදිගෙන යනවා නම් එසේම අනෙක් ජාතීන්ටත් යම් විධියකින් පහර වැදිගෙන යනවා නම් ඒ හැම අවස්ථාවකම අපිත් අභීතව කටයුතු කර තිබෙන බවයි. හෙට පැවැත්වෙන වටමේස සාකච්ඡාවට යම් යෝජනා වගයක් ඉදිරිපත් වෙනවාය කියනවා. ඒ යෝජනාවලට සංස්කෘතියට සම්බන්ධ යම් යෝජනා මාලාවක් ඇතුළත් වෙලා තිබෙනවා නම් ඒ ගැන අපිට ටිකක් සුපරීක්ෂාකාරීව කටයුතු කරන්නට සිදු වෙලා තිබෙනවා. එසේ සුපරීක්ෂාකාරීව කටයුතු කරන්නට වෙලා තිබෙන්නේ අපේ දැනීමේ හැටියට දිස්ත්‍රික් සංවර්ධන සභා ඒකාබද්ධ කිරීම තුළින් සංස්කෘතික විෂය මාලාව ඒ දිස්ත්‍රික් සංවර්ධන සභාවලටම භාර දෙන්නට යනවාය කියන තීරණය අරගෙන තිබුණොත් තමයි. අපට ලැබී තිබෙන ආරංචි අනුව, ඓතිහාසික සිද්ධීන් හා ඓතිහාසික ස්ථාන ගැන කල්පනා කර, අපේ තිබෙන දිස්ත්‍රික් සංවර්ධන සභාවල අනාගතය සම්බන්ධයෙන් රජය ගන්නා පියවර කුමක්දැයි අපි අහන්න කැමතියි. ඒ ඒ ප්‍රදේශවල තිබෙන සංස්කෘතික දායාදය, සංස්කෘතික අයිතිය දිස්ත්‍රික් සංවර්ධන සභාවලට සීමා කරන්න යනවාද එසේ නොවේ නම් මධ්‍යම රජයේ පාලනය යටත්ව දිගටම ඒවා පවත්වාගෙන යනවාද කියන එක ගැන පැහැදිලි ප්‍රකාශයක්, ඇමතිතුමාගෙන් අපි බලාපොරොත්තු වෙනවා. එතුමාගේ ප්‍රතිපත්ති මාලාව තුළ අන්තර්ගතව තිබෙන හැඟීම් පැහැදිලි කරන ලෙස මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මන්ද, පොතපත කියවාගෙන යන විට අපිට පෙනී ගොස් තිබෙනවා, සිද්ධස්ථාන 300 ක් පමණ ඒ උතුර, නැගෙනහිර ප්‍රදේශවල තිබෙන බව. පොතපතින් පමණක් නොවෙයි, පසුගිය දවස්වල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් කරන ලද කැණීම දෙස බැලුවාමත් පෙනී යනවා. කන්දරෝඩේ මන්තේ වැනි [illegible] නැගෙනහිර ප්‍රදේශයේත් තිබෙනවා. ඒ තිබෙන සෑම බෞද්ධ සිද්ධස්ථානයක්ම ඉතා පැරණි ඒවා නිසා අපේ පැරණි රජදරුවන්ගේ කාලයෙන් පසුව අපිට ඉතිරි වී තිබෙන සංස්කෘතික දායාදයන් හැටියට සලකන්නට සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා අපේ ජාතික සංස්කෘතිය පිළිබඳව පැහැදිලි ප්‍රතිපත්තිය කුමක්දැයි ගරු ඇමතිතුමා අපිට දැනුම් දීමක් කරන්නට ඕනෑ. මේ වර්ෂයේදී එය ඉතාමත් වැදගත් වෙලා තිබෙනවා.

හැම අංශයෙමන්ම වාගේ දැන් මේ සමාජයේ විෂමතාවත් තිබෙනවා. අත්‍යවශ්‍ය සමාජයය, කියලා එකක් තිබෙනවා. පෙරේත සමාජයක් කියලා තවත් එකකුත් දැන් බිහිවෙලා තිබෙනවා. සමාජයේ පෙරේතකමට වැටිලා ඉන්න කොටසකුත් දැන් ඉන්නවා. අත්‍යවශ්‍ය දෙය ගැන බලාපොරොත්තුවෙන් කටයුතු කරන සමාජ කොටසකුත් ඉන්නවා. ඒ කියන්නේ ජාතික හැඟීම්, ජාතික ගතිගුණ, ඒ දේවල් ඉතාමත් අවශ්‍යයි—අත්‍යවශ්‍යයි—කියා සලකන කොටසක් අද සමාජයේ සිටින අතර නිතරම විවිධ ගණයේ දේවල් අතර මුදල්ම රජ කරනවායයි සිතන සමාජ කොටසකුත් සිටිනවා. මෙන්න මේ මුදලම අගය කරන සමාජ කොටස නිසා අද අපිට පහර වැදී ගෙන යනවා. එම නිසා මේ රටේ ආගමික හෝ වේවා සංස්කෘතික හෝ වේවා නාට්‍යමය හෝ වේවා වෙන වෙන ආගමික වැඩකටයුතුවලදී හෝ වේවා ඉදිරියට ගෙන යාමට බලාපොරොත්තු වන රජයේ පැහැදිලි සංස්කෘතික ප්‍රතිපත්තිය කුමක්ද කියලා අපිට අවබෝධයක් ලබා දෙන්නට ගරු ඇමතිතුමාට සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමාට එය මේ වකවානුවේදීම කරන්නට සිද්ධ වෙනවා. අර වට මේස සාකච්ඡාව පවත්වන්න පෙර එය කරන්න සිද්ධ වෙනවා. එයින් පැන නගින්නට පුළුවන් වන යම් යම් තර්කවලට මුහුණ දෙන්නට පුළුවන් විදියට කරුණු ඉදිරිපත් කරන්න ගරු ඇමතිතුමාට ශක්තියක් තිබෙන්නට ඕනෑ. නැවත වරක් 1815 මාර්තු මාසයේ 15 වැනිදාට යනවාට අපි කැමති වන්නේ නැහැ. අන්න එය අපි හොඳින් කල්පනා කරන්න ඕනෑ කාලයක් අද. එවැනි දෙයක් නැවත ඇති නොවේයයි අපි ප්‍රාර්ථනා කරනවා. එවැනි දිනයක් යළි ඇති නොවේවායි අපි දෙවැනි වතාවටත් ප්‍රාර්ථනා කරනවා. එවැනි දෙයක් ඇති වුණොත් ඒ සිංහල ජාතියේ අවසානයයි. වර්ග හැටියට නොවෙයි මම මෙය කියන්නේ. එවැනි අවස්ථාවක් ඇති වුණොත් එය සිංහලයට කැමැති සිංහලයට ලැදි අයගේ අවසානය වෙන්නත් ඉඩ තිබෙන බව කියන්න පුළුවන්. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, ඒවාගේම සංස්කෘතික ත්‍රිකෝණය උතුරු නැගෙනහිර ප්‍රදේශවල තිබෙන සංස්කෘතික දායාද යනාදිය ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මේ කරුණු ටික ඉදිරිපත් කරන්නේ ඒවා ඉතාම වැදගත් නිසායි.

පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අද නායකත්වයක් නැහැ. අද එහි ඉන්නේ පුරාවිද්‍යා කටයුතු පිළිබඳ වැඩබලන කෙනෙක් පමණයි. ඔහු පුරාවිද්‍යාඥයෙක් නොවෙයි. ඔහු ගෘහ නිර්මාණ ශිල්පියෙක්. දක්ෂම කෙනෙක්. නමුත් දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියෙකුට පුරාවිද්‍යා කටයුතු ගෙන යෑමට පුළුවන් කමකුත් නැහැ. එම නිසා මෙතුවක් කලක් සිටි ශ්‍රීමත් පරණවිතාන හා ඊටත් පෙර සිටි පුරාවිද්‍යාඥයන් දෙස බලන විට දැන් අපට එවැනි කෙනෙක් සොයා ගන්නට සිදු වී තිබෙන බව පෙනෙනවා.

දැනට පුරාවිද්‍යා කටයුතු පිළිබඳ වැඩ බලන ඒ මැතිතුමාගෙන් අප සමහර විට වැඩි දේවල් බලාපොරොත්තු වෙනවා. එතුමාට කරන්න පුළුවන් හරියකුත් තිබෙනවා. ඒ නිසා මෙවැනි ආයතනයක නායකත්වයට කෙනෙකු පත් කරන විට හුඟාක් දේවල් ගැන කල්පනා කරන්න තිබෙනවා. ඒ කරුණු ගැන කතා කිරීම මම එයින් නතර කරන්න කැමතියි. එහි තවත් දක්ෂ උදවිය සිටිනවා. ඒ ස්ථානයට කෙනෙක් හැකිපමණ ඉක්මණින් පත් කරන ලෙස මම ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමතියි.

ගරු ඇමතිතුමා විසින් කරන ලද යම් යම් කරුණු ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගිය අවුරුද්දේදී එතුමා අපේ රාජකීය ආසියාතික සංගමයට රුපියල් ලක්ෂයක් දී තිබෙනවා. ඒවාගේම පළමුවැනි වතාවට සිංහල සංස්කෘතික ආයතනයට රුපියල් තුන් දාහක් දී තිබෙනවා. සිංහල සංස්කෘතික ආයතනය අපි ඉතාම පොඩි කාලයේ 1954 දී ආරම්භ කළ සංවිධානයක්. එහි පළමුවැනි දවසේම සාමාජිකත්වය පළමුවැනි සාමාජිකත්වය නොවෙයි, පළමුවැනි දවසේ සාමාජිකත්වයක්, ලබා ගැනීමට, මට භාග්‍යය ලැබුණා. දැන් අවුරුදු තිහක් පමණ වෙනවා. අපි බොහෝම අමාරුවෙන් කටයුතු කරගෙන ගොස් දැන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව ඉදිරිපිටට ඇවිත් සිටිනවා. සංස්කෘතික ඇමතිතුමාගෙන් රුපියල් තුන් දාහක් අපට ලැබෙනවා. එය ඒ ගොඩනැගිල්ලේ සුදු හුණු ගාන්නවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ ලක්ෂ්මන් ජයකොඩි මහතා ]

ප්‍රමාණවත් වන්නේ නැහැ. ලබන අවුරුද්දේ අපට රුපියල් දහ දාහක්වත් ලබා දීමට කටයුතු කරතොත් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. දැනට දී තිබෙන දීමනාව ගැන මම එතුමාට නැවත වරක් ස්තුතිවන්ත වෙනවා.

සංස්කෘතික ත්‍රිකෝණයේ කටයුතු අවසාන කිරීමට ගරු ඇමතිතුමාට රුපියල් කෝටි එකසිය තිහක් අවශ්‍ය වන බව අපි දන්නවා. 1300 million. මේ රජය පමණක් නොව අපි කවුරුත් මේ ගැන කල්පනා කරන්න ඕනෑ. ගරු මුදල් ඇමතිතුමාත් කල්පනා කරන්න ඕනෑ. කෝටි එකසිය තිහක්. මෙයින් අපේ කොටස සියයට 40 යි. විදේශීය කොටස සියයට 60 යි. වෙනත් වචනවලින් කියතොත් අපේ කොටස අවුරුද්දකට ලක්ෂ 90 බැගින් අවුරුද්දක් පාසා දුන්නොත්, ඒ ගොල්ලන්ගේ කොටස අපි දෙන පරිමාණයට ලැබුණොත් මෙය අවසාන කරන්න පුළුවන් වන්නෙ ක්‍රිස්තු වර්ෂ 2025 දී තරමයි. ඒ කියන්නේ, තව අවුරුදු පනහකින් මෙහා මෙය අවසාන කරන්න බැහැ. මම මේ කාරණය කිව්වේ මොහෙන්ජොදාරෝ සහ හරප්පාවලට මේ වාගේ සිද්ධියක් වුණ නිසයි. මම මේ කාරණය ගැන ගරු ඇමතිතුමාට ලියවිල්ලකුත් ඉදිරිපත් කළා. එහි කැණීම් කළා. කැණීම් කටයුතු කළාට මොකද සංරක්ෂණ වැඩ කටයුතු ටික කරන්නට සල්ලි තිබුණේ නැහැ. කැණීම් කටයුතු කළ නමුත් සල්ලි නැති නිසා අවසානයේදී ඒවා ආරක්ෂා කිරීම සඳහා වසා දැම්මා. දැනට අවුරුදු සියයකට පමණ කලිනුයි ඒ කටයුත්ත කළේ. නැවත වරක් මෙය හාරන්නට පටන් ගත්තේ ඉන්දියාව දෙකට බෙදී ගොස් මොහෙන්ජොදාරෝ කියන ප්‍රදේශය පකිස්ථාන් කොටසට ගියාට පසුවයි. නැවත වරක් එය හාරා අවුරුදු විසි හයකට පසුවයි එහි සංරක්ෂණ වැඩ කටයුතු ටික අවසන් කළේ.

අපටත් ඔය ටික වෙනවා. අපටත් මේ වාගේ තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වන නිසා ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් යම් කිසි වැඩ පිළිවෙළක් යොදයි කියා මම විශ්වාස කරනවා. අපිත් මේ කටයුත්තට සම්පූර්ණයෙන්ම ආධාර කරනවා. නමුන්නාන්සේ කරන්නට යන මේ කටයුත්තට ආධාර කරන අතරම නිසි මාර්ගයට එය යොමු කරමින් කටයුතු කිරීමට අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා. මේවා ජාතියේ වස්තූන්. ජාතික කටයුත්තක් වුණාම දේශපාලන පක්ෂ භේදයක් බලන්නට හොඳ නැහැ. අපි එහෙම දේශපාලනය බලන පක්ෂයක් නොවෙයි. එහෙම බැලුව යුගය දැන් අවසානයි. පටු දේශපාලන හැඟීම් අපි දේශපාලන කටයුතුවලට සම්බන්ධ කර ගන්නේ නැති බව මම කියන්නට ඕනෑ. සංස්කෘතියට දේශපාලනයක් නැත ! ඒක ඇත්ත. අන්න ඒ නිසා තමයි මම මේ ටික කිව්වේ.

මම කියාගෙන ආවේ කලා සහ කලාශිල්ප කටයුතු කිරීම සම්බන්ධව පැහැදිලි ප්‍රතිපත්තියක් ගරු ඇමතිතුමා තවම ඉදිරිපත් කර නැහැයි කියන එක ගැනයි. එතුමාගේ බලාපොරොත්තුව මොනවාද කියන එක පමණක් පොත්පත්වල තිබෙනවා. නමුත් මහරගම ගරු මන්ත්‍රීතුමාගේ (දිනේෂ් ගුණවර්ධන මහතා) විසින් අද කැසට් පටියෙන් සිදු වී තිබෙන විනාශය, රූපවාහිනියෙන් සිදු වී තිබෙන විනාශය, අසභ්‍ය පොත්පත්වලින් සිදු වී තිබෙන විනාශය, මේ ජන සමාජයේ තිබෙන විනාශය, බටහිර ශිෂ්ටාචාරයෙන් සිදු වී තිබෙන විනාශය ගැන ටිකක් සඳහන් කරන්නට යෙදුණා. මා හිතන විධියට මේ සැම දෙයක් ගැනම අද අපට කල්පනා කරන්නට සිදු වී තිබෙනවා. ඒ කල්පනා කරන අතරම ආරක්ෂා කළ යුතු පුද්ගලයන් කොටසක් ඉන්නවා. ඒ පුද්ගලයන් නම් මේ රටේ ඇති විය යුතු හා ඇති කළ යුතු සම්භාවනීය කලාකරුවන් පිරිසයි.

අපට වෘත්තීය මට්ටමේ සිටින කලාකරුවන් පිරිසක් අද ඇති කර ගන්නට සිදු වී තිබෙනවා. විවිධ රැකියාවන්හි යෙදී සිටින දොස්තර මහත්වරුන්, නීතිඥ මහත්වරුන්, ඉංජිනේරු මහත්වරුන්, සිවිල් සේවකයන් ආදී වශයෙන් වූ වෘත්තීය මට්ටමේ නියුතු පිරිසක් මේ රටේ සිටිනවා. වෘත්තීය මට්ටමේ සිටින ඒ උදවියට යම් යම් වරප්‍රසාද තිබෙනවා. ටෙලිපෝන් එකක් ලබාගන්නට, කාර් එකක් ලබා ගන්නට, රේල් ගාස්තුව ලබා ගන්නට, ගෙයක් ලබා ගන්නට මේ ආදී සැම දෙයක්ම ලබා ගන්නට පුළුවන් වෘත්තීය මට්ටමේ සිටින පිරිසක් මේ රටේ ඉන්නවා. නමුත් වෘත්තීය මට්ටමේ සිටින කලාකරුවන්ට මේ කිසි දෙයක් ලැබෙන්නේ නැහැ. වර්ෂානුකූලව අවුරුදු විසි පහක් ඇතුළත මේ රටේ සිටි විශිෂ්ට කලාකරුවන් ශ්‍රේණිගත කරන ලෙස මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. ඒ විධියට ශ්‍රේණිගත කර හැම කලාකරුවකුගේම කලා නිපුණත්ව ගැන රිපෝර්තු ටිකක් අපි හදමු. මේවා හද ගන්නට ඇති වන තරම් ආයතන නමුන්නාන්සේ ගොඩනගා තිබෙනවා. නමුන්නාන්සේලාගේ " ආර්ට් කවුන්සිල් " එක තිබෙනවා.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

දැන් ඒවා සකස් කරගෙන යනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මම බොහොම සන්තෝෂ වෙනවා.

සංස්කෘතික දෙපාර්තමේන්තුව තිබෙනවා. සංස්කෘතික අමාත්‍යාංශය තිබෙනවා. සාහිත්‍ය මණ්ඩලය තිබෙනවා. සිංහල සංස්කෘතික ආයතනය වැනි ආයතන තිබෙනවා. මේ හැම ආයතනයකින්ම හැකි තරම් දුරට වෘත්තීය කලාකරුවන්ගේ ලැයිස්තුවක් අරගන්න. ඊට පස්සේ මේ අයගේ වෘත්තීය නිපුණත්වයත්, හැකියාවත්, දක්ෂතාවයත් මොනවාද කියා බලන්න. මේ අයට ජාත්‍යන්තර තෑගි ලැබුන ඒවා බලන්න. දේශීය වශයෙන් තිබුණු හැකියාවන් මොනවාද කියා බලන්න. නිර්මාණ මොනවාද කියා බලන්න. ඒ සියල්ලක්ම ශ්‍රේණිගත කර වෘත්තීය ආයිතිවාසිකම් ටිකක් දෙන්න බලන්න ඕනෑ. එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීන් වාගේ උදවියට අපි අපේ යුගවලදී නිසි තැන දුන්නේ නැත්නම් කවර කවදාවත් ඒ තැන ඔවුන්ට ලැබෙන්නෙ නැහැ. මේ කලාකාරයන් කියන උදවිය අඳුරේ සිටින අය හැටියට සැලකෙනවා. අන්න ඒ නිසා ගරු ඇමතිතුමා ඒ වාගේ ප්‍රතිපත්තියක් අනුගමනය කළොත් එතුමාට විශිෂ්ට සේවයක් කරන්නට පුළුවන් වෙනවා. ජාතික මට්ටමෙන් පවත්වන විශේෂ උත්සවවලදී මේ සුපිරි ගණයේ සිටින කලාකරුවන්ට විශේෂ තැනක් දෙන්නට ඕනෑ. හැම උත්සවයකටම වාගේ එන කලාකරුවන්ට එවැනි දවස්වල විශේෂ ස්ථානයක් දෙන්නට කටයුතු කරන්නට ඕනෑ.

අපි දන්නවා මෑතකදී අභාවප්‍රාප්ත වුණු ගුණසේන ගලප්පත්ති ශූරීන් ගැන. එතුමා කලින් වෘත්තියක යෙදී සිටි කෙනෙක්. එතුමා ගුරුවරයෙක් හැටියට සිටියා. නමුත් අවසානයේදී එතුමා ගුරු වෘත්තියෙන් සම්පූර්ණයෙන්ම අයින්වෙලා කලා ජීවිතයට ඇතුළුවෙලා කලා ලෝකයට නාට්‍ය ලිවීමට කටයුතු පටන්ගත්ත. එතුමාගෙන් දක්ෂ කෘතීන් බිහිවුණා. එතුමාගේ කෘතීන් තුළින් නව නැම්මක් ඇති වුණු බව නමුන්නාන්සේලා දන්නවා. අවසානයේ දී ඒ මහත්මයාට වුණු දේ ගැන මම හිතන්නේ නමුන්නාන්සේලා කවුරුත් දන්නවා. ඒ ඇයි ? වෘත්තියක් කළ කෙනෙක් අවසානයේ දී කලා ජීවිතයට ඇතුළුවෙලා අමාරුවේ වැටුණා. ඒ තත්ත්වයට ගියා ට පසු ඔහුට උදව් උපකාර කරන්නට ආයතනයක් තිබුණේ නැහැ. ස්ථානයක් තිබුණේ නැහැ. වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. සැකසුමක් තිබුණේ නැහැ. අන්න ඒ නිසා ගරු ඇමතිතුමා ඒ කටයුත්ත ගැන සලකා බලයි කියා මම විශ්වාස කරනවා.

**විජයපාල මෙන්ඩිස් මහතා (පේෂකර්ම ඇමතිතුමා)**
(திரு. விஜயபால மெண்டிஸ் — புடைவைத் தொழில் அமைச்சர்)
(Mr. Wijayapala Mendis Minister of Textile Industry)

ටවර් හෝල් රඟහල පදනම ආධාරයක් දෙනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ඒක මම දන්නවා. ඇමතිතුමනි, මමත් ඒකෙ පිනුම් ගහලා තිබෙන කෙනෙක්. ගණනක් දුන්නාට මදි. මම කියාගෙන ආවෙ ඒක නොවෙයි. සල්ලිය ගැන නොවෙයි මම කියන්නෙ.

**විජයපාල මෙන්ඩිස් මහතා**
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ආරක්ෂා වෙනවා.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

ලැබෙන පඩිය ගැන නොවෙයි. එතැනින් සැහෙන සේවයක් වෙනවා. එතැනට සම්බන්ධ වෙලා කටයුතු කරන කෙනෙක් හැටියට මම කියන්නෙ. අපි එහි කටයුතු කරන්නේ අපේ දේශපාලන සිතුම් පැතුම් සැම දෙයක්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයිත් කරලා. ඒයෙ පෙරේද තමුන්නාන්සේලා දකින්නට ඇති අර 'පණ්ඩුකාභය' කියන නාට්‍යය. මට එයින් ඈත්වෙන්නට ඉඩ තිබුණා. නමුත් ඈත් වුණේ නැහැ. සම්පූර්ණයෙන්ම ආධාර කළා. ඇයි ඒ ? නව කලා කෘතියක් බිහිවීගෙන එනවාය කියා අපි දැන ගත්තා. අර පැරණි පොත්පත්වල තිබෙන නාට්‍යයකට නව තැම්මකට පණක් දෙන්නට යෙදුණා. අපි ඒ කටයුත්ත කළා. අන්න ඒ නිසා අපි දැන ගන්නට ඕනෑ වෘත්තිය කලාකරුවන් පිරිසක් මේ රටේ බිහි කරන්නට. කලා ජීවිතය වෘත්තියක් හැටියට පවත්වාගෙන යන්නට ආධාර කරන්නට මේ ගරු ඇමතිතුමාට හැකිවුවොත් එය එතුමා විසින් කරන්නා වූ විශිෂ්ටතම සේවය හැටියට මම විශ්වාස කරනවා.

මම එක ප්‍රශ්නයක් නැවත වාරයක් අහන්නට කැමතියි. එතුමාගේ ප්‍රතිපත්ති වලිනුත්, ක්‍රියා මාර්ගයන්ගෙනුත් එතුමා වැදගත් ස්ථානයක් දී තිබෙන්නේ අපි කවුරුත් දන්නා හැටියට සංස්කෘතික ත්‍රිකෝණයටයි. එතුමාගෙන් අපට අහන්නට තිබෙනවා ප්‍රශ්න කීපයක්. කොහෙන්ද මේ මුදල් අපි හොයා ගන්නෙ ? අපිට වර්ෂයකට කොපමණ මුදලක් වියදම් කරන්නට සිදු වෙනවද ? අපිට මුලින්ම වියදම් කරන්නට දුන් මුදල කොපමණද ? අපට ස්ථාවරව මුදල් පාලනයක් කිරීමට ආයතනයක් අපි ගොඩනගාගෙන තිබෙනවාද ? මේ කරුණු ටික ගැන ගරු ඇමතිතුමාගෙන් අපි විස්තරයක් ඉල්ලා සිටින්නේ මෙන්න මේ නිසයි. අපි බලාගෙන යන විට අපට පෙණුනා මේ පාර්ලිමේන්තු උත්තරයකදී ඉදිරිපත් කර තිබෙන විස්තර. ජේතවනාරාමයට මේ අවුරුදු 4 තුළදී රුපියල් ලක්ෂ 19 ක් පමණ වියදම් කර තිබෙනවා. අබයගිරියට රුපියල් ලක්ෂ 13 ක් පමණ වියදම් කර තිබෙනවා. ආලාහන පිරිවෙනට රුපියල් ලක්ෂ 20 ක් පමණ වියදම් කර තිබෙනවා. සීගිරියට රුපියල් ලක්ෂ 20 ක් පමණ වියදම් කර තිබෙනවා. දඹුල්ලට රුපියල් ලක්ෂ 3 ක් පමණ වියදම් කර තිබෙනවා. මහනුවරට රුපියල් ලක්ෂ 11 ක් පමණ වියදම් කර තිබෙනවා. මේ අනුව සම්පූර්ණ ගණන රුපියල් ලක්ෂ 87 ක් පමණ වියදම් කර තිබෙනවා.

දැන් මේ වියදම් කර තිබෙන ඒවා ගණන් ගන්න. මේකෙන් කැණීම්වලට කොපමණද ? මේකෙන් ගමන් වියදම්වලට කොපමණද ? ගෘහ නිර්මාණ ශිල්පීන්ට ගෙව්වේ කොපමණද ? විදේශ උදවියට කීයක් ගෙව්වාද ? මේ වියදම් ගැන සම්පූර්ණයෙන් සොයා බලන්නය කියා මම ඉල්ලනවා. පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයකට දී තිබෙන උත්තරය දෙස බැලුවාම අපට කියන්න සිදු වී තිබෙනවා, ඇත්ත වශයෙන්ම මේ මුදල් නිසියාකාරව වියදම් කර තිබෙනවාද කියා සැකක් පහළ වන බව. සමහර විට හරියට වියදම් කර තිබෙනවා වෙන්න පුළුවන්. නමුත් ගරු ඇමතිතුමා පරීක්ෂණයක් කර බලනවා ඇතැයි මම විශ්වාස කරනවා.

ඒ එක්කම 1983.12.31 වෙනිද දක්වා වුණත් ඔය විධියටම ගිය වියදම් ක්‍රමානුකූලව ගණන් හද බලන්න ; කොපමණ වියදම් වෙලා තිබෙනවාද කියා පරීක්ෂා කර බලන්න. පොත් පත් වගයක් මුද්‍රණය කළා. 1980–84 දක්වා මුද්‍රණය කළ පොත්පත්වලට කොපමණ වියදම් වුණාද ?

From 1980 to 1984 we have spent Rs. 1,356,049.75 on printing. We have sold these books for Rs. 252,489. We have suffered a loss of Rs. 1,133,560. Why did we fall into this difficulty ? Why is it that we could not sell all these books that we printed ? There must be some reason or other. I think an answer should be available as to why that loss had been incurred.

ඊළඟට සංස්කෘතික ත්‍රිකෝණයේ ඉතුරු වැඩ කිරීමට කොපමණ මුදලක් අනාගතයේදී වුවමනා කරයිද කියන එක ගැනත් ගරු ඇමතිතුමා නව ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න. ඒ මොකද අපට දැනෙන්න තිබෙනවා, තව ටික කාලයක් යන විට මුදල් හදල්වල තිබෙන අමාරුව. එම නිසා කොයි තරම් මුදලක් වියදම් කරන්න සිදු වේවිද කියා ගණන් හිලව් දින වකවානු ඇතිව හරියට සකස් කරන්න. එතෙන්දී එතුමාට පෙනේවි, කොපමණ මුදලක් අවශ්‍ය වේවිද කියා.

තවත් එක් කාරණයක් ගැන එනම්, "මහාවංශය" ගැන යමක් කියන්න ඕනෑ. අපි අනුමතියක් කළා 1935 සිට 1978 දක්වා "මහාවංශය" ලියන්නය කියා. 1935 සිට 1956 දක්වා පළමුවෙනි කොටස ලියා අවසන් කළා. ඒ කොටස සිංහලට සහ පාළියට නැඟුවා. මම හිතන්නෙ 1981 අගෝස්තු මාසයේදී එය ජනාධිපතිතුමාට භාර දුන්නා. 1981 දෙසැම්බර් මාසයේ මුද්‍රණය කරන්නත් යවා තිබෙනවා. නමුත් අද වන තුරු මුද්‍රණද්වාරයෙන් පිටවෙලා නැහැ. දැන් අවුරුදු 3 ක් ගත වී තිබෙනවා. දෙවැනි කොටස, 1956 සිට 1978 දක්වා කොටස, ලිවීම සඳහා එම කර්තෘ මණ්ඩලයම පාවිච්චි කර තිබෙනවා. අපි ඉල්ලීමක් කළා, ඒකත් 1981 දෙසැම්බර් වන විට අවසන් කරන්නය කියා. නමුත් අවසන් කර තිබෙනවාද නැද්ද කියන එක ගැන මේ මොහොත වන තුරු අපි දන්නෙ නැහැ.

මුල සිටම එනම්, 1978 සිට කල්පනා කළොත් අවුරුදු 6 ක් ගත වී තිබෙනවා. අවුරුදු 6 ක කාල සීමාව තුළදී මේක නැවතුණේ ඇයි ? මේක කලඑළි බැස්සෙ නැත්තේ ඇයි ? අද කවුද ඒ කටයුත්ත කරන්න යොද තිබෙන්නේ ? අපි ඒ කාරණා ගැන ගරු ඇමතිතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

සංස්කෘතිය කියන දේ හුඟාක් දෙනෙක් බොහෝ දුරට වපර ඇසින් බලන අවස්ථා තිබෙනවා. පොඩ්ඩක් හරි සංස්කෘතිය ගැන කථා කළොත් ඔහු ජාතිවාදියෙක් හැටියට පරිවර්තනය වෙනවා. නමුත් මම කියන්න කැමතියි, සංස්කෘතිය ගැන කටයුතු කරන අපි හැම සංස්කෘතියක් ගැනම ඉගෙණ ගන්න ඕනෑ. එක අතකින් මම සතුටුයි කියන්න, පසුගිය රජය කාලයේදී පළමුවැනි වතාවට මුස්ලිම් ගීතයක්ය කියල දෙයක් නිර්මානය කරන්නට අපට පුළුවන්කමක් ඇති වුණ බව. මේ රටේ මුස්ලිම් ගීතයක්ය කියල දෙයක් තිබුණාය කියා සොයා ගන්නට පුළුවන්කමක් එද ඇතිවුණා. ඒ වගේම රාමනාදන් විශ්ව විද්‍යාලය උසස් මට්ටමකට ගෙන එන්නට ඒ වකවානුවේදී අපි කටයුතු කළා. 1956 දී තමයි, සංස්කෘතික පුනර්ජීවනයක් මේ රටේ ඇති වුණේ. අන්න ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවෙන් යම් හොඳක් කරල තිබෙනවා නම් කරුණාකර ඒ ගැන කියන්න. හැමදාමත් අපට බණින්නම එපා. අමාත්‍යාංශය පිහිටුවීම තමයි, මූලික ආරම්භය.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
(Mr. W. M. G. T. Banda)

1956 දී අමාත්‍යාංශය ආරම්භ කර 1977 වන තෙක් කළ දේවල් කියන්න. කළ දෙයක් නැහැ.

**ලක්ෂ්මන් ජයකොඩි මහතා**
**(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)**
(Mr. Lakshman Jayakody)

කිසි දෙයක් කළේ නැහැ කියල තමයි හැමදාම කියන්නෙ. අර තමුන්නාන්සේට වම් පැත්තෙන් ඉන්න මන්ත්‍රීතුමා ඒ ගැන හොඳින් දන්නවා ඇති. අන්න ඒ නිසා එවැනි දායාදයකට උරුමයක් කියන්නට පුළුවන් පක්ෂයක කෙනෙක් හැටියට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ අංශය ගැන සම්පූර්ණ සහයෝගය දී කටයුතු කරන්නය කියා.

අ. භා. 3.35

**ෂෙල්ටන් රණරාජ මහතා (අධිකරණ නියෝජ්‍ය ඇමතිතුමා)**
**(திரு. ஷெல்டன் றணராஜா — நீதி பிரதி அமைச்சர்)**
(Mr. Shelton Ranaraja–Deputy Minister of Justice)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කෙරෙන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධව මමත් වචන ස්වල්පයක් කථා කරන්නට බලපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම බෞද්ධ කටයුතු පිළිබඳව අලුතෙන් දෙපාර්තමේන්තුවක් ඇති කර ඉතාම හොඳට කටයුතු කරගෙන යාම ගැන මූලික වශයෙන් ගරු ඇමතිතුමාට අපගේ ස්තුතිය ප්‍රකාශ කරන්න කැමතියි. එම දෙපාර්තමේන්තුව ඇ ? කළාට පසුව එම කටයුතු සම්බන්ධයෙන් කොමසාරිස්වරයෙක් පත් කළා. ඒ වගේ අතිරේක කොමසාරිස්වරුන් දෙදෙනෙක් නුවර හා රත්නපුර පළාත්වල කටයුතුවලට පත් කර තිබෙනවා. ඒ පත් කිරීම් නිසා ඒ පළාත්වල බෞද්ධ කටයුතු කිරීමට විශාල රුකුලක් හා උපකාරයක් සිදු වුණ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න සතුටුයි.

1980 දක්වා විශේෂයෙන්ම විහාර දේවාලගම් පනත ක්‍රියාත්මක කෙරුනේ අධිකරණ අමාත්‍යාංශයෙනුයි. ඊටපසු ඒ කටයුතු දැන් සංස්කෘතික දෙපාර්තමේන්තුවට පවරා තිබෙනවා. බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට පවරා තිබෙනවා. 1978 දී අධිකරණ අමාත්‍යාංශය යටතේ විහාර දේවාලගම්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ෂෙල්ටන් රණරාජ මහතා]

පනත ක්‍රියාත්මක වෙන වෙලාවේදී එවකට සිටි අධිකරණ ඇමති දේවනායගම් මැතිතුමා විසින් කොමිටියක් පත් කළ බව මට මතකයි. එම කොමිටිය පත් කලේ විහාර දේවාලගම් පනත සංශෝධනය කිරීමටයි ; ඒ සම්බන්ධ අදහස් ඉදිරිපත් කිරීමටයි. රාජනීතිඥ ඒ. සී. ගුණරත්න මහත්මයාගේ සභාපතිත්වයෙන් බෞද්ධ කටයුතු සම්බන්ධව දන්වා විශේෂඥයින් කීප දෙනෙක් ඒ කාරක සභාවට පත් කළ බව මම දන්නවා. එම කොමිටිය මගින් ඉතාම වැදගත් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. එම වාර්තාව සංස්කෘතික ඇමතිතුමාට ඉදිරිපත් කර තිබෙන බවත් මම විශ්වාස කරනවා. මේ කටයුත්ත කලේ දැන් අවුරුදු තුනකට හතරකට ඉහතදීයි. නමුත් අද වන තෙක් මෙම වාර්තාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දැනගැනීම සඳහා සභාගත කර නැහැ. ඒ නිසා එම ඒ. සී. ගුණරත්න වාර්තාව—විහාර දේවාලගම් සම්බන්ධ වාර්තාව—පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නය කියා මේ අවස්ථාවේදී මම ගරු සංස්කෘතික ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මන්ද ? අපට එහි ඇති අදහස් දැනගැනීම අවශ්‍යයි. විශේෂයෙන්ම මේ විහාර දේවාලගම් පනත සම්බන්ධයෙන් අද රටේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. බස්නායක, දියවඩන නිලමේවරුන් පත් කිරීම ගැන ප්‍රශ්නයක් තිබෙනවා. අද ඉතාම වැදගත් ප්‍රශ්න බවට ඒවා පත්ව තිබෙන බව අපට පේනවා. මේ අවුරුද්දේ අන්තිමට දැනට වැඩ කරන දියවඩන නිලමේ තුමාගේ කාල සීමාව අවසන් වෙන නිසා ලබන අවුරුද්දේදී මාලිගාවේ කටයුතු කිරීමට නැවත වරක් දියවඩන නිලමේ කෙනෙක් පත් කරන්න සිද්ධවෙයි කියා මා විශ්වාස කරනවා. [බාධා කිරීම්] මේ සම්බන්ධයෙන් මහජනයා බලාගෙන එන්නවා. විශේෂයෙන්ම භික්ෂූන් වහන්සේලා ඒ වාගේම බෞද්ධ ජනතාව බලාගෙන ඉන්නවා කොහොමද මේ කටයුත්ත කෙරෙන්නේ කියල. එම නිසා මා මේ අවස්ථාවේදී සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගෙන් දැන ගැනීමට කැමතියි, ඒ. සී. ගුණරත්න කොමිටියෙන් ඉදිරිපත් කරන ලද වාර්තාව ක්‍රියාත්මක වෙනවාද එහෙම නැත්නම් ඉදිරියට දිය වඩන නිලමේ පදවිය පත් කරන්නේ දැනට තිබෙන රෙගුලාසි අනුවද කියා. ලබන අවුරුද්දේ මේ පුරප්පාඩුව පුරවනවද කියාත් මා මේ අවස්ථාවේදී දැන ගැනීමට කැමතියි.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

මොනවද වාර්තාවේ තිබෙන්නේ ?

**ෂෙල්ටන් රණරාජ මහතා**
**(திரு. ஷெல்டன் றணராஜா)**
(Mr. Shelton Ranaraja)

ඒ නිසා තමයි, මා සංස්කෘතික ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ඒ වාර්තාව ඉදිරිපත් කරන්න කියල. දියවඩන නිලමේ පදවිය ගැන පමණක් නොව තවත් යෝජනා රාශියකුත් ඒ වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් රටටත්, මේ සභාවටත් දැන ගැනීම පිණිස ප්‍රකාශයක් කරන්නය කියා ගරු සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

සංස්කෘතික ත්‍රිකෝණයට අයිති කොටසක් හැටියට මහනුවර ප්‍රදේශයේ ඊට අදාල ආයතනය මගින් වැඩ රාශියක් කරගෙන ගියා. නමුත් මෑතක සිට ඒ කටයුතු අත්හිටුවා තිබෙනවා. එසේ නවත්වා තිබෙන්නේ මොන හේතුවක් නිසාද කියා දැන ගන්න පුළුවන් නම් හොඳයි. මොකද, මෙය අපේ පලාතේ උදවියටත් රටටත් ප්‍රශ්නයක් වෙයි කියා හිතන නිසා. මා ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස නැවතත් ඉතා ඕනෑ කමින් ගරු සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මා නවතිනවා.

අ. භා. 3.40

**අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)**
**(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)**
(Mr. Amarasiri Dodangoda-Baddegama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම, සංස්කෘතික ඇමතිතුමාට මේ කටයුත්ත භාර වී තිබෙන්නේ ඉතාමත් බැරෑරුම් අවස්ථාවකයි කියා මා කියන්න කැමතියි. වෙනත් අවධියකට වඩා සංස්කෘතික කටයුතු ඉදිරියට ගෙනයාම පිළිබඳව නොයෙකුත් බාධා, විවිධ ක්‍රියාත්මකවීම් පැමිණ තිබෙන අවස්ථාවකයි එතුමාට මේ කර්තව්‍යය භාරවෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම එතුමාට මේ වැඩ කොටස කිරීම සඳහා සංස්කෘතිය කෙරෙහි උනන්දුවක් දක්වන සියලු දෙනාගේම සහාය දිය යුතුව තිබෙනවා. සංස්කෘතික දෙපාර්තමේන්තුවේම බෞද්ධ කටයුතු පිළිබඳව කටයුතු කිරීමට කොමසාරිස් කෙනෙකු සිටිනවා. එතුමාට විශාල වැඩ කොටසක් භාරව තිබෙනවා.

අපේ නියෝජ්‍ය ඇමතිතුමා කී විධියට 1956 දී මේ අමාත්‍යාංශය පිහිටෙව්වේ, අපේ නැතිවී ගිය සංස්කෘතික උරුමයන් නැවත නැවතත් සොයා බලා ඒවා පුනර්ජීවනය කිරීමටත්, ඒවා පිළිබඳව පර්යේෂණ කිරීමට හා සොයා බැලීමටත් උපයෝගී කර ගන්නයි. ඇත්ත වශයෙන්ම ජනතාවක් හැටියට ශ්‍රී ලංකාවේ ජීවත්වන මිනිසුන්ට ඉතාමත් හොඳ, පැරණි, වැදගත් සංස්කෘතියක් තිබෙනවා. මා උදාහරණයක් කියන්නම්. ක්‍රිස්තු වර්ෂ 1215 කාලයේදී අපේ රටේ සිටි රජතුමා ලියූ ග්‍රන්ථය අපට තවමත් තෝරා ගන්න බැහැ. ක්‍රි. ව. 1215 කාලයේදී අපේ රටේ හිටපු රජතුමා—අපේ පාලකයා—විසින් ලියන ලද ග්‍රන්ථයක්—කව්සිළුමිණ—අපට තවමත් තේරුම් ගන්නට බැහැ. ඒ අවධියේදී එංගලන්තයේ හිටපු පළමුවන ජෝන් රජතුමාට ඉංග්‍රීසි භාෂාවෙන් අත්සන් කරන්නට බැරිව " සීල් " එකක් පාවිච්චි කර තිබෙනවා. ඒ කාලයේ එංගලන්තයේ පාලකයාගේ තත්ත්වය ඒකයි. අපේ පාලකයාගේ සාහිත්‍ය දියුණුව පිළිබඳ මට්ටම අරකයි. නමුත් එතැනදී තවත් සිද්ධියක් ඇති වුණා. තුර්කිය කොන්ස්ටන්ටිනෝපල් නගරය ආක්‍රමණය කළා. ඒ අවස්ථාවේ මෙසපොටේමියන් සහ බැබිලන් ශිෂ්ටාචාරවල කරුණු එකතු කරගත් උගතුන් ටික යුරෝපය පැත්තට පැන ගියා. ඔවුන් එසේ යුරෝපයට පැන ගියාට පසු යුරෝපයේ සංස්කෘතිය විද්‍යානුකූල පැත්තෙන් තාක්ෂණික පැත්තෙන් වැඩි දියුණු වී ඉන්පසු ඔවුන් ලොව පුරාම යාත්‍රා කරන්නට පටන් ගත්තා. ඊට පසුව තමයි ආසියාකරයේ රටවල් යුරෝපයේ බලවේගයට යටත් වුණේ. යම් විධියකින් කොන්ස්ටන්ටිනෝපල් නගරයට තුර්කි ප්‍රහාරය එල්ල වූ අවස්ථාවේදී යුරෝපයට පැන ගිය උගතුන් ටික ආසියාකරයට ආවා නම් කාර්මික දියුණුවක් ඇති වන්නේ ආසියාකරයේය කියා මතයක් තිබෙනවා.

කෙසේ වුවත් අපේ රටේ තිබුණු ප්‍රෞඪ සංස්කෘතිය ගැන මා දැන් මතක් කළා. එවැනි සංස්කෘතියක් තිබුණු රටක් නිදහස ලැබුවාට පසු ඒ සංස්කෘතිය නැවත ගොඩනැගිය යුතුය කියන හැඟීම ඇතිව තමයි, 1956 දී සංස්කෘතික අමාත්‍යාංශය පිහිටුවනු ලැබුවේ. අද මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසු ඇති වූ ඇතැම් බලවේග ක්‍රියාත්මක වීම් තුළින් ගරු ඇමතිතුමාගේ කර්තව්‍යයට ලොකු අපහසුකම් ඇති වී තිබෙනවා. ඒ ක්ෂේත්‍රය ගැන ගරු ඇමතිතුමා මීට වඩා උනන්දු වුණොත් හොඳයි.

ඊට අදාලව මා එක උදාහරණයක් පෙන්නුම් කරන්නට කැමතියි. සංචාරක ව්‍යාපාරය තුළින් මේ රටට විශාල ආදායමක් ලැබෙනවා වාගේම සංස්කෘතික ක්ෂේත්‍රයෙන් සෑහෙන හානිකර තත්ත්වයක් ඇති වේ ගෙන යනවා. " බෞද්ධ ලංකා " කියන පත්‍රයේ පළ කර තිබෙන වාර්තාවකින් මට ඒ සම්බන්ධව උදාහරණයක් පෙන්නුම් කරන්නට පුළුවනි. " රොබින්සන් හෝටලයේ මාසික ප්‍රසංගය " කියන ශීර්ෂ පාඨය යටතේ මේක තිබෙන්නේ. රොබින්සන් හෝටලය තිබෙන්නේ අලුත්ගම, කලුවාමෝදර. ඒ හෝටලයේ තිබෙනවාලු මාසික ප්‍රසංගයක්, විදේශික සංචාරකයන් වෙනුවෙන්. මම ඒ කොටස කියවන්නම් :

" මෙවර එහි පැවැත්වූ මාසික ප්‍රසංගයේදී (මුළුතැන්ගෙය භාර සේවකයින්) කෝකිවරුන් විසින් ඉදිරිපත් කළ අංගය වී ඇත්තේ නෙත් අදහාගත නොහැකි බලවත් අපරාධ නින්දිත නාඩගමකි. භික්ෂූන් වහන්සේලා පිරිසක් ලෙස සැරසුනු කෝකිවරුන් පිරිසක් බුද්ධ ප්‍රතිමාවක් රැගෙන පටක ආධාරයෙන් පොල් ගසක එල්ලා එහි බිම ගිනි ගොඩක් ගසා සතුන් පුළුස්සා මස්කර අනුභව කරමින් ගිනිගොඩ වටා නැටුමක් ඉදිරිපත් කොට ඇත. එය නැරඹූ විදේශීය සංචාරකයෝ මහත් සේ තුටුව ඔල්වරසන් හඩ නගමින් ප්‍රීති ඝෝෂා පවත්වා ඇත. "

මේ හෝටලය " බාබේරියන් බීච් හොටෙල් " කියලත් හඳුන්වනවා. කායි භාර නියමයක් නැති ගරු ඇමතිතුමා මේ පිළිබඳව දන්නවා ඇති. මේ හෝටලයේ සිදු වී ඇති මෙම සිද්ධිය ගැන—මෙම සංස්කෘතික ඝාතනය ගැන—සහ මාසිකව පවත්වන ප්‍රසංගය ගැන සොයා බැලුවොත් හොඳය කියා මම මතක් කරනවා. ඒ නිසා මේ අවස්ථාවේ සංස්කෘතික උරුමයන් ඉදිරියට භාවිතයට නොගෙන පැත්තකින් තබා ආරක්ෂා කර ගන්නවා නම් ඒ තරමට හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ සංස්කෘතික කටයුතුවලට මෑත කාලයේදී සිදු වූ තවත් තර්ජනයක් තමයි, මත්ද්‍රව්‍ය උවදුර. ඇත්ත වශයෙන් දැනට ආසියාකරයේ මත්ද්‍රව්‍ය මූලස්ථානය හැටියට තිබුණු තැන් වෙනුවට දැන් කොළඹ නගරය මත්ද්‍රව්‍ය ජාවාරමේ මූලස්ථානය බවට පත් කරගෙන යනවා. මෙන්න මේ නිසා සංස්කෘතික ත්‍රිකෝණය විසින් හාරා අවුස්සා ගනු ලබන අපේ උරුමයත් හෙරොයින් දුම්වලින් වැසී යනවා. ඒ නිසා මේ අවස්ථාවේ සංස්කෘතික උරුමයන් හාරා අවුස්සා පොළොව මතුපිටට ගැනීම ඒ තරම්ම හොඳ දෙයක් නොවෙයි. අද වෙළෙඳ පොළේ ඇති වී තිබෙන තත්ත්වයත් අනුව ආර්ථිකමය වශයෙන් වාසි ලැබීමට ඉටුවන හා සිදුවන දේවලින් සංස්කෘතියට සිදු වන හානිය පිළිබඳව ගරු ඇමතිතුමා විසින් අවධානයක් යොමු කරන්නය කියා මම විශේෂ ඉල්ලීමක් කරනවා.

එමෙන්ම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් සෑහෙන දුරට හොඳ වැඩ පිළිවෙළක් දියත් කිරීමටත් ගරු ඇමතිතුමා කටයුතු කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළේ අද ඉතාම වැදගත් දෙයක් තමයි, දහම් පාසල් පැවැත්වීම. දහම් පාසල් පැවැත්වීමේදී බෞද්ධ කටයුතු පිළිබඳව මම විශේෂ කොට කිව්වත් අපේ රටේ ජාතීන් වශයෙන් ජීවත්වන හා ආගමිකයන් වශයෙන් ජීවත්වන සියළුම ආගම්වලට සංස්කෘතීන් තිබෙන බව සඳහන් කරන්නට ඕනෑ. ඒ සියළුම සංස්කෘතීන් පිළිබඳව අපි විශේෂ අවධානයක් යොමු කළ යුතුයි ; පර්යේෂණ සහාය දිය යුතුයි. සමහර විට අපි බෞද්ධයින් වන්නට පුළුවන් ; ක්‍රිස්තු භක්තිකයින් වන්නට පුළුවන් ; මුස්ලිම් භක්තිකයින් වන්නට පුළුවන් ; හින්දු භක්තිකයින් වන්නට පුළුවන්. ඒ සියලුම ආගම්වලට අදාළ සංස්කෘතීන් පිළිබඳව මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු යොමුවීම, අවධානයට ලක්වීම ඉතා වැදගත් වෙනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
(Mr. W. M. G. T. Banda)

හින්දු කටයුතු සම්බන්ධයෙන් මුස්ලිම් කටයුතු සම්බන්ධටත් වෙනම ඉන්නවා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

සංස්කෘතික වශයෙන් සලකන විට ආගමානුකූල කටයුතුවලට අමතරව ජාතික සංස්කෘති වශයෙන් අපි මුළු ශ්‍රී ලංකාව ගැනම සලකන්නට ඕනෑ. [බාධා කිරීමක්] සිංහල සංස්කෘතිය වගේම මුස්ලිම් සංස්කෘතියක් තිබෙනවා ; ක්‍රිස්තියානි සංස්කෘතියක් තිබෙනවා ; හින්දු සංස්කෘතියක් තිබෙනවා. ඒ සියලු සංස්කෘතීන් පිළිබඳවම අපේ අවධානය යොමු විය යුතුව තිබෙනවා.

බෞද්ධ කටයුතු අංශය ගැනත් කියන්නට ඕනෑ. දහම් පාසල්වලට නොමිලයේ පොත් බෙදීම වැදගත් දෙයක්. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ඒ සේවාවන් ඉටු කරන අතරම දහම් පාසල්වල තිබෙන අනිකුත් ප්‍රශ්න දෙසත් බැලුවොත් හොඳයි. ඒ කටයුතු ගැන මේ අවස්ථාවේ උනන්දුවීම නිසා අපේ දරුවන්ට හොඳ පරිසරයක්, අවබෝධයක් හා ගුණ වගාවක් මේ තුළින් ලබා දීමේ හැකියාව ඇති වී තිබෙනවා. සමහර දහම් පාසල්වල පුටු බංකුවැනි උපකරණවල අඩුපාඩුවක් තිබෙනවා. දහම් පාසල් ගුරුවරුන්ට මගත් පහසුකම් සැලසීමක් ගැන පසුගිය දවස්වල සඳහන් වුණා. ගමනාගමන ඇමතිතුමා ගොස් දහම් පාසල් ගුරුවරුන්ට නොමිලයේ බස්වලින් ගමන් කිරීමට අවසර පත්‍ර ප්‍රදානය කළා. ඇත්ත වශයෙන්ම එය ඒ තරම් බලපෑමක් ඇති වූ දෙයක් නොවෙයි. ගමේ දහම් පාසලේ උගන්වන ගුරුවරයා පයින්මයි, එන්නේ. ඔවුන්ට නගරයේ අයට වගේ බලපත්‍රය වැදගත් නැහැ. ඒ ගුරුවරයා සෑහෙන කැප කිරීමක් කරන්නේ. ස්වේච්ඡා සේවයක්. ඒ අයට මේ ක්‍රමයෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ ක්‍රමය සංශෝධනය කර ඒ අයට ප්‍රයෝජනවත් වෙනත් යමක් කරන්නට ඕනෑ. එක්කො ඒ අයගේ සහතික රැකියාවලට බඳවා ගැනීමේදී සැලකිල්ලට ගන්නට ඕනේ. එහෙම නැත්නම් ඔවුන්ගේ සහතික ගැන වෙනත් යම් ක්‍රමයක පිළිගැනීමක් තිබෙන්නට ඕනෑ. එවිට දහම් පාසල් පිළිබඳව උනන්දුව තවත් වැඩි වෙනවා.

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහාය ඉල්ලා සිටින තවත් කොටසක් ගැන කියන්න කැමතියි. ඒ ගම්බද අඩු ආදයම් ලබන විහාරස්ථානයි. සමහර විහාරස්ථානවලින් අපට ලැබෙන පැමිණිල්ලක් තමයි, විහාරස්ථානය පිහිටා තිබෙන ඉඩම රජය සතුයි කියන එක. පන්සලේ ඉඩම අක්කර දෙකක් තිබෙනවා ; නමුත් ඔප්පුවක් නැහැ. එවැනි විහාරස්ථානවලට ඔප්පු ලබා දීමටත් ක්‍රියා කරන්නට ඕනෑ. ඉඩම් කොමසාරිස් මගින් එවැනි විහාර පිළිබඳව සැලකිලිමත් වී ඒ අඩු ආදයම් ලබන විහාරවලට ඒ මගින්වත් පහසුකම් සලසා දෙන්නය කියා අපි ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය අධිකරණ ඇමතිතුමා සඳහන් කළා, ඒ. සී. ගුණරත්න කමිටු වාර්තාව ගැන. විහාර — දේවාල ගම් පනත සලකා බැලීම සඳහා පත් කෙරුණු ඒ කමිටුවේ වාර්තාව ප්‍රසිද්ධ නොකරන්නේ ඇයි ? දියවඩන නිලමේ තනතුරට සුදුස්සකු තෝරා පත් කර ගත යුත්තේ තනට ඒ සඳහා ඡන්ද බලය තිබෙන — උඩරට ප්‍රදේශයේ අදාළ කොට්ඨාශවල — අයගෙන් යයි ඒ කමිටුව නිර්දේශ කර තිබෙනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
(Mr. W. M. G. T. Banda)

දැනට පත් කරන්නේත් එහෙමයි.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

අර වාර්තාව ප්‍රසිද්ධ නොකරන්නේ, සමහර විට එයින් බලපෑමක් ඇති වන්න පුළුවන් නිසයි.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

අපි එය ධවල පත්‍රිකාවක් වශයෙන් ප්‍රසිද්ධ කළා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

එය මේ ගරු සභාවට ඉදිරිපත් නොකිරීම පිළිබඳව —

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

එය මේ ගරු සභාවට ධවල පත්‍රිකාවක් වශයෙන් ඉදිරිපත් කළා. ඒ කාලයේ නමුන්නාන්සේ මේ ගරු සභාවේ හිටියේ නැහැ.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

දියවඩන නිලමේ තනතුරට ජනාධිපතිතුමා විසින් සුදුස්සකු නම් කරනු ලැබීමක් පිළිබඳව පළ වූ ප්‍රවෘත්ති නිසා මේ රටේ ගරුතර සංඝයා වහන්සේලා—

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

දැන් ඒ අදහස අත්හැරලා.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

මේ රටේ ජාතික හා ඓතිහාසික වශයෙන් වැදගත් තනතුරු සාම්ප්‍රදායික වශයෙන් පැවත ආ ක්‍රමයටම සුදුස්සන්ගෙන් පුරවන්නේ නැතිව වෙනත් විධියට පිරවීම සඳහා කෙරෙන ඇඟිලි ගැසීම් නිසා රජයට ලොකු අවාසි පවා සිදු වෙනවා. ඒ වාගේම රටේ කලබල ඇති වෙනවා.

ඒ කෙසේ වෙතත් විහාර — දේවාල ගම් පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳව සංස්කෘතික අමාත්‍යාංශයට ලැබුණු වගකීම ගැන අපි සතුටු වෙනවා. ඒ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරුතර සංඝ රත්නයේ අවවාද — අනුශාසනා ලබා ගන්නා උත්සාහ කරනවා නම් බොහොම හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දොඩන්ගොඩ මහතා]

සාංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට පැවරී ඇති බැරෑරුම් වගකීම ගැන මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) පෙන්වා දුන්නා. එක පැත්තකින් අද මේ රටේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන වෙනස්කම් තුළින් කෙරෙන ආයාත කිරීම් හා භාවිත කිරීම් මඟින් අපේ සාංස්කෘතික හරයන්ට විශාල බලපෑමක් කෙරෙනවා. අපේ රටේ ආර්ථික ව්‍යුහයේ ඇති වී තිබෙන වෙනස්කම් තුළින් කෙරෙන බලපෑම් මත අපේ රටේ ජනතාවට සිය සාංස්කෘතික උරුමයන් අමතක කරවන, ඒවා රැක ගැනීම අතපසු කරවන තත්ත්වයක් ඇති වී තිබෙන හෙයින් ඒ තත්ත්වය වළක්වා ගෙන අපේ සංස්කෘතිය රැක ගැනීමට කටයුතු කරන හැටියට ඉල්ලමින් මම නිහඬ වෙනවා.

අ. භා. 3.58

චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා (කඹුරුපිටිය)
(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன — கம்புருபிட்டிய)
(Mr. Chandrakumara Wijeya Gunawardane–Kamburupitiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සාංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡාවට භාජන කරන්නේ උඳුවප් මාසයේදීයි. උඳුවප් මාසය බෞද්ධයන්ට ඉතා වැදගත්, ඓතිහාසික මාසයක්. දේවානම්පියතිස්ස රජ දවසේ, මේ මාසයේ පසළොස්වක් පෝද තමයි, සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ලංකාවේ යාපා පටුනට ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් වැඩමවාගෙන ආවේ. ඒ අවස්ථාවේදී දේවානම්පියතිස්ස රජතුමා ඒ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාව යාපා පටුනේ සිට මහත් පුද පෙරහරින් අනුරාධපුර මහමෙවුනා උයනට වැඩමවාගෙන අවුත් රෝපණය කළා. මේ ඓතිහාසික සිද්ධියෙන් පෙනී යන්නේ ලංකාවේ මධ්‍යම පළාතෙ හෝ දකුණු පළාතෙ හෝ වශයෙන් ප්‍රදේශ කිහිපයක නොව පොදුවේ මුළුරට පුරාම — උතුරු පළාතේ පවා — එද බෞද්ධයන් සිටි බවයි, බෞද්ධ සිද්ධස්ථාන තිබුණු බවයි.

කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු සිරිල් මැතිව් මැතිතුමාගේ "බුදු සසුන බේරා ගනිවු" නමැති පොතෙන් මනා අවබෝධයක් ලබා දෙනවා, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල බෞද්ධ සිද්ධස්ථානවල තත්ත්වය පිළිබඳව.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
**(குழுப் பிரதித் தலைவர் அவர்கள்)**
(The Deputy Chairman of Committees)

Order, please! The hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்யரத்தின] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

අ. භා. 4

චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා
(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன)
(Mr. Chandrakumara Wijeya Gunawardane)

අපේ ගරු සංස්කෘතික ඇමතිතුමා, අපේ රටේ බෞද්ධ ඉතිහාසයේ කවදාවත් ඇති නොවූ විධියට මේ රටේ බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීමටත්, බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කිරීමටත් විශාල වැඩපිළිවෙළක් දියත් කර ඇති බව අද අපි සන්තෝෂයෙන් මතක් කරනවා. විශේෂයෙන්ම සංස්කෘතික ත්‍රිකෝණ වැඩ පිළිවෙළ යටතේ, බෞද්ධ සිද්ධස්ථාන නගා සිටුවීමට මොන අන්දමේ උත්සාහයක් එතුමා ගන්නවාද යන වග එතුමා සමග සංස්කෘතික ත්‍රිකෝණ වැඩ කටයුතු නරඹන්නට ගිය අවස්ථාවේදී අපට අවබෝධ වුණා. ඇත්ත වශයෙන්ම සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සිද්ධස්ථාන පමණක් නොවෙයි. ලංකාවේ ඇති හැම සිද්ධස්ථානයක්ම ආරක්ෂා කර දීම සංස්කෘතික අමාත්‍යාංශයට පැවරී ඇති වගකීමක්. අපේ විහාර, සිද්ධස්ථාන ගැන කල්පනා කර බැලුවාම, ඈත ඉතිහාසයේ සිටම මෙම ස්ථානවලින් තමයි, අපේ ජනතාව වෙදකම සහ නක්ෂත්‍රය මෙන්ම විවිධ භාෂාවන්ද ඉගෙන ගත්තේ. එපමණක් නොවෙයි, සිංහල සංස්කෘතියට අනුව, බෞද්ධ ධර්මයට අනුව තමන්ගේ ජීවිත හැඩ ගසා ගන්නට අවස්ථාව සලසා ගත්තේ මේ ස්ථාන මාර්ගයෙන්. එම නිසා මෙම වැඩ පිළිවෙළ සංස්කෘතික ත්‍රිකෝණයට පමණක් සීමා කරන්නේ නැතුව, මුළු ලංකාවේම වැදගත් බෞද්ධ සිද්ධස්ථාන නගා සිටුවීමට ක්‍රියා කරන ලෙස මේ ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

අපේ රටේ පැරණි රජමහා විහාරස්ථාන, පුරාණ පරිවෙනස්ථාන, පුරා විද්‍යාත්මක වටිනාකම් ඇති භාණ්ඩ ඇති තැන් සහ වැදගත් පුස්කොළ පොත් ඇති සිද්ධස්ථානත් තිබෙනවා. මේ සිද්ධස්ථාන ආරක්ෂා කර ගනිමින්, මහා සංඝරත්නයේ අනුශාසනා පරිදි, අපේ වර්තමාන තරුණ පරපුරටත්, මහා සංඝරත්නයේ ආශ්‍රයෙන්, ආශීර්වාදයෙන් බෞද්ධාගමට අනුව ජීවත් වීමට අවස්ථාව සලසා දීමේ දීප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පසුගිය දවසක ම වේහැල්ලේ ධම්මදින්න නායක ස්වාමිපාදයාණන් වහන්සේගේ පන්සලට ගියා. ඒක රාජාධිරාජසිංහ රජ්ජුරුවන්ගෙන් අක්තපත්‍ර ලැබූ ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් වැඩසිටි පැරණි පන්සලක්. වෙහෙරගම්පිට රජමහා විහාරයක් තිබෙනවා. කළුතර ධම්මාරාම හාමුදුරුවන් වැඩි විසූ ස්ථානයයි. ඒ රජ්ජුරුවන්ගෙන් උන්වහන්සේට තෑගි වශයෙන් ලැබී තිබුණු, බණ කියන්නට හරිගස්සා දුන් සිංහල කැටයම්වලින් අලංකෘත කළ ධර්මාසනය හා මේසය, කිසිම ගරු සරුවක් නැතුව එම ස්ථානයේ අස්සක මුල්ලක දමා තිබුණා. මෙන්න මේ වාගේ රජමහා විහාරවල අබලන් වී යන ඓතිහාසික භාණ්ඩ ගැන විමසිලිමත් වී ඒවා එම ස්ථානවලම තැන්පත් කර තබන්නට පුළුවන්කමක් නැතිනම්, ඒ ප්‍රදේශයේ කෞතුකාගාරයක් තිබෙනවා නම් එහි හෝ එසේ නැත්නම් කොළඹ කෞතුකාගාරයට හෝ ගෙනැවිත් තබා ලංකාවාසී බෞද්ධ ජනතාවට ඒවා නරඹා අපේ පැරණි සංස්කෘතිය පිළිබඳවත් රජදරුවන් බෞද්ධ ශාසනය ආරක්ෂා කිරීමට මහා සංඝරත්නයට ගරු කිරීමට අනුගමනය කළ වැඩ පිළිවෙළ ගැනත් හැඟීමක්, අවබෝධයක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අදත් මෙම විහාරස්ථාන නොමැති නම්, අපේ දරුවන්ට ධර්ම දානය ලබා දීමට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. හැම ගමකම වාගේ ඇති විහාරස්ථානවල අද ඉරුදින දහම් පාසල් පවත්වාගෙන යනවා. පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් හැම දෙනම ඒ දහම් පාසල්වලට නොගියත්, ඔවුන් අතරින් විශාල සංඛ්‍යාවක් මෙම දහම් පාසල්වලට යන බව අපි දන්නවා. එසේ යැවීමෙන් මහාසංඝරත්නයත්, ඒ ප්‍රදේශවල සිටින බෞද්ධ ජනතාවත්, නිස්සරණාධ්‍යාසයෙන් ඒ දරුවන් යහමග යැවීමට කරගෙන යන්නාවූ වැඩ පිළිවෙළට බෞද්ධ ශාසන දෙපාර්තමේන්තු වෙන් යම් යම් ආධාර උපකාර කරගෙන යනවා. එසේ වුවත්, ඉරුදිනවල පවත්වන පුද්ගලික ටියුෂන් පන්ති තිබෙන නිසා ඒවා මේ ඉරුදින් දහම් පාසල්වලට මහත් තර්ජනයක් වෙලා තිබෙනවා. මේ පුද්ගලික පන්ති නිසා අද දහම් පාසල්වලට යන්නට කැමති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් එම දහම් පාසල්වලට යන්නට පුළුවන් කමක් ඇත්තේ නැහැ. ඉරුදින දහම් පාසල්වල ඉගැන්වීමට යන ගුරුවර ගුරුවරියන්ගේ ගමන් පහසුව සඳහා පසුගිය දවස්වල ලංගමයෙන් බස්රිය ගමන් බලපත්‍ර බෙද දුන්නා. මේ ගමන් බලපත්‍ර සමහර ගුරුවර ගුරුවරියන් ඉරුදින පුද්ගලික පන්ති පැවැත්වීමට යෑම සඳහා ප්‍රයෝජනයට ගන්නවා. එම නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාත් සමඟ සාකච්ජා කර මේ පුද්ගලික පන්ති ඉරුදින උදය වරුවේවත් පැවැත්වීම නතර කිරීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. එසේ නැති වුව හොත් හැම දරුවෙකුගේම දහම් පාසල් සේවය ලබා ගන්නට පුළුවන් වන්නේ නැහැ.

මහා සංඝ රත්නය ඒ ඒ ප්‍රදේශවල ඉන්න, බෞද්ධ ධර්මය පිළිබඳ උගතුන් සොයා ගෙන බොහොම අමාරුවෙන් අද දහම් පාසල් පවත්වාගෙන යනවා. අද දහම් පාසල්වලට නොමිලයේ පොත් ලබාදෙනවා. ඒ ඒ දහම්පාසල්වලට ලබා දෙනවා. නමුත් එයම ප්‍රමාණවත් නැහැ. මගේ ආසනයේ බොහොම දහම් පාසල් තිබෙනවා. ඒවා පවත්වා ගෙන යන්නේ බොහොම අමාරුවෙන්. දහම් ඉගෙන ගන්නා පැය කිහිපය තුලදී සමහර දරුවෝ බිම වාඩි වෙලා දහම් ඉගෙන ගන්නවා. ඒ වුණත් කෙසේ හෝ තම දරුවන් දහම් පාසල්වලට යැවීමට දෙමාපියන්ගේ දැඩි කැමැත්තක් තිබෙනවා. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට ඕනැ. ධර්මඥනය නැතිව දරුවෙක් හැදුණොත් ගස් ගල් වගේ අය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිස හොඳ පුරවැසියන් හැටියට මේ රටේ ක්‍රියා කරන හොඳ පරම්පරාවක් ඇති කරන්නට පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා මේ ගැන දිය යුතු පූර්ණ සහයෝගය සංස්කෘතික අමාත්‍යාංශයෙන් තව දුරටත් දීමට යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මහා සංඝ රත්නය ආශ්‍රයෙන් ධර්ම ඥානය ලබා ගත් ශාස්ත්‍රය ඥානය ලබාගත් හැම දෙනෙකුටම සිංහල සාහිත්‍ය සහ බෞද්ධ සාහිත්‍ය පිළිබඳ පත පොත ගැන හොඳ දැනීමක් තිබෙනවා. අද අපේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළින් සිංහල සාහිත්‍ය පත පොත පිළිබඳ දැනීම ක්‍රම ක්‍රමයෙන් අභාවයට යනවා. අද සමහර ළමයින් කව් සිළුමිණ කියන්නේ මොකක්ද කියා දන්නේ නැහැ. ගුරුළුගෝමින් කියන්නේ කවුද කියලා දන්නේ නැහැ. සිදත් සඟරාව කියලා පොතක් තිබුණාද කියලාවත් දන්නෙවත් නැහැ. ඒ වැනි පොත්පත් පිළිබඳ දරුවන්ට තිබෙන දැනීම ක්‍රම ක්‍රමයෙන් ඈත් වෙගන යනවා. බෞද්ධ සාහිත්‍ය පිළිබඳ යම්කිසි පුළුල් දැනීමක් දරුවන්ට ලබා දීමට පාසල්වල දැන් ලබා දෙන සිංහල සාහිත්‍ය දැනුම වැඩි දියුණු කරන්නට ඕනෑ. බෞද්ධ සාහිත්‍ය පොත්පත් ලබාදීමෙන් දරුවන්ගේ කියවීමේ රුචිය දියුණු කර, සිංහල සාහිත්‍ය පිළිබඳ දැනීමක් ද ඇති කර, ඒ අනුසාරයෙන් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමේ අවස්ථාවක් ඔවුන්ට ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

අපේ නියෝජ්‍ය සංස්කෘතික කටයුතු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගිය දවස්වල එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍යය වේදිකා ගත කළා. නාට්‍යය පිළිබඳව මහජනතාව අතර විශාල උනන්දුවක් අද ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන් වේදිකා නාට්‍යය පිළිබඳව දැඩි ආශාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාට සහ ගරු ඇමතිතුමාට අපි ප්‍රශංසා කරන්නට ඕනෑ. ටවර් හෝල් පදනම යටතේ ඒ අයට දැනුමක් ලබා දී ඒ අයගේ කටහඬ තවදුරටත් ඇසීමට ජනතාවට අවස්ථාවක් ලබා දීම ගැන ප්‍රශංසා කරන්නට ඕනෑ. ටවර්හෝල් පදනමේ කටයුතු සාර්ථක අන්දමින් ගෙනයනවාත් සමගම සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් මහාචාර්ය සරත්චන්ද්‍රයන්ගේ 'මනමේ', සිංහබාහු' වැනි නාට්‍ය ගම්බද ප්‍රදේශවලට ගෙනගොස් සාමාන්‍ය ජනතාවටත් ඒවායේ ආස්වාදය ලැබීමේ අවස්ථාව සලසා දෙන්න ඕනෑ. අද තිබෙන ජීවන තත්ත්වය අනුව ඒ ජනතාවට රුපියල් පණහක්-සියයක් ගෙවා මේ නාට්‍ය බැලීමට යන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා සංස්කෘතික අමාත්‍යාංශය කිසියම් දිප ව්‍යාප්ත වැඩ පිළිවෙළක් ඇති කොට ඒ ඒ ප්‍රදේශවලට මේ නාට්‍ය ගෙන ගොස් සාධාරණ මුදලකට ඒවා නැරඹීමට සාමාන්‍ය ජනතාවට අවස්ථාව සලසා දීමෙන් ඒ ජනතාවට යහපතක් වන අතරම නාට්‍ය දියුණු කිරීමේ අවස්ථාවකුත් එයින් සැලසෙනවා. ඒ සමගම එය කලාකරුවාට රුකුලකුත් වෙනවා.

නොයෙක් ක්ෂේත්‍රවල කලාකරුවන් ලංකාවේ නා නා දිග්භාගවල විසිරී සිටිනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් ප්‍රකාශ වුණු පරිදි අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා සාහිත්‍යය පිළිබඳව, කලාව පිළිබඳව හැඟීමක් ඇතිව කටයුතු කරන කෙනෙක් නිසා මම එතුමා සමග එකඟ වෙනවා. රටේ සියලුම ප්‍රදේශවල විසිරී සිටින සියලු ක්ෂේත්‍රවල කලාකරුවන්ගේ නාම ලේඛනයක් සකස් කොට ඔවුන්ට දිය යුතු යම් දිරිගැන්වීමක් තිබෙනවා නම් ඒ සැම දෙයක්ම ඔවුනට දෙන්නට ඕනෑ. මේ රටේ කලාව පෝෂණය වී තිබෙන්නේ බුද්ධ ශාසනය නිසායි. ඒ නිසා එකී අන්දමේ වැඩ පිළිවෙළක් සකස් කොට එමගින් කලාකරුවා දිරිගැන්වීම බුද්ධ ශාසනයේ ආරක්ෂාවටත් හේතු වෙනවා.

සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේදී අපේ මන්ත්‍රීවරුන් කීපදෙනෙක් වටමේස සාකච්ඡාවක් ඇදගෙන ත්‍රස්තවාදය ගැන දිගින් දිගට කතා කිරීම ගැන මම කනගාටු වෙනවා. වටමේස සාකච්ඡාවට ගොස් තම කරුණු එදිරිපත් කොට මේ රට වෙනුවෙන් මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙන් තමන්ටත් කළ හැකි සේවයක් තිබෙනවා නම් එසේ කිරීම සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් මහජන එක්සත් පෙරමුණටත් අවස්ථාව දුන්නා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මහජන එක්සත් පෙරමුණත් ඒ අවස්ථාව පැහැර හැර ජනතාව වෙනුවෙන් ඒ පක්ෂ තමන්ගේ යුතුකම් ඉටු නොකිරීම ගැන කනගාටු වෙනවා. සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේදී වට මේස සාකච්ඡාව ගැන මේ ස්ථානයේ කතා කිරීමෙන් කිසිම පලක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අදහස් වෙනස් කර වටමේස සාකච්ඡාවට සහභාගි වී මේ රටේ ජනතාව වෙනුවෙන් කරන්නට තිබෙන යුතුකම ඉෂ්ට කරන හැටියට මම දකුණේ මන්ත්‍රීවරයකු හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

මම දිගින් දිගටම කතාකරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. සංස්කෘතික ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ රටේ සංස්කෘතිය නගාලීමට මේ රටේ බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමට ගෙනයන මේ වැඩ පිළිවෙළ වඩාත් ක්‍රියාකාරී අන්දමින් එදිරිපට ගෙනයාමට අවශ්‍ය සියලු ධෛර්යය හා ශක්තිය එතුමන්ලාට ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසාන කරනවා.

අ. භා. 4.12

**රිචඩ් පතිරණ මහතා (අක්මීමන)**
**(திரு. றிச்சட் பத்திரன — அக்மீமன)**
(Mr. Richard Pathirana–Akmeemana)

ගරු සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මී අවස්ථාවේදී මේ රටේ සංස්කෘතියට බලපාන කරුණු කීපයක් ගරු ඇමතිතුමාගේත් නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානයට යොමු කිරීමට මම අදහස් කරනවා. මේ අමාත්‍යාංශය 1956 දී අපගේ ශ්‍රේෂ්ට නායක දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ මහජන එක්සත් පෙරමුණු රජය ඇති කළාට පසු පිහිටුවන ලද අමාත්‍යාංශයක් වීම ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට මම විශේෂයෙන්ම සන්තෝෂ වෙනවා. ඊට පසුව වරින්ව ර මේ රටේ ආණ්ඩු වෙනස් වුවත් එක්සත් ජාතික පක්ෂ රජය හෝ වේවා සමගි පෙරමුණු රජය හෝ වේවා මේ අමාත්‍යාංශය දිගටම පවත්වාගෙන ඇවිත් තිබීම ගැනත් අපි සන්තෝෂ වෙනවා. එයින් පැහැදිලි වන එක් කාරණයක් නම් මේ රටේ සංස්කෘතිය ආරක්ෂා කිරීමේ කාර්ය භාරය රජයේ මඟපෙන්වීම යටතේ රජයේ අනුදැනුම ඇතිව ඉෂ්ට කළ යුතුය යන්න සැම දේශපාලන පක්ෂයක්ම පිළිගත්තා බවයි.

අපට හැඟෙන හැටියට දැන් මේ ගරු ඇමතිතුමාට පැවරී තිබෙන්නේ බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කිරීම පමණයි. හින්දු සංස්කෘතිය හා මුස්ලිම් සංස්කෘතිය පිළිබඳ කටයුතු වෙනත් ඇමතිවරුන් දෙදෙනෙකුට බාර වී තිබෙනවා. මම හිතන හැටියට අපට ඒ කාරණය ගැන තරම් සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ මන්ද කියනවා නම් සංස්කෘතික යන වචනය දෙස බැලුවාම එය එක ආගමකට එක ජාතියකට අයිති දෙයක් නොවෙයි. සංස්කෘතිය කිව්වාම මේ රටේ බෞද්ධ සංස්කෘතියත් තිබෙන්නට පුළුවන්, සිංහල සංස්කෘතියත් තිබෙන්නට පුළුවන්, ද්‍රවිඩ අයගේ හින්දු සංස්කෘතියත් තියෙන්නට පුළුවන්, ක්‍රිස්තියානි, රෝමානුකතෝලික ආදී වශයෙන් විවිධාකාර සංස්කෘතීන් තිබෙන්නට පුළුවන්. මේ සියලුම අංශවලට අයත් සංස්කෘතික කටයුතුවල ආරක්ෂාවත්, වර්ධනයත් ඇති කිරීමේ කාර්යය කලින් මේ අමාත්‍යාංශයට පැවරී තිබුණා. නමුත් දැන් ඒ සඳහා වෙන වෙනම අමාත්‍යාංශ පිහිටුවීම ඒ මූලික පරමාර්ථයට වෙනස් දෙයක් හැටියටයි අපට කල්පනා වෙන්නේ. සංස්කෘතිය යන වචනයේ අර්ථය දෙස බැලුවාම එක් එක් ආගමට නැත්නම් ජාතියට වෙන වෙනම අමාත්‍යාංශ පිහිටුවීමේ අවශ්‍යතාවයක් නැහැ. එම නිසා මේ ගැන නැවත කල්පනා කළ යුතුව තිබෙනවා. දැන් සිටින ඇමතිතුමාටත් එම අමාත්‍යාංශයටත් අනෙක් සංස්කෘතීන් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන්නට බැරිය කියන අදහසින් එසේ කර තිබෙනවාද කියන්නට මම දන්නේ නැහැ. නමුත් එහෙම දෙයක් වෙන්න පුළුවන්කමක් නැහැ.

මම දැන් මේ වටමේස සාකච්ජා ගැන කථා කරන්නේ නැහැ. මම ද්‍රවිඩ ප්‍රශ්නය ගැන මෙතැනදී කථා කරන්නේ නැහැ. දැන් මේ රජය හැම තිස්සේම කියන්නේ මොකක්ද ? අපි කවුරුත් ශ්‍රී ලාංකික ජාතියක් හැටියට ජීවත් වෙන්න උත්සාහ කරමුය කියනවා. දැන් ඒ විධියේ හැඟීමක් ඇති කරන්නටයි හදන්නේ. නමුත්නාත්සේලගේ බලාපොරොත්තුවත් එහෙමයි. එහෙම නම්, අපි ශ්‍රී ලාංකිකයන් හැටියට පොදුවේ මේ රටේ සංස්කෘතිය ආරක්ෂා කරන්නේ කෙසේද යන ප්‍රශ්නය සලකා බැලිය යුතුව තිබෙනවා.

මම ගරු ඇමතිතුමා විවේචනය කරනවා නොවෙයි. ගරු ඇමතිතුමා ගැන අපට සැහෙන දුරට සතුටු වෙන්න පුළුවන්. ඔබතුමාගේ අමාත්‍යාංශය මේ කාර්යය කරන්නට උත්සාහ කරනවා. එය හරියට කර තිබෙනවාය කියන එක නොවෙයි මම එයින් අදහස් කරන්නේ. නමුත් මේ කාර්යය කරන්නට හොඳ උත්සාහයක් දරනවා. ගරු සභාපතිතුමනි, මේ රටේ අවුරුදු දෙදහස් ගණනක් තිස්සේ ආරක්ෂා වුණ ඒ සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කරන්නට සංස්කෘතික අමාත්‍යාංශය උත්සාහ කරන අතරේ අද සිදු වන්නේ කුමක්ද ? සංස්කෘතික ත්‍රිකෝණයේ කටයුතු දියුණු කිරීම සඳහා නොයෙක් ආකාරයෙන් විදේශ ආධාර ලබාගෙන කටයුතු කරන අතරේ අද සිදු වන දේ මේ ව්‍යාපාරයට බාධාවක් වන්නේ නැද්ද ?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රූපවාහිණිය ළඟට කවුරුත් තරුණයො එක්කහුවෙලා බලාගෙන ඉන්නවා. රූපවාහිණිය දැන් ඒ ගොල්ලන්ට හොඳයි. වැඩිපුර බලන්නේ මේ රටේ සංස්කෘතියට අදාළ දේ නොවෙයි. විදේශ චිත්‍රපට ආදී දේවල් ගැන තමයි වැඩියෙන් අවධානය යොමු වෙන්නෙ.

අනික් කාරණය තමයි දියවඩන නිලමෙතුමා පත් කිරීම පිළිබඳ ප්‍රශ්නය. ඒ දියවඩන නිලමෙතුමා තේරීම සම්බන්ධයෙන් පාරම්පරිකව පැවත ආ චාරිත්‍ර අනුව ඉදිරියටත් ක්‍රියා කරනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. ඒ මොකද, මේ රටේ අපට දැනට මුහුණ පාන්නට තිබෙන ප්‍රශ්න අස්සේ තවත් ප්‍රශ්නයක් ඇද ගන්න ඕනෑය කියා මම හිතන්නේ නැහැ. පෞරාණික ක්‍රමයට ඒක කරන්න පුළුවන්. මම හිතන්නෙ දැන් නායක හාමුදුරුවරු කවුරුත් වාගේ ඒ විධියටම කරන්න තමයි කැමති වී සිටින්නෙ. එහෙම පවත්වාගෙන යන විට ඒ තනතුරේ ගෞරවය ආරක්ෂා වෙනවා.

ඉරිද දහම් පාසල් ගැන කරුණක් දෙකක් මතක් කළ යුතුව තිබෙනවා. සෑහෙන කාලයක් තිස්සේ සෑම රජයකටම හාමුදුරුවරුන් සහ ගුරුවරුන් මේ ගැන කරුණු ඉදිරිපත් කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ රජය මගින් පසුගිය දවස්වල බස් ගමන් බලපත්‍රයක් දෙන්න කටයුතු කළා. ඒ ගොල්ලන්ගේ ඉල්ලීම ඒක නොවෙයි. මේ ඉරිද දහම්පාසල්වල ගුරුවරුන්ගේ ඉල්ලීම ගුරු පත්වීම් දීම් ආදී අවස්ථාවලදී ඒ ගොල්ලන් කරන සේවයටත් ලකුණු ටිකක් දීමට සැලැස්විය යුතුයි, කියන එකයි.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

මේ සම්බන්ධයෙන් ඇමති මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කර දැනට ඒක පිළිගෙන තිබෙනවා.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

බොහෝම ස්තුතියි. ගරු ඇමතිතුමා කියනවා ඇමති මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කර ඒක පිළිගෙන තිබෙනවාය කියා. ඒ ගොල්ලන් කියන්නේ අපි ඉරිද දහම්පාසල්වල ඉගැන්වීමේ යෙදී සිටින්නේ නොමිලේ, අපිට මේ ගැන සැලකිල්ලක් කරන්න, මෙක කරනවාය කියා අපට පත්වීම් දෙන්න කියා නොවෙයි ඉල්ලන්නෙ., අපි මේ ස්වේච්ඡාවෙන් කරන සේවය වෙනුවෙන් ලකුණු ටිකක් දෙන්න කියලයි. එසේ නැතිව බස් ටිකට් එකෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. ඒ මොකද ? ගමේ අවට ඉන්න අය තමයි බොහොමයක් ඒ ඒ දහම්පාසල්වල උගන්වන්නෙ.

ඊළඟට විහාරවලට ආධාර දීමේදී අනුගමනය කරන වැඩ පිළිවෙළ ගැන කරුණක් සඳහන් කරන්න කැමතියි. මම ඒගැන තමුන්නාන්සේට දොස් කියන්නෙ නැහැ. ලංකාවේ පැරණි විහාරස්ථාන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒවායේ නඩත්තු කටයුතු ගෙනයන්න බැහැ. මම දන්නවා තමුන්නාන්සේට වෙන්කර දෙන මුදල් වලින් තමුන්නාන්සේට බොහොම අමාරුයි ප්‍රතිපාදන ලබා දෙන්න. නමුත් ඇත්ත වශයෙන්ම විහාරස්ථානවලට මීට වඩා වැඩි මුදලක් දීම අවශ්‍යයයි. අපේ ආසනවලටත් ලැබෙනවා. මගේ ආසනයෙත් තුන හතරකට දෙනවා. විරුද්ධ පාර්ශ්වයේ සිටියත් ආණ්ඩු පක්ෂයේ සිටියත් අපි ඒ ගැන ප්‍රශංසා කරනවා. අපි ඉල්ලන්නේ ඇත්ත වශයෙන්ම මෙකයි. අපේ ආසනවල හුඟක් පන්සල් තිබෙනවා. ඒවායේ ගොඩනැගිලිවල නඩත්තුව ගෙනි යන්න බැහැ. ඒවාට ආධාර දෙන්න ඕනෑ.

මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි අක්මීමන ආසනයේ තිබෙන බොහෝම පැරණි පන්සලකට. එය ලංකවේ ප්‍රමුඛ පිරිවෙනක් වූ කිතුලම්පිටියේ ආනන්ද පිරිවෙණයි. දැනට විද්‍යෝදය පරිවේනාධිපති හාමුදුරුවොත්, අකුරටියේ අමරවංශ නායක හාමුදුරුවොත් ඒ පිරිවෙනේ ආදි ශිෂ්‍යයෝ. බද්දේගම පියරතන නායක හාමුදුරුවොත් ඒ පිරිවෙනේ ආදි ශිෂ්‍යයෙක්. ඔය විධියට ලංකාවේ ඉතාමත් උගත් භික්ෂූන් වහන්සේලා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් බිහි කළ පිරිවෙනක් මේ කිතුලම්පිටියේ ආනන්ද පිරිවෙණ. එහි ගොඩනැගිලි අද බොහොම දුර්වල තත්ත්වයකට පත් වී තිබෙනවා. එහි ඉතාමත් පැරණි බිතු සිතුවම් සහිත බුදු ගෙයක් තිබෙනවා. මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. මේ ගැන පරීක්ෂණයක් කරවා, එහි සියලු ගොඩනැගිලි නොවෙයි, අඩු ගණනේ බුදු ගෙයවත් යථාතත්වයකට පත් කර ආරක්ෂාකර දෙන්නය කියා.

මේ බුදු ගෙයි ඉතාමත් පැරණි සිතුවම් තිබෙනවා. සමහර කෙනෙකුගේ මතයක් තිබෙනවා මේවා කෝට්ටෙ යුගයට සමාන සිතුවම්ය කියා. ඒ මොකද ශ්‍රී රාහුල හාමුදුරුවන්ගේ පන්සලෙත් මේ පන්සලෙත් බිතු සිතුවම් අතර විශාල සමානත්වයක් තිබෙන නිසා. මේ පිරිවෙනේ මේ වටිනා කෞතුක චිත්‍ර ආරක්ෂා කර ගැනීමට කටයුතු යොදනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ඊළඟට අපේ දේශීය වෛද්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේ ඉන්න නිසා මම කියන්න කැමතියි වැදගත් දෙයක් ගැන. මේ රටේ සිංහල නාට්‍ය තිබෙනවා ; කවි, නාඩගම්, සිවුපද, වන්නම් ඔය වගේ නොයෙක් දේවල් තිබෙනවා ; බලි තොවිල් තිබෙනවා. මේවා මේ රටේ සංස්කෘතියේ [බාධාකිරීමක්]. මම කියන කල් ඉන්න. මම කියන්නෙ ඒවා එකතු කරන්න නොවෙයි. මේවා රැකගැනීම පමණක් නොවෙයි කළ යුත්තෙ. මේවා ජනතාව අතරට ගෙනෙන්න ඕනෑ. දැන් අපි අතරේ කවියන් ඉන්නවා. ඒ අයට කවි පොතක් ලියා පළ කරගන්න බොහොම අමාරුයි. කෙටි කථා පොතක් ලියා පළ කරවා ගන්න බොහොම අමාරුයි. ලේඛකයෙකුට නවකථාවක් ලියා පළ කර ගන්න බොහොම අමාරුයි. පොත්පත් ලියා පළ කරවා ගන්න නම් සමහර විට ණය වෙන්න සිදුවෙනවා. සමහර විට පොතක් පළ කළ විට වැඩි ලාභය ලබා ගන්නෙ ප්‍රකාශක මහත්වරුයි. ලේඛකයාට ලැබෙන්නෙ බොහොම සුළු ගණනකුයි. ඒ නිසා මෙන්න මේ වගේ උදවියට සංස්කෘතික අමාත්‍යාංශය මගින් යම්කිසි අනුදීමක් කෙරෙන්න ඕනෑ. අවුරුද්දකට වරක් හොඳම නාට්‍ය පොත තෝරා තෑග්ගක් දීමෙන් වැඩක් නැහැ. හොඳම කවි පොත තෝරා තෑග්ගක් දීමෙන් වැඩක් නැහැ. ඊට වඩා පුළුල් වැඩපිළිවෙළක් [බාධාකිරීමක්] මුද්‍රණය කරන්නත් ඕනෑ. ලැබෙන ප්‍රතිපාදන අනුව ඒ කටයුතු කරනවා නම් බොහොම හොඳයි.

ඒ වාගේම මේ ලේඛකයන්ට යමක් දෙනවා නම් ඒ අය මැරුනාට පසු දීමෙන් වැඩක් නැහැ. නමුත් දැන් ඒ තත්ත්වය ටිකක් වෙනස් වී තිබෙන බවක් පේනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. දැන් බොහෝ විට ජීවත්ව ඉන්න කාලයේදීම යම් පරිත්‍යාගයක් කරන්නට තමුන්නාන්සේලා උත්සාහ කරන බවක් පෙනෙනවා. ජී. බී. සේනානායක මහත්මයාට පසුගිය දිනකදී යම්කිසි පරිත්‍යාගයක් කර තිබෙන බව මා දැක්කා. අන්න ඒ වගේ අය ඉන්නවා. ලේඛකයන් පමණක් නොවෙයි. මේ රටේ නාට්‍ය කරුවන්, නාඩගම්කරුවන්, කවියන් ආදී නොයෙක් දෙනා ඉන්නවා. අන්න ඒ වගේ අයටත් යම් පිළිසරනක් වීමට ගරු ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් උත්සාහ කරනවා ඇතැයි කියා බලාපොරොත්තු වෙමින් මේ රටේ ඉතාම ශ්‍රේෂ්ඨ සංස්කෘතිය ආරක්ෂා කර ගන්නට ඔබ අමාත්‍යාංශයට ධෛර්‍යයත් ශක්තියක් ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 4.30

**ඩබ්. ජේ. මු. ලොකුබණ්ඩාර මහතා (ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார — அமைச்சர்)**
(Mr. W. J. M. Lokubandara–Minister)

ගරු සභාපතිතුමනි, මේ වගේ වැදගත් අමාත්‍යාංශයක් ගැන වචන කීපයක් කථා කරන්නට ලැබීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරන මහතා) කථාව අහගෙන ඉන්න විට මට හැඟුනේ සංස්කෘතික අමාත්‍යාංශය, මුළු මහත් ආණ්ඩුවම නැත්නම් මුළු අයවැය ලේඛනයම සඳහා වගකීමක් දරන අමාත්‍යාංශයක් විධියට හිතාගෙන එතුමා කථා කළ බවකුයි. එතුමා කිව්වා, රූපවාහිනියේ දර්ශන නරක නම්, ගුවන් විදුලියේ හඬ හොඳ නැත්නම්, වැල්ලේ දෙන්නෙක් පෙම් කරනවා නම් ඒ සියල්ලක්ම සංස්කෘතික අමාත්‍යාංශයේ වගකීමට යටත් වෙන්න ඕනෑ කියල. හොඳ අදහසක්. මොකද? මේ ගරු ඇමතිතුමා පසුගිය කාලය තුළදී අමාත්‍යාංශයේ වැඩකටයුතු කර තිබෙන ආකාරයෙන් අපට පෙන්නා දී තිබෙනවා, මුළු රටම භාරගත්තත් වැඩ කරන්න පුළුවන් තරම් දක්ෂතාවයක් එතුමාට තිබෙන බව.

ගරු සභාපතිතුමනි, කවුරුත් විසින් අමාත්‍යාංශයක් බිහි කළත්, එහි ඉතිහාසය පමණක් හැමදම කිය කියා සිටියත් වැඩක් වෙන්නෙ නැහැ. අක්මීමන ගරු මන්ත්‍රීතුමාට අමතක වී තිබෙන කාරණයක් මේ අවස්ථාවේදී මතක් කර දෙන්න ඕනෑ. 1970-77 කාලයේ සිටි එක්තරා සංස්කෘතික ඇමතිතුමෙක් ළඟට අමරදේව කියන අපේ සුප්‍රසිද්ධම ගායකයා ගිය විට, ඒ කව්ද කියන්නවත් ඒ ඇමතිතුමා දැනගෙන සිටියේ නැති බව ගරු අක්මීමන මන්ත්‍රීතුමාට මතකද දන්නෙ නැහැ. අන්න එවැනි ඉතිහාසයකුයි තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

ඒක එයාගෙ වරද.

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
(Mr. W. J. M. Lokubandara)

එය අමරදේව මහතාගේ වරදක් කියා තමුන්නාන්සේත් හිතනවා නම් මම කනගාටු වෙනවා. වෙන කරන්න දෙයක් නැහැ. එහෙම නම් අමරදේව මහතා කළ යුතුව තිබුණේ තමන් ගැන විස්තරයක් කලින් දන්වා එන්නයි.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

නැහැ, නැහැ, මම කිව්වෙ ඇමතිතුමාගේ වරද කියලයි.

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
(Mr. W. J. M. Lokubandara)

වැරදි ඇමතිවරයෙක් හිටි ආණ්ඩුවක්. ප්‍රධාන දෙය වන්නේ අමාත්‍යාංශයක් ඇති කිරීම නොවෙයි. අමාත්‍යාංශයක් ඇති කර හරියට සයිබුට හරක් භාර දෙන්නා වාගේ සංස්කෘතිය ගැන දන්නෙ නැති මනුෂ්‍යයෙකුට සංස්කෘති පාලුවෙකුට එය භාර දුන්නාට වැඩක් නැහැ. අපේ ගරු ජනාධිපතිතුමා කටයුතු කරන්නෙ එහෙම නොවෙයි. හරියට තේරුම් බේරුම් ඇතිව රජරට අපේ මේ ගරු ඇමතිතුමාට සංස්කෘතික කටයුතු භාර දුන්නා. මේ රටේ තරුණ පරපුර, ගොවි ජනතාව, පොදු ජනතාව කොයි තරම් විශ්වාසයක් අචල විශ්වාසයක් අපේ ජනාධිපතිතුමා කෙරෙහි තබා තිබෙනවාද කියා පෙන්නුම් කළේ වැඩි ඈතකදී නොවෙයි. මින්නේරියේ අතුරු මැතිවරණය පවත්වා දුන් මාසයක් දෙකකට වඩා ගත වුණේ නැහැ. එද අපේ නායකත්වය මේ රටේ මොන තරම් පිළිගන්නවාද කියා පෙනී ගියා. එතුමාගේ දූරදර්ශී නායකත්වය ගැන අපි මේ අවස්ථාවේදී ප්‍රශංසා කරන්න ඕන.

සංස්කෘතික අමාත්‍යාංශය පිහිටුවුවේ 1956 දී නිසා එම ගෞරවය ඔවුන්ට හිමිවිය යුතුය කියන එක ගැන හැම අයවැය විවාදයකදීම කියනවා. එහෙම නම් මේ රටේ කලා මණ්ඩලය බිහි කළේ අද ජනාධිපති ධුරය දරණ ගරු ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා බව අමතක කරන්න එපා. අපේ ගරු ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා මුදල් ඇමතිතුමා වශයෙන් සිටියදී 1955 අප්‍රේල් 6 වැනිද පාර්ලිමේන්තුවේදී බුද්ධ ජයන්තිය සම්බන්ධයෙන් මුදල් වෙන් කිරීම ගැන කළ කථාව තමුන්නාන්සේ බලන්න. එදින හැන්සාඩ් වාර්තාවේ 4045 තීරුවේ එය සඳහන් වෙනවා. තමුන්නාන්සේට ඕනෑ නම් එය පැය ගණනක් හරි කියවන්න පුළුවන්. ඒ කාලයේදී වෙනම අමාත්‍යාංශයක් නොතිබුණාට බුද්ධ ජයන්තිය සම්බන්ධයෙන් කළයුතු ප්‍රතිපාදන සැලසීමේදී ගන්න පියවර ගැන එක්සත් ජාතික පක්ෂය මොන විධියේ ආකල්පයක්ද දැරුවේ කියා එම කථාවෙන් පෙනෙනවා. ඒ සම්බන්ධයෙන් ඉතාමත් පැහැදිලි ප්‍රතිපත්ති අපේ ආණ්ඩුව ගත්තා. 1815 මේ රටේ පාලන තන්ත්‍රයේ යම් වෙනසක් ඇති වුණාද ඒ වෙනස ඇතිවෙන විටත් උඩරට ගිවිසුමෙන් කියා තිබුණා, බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමේ වගකීම භාර දෙනවාය කියා. ඒ කරුණ ඉදිරිපත් කරමින් එද අපේ ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව කරුණු ඉදිරිපත් කර තිබුණා.

ඒ අවස්ථාවේදී මාක්ස්වාදීන් මෙයට පුදුමාකාර විධියට විරුද්ධ වුණා. රාජ්‍ය ආගම බුද්ධාගමද කියා ප්‍රශ්න කළා. ඇයි මේ බුද්ධාගමට පමණක් විශේෂත්වයක් දෙන්නේ කියා ඇහුවා. ඒ කාලයේ මේ ලංකාවේ පාලනය කළේ එළිසබෙත් මහා රාජිනියයි කියල පෙන්නුම් කරල, එහෙමනම් එය නීතිවිරෝධී නේද කියා තර්ක ඉදිරිපත් කළා. ඒ සියල්ලටම ඉතාමත් චතුර විධියට පිළිතුරු දුන් අපේ ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා, මේ රටේ සිංහල සංස්කෘතියට තිබෙන්න ඕනෑ විශේෂත්වය ගැනත් බුද්ධ ශාසනයට තිබෙන විශේෂ උරුමය ගැනත් පැහැදිලිව පෙන්නුම් කළා. මේවා අමතක කරන්න වටින්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේලා හැම විටම කල්පනා කරනවා නම් සංස්කෘතියට සම්බන්ධ හැම ප්‍රශ්නයක්ම මේ ගරු ඇමතිතුමා විසඳන්න ඕනැය කියා එය වැරදියි.

අපේ සංස්කෘතියේ මූලික පදනම මොකක්ද ? මූලික පදනම තමයි, අම්මයි පුතයි අතරේ තිබෙන සම්බන්ධතාවය. කිසිසේත්ම පුතෙක් අම්මට අත උස්සන්නේ නැහැ. කිසිසේත්ම පුතෙක් අම්මට අනිකරු වෙන්නේ නැහැ. කිසිසේත්ම අම්මා පුතාට නිග්‍රහ කරන්නේ නැහැ. ප්‍රසිද්ධයේ කිසිවිටක අවලාද කරන්නේ නැහැ. නමුත් සංස්කෘතික අමාත්‍යාංශයක් ඇති කිරීම පිළිබඳව මේ තරම් ආඩම්බර වෙන තමුන්නාන්සේලා කල්පනා කර බලන්න, තමුන්නාන්සේලාගේ පක්ෂය—ප්‍රසිද්ධියේ ලියුම් හුවමාරු කරගෙන මොන තරම් නින්දිත තත්ත්වයට වැටුනාද කියා. අපි අයවැයේදී සාකච්ඡා කරන්නේ, මේ මුදල් දීම හරිද වැරදි ද, ගිය අවුරුද්දේ මෙපමණ දුන්නා එහි කෙරුවාව කොහොමද, එහෙම නම් තවත් මෙපමණ දෙන්න යුතුකමක් තිබෙනවාද යන මූලික ප්‍රශ්නයි. තමුන්නාන්සේලා එයින් පිටස්තරව සංස්කෘතිය ගැන කතා කරනවානම් මේ රටේ රූපවාහිණිය භාර ඇමතිතුමාගේ ඒ වාගේම පොලිසිය භාර ඇමතිතුමාගේ වැඩිත් එතුමාට පවරමින් කතා කරනවානම් මේ රටේ ජන ජීවිතයේ මූලික පදනම දෙදරා එබඳු කරුණු ගැනත් බලන්න කරුණාකර එතුමාට බලය දෙන්න.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ ආයුර්වේද ඇමතිතුමාතේ.

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
(Mr. W. J. M. Lokubandara)

ඔව්.

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ වෙද මහත්මයෙක්ද ?

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
(Mr. W. J. M. Lokubandara)

නැහැ. කොහොමද අපේ වැඩ ?

**රිචඩ් පතිරණ මහතා**
**(திரு. றிச்சட் பத்திரன)**
(Mr. Richard Pathirana)

තමුන්නාන්සේ අධිනීතිඥයෙක්.

**ඩබ්. ජේ. එම්. ලොකුබණ්ඩාර මහතා**
**(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)**
(Mr. W. J. M. Lokubandara)

කොහොමද, වෙද මහත්මයාගේ වැඩේ භාර දුන්නාම ? සුදුස්සා ලවා සුදුසු විදියට වැඩ කරවා ගැනීමයි, ඇමතිවරයකුගෙන් බලාපොරොත්තු වෙන්නේ. ඒ කාර්යය හරියටම ඉෂ්ට කළ යම් ඇමතිවරයෙක් ඉන්නවා නම්, ඒ සංස්කෘතික අමාත්‍යාංශය භාර ඇමතිතුමායි.

මා සංස්කෘතික ඇමතිතුමාට සම්පව කටයුතු කළ නිසා මා එතුමාගේ වැඩ ගැන දන්නවා. සිංහල ශබ්දකෝෂය ඉබි ගමනින් ගමන් කළ අවස්ථාවේදී අපේ සංස්කෘතික ඇමතිතුමා කල්පනා කළා එයට රෝග නිධානය මොකක්ද කියා. කල්පනා කර පැහැදිලිවම විධානයක් කළා. මහවැලියට පුළුවන් නම් තිස් අවුරුද්දක ගමන මේ තරම් වේගවත් කරන්න " අ " යන්නේ ඉඳලා මට මේ විධියට කරන්න බැහැ. එමනිසා පළමුවෙන්ම මේ කපේද එනම්, මේ ජීවිත කාලයේදී යමක් අපට දකින්න දෙන්න. ප්‍රායෝගික ශබ්ද කෝෂයක් කියා විධානයක් කළා. ඒවාගේම සංස්කෘතික අමාත්‍යාංශයේ මේ අතන්ත මහා ශබ්ද කෝෂය වන්න ගිය ශබ්ද කෝෂයට ක්‍රමවත් සැලැස්මක් හදගෙන ඒ කාර්යය නියත විධියට ඉෂ්ට කරන්නට භාර දුන්නා. අපට මේ අවස්ථාවේදී මතක් වෙනවා තුන්පනේ අපේ ගරු වැලිවිටියේ සිරි සරණංකර හිමි නාමය. ඒ නාමය හා සම්බන්ධයක් තිබෙන අපේ නියෝජ්‍ය ඇමතිතුමාට මේ කාර්යය පැවරුවා. තිස්සාට තිසි තැන දුන්නා. එතුමා ඒ කාර්යය තිසිසේ කර තිබෙනවා. අධිරාජ්‍යවාදී යුගයේදිවත් කරගන්නට බැරි දෙයක් එතුමා කර තිබෙනවා. ඒකයි හපන්කම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඇමතිතුමා දන්නවා ඒ වැඩේට සුදුසු පුද්ගලයා කවුද කියන එක. අමරදේව කියන්නේ කවුදැයි නොදන්නා උදවිය අමාවතුර කියන්නේ ඇල් වතුරද උණු වතුරද කියා නොදන්නා උදවිය සංස්කෘතික අමාත්‍යාංශයේ නැහැ. එතුමා තිස්සා තිසී තැනට ගත්තා. ලේකම් පදවිය බලන්න. ඉතාම පැහැදිලි විචක්ෂණ තීරණ ගත හැකි ඉතාම බුද්ධිසම්පන්න දෙවරක් විනිශ්චයකාර ධූරයක් හෙබ වූ කෙනෙක් ඒ පදවියට තෝරා ගත්තා ඒ නිසාම කාලාන්තරයක් තිස්සේ තිබුණු කටයුතු පිළිබඳව විශ්ව කෝෂය පිළිබඳව ශබ්ද කෝෂය පිළිබඳව ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදනය පිළිබඳව නොයෙකුත් අන්දමේ ක්‍රියාශීලී පියවරවල් ගන්නට පුළුවන් වුණා. ඇමතිවරුන්ගේ හපන්කම නම් සුදුස්සා සුදුසු තැන්හිලා ඔහුගෙන් සුදුසු වැඩ ඉටු කරවා ගැනීමය කියා මා මේ අවස්ථාවේදී කියන්නට සතුටුයි. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙද මහත්මයෙක් ම කරන්නට ඕනැය කියා අක්මීමන මන්ත්‍රීතුමා (රිචර්ඩ් පතිරණ මහතා) ඉදිරිපත් කළ තර්කය ඉතාම බොළඳයි. එහෙම නම් දැනට සංස්කෘතික අමාත්‍යාංශයේ කෙරෙන ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදනය හාමුදුරු නමකට භාර දෙන්නට ඕනෑ. ඒ විධියට තර්ක කරන්න එපා. එතැනයි තමුන්නාන්සේට වැරදුණේ.

ඊළඟට ඒ ඒ විෂයයන්ට අතිරේක ලේකම්වරු දෙදෙනෙක් ඉන්නවා. මුද්‍රණ ශිල්පය අයන්න ආයන්නේ සිට සියලුම වැඩ දන්නා පරිපාලන නිලධාරියෙක් ප්‍රකාශන අංශය භාරව ඉන්නවා. මේ රටේ පරිපාලන සේවයේ කිසිම තැනකින් ඒවාගේ කෙනෙක් සොයා ගන්නට බැහැ. අකුරු අමුණන තැන ඉඳලම එතුමා මුද්‍රණ ශිල්පය ගැන දන්නවා. මහත් අභිමානයෙන් තමන්ගේ දැනුම ගැන කියන්නට ශක්තියක් තිබෙන උදාර රජයේ සේවකයෙක් ඒ මහත්මයා. ඒවාගේමයි කලා අංශය භාරව ඉන්න අතිරේක ලේකම්තුමා. එතුමා තුළ කැක්කුමක් තිබෙනවා, ඒ පිළිබඳව. ඔය සඳහන් කළ තොවිල් පවිල්වල යම්කිසි ජන සංස්කෘතියක්, ජන කවියක් තිබෙනවා නම් ඒ සියලුම දේවල් එකතු කර ඒවා ආරක්ෂා කර තිබෙන හැටි සංස්කෘතික අමාත්‍යාංශයට ගියොත් තමුන්නාන්සේලාට බලාගන්නට පුළුවනි. මේ රටේ යම් අමාත්‍යාංශයක් ගැන තමුන්නාන්සේලා හොඳින් කථා කරනවා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පදනම වශයෙන් ඒ අමාත්‍යාංශය ගැන තමුන්නාන්සේලා කියනවා නම්, සිංහල සංස්කෘතිය සහ සිංහල ජන ජීවිතය හඳුනන පිරිසක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්නවා නම් පිළිගන්නට ඕනෑ, පසුගිය හත් අවුරුද්ද ඇතුළත මේ ඇමතිතුමා සංස්කෘතිය පිළිබඳව විප්ලවයක් කර තිබෙන බව. තමුන්නාන්සේලාට පෙනෙන්නේ සංචාරක ව්‍යාපාරය පමණයි. මේ යුගය මහා දැවැන්ත පරිවර්තනයක් වෙන යුගයක්. නැහැ. මේක සුළු පටුය කියා තමුන්නාන්සේලා සිතන්නට එපා. සංස්කෘතිය සම්බන්ධයෙන් තීරණ ගැනීම මේ යුගය තරම් අමාරු වූ තවත් යුගයක් තිබුණේ නැහැ. මිනිසා ජීවත් කරවීමේ ප්‍රශ්නය මූලිකව තිබෙනවා. ආර්ථික ප්‍රශ්නය වැනි දැවැන්ත ප්‍රශ්න තිබෙනවා. ඒ සියල්ලටම මුහුණ දී අපේ සංස්කෘතියේ මුදුන් මුල, පදනම ආරක්ෂා කරගෙන බොහොම කල්පනාකාරීව කටයුතු කරන්න සිදු වී තිබෙනවා. ඒ කාර්යය හොඳින් ඉටු කරන ගරු ඇමතිතුමාගේ අවධානය ඊළඟට පුළුල් ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් ගැන යොමු කරවන්නට මා අදහස් කරනවා. මෙවැනි යුගයක අපේ රටේ ජනතාවගේ සම්භවය පිළිබඳව මූලික කරුණු කියන කොට අපට කියන්නට තිබෙන මූලික දෙයක් තමයි, යම් දවසක බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය සිද්ධ වුණාද එද සිට මේ රටේ සිංහල ජනතාවගේ සම්භවය ඇති වුණාය යන්න. ඒක පිළිගත් මතයක්. අපේ වංශ කථාවල තිබෙන දෙයක්. සිංහල බෞද්ධ කියන සම්භවය ඒ නිසා ඇති වී තිබෙන දෙයක්. එය එහෙම නොවේය කියා කවදාවත් කවුරුවත් කියන්නේ නැහැ. දේශපාලන වශයෙන් හෝ වේවා සීමා සම්බන්ධව හෝ වේවා අද මහා භාරතයත් සමග යම් අර්බුදකාරී තත්ත්වයක තිබෙනව නම් අපට තිබෙන විශේෂ විසඳුම වන්නේ බුද්ධාගමේ ආශීර්වාදය ගැන ශ්‍රී ලංකා දන්ත ධාතුන් වහන්සේ, ශ්‍රී මහා බෝධිය, ශ්‍රී පාදස්ථානය, අටමස්ථානය, සොළොස්මස් ස්ථානය ගැන අප තුළ තිබෙන අචල විශ්වාසයයි. මෙබඳු යුගයකදී අපි විශේෂයෙන්ම උතුරු ඉන්දියාවෙන් පැමිණි පිරිසක් වශයෙන් අපේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමේ ප්‍රශ්නයේ දී අපි උතුරු ඉන්දියාවේ නේපාලය වැනි රාජ්‍යයන් සමග මීට වඩා සමීප සම්බන්ධකම් පවත්වන්නට ඕනෑ. විශේෂයෙන්ම අම්බෙඩ්කාර් පදනම වැනි පදනම් සමග සම්බන්ධතාවය ඇති කර ගත්තොත් මේ රටේ සිංහල බෞද්ධයන්ට එරෙහිව එන දකුණු ඉන්දියාවේ හෝ වේවා තමිල්නාඩුව හෝ වේවා වෙන ඕනැම නාඩුවක් හෝ වේවා ඒ සියල්ලන්ටම උත්තර දෙන්නට පුළුවන් ශක්තියක් අපට ලැබෙනවා, බෞද්ධයන් වශයෙන් ලෝක බෞද්ධයන්ගේ මතයක් ඇති කිරීමෙන්. පසුගිය මාසවල මේ රටේ ලෝක බෞද්ධ සම්මේලනයක් ඇති කර වාර්තාවක් පිහිටෙව්වා ගරු ඇමතිතුමා. ඒ අවස්ථාවේ ගත් මූලික තීරණ අනුව සමස්ත ලෝක බෞද්ධයන්ගේ මූලස්ථානය වශයෙන් නිජබිම වශයෙන් සළකන්නට පුළුවනි, ශ්‍රී ලංකාව. ථෙරවාදී බුද්ධාගමේ මූලස්ථානය වන ශ්‍රී ලංකාවේ අනාගතය පිළිබඳව තර්ජනයක් තිබෙන අවස්ථාවක්, මේක. එවැනි අවස්ථාවක ලෝක මට්ටමින් බෞද්ධයින් එක්රැස් කොට ලෝක මට්ටමේ සංවිධානයකින් සිංහල බෞද්ධයාට වන හානිය බුද්ධාගමට වන හානියක් බව—විශේෂයෙන්ම ථෙරවාදී බුද්ධාගමට වන හානියක් බව—පසක් කරන්නට, මේ මනුෂ්‍ය ඝාතනයට හා නීත්‍යනුකූල රජයකට විරුද්ධව ගෙන යන අරගලයට විරුද්ධව හඬක් ලෝකයේ වෙනත් බෞද්ධ රාජ්‍යයන්හි නැඟීමට, ගරු ඇමතිතුමා මූලික වන්නැයි මම ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. අපේ රටේ සංස්කෘතිය පිළිබඳ නියෝජිතයින් වන අපේ රටේ මහා සංඝ රත්නයේ කසාවත තමයි, සදාකාලිකවම මේ මෙහෙවරේ යෙදුණේ. උන්වහන්සේලාගෙන් උපරිම ප්‍රයෝජන ගෙන හෙට යුගයට ගැළපෙන අන්දමට මේ රටේ නායකත්වය ගෙන දීමේදී සංස්කෘතික අංශයෙන් දිය යුතු නායකත්වය දීමට ගරු සංස්කෘතික ඇමතිතුමාත් නියෝජ්‍ය ඇමතිතුමාත් එතුමාගේ දක්ෂ නිලධාරී මණ්ඩලයත් ගෙන යන කාර්යයට මා අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ නමේම මේ වෛද්‍ය භාවය තිබෙනවා. අපේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දියුණුවීම තමුන්නාන්සේට සන්තෝෂයක්. සංස්කෘතික අමාත්‍යාංශයෙන් මෙයට ලොකු සහයෝගයක් ලැබී තිබෙනවා. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තිබෙන අපේ ආයුර්වේදය සම්බන්ධ යම් යම් පත පොත ගෙන්වා ගැනීමේ මූලික කාර්යයට මෙය පිටුබල වී තිබෙනවා. එමෙන්ම කෞතුකාගාර දෙපාර්තමේන්තුව ආයුර්වේද වර්ෂය සම්බන්ධයෙන් කෞතුකාගාරයේ තිබෙන ඉතාම දුර්ලභ ගණයේ ආයුර්වේද පත පොත මුද්‍රණය කිරීමට භාර ගෙන තිබෙනවා. ඒ අතින් අපේ දේශීය දේ ආරක්ෂා කර ගැනීමට දෙන ධෛර්යයට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා (නැගෙනහිර කොළඹ — නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(திரு. எட்மண்ட் சமரவிக்ரம — கொழும்பு கிழக்கு — உப குழுத் தலைவர்)

(Mr. Edmund Samarawickrema - Colombo East - Deputy Chairman of Committees)

ගරු සභාපතිතුමනි, කථානායකතුමාත්, තමුන්නාන්සේත් මමත් නන්දිමිත්‍ර රජමහා විහාරයේ උත්සවයකට ලැබුණු ආරාධනාවක් අනුව පසුගිය අවුරුද්දේ එහි ගිය බව තමුන්නාන්සේට මතක ඇති. ගරු ජනාධිපතිතුමාගේ උපන් දිනයේ තෑගි ලැබුණු බුදු පිළිම වහන්සේ හත් නමෙන් මටත් එකක් තෑගි ලැබුණා. මම කල්පනා කළා නන්දිමිත්‍ර යෝධයා සිටි තැනට එය ගෙන යන එක හොඳයි කියා. ඒ අනුව අපි පෙරහරින් ගියා. ඒ වන විට අවුරුදු 5 ක් වැස්ස තිබුණේ නැහැ. එහෙත් එද මල් වර්ෂාවක් ඇති වූ බව තමුන්නාන්සේටත් මතක ඇති. එද සිට මාස අට හමාරක්ම නවතින්නේ නැතිව වැස්සා. දැන් ඒ පළාතේ අවශ්‍ය වෙලාවට වර්ෂාව තිබෙනවා. අපේ ගරු ඇමතිතුමාත් මේ විහාරය ගැන බැලුවා. අපි දැන් ලක්ෂයක් පමණ වියදම් කර බුදුගෙය හද තිබෙනවා. විශේෂයෙන්ම අපි ජනවසමට ස්තුති කරන්නට ඕනෑ. අපට ඒ අය රු. 8,500 ක බඩු දුන්නා. මුදල් රු. 1,500 ක් දුන්නා. දැන් ඒ පන්සල හොඳ පැත්තකට හැරීගෙන යනවා.

අපේ අගමැතිතුමාත් දැන් මෙහි සිටිනවා. පැලෑනේ ශ්‍රී වජිරඤාන ස්වාමීන් වහන්සේ අගමැතිතුමාට උගන්වා තිබෙනවා. ජනාධිපතිතුමාටත් උගන්වා තිබෙනවා. දිවංගත ඩඩ්ලි සේනානායක අගමැතිතුමාටත් උගන්වා තිබෙනවා. අපේ විරුද්ධ පාර්ශ්වයේ නායක අනුර බණ්ඩාරනායක මහතාත් ඒ දහම් පාසලේ ඉගෙනගෙන තිබෙනවා. ඇතුළත් මුදලි ඇමතිතුමාත් ඉගෙන ගෙන තිබෙනවා. ඩේවිඩ් කරුණාරත්න කියා කෙනෙක් මේ පන්සල ගැන පොතක් පළකර තිබෙනවා. ඒ පන්සලට උදව් කළ සමහර දායකයින් දැන් ජීවතුන් අතර නැහැ. ගරු ජනාධිපතිතුමාගේ මව උදව් කර තිබෙනවා. එතුමාගේ මවගේ මව වන හෙලේනා විජේවර්ධන මැතිණියත් උදව් කර තිබෙනවා. මේ පොත බලා වජිරාරාමය ගැනත් චෛත්‍යය ගැනත්—ශ්‍රී වජිරඤාන චරිතය කියා එකක් ලියා තිබෙනවා—ආණ්ඩුවෙන් අලුතින් පොතක් පළ කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

නාරද හාමුදුරුවෝ විශාල සේවයක් කරල තිබෙනවා. මහානාම හාමුදුරුවෝ දැන් ජීවතුන් අතර නැහැ. මේ ඔක්කෝම නම් සඳහන් කරල පොතක් ගහන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. ඒ හාමුදුරුවන්ගේ මාමාගේ පුතෙක් හිටියා. ඒ තමයි පැලෑනේ ධම්මාරාම හාමුදුරුවෝ. ඒ හාමුදුරුවෝ හොඳට ඉංග්‍රීසි ඉගෙනගෙන හිටියා. මෙතුමා අර හාමුදුරුවන්ව බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා. ඒ විස්තර තිබෙන පොතක් අච්චු ගහල තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා]

බර්ට්‍රම් සේරසිංහ නමැති කෙනෙක්. ඒ පොඩි පොතේ පිටු වැඩිපුර නැහැ. ඒ නිසා මම දැන් ඒ පොත සභාගත කරනවා.* පැලැනේ ධම්මාරාම හාමුදුරුවෝ මහණ වෙන්න කලින් ලොකු රක්ෂාවක් කළ කෙනෙක්. ඒ කාලේ හැම දමත් තමන්ගේ දෙමාපියන්ට කියනවා, තමාව මහණ කරවන්න කියල. ඒ පාර, ගෙනත් මහණ කෙරෙව්වා. එතුමා තමයි, පළමුවෙන්ම ඉංග්‍රීසියෙන් බණ කී හාමුදුරුවෝ. ඒ හාමුදුරුවන්ගේ අයියත් නීතිඥයෙක්. උන්නැහේ මාතරට ගියේ, 1889 අවුරුද්දේයි. ඒ හාමුදුරුවෝ මේ සහෝදරයා එක්ක බොහොම කිට්ටුවෙන් ආශ්‍රය කළා. ඒ විධියට පැලැනේ ගුරු කුලයේ අය විශ්ව විද්‍යාල මහාචාර්යවරු වුණා ; උප කුලපතිවරු වුණා.

අ. භා. 4. 52

**ආනන්ද දසනායක මහතා (කොත්මලේ)**
**(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)**
(Mr. Ananda Dassanayake–Kotmale)

සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සලකා බැලෙන මේ අවස්ථාවේදී එක් - එක්කෙනා එක් - එක් විධියට සංස්කෘතිය විග්‍රහ කරනවා. සංස්කෘතිය, එක - එක විධියට විග්‍රහ කරන්නත් පුළුවන් විෂයයක්. එක අතකින් එය විග්‍රහ කර ඉවර කරන්න පුළුවන්කමකුත් නැහැ. මිනිසාගේ ජීවිතයට සම්බන්ධ නොයෙකුත් කාර්යයන්, හැසිරීම්, සිතුම් - පැතුම්, ආගම් ආදී සියලුම දේවල සංකීර්ණයක්, එකතුවක් තමයි, සංස්කෘතිය හැටියට සලකන්න සිදු වෙන්නේ. මිනිසාගේ ජීවිතයෙන් සංස්කෘතිය වෙන් කර තෝරා - බේරා ගන්න බැහැ. ඒ නිසා එක් වරම කියන්න බැහැ, සංස්කෘතිය නරක් වෙනවාය, නරක් වුණාය කියා. සමහර විට පුද්ගලයකුගේ දෙදෙනකුගේ හෝ සුළු පිරිසකගේ කටයුතුවලින් සංස්කෘතියට, සංස්කෘතියේ තිබෙන ලක්ෂණවලට හානියක් වන්න පුළුවන්. නමුත් ඒ නිසාම කියන්න බැහැ, රටේ සංස්කෘතියට හානි වුණාය, සංස්කෘතිය නැති වුණාය කියා. ලංකාවේ බුද්ධ ශාසනය අවුරුදු 2,500කටත් වැඩි කාලයක් පැවතී තිබෙනවා. බුද්ධාගමින් පෝෂණය වුණු සිංහල සංස්කෘතියත් අවුරුදු 2,350 ත් 2,400 ත් අතර කාලයක් තුළ පැවතී ගෙන එනවා. අපේ මේ සිංහල සංස්කෘතිය නැති කරන්න, ඊට හානි කරන්න, එහි පැවැත්මට බාධා කරන්න නොයෙකුත් බාධක ඇති වුණා. විදේශීන්ගෙන් අපේ සංස්කෘතියට නොයෙකුත් විධියේ තර්ජන ඇති වී තිබෙනවා. ඒ විධියේ නොයෙකුත් බාධක, තර්ජන ඇති වෙන්න පටන් ගත්තේ අපේ ජාතිය මේ රටේ ඇති වෙනවාත් එක්කම වාගේයි.

ඒ අතර අපේ සංස්කෘතියට එල්ල වුණු විශාල තර්ජනයක්, හානියක් තමයි, ඇතැම් විදේශිකයන් විටින් - විට බලහත්කාරයෙන් අපේ සාංස්කෘතික දායාදයන්ගෙන්—අපේ පැරණි ශ්‍රී විභූතිය විදහා දක්වන නටබුන්වලින්—ඇතැම් ඒවා විනාශ කිරීම. අපේ ඒ පුරා වස්තූන් කඩා - බිඳ දමා විනාශ නොකලා නම් අපේ සංස්කෘතියේ, ශිෂ්ටාචාරයේ, සභ්‍යත්වයේ, සංවරකමේ, කලා ශිල්ප පිළිබඳ නිපුණත්වයේ සාධක මීට වඩා පැහැදිලිව දැක ගන්න තිබුණා. ඇත්ත වශයෙන්ම කියනවා නම් අද අපට තියම සාංස්කෘතික දායාදයන් ඉතිරි වී නැතැයි කිවත් නිවැරදියි. අපේ මුතුන් - මිත්තන්ගෙන් අපට උරුම වන ඒ සාංස්කෘතික දායාදයන්—පොත් - පත් ආදී වටිනා වස්තූන්—බොහොමයක් මේ රටින් හොරකම් කරගෙන ගොස් තිබෙනවා.

ඒ සම්බන්ධයෙන් වර්තමාන ආණ්ඩුවත්, පසුගිය ආණ්ඩුවත්, අපේ වෙනත් ආණ්ඩුවක්වත් වැරදිකරු නොවෙයි. කවුරු හෝ ඒ විධියට මේ රටේ ආණ්ඩුවකට දෙස් කියනවා නම් ඔහු රට - ජාතිය - සංස්කෘතිය පිළිබඳ ඉතිහාසය නොදන්නා කෙනෙක් යයි කියන්න පුළුවනි.

දවසකින් - දෙකකින් සංස්කෘතියක් ගොඩ නඟන්න පුළුවන් යයි කාටවත් කියන්න බැහැ. මොන ඇමතිවරයා බලයේ සිටියත්, අපට කියන්නට බැහැ, හැම තැනම ඒකාකාරව සංස්කෘතිය හැඩ ගස්වන්න පුළුවන්ය කියා. ඒක කරන්නට කිසිම කෙනෙකුට පුළුවන් වන්නේ නැහැ. එහෙම පුළුවන්කමක් තිබුණා නම් ලෝකය පුරාම බෞද්ධාගම පැතිර යන්නට තිබුණා. බුදුරජාණන් වහන්සේ තමන්ගේ සර්වඥතා ඥානයෙන්, සැම දෙනාටම ඇසෙන සේ දහම් දේශනා කලා නම්, එහෙනම් හැම දෙනාම නිවන් යන්න ඕනැ : හැම දෙනාම වාගේ බෞද්ධාගම වැළඳ ගෙන තිබෙන්නට ඕනැ. නමුත් ඒක කරන්නට පුළුවන්කමක් නැහැ. අප විශ්වාස කරන හැටියට ලෝකයේ පහළ වුණු ශ්‍රේෂ්ඨම ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේ ලෙස පිළිගන්නවා. නමුත් උන් වහන්සේටවත් බැරි වුණා, හැම දෙනාම එකම ධර්මයකට යොමු කර එමඟින් එකම සංස්කෘතියක් ලොව පුරා ඇති කරන්නට. කොහොම වුණත් එක් එක් ජාතීන්ගේ සංස්කෘතීන් විවිධයි. මේ සංස්කෘතීන් ඇතම්විට එකිනෙකට වෙනස්.

සංස්කෘතීන් අතර මේ වෙනස්කම දකින්නට ලැබෙනවා වාගේම පුද්ගල රස වින්දනයේත් පුද්ගලයා අනුව වෙනස්කම් දකින්නට ලැබෙනවා. " ටේස්ට් ඩිෆර්ස් " යයි ඉංගිරිසි කියමනක් තිබෙනවා. සංස්කෘතිය අගය කරන පුද්ගලයන් ඉන්නවා වාගේම සංස්කෘතිය ගැන දැනුමක් ඇතත් අගය නොකරන පුද්ගලයන්ද ඉන්නවා. මේ අනුව මේ පුද්ගල දෙකොට්ඨාශය අතර පැහැදිලි වෙනස්කම් දකින්නට තිබෙනවා. කෙසේ වුණත් කිසියම් සංස්කෘතියකට හැඩ ගැසෙන පුද්ගලයා වඩා ශිෂ්ට සම්පන්න බවක් පෙනෙනවා. සංස්කෘතියක ලක්ෂණය එයයි. සංස්කෘතිය පුද්ගලයකුගේ චරිත හැඩ ගැස්වීමට විශේෂයෙන්ම බලපානවා. අවංක, ඍජු චරිත ලක්ෂණ ඇති පුද්ගලයා ආධ්‍යාත්මික වශයෙන් දියුණු වුණු පුද්ගලයෙක්. එබඳු යහපත් චරිත ලක්ෂණ, සංස්කෘතියක දායාදයන් වශයෙන් අපට සලකන්නට පුළුවනි. හැම දෙනාටම මෙවැනි සංස්කෘතියකට අනුව හැඩ ගැසෙන්නට බැරි බව අපේ විශ්වාසයයි.

අර මා කලින් සඳහන් කළ විධියට පුද්ගල රස වින්දනයේ වෙනස්කම් ඇත්නම්, සහජ ගතිපැවතුම්ද වෙනස් කරන්නට අමාරුයි. ඇතැම් අයට සහජයෙන් නැතිනම් පරම්පරාවෙන් එන දරදඬු ගති පැවතුම් තිබෙනවා. ඒ අයට මොන විධියෙන් කිව්වත්, බණ දේශනා කළත්, අපේ සංස්කෘතික දායාදයන් ගැන මොන විධියේ පොත්පත් ලියා තිබුණත් ඒවා කියවන්නේ නැතිව, ඒ පිළිබඳව කිසිම දැනුමක් ලබා ගන්නේ නැතුව, ඉබාගාතේ, අසංවර අන්දමට හැසිරෙනවා. මේ අන්දමට ගත් කළ සමාජයේ පුද්ගලන්ට විවිධ චරිත ලක්ෂණ ඇති බව පෙනෙනවා. මේ අනුව බලන විට සමාජයේ හැම දෙනාම එක විධියට හැඩ ගස්වන්නට බැරි බව, හැම දෙනාම යහපත් පුද්ගලයන් කරන්නට බැරි බව පැහැදිලියි. අපේ සංස්කෘතික ඇමතිතුමාට තමන්ගේ මුළු ජීවිත කාලය තුළ සැම තත්පරයක්ම ඒ සඳහා කැප කළත් එය ඉටු කර ගන්නට පුළුවන්කමක් නැහැ. එහෙම නම් සමාජයේ ඇති වන විකාශනය අනුව ප්‍රශ්න එන්ට එන්ටම ලියලන බව, වැඩි වන බව පිළිගන්න ඕනැ. ප්‍රශ්න වැඩි වන විට ඒවා විසඳන්න වැඩි වෙහෙසක් දරන්නට වෙනවා. ප්‍රශ්න විසඳීම පහසු කාර්යයක් නොවෙයි. කෙසේ වුණත් රටක සංස්කෘතිය අපි ආරක්ෂා කළ යුතුමයි. එසේ අරක්ෂා කර දීම සඳහා නීතිරීති පැනවීමත් ඉතාමත්ම වැදගත්. අවශ්‍ය වෙනස්කම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කර කැබිනට් මණ්ඩලයේ මාර්ගයෙන් කටයුතු සකස් කර ගැනීමට අපේ ඇමතිතුමා ක්‍රියා කළ යුතුයි.

ගරු සභාපතිතුමනි, අධ්‍යාත්මික වශයෙන් පුද්ගලයන් හැඩ ගස්වන සංස්කෘතියකුයි, අපට තිබෙන්නේ. බෞද්ධ දහමේ හැටියට ආමිස පූජාව හා ප්‍රතිපත්ති පූජාව යන කොටස් දෙකක් තිබෙනවා. බෞද්ධයන් තමන්ගේ ආගමික මධ්‍යස්ථානවලට ගිහින් වන්දනාමාන ආදිය කරන්නේ අන් අයට පෙනීමට නොවෙයි. තමන්ගේ චරිතය හැඩ ගස්වා ගැනීම, තමන්ගේ සිත දමනය කිරීම ආදී උසස් ලක්ෂණ හි ගැබ්වී තිබෙනවා. එහෙම නම් මුළු ලොවටම දිය හැකි උසස්ම සංස්කෘතික දායාදය තමයි, අපේ සංස්කෘතිය හා යන බෞද්ධාගම. වෙනත් වචනවලින් කියනවා නම්, බෞද්ධ ධර්මයේ ඇති සම්පූර්ණ අරටුව එයින් පෙරාගත් වැදගත් කොටස, අපේ සංස්කෘතියට—අපේ ජීවිතවලට එකතු වී තිබෙනවා. මේ ලක්ෂණ අපෙන් එක් වරටම නැති කර දමන්නට බැහැ. කෙනෙකුට එය වෙනස් කර දමන්නට පුළුවන් වෙන්නේද නැහැ. එම නිසාම තමයි, විශේෂයෙන්ම දකුණු ඉන්දියානු ද්‍රවිඩ ජනතාව, අවුරුදු දහස් ගණනක් තිස්සේ අපේ සිංහල සංස්කෘතිය නැති කර දමන්නට වෙහෙසුණත්, අද දවස දක්වාම එම සංස්කෘතිය රැකී තිබෙන්නේ.

අපේ සංස්කෘතියට සම්බන්ධ වුණු බෞද්ධාගම, බෞද්ධයන්ගෙන් ඈත් කරන්නට ලෙහෙසි නැහැ. තමන් කැමති ආගමක් ඇදහීම පුද්ගලයා සතු නිදහසක්. තමන්ගේ කැමැත්ත අනුවයි ආගම අදහන්නේ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. කොහොම වුණත් අපේ රටට පැමිණි දමිළ පිරිස නිසා පසු භාගයේදී බෞද්ධාගමටත් හින්දු ආගමේ යම් යම් ලක්ෂණ එකතු වූ බව අපි දන්නවා අපේ ආගමට හා සංස්කෘතියට මිශ්‍ර වුණු බව අපි පිළිගන්නවා ; නැත කියන්නත් නැහැ. අපිට ඒ සංස්කෘතිය ආවේ ඉන්දියාවෙන්. නමුත් ඉන්දියාවට

* පුස්තකාලයේ තබා ඇත.
நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැරි වුණා ඒ බෞද්ධ සංස්කෘතිය ඒ රටේ ආරක්ෂා කර ගන්න. බෞද්ධ සංස්කෘතිය ඉන්දියාවෙන් විනාශ කරලා දැම්මා. ඒකට හේතුව මොකක්ද ? බෞද්ධ සංස්කෘතියට විරුද්ධ අය එහි සිටි නිසයි ; බෞද්ධ ශාසනයට විරුද්ධ අය එහි සිටි නිසයි. ඒ ඉන්දියාවේ අයයි. ඒ අපේ අසල් වැසියෝ. ඉන්දියාවේ බ්‍රාහ්මණ ආගම ඇති වුණා. ඉන්දියාවේ ජෛනාගම ඇති වුණා. ඉන්දියාවේ නිඝන්ටයෝ හිටියා. ඒ අයගෙන් පැවත එන සියළු දෙනාම බෞද්ධ සංස්කෘතියට විරුද්ධ වුණා. බෞද්ධාගම ඉන්දියාවෙන් නැති කරන්න ඒ අය විශාල සටනක් ගෙන ගියා. ඉන්දියාවේ බෞද්ධාගම නැති වෙද්දී ලංකාවේ බෞද්ධාගම ක්‍රමයෙන් ව්‍යාප්ත වුණා. බෞද්ධාගම අපට උරුම වුණා. මේ රටේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට අපට පුළුවන් වුණේ අපේ රටේ වැඩි දෙනෙක් බෞද්ධාගම ඇදහූ නිසයි. වැඩි දෙනෙක් බෞද්ධාගම පිළිගත්තා. දේවානම්පියතිස්ස රජතුමාගේ කාලයේ සිටම වැඩි දෙනෙක් බුද්ධාගම හොඳ දර්ශනයක් කියලා පිළිගත්තා ; මේක හොඳ ආගමක් කියලා පිළිගත්තා ; මේක හොඳ සංස්කෘතියක් ඇති කරන්නට පුළුවන් ආගමක්ය කියලා පිළිගත්තා ; මිනිහා නියම මිනිහෙක් කරන්නට පුළුවන් ආගමක් හැටියට පිළිගත්තා. මිනිහා තිරිසන් ලෝකයෙන් මුදවා ගන්නට පුළුවන් ආගමක් හැටියට පිළිගත්ත. අන්න ඒ හැඟීමකට මේ රටේ බුද්ධාගම ප්‍රතිෂ්ඨාපනය වූද පටන්ම අපි ආරක්ෂා කරගෙන එනවා. කවුරු කිව්වත් මේ සංස්කෘතියට අපි කැමති නැහැ කියලා, අපේ සංස්කෘතිය නැති කරනවාය කියලා කිව්වත් නැති කරන්නට බැහැ. තමුන්නාන්සේවත් මමවත් කවුරුවත් ඒකට බය වන්නට වුවමනාවක් නැහැ. අපිට තර්ජන තිබෙනවා. උතුරේ තර්ජන තිබෙනවා. උතුරේ තර්ජන එදත් තිබුණා. එද තර්ජන කිරීම විතරක් නොවෙයි, ඒවා ක්‍රියාත්මක කිරීමත් කළා. ඒ හැම දෙයකටම අපේ ජනතාව මුහුණ දුන්නා. ඉදිරියේදී වුණත් අපේ සංස්කෘතිය අපේ අයිතිය අපේ ස්වාධීනත්වය කවදාවත් ඔවුන්ට නැති කරන්නට පුළුවන් වෙන්නේ නැහැ කියලා මම කියනවා.

තමුන්නාන්සේ සංස්කෘතික ත්‍රිකෝණය ඇති කිරීම ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. මොනවා හෝ සිද්ධස්ථාන කොටසක් තෝරාගෙන පැරණි නටබුන් ස්ථාන ආරක්ෂා කරමින් ඒවායේ තිබෙන වටිනාකම ආරක්ෂා කරමින් ඒවා වැඩි දියුණු කරමින් ගෙන යන මේ ව්‍යාපාරය අපි බොහොම හොඳයි කියලා පිළිගන්නවා. ඒ කාර්යය තවත් වැඩි දියුණු කරන්නට ඕනෑ.

**සභාපතිතුමා**
**(தலைவர்)**
(The Chairman)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES[ MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කරමින් සිටියේ සංස්කෘතික ත්‍රිකෝණය ගැනයි. සංස්කෘතික ත්‍රිකෝණයට වෙන් කළ කොටසයි එයින් ඉතිරි වන කොටසයි අතර තිබෙන පරතරය ගැනයි. සංස්කෘතික ත්‍රිකෝණය කියන මේ කොටසට ඇතුළත් වන්නේ මහනුවර, අනුරාධපුරය, කුරුණෑගලින් කොටසකුත් පමණයි [බාධා කිරීම්] නැහැ, කුරුණෑගල අයිති වන්නේ නැහැ. දැන් අද තිබෙන තත්ත්වයටත් අපේ සංස්කෘතික ලක්ෂණ, අපේ සංස්කෘතික වටිනාකම නැති කර තිබෙන්නේ මේ රටේ දකුණු ප්‍රදේශයෙන් නොවෙයි. උතුරු ප්‍රදේශයෙන් තමයි, නැති කර තිබෙන්නේ. ඒ උතුරු ප්‍රදේශයත් ඇතුළත් කිරීමට සංස්කෘතික ත්‍රිකෝණය මම කියන්නේ 'රෙක්ටැන්ගල්' කරනවා නම් හොඳය කියලයි. කෝණ පහක් නැත්නම් කෝණ අටක් වුණත් කමක් නැහැ. මේ ත්‍රිකෝණයට අහු වෙන ටික නම් නැවත විනාශ කරන්නට දෙයක් නැහැ. ඒ කෙසේ වෙතත්, තමුන්නාන්සේ ගත් පියවර ගැන මම සංතෝෂ වෙනා. ඒක වැඩි දියුණු කරන්නට ඕනෑ.

තමුන්නාන්සේගේ වාර්තාවේ මේ රටේ බෞද්ධ ඉතිහාසය ගැන සඳහන් වෙලා තිබෙනවා. නාථ දේවාලය ගැන විස්තර තිබෙනවා. නාථ දෙවියන් බුදුන් වහන්සේගේ දර්ශනයක් හැටියට පෙන්වනවා. මෙය හීනයාන දර්ශනයක් හැටියට පෙන්වනවා. ඒක ඉතාමත් වැදගත් වෙනවා. අපේ මිනිසුන්ට මේවා පෙන්වන්නට ඕනෑ. මෙයින් වැඩක් නොවෙනවාය කියනවා නොවෙයි. ඇත්ත වශයෙන්ම සංස්කෘතික ත්‍රිකෝණයෙන් වැඩක් වෙනවා ; ඒ නිසා අපි එය අගය කරනවා.

උතුරු නැගෙනහිර ප්‍රදේශවල තිබෙන අපේ සංස්කෘතික දායාදයක් ගැනයි ඊළඟට මම කියන්නේ. මම මේක මීට ඉස්සෙල්ලාත් කියෙව්වා. මෙහි තිබෙන ඒවා ක්‍රියාත්මක කරන්න කියලයි මම කියන්නේ :

"An appeal to UNESCO to safeguard and preserve cultural property in Sri Lanka endangered by racial prejudice, unlawful occupation or wilful destruction."

මේක තමයි කරන්න ඕනෑ. මේ වාර්තාවේ තවත් වැදගත් කරුණු කියා තිබෙනවා. මට පෙනී යන හැටියට සිංහලයා ගැන බෞද්ධයා ගැන කතා කරන්න ඉන්නේ කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා පමණයි.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

මේ සම්බන්ධ යෝජනාවක් ඇමති මණ්ඩලයේ සම්මත කොට ඒ යෝජනාව යුනෙස්කෝ සංවිධානයට යවා තිබෙනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

උතුරේ කෙරෙන සටනට ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් කෙරෙන ප්‍රති-ප්‍රහාර දීම ඇත්ත වශයෙන්ම මේ පොත්පත්වලින් පමණක් නොව එතුමාගේ හදපත්ලේම තිබෙන හැඟීමක් අනුව කරන දෙයක්. එය අද ඊයේ ඇති වුණු දෙයක් නොවෙයි. එක් දහස් නමසිය පණස් ගණන්වල සිටම එතුමා මෙය කරගෙන යනවා. අපි එතුමාට ධෛර්යය දෙන්න ඕනෑ. සංස්කෘතික ඇමතිතුමාට මෙය දී තිබෙන්නේ යුනෙස්කෝ ආයතනයට ඉදිරිපත් කිරීමටයි. මේකේ වැදගත් දෙයක් තිබෙනවා.

අපේ බෞද්ධ සිද්ධස්ථාන අපේ හතුරන් ත්‍රස්තවාදීන් පමණක් නොව ඊට ඉස්සර සිටි ත්‍රස්තවාදීන්ගේ සගයෝ විනාශ කර තිබෙනවා. එවැනි ස්ථාන මෙහි පැහැදිලිව දක්වා තිබෙනවා. ගණනින් දහක්-එක් දහස් පන් සියයක් පමණ වෙනවා. මේ යන්නේ ඉතිහාසය වෙනස් කරන්නයි. නමුත් ඉතිහාසය වෙනස් කරන්න බැහැ. ආකියොලොජිකල් ඩිපාර්ට්මන්ට් එකෙන් එක්ස්කැවේෂන්ස් කරගෙන යනවා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. මේ වාර්තාවෙන් ඒවා පැහැදිලි කර තිබෙනවා. බෝධීන් කපා දමනවා. විහාර භූමි කඩා දමනවා. පිළිම කඩා දමනවා. කැඩුවත් ගල් පිළිම නිසා ඒවා ඉවතට අදින්න බැහැ. කැඩූ කොටස් එතැනම ඉතුරු වෙනවා. නාගදීපය අපි ආරක්ෂා කරන්න ඕනෑ. මේ ට්‍රැන්ගල් එක නාගදීපයේ සිට එතැනින් මහියංගනය හරහා කෙළින්ම කැලණිය දක්වා ගන්න ඕනෑ. පැරණි සිද්ධස්ථාන තුනක් හැටියට මේ ස්ථාන තුන ඊට ඇතුළත් වෙන්න ඕනෑ. එසේ කළොත් අවශ්‍ය කොටස් ඔක්කෝම ඊට ඇතුළත් වෙනවා.

අපට වුවමනා කරන්නේ යාපනේ තිබෙන බෞද්ධ සිද්ධස්ථාන වෙහෙර විහාර හා සොයා ගන්නට තිබෙන පුරාවිද්‍යා වස්තූන් සොයාගෙන ඒ ස්ථාන ආරක්ෂා කිරීමයි. ඒ ටික කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ට්‍රැන්ගල් එකට ඒවා ඇතුළත් කරන්න. එසේ නොකළොත් මේ පොත් ලිවීමෙන් ඇති වැඩකුත් නැහැ. මේ පොත් පුස්තකාවල තියෙයි. එපමණක් මදි. ඒවායේ තිබෙන දේ ක්‍රියාත්මක කරන්න ඕනෑ.

ඊළඟට මගේ මැතිවරණ කොට්ඨාශය වන කොත්මලේ කොට්ඨාශය සම්බන්ධව කරුණක් දෙකක් ඉදිරිපත් කරන්න තිබෙනවා. ඒ සඳහා කාලය දෙන මෙන් මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාගෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා. ඉතා විශාල සංස්කෘතික වටිනාකමක් ඇති ස්ථානයක් කොත්මලේ තිබෙනවා. එනම්, පුසුල්පිටියේ රජමහා විහාරයයි. බුදුන් වහන්සේගේ දර සෑයෙන් ඇත තැංගායයි කියන දඹරන් පිළිමයක් එහි තිබුණා. මේ පිළිබඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

කතාවේ සත්‍යාසත්‍යතාව හොයන්න මම දන්නේ නැහැ. ජනප්‍රවාදය ඒකයි. ඒ දඹරන් පිළිමය දූනට මාස තුනකට හතරකට උඩදී හොරු අරගෙන. මේ ගැන පරීක්ෂණයක් කරන ලෙස මම ඉල්ලා සිටිනවා. මම සී. අයි. ඩී. එකත් එක්ක ගියා. පොලිසියේ කට්ටිය අඩගහගෙන ගහින් පරීක්ෂණ කළා. නමුත් කිසිම තොරතුරක් දැනගත්ත නැහැ.

මේ පිළිමය ඉතාම වටිනා සංස්කෘතික දයාදවලින් එකක්. හරියට කියනොත් පුසුල්පිටියේ රජමහාවිහාරය විභීෂණ දෙවියන්ගේ දේවාලවලට සම්බන්ධයි. රුහුණට සම්බන්ධ ස්ථානයක්. කොත්මලේ අරක්ෂක ප්‍රදේශයක්. ඒ නිසා කතරගම හා දෙවුන්දර විභීෂණ දේවාල එක්ක මේ ස්ථානය සම්බන්ධයි. ඒ තරම්ම පැරණි සිද්ධස්ථානයක්. එහි තැති වුණු පිළිමය සෙවීමත් ඊට දිය යුතු ආරක්ෂාව සලසා දීමත් අවශ්‍යබව මම කොත්මලේ ජනතාව වෙනුවෙන් බෞද්ධයන් වෙනුවෙනුත් ගරු ඇමතිතුමාට මතක් කරනවා.

පන්සල් ගැන කීප වතාවක් මම ගරු ඇමතිතුමාට කියා තිබෙනවා. තමුන්නාන්සේ මට මේකට උදව් දෙන්න ඕනෑ. අපේ ප්‍රදේශයේ පන්සල් එකොළහක් පමණ තිබුණා. මේ පන්සල් හැදීම සඳහා ඉඩම් ලබා ගෙන ඒවා ඉක්මණින් සාද ඒවායේ තිබුණු සංස්කෘතික ලක්ෂණ ඒ විදියටම ඇති කරන්න ඕනෑ. එහෙම කියන්නට ප්‍රධාන හේතුව මම කියන්නම්. දැන් මැදරට උතුරට වඩා තරක් වේගන එනවා. මැදරට බෞද්ධ සංස්කෘතික ලක්ෂණ හා බෞද්ධයන් සම්පූර්ණයෙන්ම වාගේ අඩු වේගන යනවා. අද එහි බෞද්ධයන්ගේ හා සිංහලයන්ගේ සංඛ්‍යාව සියයට විස්ස දක්වා පහත බැස තිබෙනවා. එහෙම නම් සංස්කෘතිය ආරක්ෂා කිරීමේදී තමුන්නාන්සේලාගේ රජයෙන් නැත්තම් කැබිනට් මණ්ඩලයෙන් මේ පිළිබඳව පියවරක් ගත යුතුයි කියන එකයි මගේ යෝජනාව. ස්තුතියි.

අ. භා. 5.10

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා (සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා)**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா — கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)**
(Mr. W. M. G. T. Banda–Deputy Minister of Cultural Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේ විරුද්ධ පාර්ශ්වයෙන් නොයක් අදහස් ඉදිරිපත් කරන්නට යෙදුණා. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් කරුණු රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන විට 1956 දී මේ අමාත්‍යාංශය පිහිටෙව්වොය කියන එක මූලික වශයෙන් හැම අවුරුද්දකදීම කියන කථාවක් වී තිබෙනවා. 1956 දී මේ අමාත්‍යාංශය පිහිටවූ බව අපි පිළිගන්නවා. නමුත් 1956 පිහිටවූ අමාත්‍යාංශය තුළින් 1977 වන තුරු මේ රටේ කළ යම් කිසි වැඩ කොටසක් කිසිම කෙනෙකුට ඉදිරිපත් කරන්න බැරිවුණා. ඉදිරිපත් කරන්නට දෙයක් කර තිබුණේ නැහැ. 1977 න් පසුවයි මේ රටේ ජනතාවට සංස්කෘතික අමාත්‍යාංශයක් තිබෙනවාය කියන එක වත් දැන ගන්නට ලැබුණේ.

විශේෂයෙන් දැන් නොයක් චෝදනා එල්ල වුණත් 1977 ට කලින් උතුර හා නැගෙනහිර පළාත්වල බෞද්ධ සිද්ධස්ථාන තිබෙනවාය කියන හඬක්වත් මේ රටේ ජනතාවට දැන ගන්නට තිබුණේ නැහැ. එවැනි ස්ථාන අඩු වශයෙන් 180 ක් පමණ අපි සොයාගෙන කැනීම් කටයුතු කර, ඒවා ආරක්ෂිත ස්ථාන බවට පරිවර්තනය කර නීති කෙටුම්පත් කර තිබෙනවා. මට මතකයි, 1974 දී මුත්තූර් ආසනයේ මන්ත්‍රීවරයා හැටියට සිටියේ ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ තංගතුරෙයි නමැති මහත්මයෙක්. ඒ මහත්මයාගේ ගෙදරට ටෙලිපෝන් කම්බි ඇදීමට ඒ ස්ථානයේ තිබුණු කිරිවැඩි බෝධිය නමැති ඓතිහාසික බෝධියත් කපා දැම්මා. මේ බෝධිය සම්පූර්ණයෙන්ම කපා දමා එතැනින් ටෙලිපෝන් කම්බි ඇද්දා. ඒ අයම අද අපට මේවා ආරක්ෂා කරන්නය කියනවා. අපි මේ කටයුතු සියල්ලක්ම කරගෙන යනවා. අපේ අමාත්‍යාංශය මඟින් මේ වන තුරු කර තිබෙන වැඩ කටයුතු දෙස බලන විට අද කියැවුණු ඒවා පමණක් නොව ඒ වාගේ සිය ගණනක් වැඩ අපි පටන්ගෙන තිබෙන බවත් ඒ වාගේම අවසන් කර තිබෙන බවත් පෙනෙන්නට ඕනෑ.

විරුද්ධ පාර්ශ්වයේ උදවිය දහම් පාසල් ගැන කථා කළා. මහාවංශය ගැන කථා කළා. කලාකරුවන් ගැන කථා කළා. පුරා විද්‍යාව ගැන කථා කළා. මේ ආදී වශයෙන් නොයෙක් දේවල් ගැන කථා කළා. මම ඒ හැම එකක් ගැනම නොකියන්නේ ගරු ඇමතිතුමාට එතුමාගේ කථාව කිරීමට කාලය දිය යුතු නිසයි. 1984/85 වර්ෂ සඳහා අපි කරන ලද වැඩත්, කරන්නට බලාපොරොත්තු වන වැඩක් පිළිබඳ සැලසුම් ආදියත් මම දැන් සභාගත* කරනවා. පිටු 68 කින් යුතු මේ පොතේ සඳහන් වෙනවා. ඒවා කියවීමට යන කාලය ඉතිරි කර ගැනීම සඳහා මේ පොත සම්පූර්ණයෙන්ම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එය කියැවුවාට පසුව, එය කියවන අයට පසුගිය අවුරුදු හත තුළ මොන විධියේ වැඩ කොටසක් කර තිබෙනවාද කියන එක පැහැදිලි වෙනවා ඇති. සංස්කෘතික අමාත්‍යාංශය විසින් මේ රටේ මෙතෙක් කලකට නොකෙරුණු අන්දමේ වැඩ කොටසක් හැම කෙනෙකුගේම සහයෝගය ඇතිව කර තිබෙන අතර අපි හැම වෙලාවෙම කල්පනා කරන්නේ ඒ වැඩකටයුතු තවදුරටත් ඉදිරියට ගෙන යාමටයි. විවේචන අවශ්‍ය වෙනවා. නමුත් විවේචන කරන අවස්ථාවේදී කවුරුත් කල්පනා කරන්නට ඕනෑ මේ අවුරුදු හත තුළ මේ අමාත්‍යාංශය තුළින් කෙරුණු වැඩ, පසුගිය අවුරුදු 19 ක කාලය තුළදීවත් කෙරුණාද කියා. එසේ කෙරී නැහැ. අපි හැම වෙලාවෙම උතුරු නැගෙනහිර ප්‍රදේශ ගැන, ඒ ප්‍රදේශයේ තිබුණු බෞද්ධ සිද්ධස්ථාන ගැන, කටයුතු කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයෙන් තව කථාවක් කිව්වා. සංස්කෘතිය දැන් කොටස් තුනකට බෙදලා කියා කිව්වා. අද කොටස් තුනකට බෙදන්නේ නැතුව එකට තිබෙන නමුත් මම තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ එක කරුණක්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ සංස්කෘතික ඇමතිවරයා හැටියට කුලතිලක මැතිතුමා පත් කළාට පසුව එතුමා මොකක්ද කිව්වේ ? මාව සංස්කෘතික ඇමතිවරයා හැටියට පත් කළාට මම සංස්කෘතිය ගැන මොකුත් දන්නේ නැහැ කියා එතුමා කිව්වා. එහෙම කෙනෙකු එද පත්කරලා තමුන්නාන්සේලා අද අපට කියනවා අහවල් වැඩේ අහවල් විධියට කළේ නැහැ කියා. නමුත් මේ පොත අරගෙන කියෙව්වොත් තමුන්නාන්සේලාට පැහැදිලිවෙයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මටද කියන්නෙ ?

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
(Mr. W. M. G. T. Banda)

විරුද්ධ පක්ෂයේ ඔක්කොටම, විවේචනය කළ අයට කියන්නෙ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මටත් එක්ක.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා**
**(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)**
(Mr. W. M. G. T. Banda)

තමුන්නාන්සේ විවේචනය කළේ නැහැ නේ ? තමුන්නාන්සේ මොකටද කලබල වෙන්නෙ ? තමුන්නාන්සේටත් යම්කිසි කොනක් තිබෙනවා නම් භාරගන්න. [බාධාකිරීමක්] උත්තර දෙන්න අපි සූදානම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ තිබෙන කලා අංශය, මේ රටේ තිබෙන ජන කවි, මේ රටේ තිබෙන අතීතයේ ඉපැරණි සංස්කෘතික දායාදයන් සියල්ලක්ම එක්රැස් කර ඒවා තහවුරු කිරීමට පුළුවන් හැම පියවරක්ම ගැනීමට මේ අමාත්‍යාංශය මඟින් කටයුතු කරගෙන යන බව ප්‍රකාශ කරමින් මගේ ඇමතිතුමාට පිළිතුරු කථාව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසමින් මගේ කථාව අවසන් කරනවා.

---

* පුස්තකාලයේ තබා ඇත.
நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
*Placed in the Library.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.17

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே — கலாசார அலுவல்கள் அமைச்சர்)**
(Mr. E. L. B. Hurulle–Minister of Cultural Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විරුද්ධ පක්ෂයේ යම් යම් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද යම් යම් කාරණා ගැන නිවැරදි අවබෝධයක් ලබා දෙන්නට මම කල්පනා කරනවා.

ප්‍රථමයෙන්ම අපේ මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කරුණු ඉදිරිපත් කළා අද අපේ සංස්කෘතිය විනාශවේගෙන යනවා කියා. බාහිර සංස්කෘතීන් නිසා, සංචාරක ව්‍යාපාරය නිසා, රූපවාහිනිය නිසා එය විනාශවේගෙන යන බව කිව්වා. මේ විධියේම අදහස් තවත් ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ඉදිරිපත් කළා. එනිසා මේ සම්බන්ධව මම කියන්න කැමතියි. අපේ අවධානය මේවා ගැන යොමු වී තිබෙනවා. අපි මේ ගැන අපේ රාජ්‍ය ඇමතිතුමාට දන්වා තිබෙනවා. නැවත වාරයක් ඒ ගැන එතුමාට දැන්වීමට මම බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ එතුමා මේ ගැන දන්නෙ නැතිව ඇති. විශේෂයෙන් බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) ඉදිරිපත් කළ බෙන්තොට සංචාරක හෝටලයේ සිද්ධිය ගැන එතුමා දන්නෙ නැතුව ඇති. එතුමා ඒ ගැන විභාග කර නිසි පියවරක් ගනීවි.

ඒ වාගේම අපේ මහරගම ගරු මන්ත්‍රීතුමා ඇහුවා, ඇයි මේ දුටුගැමුණු හෂ්මාවශේෂ තැන්පත් නොකර යටපත් කර තිබෙන්නේ කියා. මම කියන්න කැමතියි අපි ඒක යටපත් කර නැති බව. සුදුසු අන්දමේ සිහිවටනයක් ගොඩනගා දක්ෂිණ ස්තූපයට නුදුරුව එය තැන්පත් කරන්නටයි අපි බලාපොරොත්තු වෙන්නේ. ලබන වසරේ පොසොන් පෝය උත්සවයට ඒවා තැන්පත් කර එම ස්ථානය විවෘත කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒකට මුදල් අවශ්‍ය වෙනවා. මහරගම ගරු මන්ත්‍රීතුමා පොරොන්දු වුණා මුදල් එකතු කර දෙන්නට. එම නිසා මම එතුමාගෙන් ඒ සම්බන්ධව ආධාර බලාපොරොත්තු වෙනවා.

මගෙන් තවත් ප්‍රශ්නයක් ඇසුවා සංස්කෘතික ඇමතිවරයා වශයෙන් මට බැරිද මේ සර්ව පාක්ෂික සම්මේලනය කල් දාන්න කියා. තමුන්නාන්සේ දන්නවා ඇති විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මහජන එක්සත් පෙරමුණත් යන දෙක්ෂයටම අවස්ථාවක් දී තිබුණ බව සර්ව පාක්ෂික සම්මේලනයට ඉදිරිපත් වී තමන්ට තිබෙන යම් යම් අදහස් හා කරුණු ඉදිරිපත් කරන්න. නමුත් එසේ නොකර මේ රට නැවත විනාශ මුඛයට පත් කරන්න, මේ රටේ කෝලාහල ඇති කරන්න, මේකෙන් දේශපාලන වාසියක් ගන්න මේ උදවිය ක්‍රියා කරන බව මම නිර්භයවම ප්‍රකාශ කරන්නෙ ඉතාම කනගාටුවෙන්.

දැන් වුණත් තමුන්නාන්සේලාට අවස්ථාවක් තිබෙනවා, 14 වෙනිද සර්ව පාක්ෂික සම්මේලනයට සහභාගි වී තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න. රජය තවමත් තීරණයකට එළඹිලා නැහැ, මේ විධියට ක්‍රියා කරනවාය කියා. යම්කිසි සම්මුතියකට එළඹෙන්න අදහස් දැනගන්නයි ඒ සර්ව පාක්ෂික සම්මේලනය 14 වෙනිද කැඳවා තිබෙන්නේ. තමුන්නාන්සේලාට මේ රට ගැන කැක්කුමක් තිබෙනවා නම්, සිංහල ජාතිය වෙනුවෙන් කැක්කුමක් තිබෙනවා නම්, බෞද්ධ ශාසනය අරක්ෂා කරන්න කැක්කුමක් තිබෙනවා නම්, එහෙමනම් මේ අවස්ථාවේදිවත් තමුන්නාන්සේලාට යුතුකමක් තිබෙනවා, ඒ සර්ව පාක්ෂික සම්මේලනයට සහභාගි වී තමුන්නාන්සේලාගේ අදහස් ප්‍රකාශ කරන්න. රජයේ අදහස තවම ක්‍රියාත්මක වෙලත් නැහැ, බලෙන් ක්‍රියාත්මක කරවන්නෙත් නැහැ. සියලුම පක්ෂවල අදහස් අනුවයි 14 වෙනිද යම් තීරණයකට එළඹෙන්නේ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඒ සම්මේලනයෙ දැනට ඉන්න පක්ෂ විතරයි.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

තමුන්නාන්සේලා දැන් මේව ගැන කථා කරනවා. [බාධාකිරීම්] මම මතක් කර දෙන්නද තමුන්නාන්සේලාගේ ඉතිහාසය ටිකක්. තමුන්නාන්සේලාට මතකද ඉන්දිරා ගාන්ධි මැතිණිය ජීවමානව සිටින කාලයේදී අපේ ගරු අගමැතිතුමා මෙතන කථාවක් කළ අවස්ථාව, ත්‍රස්තවාදීන් පුහුණු කරන කඳවුරු දකුණු ඉන්දියාවේ තිබෙනවාය කියා. එසේ ප්‍රකාශ කෙළේ අහවල් වීදියේ අහවල් අංකය දරණ නිවසේ අවි ආයුධ රැස් කරනවාය, මේ රටේ බැංකු කොල්ල කාලා, රජයේ ආයතන මංකොල්ල කාල විනාශ කරලා මිනී මරලා විප්ලවයක් කරන්න ත්‍රස්තවාදීන් පුහුණු කරනවාය, දකුණු ඉන්දියාවේ අහවල් නිවාසවල රැකවරණ ඇතිව ඔවුන් ඉන්නවාය කියා ඒ අල්ලාගත් ත්‍රස්තවාදීන්ගෙන් ලැබුණු සාක්ෂි අනුවයි. ඒ අවස්ථාවේ තමුන්නාන්සේලාගේ පක්ෂයේ විරුද්ධ පාර්ශ්වයේ නායකයා කුමක්ද කිව්වෙ ? නැහැ ඒක පිළිගන්න බැහැ, ඉන්දිරා ගාන්ධි මැතිණිය මෙහෙම කියනවාය, ඉන්දියා මහා කොමසාරිස් මෙහෙම කියනවාය එහෙම දෙයක් නැත කියල එතුමා කිව්වා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඒ කථාවම කිව්වා. එද සාක්ෂි ඇතිව ඔප්පු කළ කරුණු තමුන්නාන්සේලා පිළිගත්තෙ නැහැ. [බාධාකිරීම්] මොකද නැත්තෙ ? ත්‍රස්තවාදීන්ගේ කට උත්තර උඩයි අගමැතිතුමා ඒ ප්‍රකාශය කළේ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

නැහැ ඇමතිතුමනි, ඒවා ගැන පස්සෙ කියන්නම් කිව්වා. මමත් හිටියා.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

දැන් සත්‍යය ප්‍රකාශ වන විට තමුන්නාන්සේලාට ඉවසන්න බැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

මම එතෙන්ද කිව්වා ගරු අගමැතිතුමාට—

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

තමුන්නාන්සේට කථා කරන්න අවස්ථාවක් තිබුණා [බාධාකිරීම්] මම තමුන්නාන්සේට ඉඩ දෙන්නෙ නැහැ. මට මතකයි ඊට පස්සෙ තමුන්නාන්සේලාගේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා පත්‍රවලට ප්‍රකාශයක් කර මොනවද කිව්වෙ කියා. තමුන්නාන්සේලාගේ පක්ෂයට ආණ්ඩු බලය ලැබුණට පස්සෙ ඉන්දිරා ගාන්ධි මැතිණියට කියලා දකුණු ඉන්දියාවේ සිටින ත්‍රස්තවාදීන් අපි ගෙන්වා ගන්නවාය කියා එතුමා කිව්ව බව මතක නැද්ද ? ඒවා මතක නැද්ද ? අන්න එවැනි උදවිය, හැම විටම දේශපාලන වාසියක් ගන්න උත්සාහ කරන උදවිය ඉන්න පක්ෂයක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. ජාතියට හෙන ගැහුවත් කමක් නැහැ, බෞද්ධ ශාසනයට හෙන ගැහුවත් කමක් නැහැ, තමුන්නාන්සේලා නිතරම මාන බලන්නේ කොහොමද මේ පුටුවලට පනින්නෙ කියලයි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේලා වැරදි කරනවා නම් අපි ඒවා පෙන්නා දෙන්න ඕනැ. එය අපේ අයිතියක්.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

තමුන්නාන්සේලාට ජාතික කැක්කුමක් ඇතිවී තිබෙන්නෙ දැන් තමයි. එද රජයට සහයෝගය දුන්නා නම්, මා සිතනවා අපට පුළුවන්කමක් ඇතිවෙන්න තිබුණා—

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ගරු ඇමතිතුමනි, ඔය සහයෝගය ගන්න හැටිත් දැනගන්න ඕනැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

තමුන්නාන්සේලා එද සහයෝගය දුන්නා නම් මීට වඩා ලේසියෙන් මේ ත්‍රස්තවාදී කටයුතු මර්දනය කරන්න තිබුණාය කියා මා හිතනවා. ඒ නිසා තමුන්නාන්සේලා ගැන දන් මහජනතාව හොඳට අවබෝධ කරගෙන ඉවරයි. මම එද තමුන්නාන්සේට කිව්වා, මහජනතාවගේ කල්පනාවන් ගැන තමුන්නාන්සේලාට අබමල් රේණුවක තරම්වත් දැනීමක් නැහැ කියා. මම එද පාර්ලිමේන්තුවෙන් පිට වෙන කොට තමුන්නාන්සේට කිව්වා මතකද, මහජනතාව කල්පනා කරන ආකාරය ගැන තමුන්නාන්සේලා දන්නෙ නැහැ කියල, තමුන්නාන්සේලාගේ පක්ෂය දන්නේ නැහැ කියල. අන්න ඒකයි අද සිදුවී තිබෙන්නෙ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේ ඔය කියන්නේ තමුන්නාන්සේගේ පක්ෂයේ උදවියටමයි.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

මම කියන්නේ ආණ්ඩු පක්ෂයේ උදවියට නොවෙයි. තමුන්නාන්සේටයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටයි.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) යම් යම් මත ප්‍රකාශ කළා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙ වැඩ බලන කොමසාරිස්තුමාට පුරාවිද්‍යාව ගැන කිසිම දැනීමක් නැහැ කිව්වා. එය සම්පූර්ණ වැරදි ප්‍රකාශයක්. එතුමා පුරාවිද්‍යාව සම්බන්ධයෙන් ඉන්දියාවේදී පශ්චාත් උපාධියක් ලබාගෙන තිබෙනවා. ඒ වගේම විශේෂ පුරාවිද්‍යාඥයෙකු වන කේ. ජී. බී. කොඩ්රින්ටන් මහතා යටතේ එතුමා පුහුණුවක් ලබා තිබෙනවා. ඔන්න ඔය විධියේ සුදුසුකම් වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස්තුමාට තිබෙනවා.

ඒ වගේම ඒ මන්ත්‍රීතුමා මතක් කළා, ගලප්පත්ති මහත්මයා ගැන අපි කිසිම සැලකිල්ලක් කළේ නැත කියා. එතුමාගේ අවමංගල්‍යය සඳහා අපේ අමාත්‍යාංශයෙන් රු. 5,000 ක් පරිත්‍යාග කළා. ඒ වගේම ඒ මහතාගේ නාට්‍යයක් නැවත වරක් වේදිකා ගත කරන්නට අපි දැන් ක්‍රියා කරගෙන යනවා. ඒ නිසා කලාකරුවන් අපි අමතක කර තිබෙනවාය කියා කිසිම බියක් ඇති කරගන්න වුවමනාවක් නැහැ.

වයෝවෘද්ධ කලාකරුවන්ට ආධාර කරන්නට අපි වැඩපිළිවෙලක් සකස් කර තිබෙනවා. අපි ගිය අවුරුද්දේ 48 දෙනෙකුට රුපියල් 5,000 ක තැන්පත් ගිණුම් පරිත්‍යාග කළා. උත්සව පවත්වා පෙරහැරින් කැදවාගෙන ඇවිත් තමයි අපි ඒ උදවියට ඒ පරිත්‍යාගයන් කළේ. එසේ ඒ උදවිය පෙරහැරෙන් කැදවාගෙන එද්දී එක් කලාකරුවෙක් විසින් පෙරහැරේ ගමන් කරද්දිම කියන්න යෙදුනා, "මෙතුවක් කල් අපි අනුන්ට පෙරහැර කළා, නමුත් අද සංස්කෘතික අමාත්‍යාංශයෙන්, අපට පෙරහැර කරනවාය" කියා. අන්න ඒ විධියටයි අපි කලාකරුවන්ට සලකන්නෙ කියා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි.

පොත් මුද්‍රණය කිරීමට විශාල මුදලක් ගිය බවත්, නමුත් ඒ සඳහා ලබා ගත්තේ සුළු මුදලක් බවත්, එම නිසා මෙයින් විශාල පාඩුවක් සිදුවූ බවත් පිළිබඳව එතුමා ප්‍රශ්න කළා. එයත් සම්පූර්ණයෙන් වැරදියි. එතුමා රටට පෙන්වන්නට උත්සාහ කළේ මෙයින් ලොකු පාඩුවක් සිදු වූ බවයි. නමුත් අපි මුද්‍රණය කළ පොත්වලින් තවත් කොටසක් අලෙවි වෙන්න තිබෙනවා. අනුරාධපුරයේ පොත් අලෙවි වෙලා ඉවරයි. ඒවා තවත් මුද්‍රණය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ පොත් සඳහා ගිය වියදම වගේ දෙගුණයක් අලෙවි කරන අවස්ථාවේදී අය කර ඒ ආදායම සංස්කෘතික ත්‍රිකෝණයේ වැඩකටයුතු සඳහා පාවිච්චි කරනවා. මේවායින් කිසිම පාඩුවක් ඇති වෙලා නැහැ.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩන්ගොඩ මහතා) ඒ. සී. ගුණරත්න වාර්තාව ගැන මතක් කරන අවස්ථාවේදී මා කිව්වා එය ධවල පත්‍රිකාවක් වශයෙන් සභාගත කළාය කියා. වැරදීමක්, මට වුණේ මා ධවල පත්‍රිකාව වශයෙන් සභාගත කළේ සංඝාධිකරණ පනතයි. නමුත් ඒ. සී. ගුණරත්න වාර්තාව සභාගත කිරීමට කිසිම ප්‍රශ්නයක් නැහැ. මම එය පසුව සභාගත කරන්නම්. දියවඩන නිලමේ තේරීම පිළිබඳවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක්ම ඇහුවා. ඒ. සී. ගුණරත්න වාර්තාවත්, ඇමති අනුකාරක සභාවේ වාර්තාවත් ඇමති මණ්ඩලයට ඉදිරිපත් කළා. ඒ පිළිබඳව සාකච්ඡා කළා. මේ වගන්තිය පිළිබඳව අපේ භික්ෂූන් වහන්සේලාගේත්, නායක ස්වාමීන් වහන්සේලාගේත්, මහා නායක ස්වාමීන් වහන්සේලාගේත් අදහස් ගෙන එන්නටය කියා අපේ ජනාධිපතිතුමා නියෝග කළා. ඒ නිසයි, මෙය ඉදිරිපත් කරන්න අවුරුදු ගණනාවක් ප්‍රමා වූයේ.

අපේ රජය ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන රජයක්. ඒ නිසයි කාගෙත් අදහස් දැන ගැනීමට අපි කටයුතු කරන්නේ. මේ යෝජනාව ඊයේ–පෙරේද ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරන අවස්ථාවේදී අදහසක් ඇති වුණා මේ පිළිබඳව අනිත් නායක ස්වාමීන් වහන්සේලාටත් ඡන්ද බලය දුන්නොත් හොඳද නැද්ද කියා දැනගැනීමට. එම නිසා ජනාධිපතිතුමා මට නියෝග කළා මේ පිළිබඳව මහානායක ස්වාමීන් වහන්සේලාගෙන් අදහස් දැනගෙන වාර්තා කරන්නය කියා. නමුත් මේ පිළිබඳව තවමත් තීරණයක් අරගෙන නැහැ. අපි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් අනුගමනය කරන නිසයි සැම විටම සැම දෙනාගේම අදහස් දැනගෙන ඒ අනුව ක්‍රියාත්මක කරන්නේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

දියවඩන නිලමේ පත් කිරීමට කරදරයක් තිබුණේ නැහැ.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

කරදරයක් තිබුණා. ඒ ගැන අපි නොකීවාට තමුන්නාන්සේ දන්නවා. ඒ. සී. ගුණරත්න කොමිටියක් අපි පත් කළේ, මේ පනතට සංශෝධන රාශියක් අවශ්‍ය වූ නිසයි. අවුරුදු ගණනාවකින් මේ පනතට සංශෝධන තිබුණේ නැහැ. අඩුපාඩු සම්පූර්ණ කිරීම පිණිස සංශෝධන ඉදිරිපත් කරන්නයි, මේ කමිටුව පත් කළේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අනවශ්‍ය දේවල්වලට ඇඟිලි ගහන්න යනවා.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

අපට දේශපාලන වාසියක් ලබා ගන්න පුළුවන්ය කියා තමුන්නාන්සේ කොහොම හිතුවත්, මේ පිළිබඳව තවමත් තීරණයක් අරගෙන නැති බව මා කියන්න කැමතියි. තවම තිබෙන්නේ අදහස් පමණයි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් ගෙන යනවා නම් අපි කාගෙත් අදහස් දැන ගෙනයි රජයේ ප්‍රතිපත්ති සකස් කරන්න ඕනෑ කියා මා තමුන්නාන්සේට අවධාරණයෙන් ප්‍රකාශ කරනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගරු ඇමතිතුමනි, අපට දේශපාලන වාසියක් ඕනෑ නම් තමුන්නාන්සේලාට ඔක කරන්න ඇරලයි අපි පටන් ගන්නේ.

ඊ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

බද්දේගම ගරු මන්ත්‍රීතුමා වැදගත් කාරණයක් ඉදිරිපත් කළා. මේ පුස් කොළ පොත් පිටරටවලට ගෙන යන්නට දෙන්නේ නැතිව ආරක්ෂා කර ගන්නට ඕනෑ. පුස් කොළ පොත් වාගේම අපේ වෙනත් එවැනි සංස්කෘතික දේවල් ආරක්ෂා කර ගන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පසුගිය ආණ්ඩුව තිබුණු කාලයේදී ඕනෑ තරම් පුස්කොළ පොත් පිටරට ගෙන යන්නට අවස්ථාව තිබුණු බව මා මතක් කරන්නට ඕනෑ. දෙකට කපාපු පුස්කොළ කැලි ගෙන යන්නට ඒ කාලයේ අවසර දී තිබුණා. ඒ ආකාරයට අපේ වටිනා පුස් කොළ පොත් දෙකට කපා පිටරටවලට ගෙන ගියා. නමුත් මා සංස්කෘතික ඇමති වූවාට පසු නියෝගයක් කළා පුස්කොළ පොත්වල කැල්ලක්වත් ගෙන යන්නට බැරිය කියා. පුස්කොළ පොත්වල කැල්ලක්වත් ගෙන යන්නට බැරි විධියට අපි දැන් තහනමක් පනවා තිබෙනවා.

ඒ හැර පිළිම යනාදී තවත් අපේ වටිනා වස්තූන් තිබෙනවා. ඒවා ආරක්ෂා කරන්නටත් අපි වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කරගෙන යනවා. එපමණක් නොවෙයි. රජමහා විහාරස්ථානවල තිබෙන වටිනා වස්තූන් ආරක්ෂා කර ගැනීම සඳහා ඒ විහාරස්ථානවලට අපි දැන් යකඩ සේප්පු පරිත්‍යාග කරගෙන යනවා. ඒ විධියේ වැඩ පිළිවෙළක් අපි ආරම්භ කර තිබෙනවා.

තවත් සංශෝධනයක් කර නීතිය තවත් තද කර අපේ සංස්කෘතික දායාදයන් ආරක්ෂා කරන්නට අපි අදහස් කරනවා.

උතුරු නැගෙනහිර සිද්ධස්ථාන ගැන මහරගම ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. 1970 සිට 1977 දක්වා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබුණු කාලයේ කිලිවෙඩ්ඩිහි තිබුණු වටිනා ඓතිහාසික බෝධිය ඒ පක්ෂයේ මන්ත්‍රීවරයකුගේ දුරකථනයට රැහැන් ඇදීම සඳහා කපා දැමූ බව මා මතක් කරන්නට ඕනෑ. පළමුවෙන් අතු කපා පසුව එය සම්පූර්ණයෙන්ම එතැනින් ඉවත් කළා. නමුත් අපේ රජය පත්වූවාට පසු ඒ ස්ථානය සංරක්ෂණය කර දැන් පුරා විද්‍යා ඉඩමක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

ඒ වාගේම පසුගිය ආණ්ඩුව කාලයේ වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව නගරයට සැතපුම් දෙක තුනක් නුදුරින් බෞද්ධ සිද්ධස්ථාන දෙකක හින්දු කෝවිල් ඉදි කරමින් තිබුණා. නමුත් එවකට තිබුණු ආණ්ඩුව ඒ ගැන කිසිම රාජකාරියක් කළේ නැහැ ඒක නවත්වන්න. නමුත් මා සංස්කෘතික ඇමති වූවාට පසු මා එය තහනම් කළා. [බාධා කිරීමක්] නමුත්නාන්සේ මට උගන්වන්න වුවමනා නැහැ. පසුගිය කාලයේ කළ දේවල් මතක් කරන කොට නමුත්නාන්සේට ඉවසන්න බැහැ. දෙඩවනවා.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

අපි මොකවත් කළේ නැහැ කියන එකට උත්තරයක් තිබෙනවා.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

නමුත් මොකවත් කෙරුණේ නැහැ නේද ? මම සංස්කෘතික ඇමති වූවාට පසු ඓතිහාසික වටිනාකමක් ඇති ඒ බෞද්ධ සිද්ධස්ථාන දෙකම රජයට පවරා ගෙන කැණීම් කටයුතු ආරම්භ කොට ඒවා සංරක්ෂණය කළා.

ඊයේ පෙරේද ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තවත් සිද්ධස්ථාන දෙකක කැණීම් කටයුතු කර ඒවා සංරක්ෂණය කරන්නට අපි පියවර ගත්තා. එකක් පොලිකන්දකුලම. අනික මයිලෑව. ඒක කරන්නට පුළුවන් වුණේ බුද්ධදාස අතපත්තු මහතමයා කළ පරිත්‍යාගය නිසයි. එතුමා වටිනා ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් මධ්‍යම සංස්කතික අරමුදලට පරිත්‍යාග කර තිබෙනවා. එතුමාගේ නැසී ගිය භාර්යාව ජීවතුන් අතර සිටියදී කියා තිබෙනවා උතුරු නැගෙනහිර බෞද්ධ කටයුතු සඳහා කොළඹ කුරුඳුවත්තේ මෙට්ලන්ඩ් ක්‍රෙසන්ට්හි පිහිටි ඒ ගොඩනැගිල්ල සංස්කෘතික අමාත්‍යාංශයට පරිත්‍යාග කරන්නය කියල. අතපත්තු මහත්මයා ඒක මධ්‍යම සංස්කෘතික අරමුදලට පරිත්‍යාග කළා. ඒ ගොඩනැගිල්ලෙන් අපට මාස්පතා රු. 40,000 ක ආදායමක් ලැබෙනවා. ඒ ගොඩනැගිල්ලෙන් ලැබෙන මාස පහක මුදලින් නැතහොත් රු. 2,00,000 න් තමයි, ඒ ස්ථානවල කැණීම් කටයුතු ආරම්භ කළේ. ඒ මුදල්වලින් ඉදිරියටත් ඒ ආකාරයටම උතුරේ හා නැගෙනහිර තිබෙන සිද්ධස්ථාන කැණීම් කර සංරක්ෂණය කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. අපට ලැබුණු වටිනාම ත්‍යාගය මෙය බව මේ පාර්ලිමේන්තුවේ නමුත්නාන්සේලාටත් මහජනතාවටත් මම ප්‍රකාශ කරනවා. මේ ත්‍යාගය හැමදාටම අපට ලැබෙන ආදායමක්. ඒ නිසා ඉදිරියටත් නොකඩවාම වැඩ කරගෙන යන්නට අපට පුළුවන් වෙනවා.

අපේ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ගැනත් කථා කළා. විශේෂයෙන්ම දහම් පාසල් ගැන කථා කළා. 1977 න් පසුව දහම් පාසල් පිළිබඳව විශාල ප්‍රගතියක් ඇති වී තිබෙන බව නමුත්නාන්සේලා දන්නවා. අපේ තරුණ පරම්පරාව කලින්ට වඩා ලක්ෂ ගණනින් දැන් දහම් පාසල්වලට යනවා. 1947 න් පසුව පළමුවන වරට දහම් පාසල්වල පුටු බංකු ආදිය සඳහා ලක්ෂ 10 ක පමණ මුදලක් පසුගිය අවුරුද්දේ අපි පරිත්‍යාග කර තිබෙනවා. මේ අවුරුද්දේත් ඒ ආකාරයටම ආධාර දීගෙන යනවා. කලින් තිබුණු ආණ්ඩුවෙන් එය කළේ නැහැ. කිසිම ආණ්ඩුවක් මේ විධියට ආධාර කර නැහැ. එපමණක් නොවෙයි. දහම් පාසල්වල ළමයින්ට අපි නොමිලයේ පොත් දෙනවා. කලින් ආණ්ඩුව එයත් කළේ නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඇයි නැත්තේ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

නැහැ. නමුත්නාන්සේලා සියලු දෙනාටම නොමිලයේ පොත් දුන්නේ නැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

සියලු දෙනාටම දුන්නේ නැහැ. සෑහෙන පිරිසකට දුන්නා.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

ඔව්. තෝරගත් පන්දම්කාරයින්ගේ ළමයින්ට දෙන්න ඇති.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඇමතිතුමා ඔන්න දැන් රතු ඉරෙන් පනින වෙලාව. ඒක තමයි වරද.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

මේවා කියන විට නමුත්නාන්සේලාට ඉවසන්න බැහැ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඇත්ත කියන්න ඕනෑ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

ඒ නිසා තමයි, ඔය අනම්මනං දොඩවන්නේ.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
**(Mr. Ananda Dassanayake)**

ඔප්පු කරන්න බැරි දේවල් කියන්න එපා. ඒවා කියන්නට ගියාමයි නමුත්නාන්සේගේ තත්ත්වය බහින්නේ.

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
**(Mr. E. L. B. Hurulle)**

අපේ කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා) වැදගත් අදහසක් ප්‍රකාශ කළා. ඉරිද දිනවල ටියුෂන් පන්ති පැවැත්වීම නවත්වන්නැයි එතුමා කිව්වා. එය කළොත් හොඳයි. ඒ ටියුටරිවලට නැත්නම් පන්ති පවත්වන අයට අපි ආයාචනයක් කර තිබෙනවා, දහම් පාසල් පවත්වා ගෙන යැමට බාධා වන ආකාරයට ඒවා පවත්වන්නට එපාය කියා. වැඩි දෙනෙක් අපේ ඉල්ලීමට ඇහුම්කන් දෙයි කියා මම බලාපොරොත්තු වෙනවා. නමුත් අපට බල කරන්නට බැහැ. මෙය ප්‍රජාතන්ත්‍රවාදී රටක්. ඒ නිසා අපි ඒ විධියට බල කරනවා නම් එය මානුෂික අයිතිවාසිකම්වලට පටහැනි දෙයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. එල්. බී. හුරුල්ලේ මහතා]

අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිචඩ් පතිරත මහතා) එතුමාගේ ආසනයේ විහාරස්ථානයක තිබෙන බිතුසිතුවම් ආරක්ෂා කරන්නැයි මතක් කළා. යම් ස්ථානයක වටිනා බිතිසිතුවම් තිබෙනවා නම් හා ඒවා සංරක්ෂණය කිරීම අවශ්‍ය නම් ඒ බව අපට දැන්වුවොත් අපි ඒවා සංරක්ෂණය කර ආරක්ෂා කරන්නට සූදානම්. ඒ ආකාරයට මේ අවුරුදු කීපය තුළ පන්සල් සිය ගණනක බිතිසිතුවම් ගණනාවක්ම අපි ආරක්ෂා කර සංරක්ෂණය කර තිබෙනවා.

මහාවංශය ගැනත් මගෙන් ඇසුවා. මහාවංශය නූතන කොටස පළමු වැනි භාගය දැනට මුද්‍රණයේ පවතිනවා. මෙය 1985 වර්ෂය අවසාන වීමට පෙර මුද්‍රණය කොට අලෙවි කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. එහි දෙවැනි භාගය 1985 ජූනි 30 වැනි දින වන විට සම්පාදනය කොට අවසාන වෙනවා ඇති. ඉන් පසු එය මුද්‍රණය කිරීමට පියවර ගන්නවා.

අ. භා. 5.45

මේ අවස්ථාවේදී දීර්ඝ වශයෙන් කථාකරන්න වෙලාව නැති නිසා මීට වඩා විස්තර ඉදිරිපත් කරන්න නොහැකි වීම ගැන මම කනගාටු වෙනවා. නමුත් මගේ නියෝජ්‍ය ඇමතිතුමා විසින් සභාගත කරන ලද පිටු 68 කින් යුත් ලේඛනයේ සඳහන් වෙනවා, අපේ අමාත්‍යාංශයෙන් පසුගිය අවුරුද්දේ සහ මේ අවුරුද්දේත් කර ලද වැඩ කටයුතු වලින් ස්වල්පයක්. අපේ සංස්කෘතිය සම්බන්ධයෙන් මගේ අමාත්‍යාංශයෙන් කෙරී තිබෙන වැඩ ගැන හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවනි, ඒ විස්තර කියවා බැලීමෙන්.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ඇමතිතුමනි, දේශීය වෛද්‍ය ඇමතිතුමා හොඳ යෝජනාවක් කළා. අද අපේ රටේ තිබෙන අවදානම් තත්ත්වය නිසා, ලෝකයේ සියලුම බෞද්ධ රටවල් එකතු කොට ඒ සම්බන්ධයෙන් යම්කිසි විධියක ආධාරයක්, පිටුබලයක් ලබා ගත යුතුය කියන අදහසයි, එතුමා ඉදිරිපත් කළේ. ඒ විධියේ දෙයක් දැනට මත් ක්‍රියාත්මක වෙනවා, එහෙම නැත්නම් ක්‍රියාත්ම කරන්න බලාපොරොත්තු වෙනවාද ?

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

ලෝක බෞද්ධ සම්මේලනයේ 14 වැනි සැසි වාරය, ළඟදී ලංකාවේ පැවැත්වුණා. එහිදී ලංකාවෙන් ඉදිරිපත් කළ යෝජනාවක් ඒකඡන්දයෙන් සම්මත වුණා. ඒ යෝජනාව අනුව සියලුම බෞද්ධ රටවල් සම්බන්ධ කරගෙන ලංකාව මූලස්ථානය කොටගත් වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න දැන් කටයුතු කරගෙන යනවා. ඒ කටයුතු සම්බන්ධයෙන් සියලුම බෞද්ධ රටවල් දායක වන අරමුදලක් ඇති කරන්න පියවර ගෙන තිබෙනවා. ඒ නිසා, කොත්මලේ ගරු මන්ත්‍රීතුමාගේ (ආනන්ද දසනායක මහතා) අදහස දැන් ක්‍රියාත්මක වන බව මතක් කරන්න කැමතියි.

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

පුසුල්පිටිය ගැන ?

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

පුසුල්පිටියේ ඒ වටිනා පිළිමය නැතිවීම ගැන අපි ඉතා කණගාටුවෙනවා. මෙවැනි වටිනා දේවල් ආරක්ෂා කරන්න අපි හැම උත්සාහයක්ම ගන්නවා. ඒ විධියේ වටිනා දේවල් ආරක්ෂා කර ගැනීම සඳහා අපි දැන් යකඩ සේප්පු පරිත්‍යාග කරගෙන යනවා. එක අතකින් ඊටත් වඩා වෙන මොනවා කරන්නද ?

ඒ අතර අපි තවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවා. එවැනි වටිනා වස්තූන් අපට භාර දෙනවා නම් අයිතිය විහාරස්ථානය සන්තකව පවතිද්දීම ඒවා කෞතුකාගාරයේ තැන්පත් කරන්න පුළුවන්. නියම ආරක්ෂාවක් නැතිව එවැනි වටිනා වස්තූන් විහාරස්ථානවල තබා ගැනීම නිසා ඇතැම් විට ඒ ස්වාමීන් වහන්සේලාගේ ජීවිතවලට පවා හානි ඇති වන්න පුළුවන්. එහෙම ජීවිත හානි වෙලාත් තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, තමන්ගේ ඡන්ද කොට්ඨාශවලට අයත් යම් විහාරස්ථානයක තිබෙන එවැනි ඉතා වටිනා වස්තූන් ආරක්ෂා කර ගැනීම අමාරු නම් අපේ කෞතුකාගාරවලට භාර දෙන්නය කියා. එවිට, භාරකාරයන් වශයෙන් අපි ඒවා ආරක්ෂා කරන අතර ඒවායේ අයිතිය අදාල විහාරස්ථාන සන්තකව තබන බව කියන්න කැමතියි.

අපේ අමාත්‍යාංශයෙන් මේ දක්වා යම් වැඩ කොටසක් කෙරී තිබෙනවා නම් අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, අමාත්‍යාංශය යටතේ ඇති නොයෙකුත් දෙපාර්තමේන්තුවල හා ආයතනවල ඉන්නා අන්තිම පහළ ශ්‍රේණියේ සේවක මහතා හෝ මහත්මිය දක්වා වූ සියලු දෙනාමත් ඊට හවුල් කරුවන් වී තිබෙනවා. ඒ සියලු දෙනාටම මගේ ගෞරවයත්, ස්තුතියත් මේ අවස්ථාවේදී පිරිනමන්න කැමතියි. ඒ අතර විශේෂයෙන්ම මගේ නියෝජ්‍ය ඇමතිතුමාත්, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ සියලුම සාමාජික මන්ත්‍රීතුමන්ලාත් ඒ කටයුතුවලදී මට නොමසුරු සහයෝගය ලබා දී තිබෙන බව ප්‍රකාශ කරන්නේ සන්තෝෂයෙන්. මේ අවස්ථාවේදී අපේ ගරු කථානායකතුමාටත්, නියෝජ්‍ය කථානායකතුමාටත්, මූලාසනයේ සිටින නමුන්නාන්සේටත්, ඒ වාගේම මහ ලේකම්තුමා,නිලධාරීන් ඇතුළු සේවක පිරිසටත් මම ස්තුතිවන්ත වෙනවා, මේ කටයුතු ඉක්මනින් අවසන් කර ගැනීමට දක්වන ලද සහයෝගය ගැන.

අවසාන වශයෙන්, මෙම වැය ශීර්ෂය සම්මත කර ගැනීමට හැම දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස සංස්කෘතික කටයුතු භාර ඇමතිවරයා වශයෙන් මා ඉල්ලා සිටිනවා.

**"162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 99,67,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**"தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 99,67,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

**தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.**

Question, "That the sum of Rs. 9,967,000, for Head 162, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 162, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා—මූලධන වියදම, රු. 91,00,000**

**நிகழ்ச்சித் திட்டம் 1.—பொது நிருவாகமும் பதவியினர் சேவைகளும்—ஆக்கப்பொருட் செலவு, ரூபா 91,00,000**

Programme 1.– General Administration and Staff Services – Capital Expenditure, Rs. 9,100,000

**"162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම සඳහා රු. 91,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.**

**162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**"தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 91,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**

**தலைப்பு 162, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.**

Question, "That the sum of Rs. 9,100,000, for Head 162, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 162, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**166 වන ශීර්ෂය.– බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

**1 වන වැඩ සටහන.–බෞද්ධාගමික කටයුතු වර්ධනය.–පුනරාවර්තන වියදම, රු. 79,15,000**

**தலைப்பு 166.—பௌத்த அலுவல்கள் திணைக்களம்**

***நிகழ்ச்சித் திட்டம் 1.—பௌத்த சமய முயற்சிகளின் மேம்பாடு—மீண்டுவரும் செலவு, ரூபா 79,15,000***

## HEAD 166.– DEPARTMENT OF BUDDHIST AFFAIRS

Programme 1.– Promotion of Buddhist Religious Activities – Recurrent Expenditure, Rs. 7,915,000

**"166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 79,15,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

***"தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவுக்கான ரூபா 79,15,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.***

***தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவரும் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.***

Question, "That the sum of Rs. 7,915,000, for Head 166, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

**1 වන වැඩ සටහන.–බෞද්ධාගමික කටයුතු වර්ධනය.–මූලධන වියදම, රු. 66,000**

***நிகழ்ச்சித் திட்டம் 1.—பௌத்த சமய முயற்சிகளின் மேம்பாடு—ஆக்கப்பொருட் செலவு, ரூபா 66,000***

Programme 1.– Promotion of Buddhist Religious Activities – Capital Expenditure, Rs. 66,000

**"166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 66,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.**

**166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

***"தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 66,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.***

***தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.***

Question, "That the sum of Rs. 66,000, for Head 166, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

***අ. භා. 5.51ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි : නැවත රැස්වීම 1984 දෙසැම්බර් 14.***

***நேரம் பி. ப. 5.51 மணியாகவிடவே குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைவர் அக்கிராசனத்திலிருந்து நீங்கினர்.***

***குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது 14 டிசம்பர் 1984***

*At 5.51 p.m., the Deputy Chairman left the Chair to report Progress.*

*Committee report Progress ; to sit again on 14th December, 1984.*

## වෙළඳ නැව් පනත : නියෝගය

**வணிகக் கப்பற் சட்டம் : ஒழுங்குவிதி**

## MERCHANT SHIPPING ACT : REGULATION

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

On behalf of the Minister of Trade and Shipping, I move,

"That the Regulation made by the Minister of Trade and Shipping under sections 44 and 321 of the Merchant Shipping Act, No. 52 of 1971 and published in the Gazette Extraordinary No. 314/5 of 11.09.1984 which was presented on 26.11.1984, be approved."

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
**வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**
*Question put and agreed to.*

## ජාතික ලේඛනාරක්ෂක පනත : නියෝග

**தேசிய சுவடிக்கூடச் சட்டம் : ஒழுங்குவிதிகள்**

## NATIONAL ARCHIVES LAW : REGULATIONS

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

I move,

"That the Regulations made by the Minister of Cultural Affairs, under section 16 (1) (*a*) and (*h*) of the National Archives Law, No. 48 of 1973, for the periodical disposal of facilitative (housekeeping) records in public offices of Sri Lanka and published in the Government Gazette No. 313 of 31.08.1984 which were presented on 07.11.1984 be approved."

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
**வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**
*Question put and agreed to.*

## කල්තැබීම

**ஒத்திவைப்பு**

## ADJOURNMENT

**ඊ. එල්. බී. හුරුල්ලේ මහතා**
**(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)**
(Mr. E. L. B. Hurulle)

I move,

"That the Parliament do now adjourn"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
***வினா எடுத்தியம்பப்பெற்றது.***
***Question proposed.***

**ආනන්ද දසනායක මහතා**
**(திரு. ஆனந்த தஸநாயக்க)**
(Mr. Ananda Dassanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ඉදිරිපත් කරන්න ඇති ප්‍රශ්නය මේකයි. රක්වාන ඡන්ද කොට්ඨාශයෙහි උඩවලවේ වන උද්‍යානයේ කැලෑ ඉඩම්වල ගොවිතැන් කරමින් කලක් තිස්සේ පදිංචිව සිටින පවුල් පන්සියයකට අධික පිරිසක් අද ඉතා අසරණ තත්ත්වයකට පත්ව සිටිනවා. මෙයින්, පවුල් විසි පහකට අධික පිරිසකට තඩු දමා තමන් මෙතෙක් පදිංචිව සිටි ස්ථානවලින් ඉවත් කර තිබෙනවා. සෙසු අයටද මේ ඉරණමට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. මේ නිසා මෙම පවුල්වල අය උන්හිටි තැන් නැතිව, යන එනමං නැතුව ඉතා දුක්ඛිත තත්ත්වයකට පත්ව සිටිනවා. මේ පිරිස වැටී සිටින තත්ත්වය ගැන සානුකම්පිකව සලකා බලා සංවර්ධන යෝජනා ක්‍රමයකින් හෝ වෙනත් ව්‍යාපාරයකින් හෝ විකල්ප ඉඩම් ලබා දීමට ඇමතිතුමා සුදුසු වැඩ පිළිවෙළක් යොදනවාද කියන ප්‍රශ්නයයි, මතු කරන්නේ.

දෙවැනි ප්‍රශ්නය මම අසන්නේ අපේ රාජ්‍ය ඇමතිතුමාගෙන්. මේ කාරණය ගැන දීර්ඝ ලෙස විස්තර කිරීම අවශ්‍ය නැහැ. වන උද්‍යානය හැටියට හඳුන්වන මේ කොටස කාලයක් තිස්සේ වගා කරගෙන මේ අය ජීවත් වුණා. නමුත් මෙපමණ කලක් කිසිම පියවරක් ගත්තේ නැහැ. තමන් පදිංචි ඉඩම් දියුණු කරගෙන, ඒවායේ ගෙවල් හද ගෙන මෙතෙක් කලක් ජීවත් වුණා. දැන් ඒ අයට විරුද්ධව මහේස්ත්‍රාත් උසාවියේ නඩු පවරා මෙතෙක් පදිංචිව සිටි ඉඩම්වලින් ඉවත් කර ගෙන යනවා. මේ අන්දමට පදිංචිව සිටින තවත් අය ඉන්නවා. නමුත් ඒ ගැන ක්‍රියා කළේ නැහැ. ඒ නිසා මෙය මොන යම් පිරිසකගෙන් හරි සිදු වී ඇති දෙයක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවුරුදු දහයක-පහළොවක කාලයක් පදිංචිව සිටි ස්ථානවලින් ඒ අය එළවා දමන විට, ඔවුන් කොහේද යන්නේ ? ඒ අයට ගෙයක් හදා ගන්නට තැනක් නැහැ. රක්ෂාවක් කරන්නට තැනක් නැහැ. වවා ගන්න බිම් කැබැල්ලක් නැහැ. එම නිසා, එම පිරිසට එම ඉඩම්වලින් ඉවත් වෙන්නට සිදු වෙන්නේ ඉතාමත්ම අසරණ තත්ත්වයෙන් බව රාජ්‍ය ඇමතිතුමාට මතක් කරනවා. මේ අයගේ වරදකින් නොවෙයි මෙය සිදු වෙලා තිබෙන්නේ. වනෝද්‍යානය ආරක්ෂා කළ නිලධාරීන්ගේ වරදින් මෙය සිදුවෙලා තිබෙන්නේ. ඒ අයයි, ඉඩ දී තිබෙන්නේ. දැන් එය පැහැදිලි වේලා තිබෙනවා. ඒ අනුව ඉඩම්වලට තඩු දලා ඒ අය එළියට ඇද දැමීම නොවෙයි, කරන්නට තිබෙන්නේ. මේ අයට රජයේ ඉඩම් අමාත්‍යාංශයෙන් හෝ ඉඩම් ලබා දීලා පදිංචි කරනවා නම් ඉතාම වැදගත් වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මේ සම්බන්ධයෙන් පිළිතුරු ලැබේයයි බලාපොරොත්තු වෙනවා.

**චන්ද්‍රා කරුණාරත්න මහතා (නියෝජ්‍ය රාජ්‍ය ඇමතිතුමා)**
**(திரு. சந்திரா கருணாரத்ன — இராசாங்கப் பிரதி அமைச்சர்)**
(Mr. Chandra Karunaratne–Deputy Minister of State)

Sir, the Department of Wild Life has agreed to excise a portion of land from the Western boundary of the Uda Walawe Park already occupied by villagers. There are other encroachers in the Hataramune and Dambamadayaya villages. These areas also fall within the boundaries of the National Park. Action has been taken to eject these encroachers.

Before this action was taken the matter was discussed at a conference held in the Ratnapura Kachcheri on 3.12.84, presided over by the hon. District Minister, Ratnapura, Mr. Nanada Mathew. The hon. Deputy Minister of Transport, Mr. ·Kularatne, Member for Rakwana – I think this land falls within his area – the Director of Wild Life and the Government Agent, Ratnapura, were present at this meeting. At this meeting it was agreed to settle these encroachers in the portion of land that is to be excised from the Reserve. This decision is being implemented by the GA.

මේ අය ඉන්නේ ජලාශයේ බැම්මේ වගෙයි. "කැච්මන්ට් ඒරියා" එකේ ඉන්නේ. එම නිසා මෙතැනින් ඉවත් කර උඩ වළවේ කොටසෙහි මේ අය සෙට්ල් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ විධියට සාකච්ඡා කර ඒ පළාතේ මන්ත්‍රීවරයා, දිස්ත්‍රික් ඇමතිවරයා සහ දිසාපතිවරයා කටයුතු කරගෙන යනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.*
**வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.**
*Question put and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව 5.57 ට, 1984 දෙසැම්බර් 10 වන දින සභා සම්මුතිය අනුව 1984 දෙසැම්බර් 14 වන සිකුරාදා පූ. භා. 8.30 වන තෙක් කල් ගියේය.***

***அதன்படி, பி. ப. 5.57 மணிக்கு பாராளுமன்றம், அதனது 1984 நவம்பர் 10 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1984 டிசம்பர் 14, வெள்ளிக்கிழமை மு. ப. 8.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.***

*Adjourned accordingly at 5.57 p.m. until 8.30 a.m. on Friday, 14th December, 1984, pursuant to the Resolution of the Parliament of 10th December, 1984.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සැ. යු.**

**මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත**

**1984 දෙසැම්බර් 27 වන බ්‍රහස්පතින්ද**

**නොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි**

***குறிப்பு***

***அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு***

**1984 டிசம்பர் 27, வியாழக்கிழமைக்குப் பிந்தாமற்**

***கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.***

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD

**not later than**

**Thursday, 27th December 1984**

---

| | | |
|---|---|---|
| **Contents of Proceedings** | : | **From 8.30 a.m. to 5.57 p.m. on 13.12.1984** |
| **Final set of manuscripts received from Parliament** | : | **7.15 p.m. on 14.12.1984** |
| **Printed copies despatched** | : | **15.12.1984 morning** |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දායක මුදල් :** පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

*சந்தா :* *ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2.50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.*

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org